234 වන කාණ්ඩය - 8 වන කලාපය (1 කොටස)
தொகுதி 234 - இல. 8 (1ம் பகுதி )
**Volume 234 - No. 8 (1st Part)**

**2015** අප්‍රේල් 28වන අඟහරුවාදා
2015 ஏப்பிரல் 28, செவ்வாய்க்கிழமை
**Tuesday, 28th April, 2015**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**විගණකාධිපතිවරයාගේ වාර්තාව**

**නොපැමිණීමේ අවසරය :**
ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා

**වරප්‍රසාද :**
අධිකරණය ඉදිරියට කැඳවීම

**දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත:**
දෙ වන වර කියවන ලදී

---

# பிரதான உள்ளடக்கம்

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை**

**வராதிருக்க அனுமதி :**
மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ

**சிறப்புரிமை:**
நீதிமன்றத்துக்கு வரவழைத்தல்

**அரசியலமைப்புக்கான பத்தொன்பதாம் திருத்தச் சட்டமூலம்:**
இரண்டாம்முறை மதிப்பிடப்பட்டது

---

# PRINCIPAL CONTENTS

AUDITOR-GENERAL’S REPORT

LEAVE OF ABSENCE:
Hon. Basil Rohana Rajapaksa

PRIVILEGE:
Summoning before Court

NINETEEENTH AMENDMENT TO THE CONSTITUTION BILL:
Read the Second Time

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

*2015 අප්‍රේල් 28වන අඟහරුවාදා*
*2015 ஏப்பிரல் 28, செவ்வாய்க்கிழமை*
*Tuesday, 28th April, 2015*

**පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி ] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] in the Chair.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාර 2012 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ VIII, IX සහ X වැනි කොටස්, දෙවැනි කාණ්ඩයේ XIX වැනි කොටස සහ හයවැනි කාණ්ඩයේ XIII, XIV සහ XV වැනි කොටස්; සහ

2013 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ II සහ III වැනි කොටස් සහ හතරවැනි කාණ්ඩයේ III වැනි කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Plantation Industries and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "එකී වාර්තාවල එකී කොටස් මුද්‍රණය කළ යුතුය"යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*



## උපදේශක කාරක සභා වාර්තා
## ஆலோசனைக் குழு அறிக்கைகள்
## CONSULTATIVE COMMITTEE REPORTS

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍ය ගරු ආචාර්ය සරත් අමුණුගම මහතා විසින් පිළිගැන්වීම - පැමිණ නැත.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2013 වර්ෂය සඳහා සී/ස හලාවත වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව සහ 2013 වර්ෂය සඳහා සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதார மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health and Indigenous Medicine)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2012 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ 2012 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය ගරු රිසාඩ් බදියුදීන් මහතා විසින් පිළිගැන්වීම - පැමිණ නැත.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Mass Media and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම 2012 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## නොපැමිණීමේ අවසරය : ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා
## வராதிருக்க அனுமதி : மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ
## LEAVE OF ABSENCE: HON. BASIL ROHANA RAJAPAKSA

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Nimal Siripala de Silva - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 66(ඊ) ව්‍යවස්ථාව යටතේ, ගම්පහ මැතිවරණ දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතාට 2015 අප්‍රේල් මස 28 වැනි දින සිට මාස තුනක් තුළ පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට නොපැමිණීමට අවසර දිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## වරප්‍රසාද : අධිකරණය ඉදිරියට කැඳවීම
## சிறப்புரிமை: நீதிமன்றத்துக்கு வரவழைத்தல்
## PRIVILEGE: SUMMONING BEFORE COURT

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් කරනු ලබන ක්‍රියාවන් හේතුවෙන්, අධිකරණයට කැඳවීම් ලැබීමෙන් මන්ත්‍රී වරප්‍රසාද උල්ලංඝනය වීම සම්බන්ධයෙන් වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධව මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

1989 වර්ෂයේ සිට මෙම ගරු සභාව නියෝජනය කිරීම සඳහා මහජන ඡන්දයෙන් තේරී පත් වූ මා හට මාගේ පාර්ලිමේන්තු ජීවිත කාලයේ ප්‍රථම වතාවට අප්‍රේල් 20 වන දින අධිකරණ නියෝග පැහැර හැරීම, අධිකරණයට අපහාස කිරීම සහ මහා මාර්ගය අවහිර කිරීම යන චෝදනා යටතේ මැයි මස 08 වන දින අධිකරණයේ පෙනී සිටින ලෙසට සිතාසියක් භාර දෙනු ලැබීය. [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක අධිකරණය ඉදිරියේ තිබෙන ප්‍රශ්නයක්.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
නැහැ, නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අධිකරණය ඉදිරියේ තිබෙන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
එතුමාට එය ඉදිරිපත් කිරීමට ගරු කථානායකතුමා අවසර දී තිබෙනවා.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- [බාධා කිරීමක්] මේක අධිකරණය ඉදිරියේ නොවෙයි, පොලීසිය මඟින් මේ මන්ත්‍රීවරුන්ට කරන හිරිහැර - [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා කියන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමා අවසර දී තිබෙනවා- [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු සභානායකතුමා, මන්ත්‍රීතුමාට ඒක ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න. ගරු බන්දුල ගුණවර්ධන මහතා, ඉදිරිපත් කරන්න. [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
තේරුම් ගන්න ඕනෑ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
තමුන්නාන්සේට විතරයි තේරෙන්නේ! අපි කාටවත් තේරෙන්නේ නැහැ!

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා කියන්න. ගරු කථානායකතුමා විසින් අනුමත කරන ලද කොටස කියවන්න.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

2. මහජන නියෝජිතයන් බිය වැද්දීම අරමුණු කොටගෙන හිතා මතා ඕනෑකමින් කුමන්ත්‍රණකාරී සැලැස්මකට අනුව ඉදිරිපත් කොට ඇති ඉහත අසත්‍ය චෝදනා කරණකොටගෙන මාගේ මන්ත්‍රී වරප්‍රසාද බරපතළ ලෙස උල්ලංඝනය වී ඇති බව සඳහන් කරමි.
3. අප්‍රේල් මස 20 වෙනි දින පෙර වරුවේ මම බෞද්ධාලෝක මාවත දොරටුවෙන් නිල පිවිසුම් ක්‍රමවේදය අනුගමනය කොට අදාළ පොතේ අත්සන් තබා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පරිශ්‍රයට ඇතුළු වීමි.

එසේ කොමිසම වෙත ගියේ මට විරුද්ධව ජනතා විමුක්ති පෙරමුණේ පළාත් සභා මන්ත්‍රීවරයෙක් විසින් මහින්දෝදය පාසල් දහසේ ව්‍යාපෘතිය හරහා දැවැන්ත හොරකම්, දූෂණ, වංචා සිදු කර ඇති බවට කරන ලද ද්වේෂ සහගත පැමිණිල්ලක් විභාග කොට අවසන් කරන ලෙස ඉල්ලා සිටීමටය. ජනතාව දන්නා පරිදි මීට පෙර අවස්ථා දෙකකදී ද මම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙතට ගොස් සාධාරණ හා යුක්තිසහගත කඩිනම් පරීක්ෂණයක් ඉල්ලා ඇත. මාර්තු මස 30 වෙනි දින අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය දුරකථනයෙන් මා අමතා සති දෙකක් ඇතුළත මෙම පරීක්ෂණය නිම කරන බව දැන්වීය. ඊට පසු දින එනම් මාර්තු මස 31 වෙනි දින පෙර වරු 11.17ට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය දුරකථන මාර්ගයෙන් මා සමඟ සංවාදයක යෙදුණි. නමුත් අප්‍රේල් 20 වෙනි දින දක්වාම මෙකී පරීක්ෂණය අවසන් වී නොමැති බැවින් ඒ පිළිබඳ යළිත් සොයා බැලීමට තුන් වෙනි වතාවට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගියේ අප්‍රේල් 20 වැනිදා ය. කොමිෂන් සභාවේ පිළිගැනීමේ කවුන්ටරයේ සිටි නිලධාරීන් දෙදෙනාට අවශ්‍ය දැනුම් දීම කොට ඔවුන් ඉදිරිපිට අසුනේ මම වාඩි වී සිටියෙමි. එම ස්ථානයේ ප්‍රවීණ මාධ්‍යවේදී බන්දුල පද්මකුමාර මහතා මෙන්ම, නීතිඥයන් විශාල පිරිසක් ද විය. හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා කොමිසම වෙත පැමිණෙන හෙයින් දැඩි ආරක්ෂක විධිවිධාන යොදා බෞද්ධාලෝක මාවතේ පිටත නොපෙනෙන අයුරින් කොමිෂන් සභා පරිශ්‍රය සම්පූර්ණයෙන් වසා දමා තිබිණි. දොරටුවෙන් පිටත සිට පිරිත් දේශනා හඬ සහ විශාල පිරිසක් රැස් වී සිටින හඬ මට ඇසුණ නමුත්, පිටත දර්ශන කිසිවක් දැක ගත නොහැකි විය. ටික වේලාවක් ගතවෙද්දී හිටපු ආරක්ෂක ලේකම්තුමා සිය රථයෙන් පැමිණි අතර, මම ද ගොස් එතුමා සමඟ සාකච්ඡා කළ අතර, එතුමා නීතිඥයන් තිදෙනෙකු සමඟ කොමිසමේ නිලධාරීන් හමු වීමට ගියේය. හිටපු ආරක්ෂක ලේකම්තුමාගේ පැමිණීම සම්බන්ධයෙන් යොදා තිබූ ආරක්ෂක අංශයේ විධිවිධාන සම්බන්ධයෙන් මා තුළ විශාල කුතුහලයක් හා සැකයක් ඇති වූ බැවින් රටට වගකිව යුතු ජනතා නියෝජිතයෙක් වශයෙන් මම කොමිෂන් පරිශ්‍රයෙහි මිදුලේ රැඳී සිටි අතර, විනාඩි කිහිපයකට පසු පිටතට පැමිණි හිටපු ආරක්ෂක ලේකම්වරයා වෙනත් දිනයක් ලබා ගත් බව හා ඒ හා සම්බන්ධිත කරුණු මට පැවසීය.

4. හිටපු ආරක්ෂක ලේකම්වරයා සමඟ කොමිෂන් සභා පරිශ්‍රයේ පිට වීමේ දොරටුව වෙත අප පැමිණෙන විට පොලිස් නිලධාරීන් විශාල පිරිසක් හා මාධ්‍යවේදීන් සුවිශාල පිරිසක් හා විශාල ජනතාවක් දොරටුව ඉදිරිපිට පොදි ගැසී සිටි බැවින් ඇවිදගෙන පිටතට යාම අතිශයින් දුෂ්කර විය. ඒ නිසා හිටපු ආරක්ෂක ලේකම්වරයා පිටව යාම සඳහා සිය රථයට ගොඩ වූ අතර, අපි -මම සහ බන්දුල පද්මකුමාර මහතා- එම රථයටම ගොඩ වී කොමිෂන් සභා පරිශ්‍රයෙන් පිටතට පැමිණියෙමු. එහිදී එම රථයේ සිටම මාධ්‍යවේදීන්ට සහ ජනතාවට කරුණු පැහැදිලි කිරීමක් ද කළෙමි.

5. උක්ත පැහැදිලි කිරීම අනුව මහජන නියෝජිතයෙකුට හඬක් නැඟිය නොහැකි නිරායුධ අවිහිංසක මිනිසුන් වෙනුවෙන් පෙනී සිටීමට, අදහස් දැක්වීමට ඇති අයිතියට ප්‍රජාතන්ත්‍ර විරෝධී ලෙස මැදිහත් වීමට ඇතැම් බලවේග විසින් උත්සාහ දරන බව මට මොනවට හැඟී යන බැවින්, උක්ත කරුණ සම්බන්ධයෙන් පුළුල් විමර්ශනයක් කිරීමට මෙම ප්‍රශ්නය පාර්ලිමේන්තු වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කරවීමට කාරුණික වන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට වඩා අද දවසේ ඔබතුමා අපේ භාරකරු ලෙස වගකීමට බැඳෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාර්ගයක් අවහිර කිරීමට හෝ එහෙම නැත්නම්, උසාවියට අපහාස කිරීමට හෝ එහෙම නැත්නම්, අධිකරණ නියෝගයක් කඩ කිරීමට හෝ මගේ අබමල් රේණුවකවත් සම්බන්ධයක් නැහැ. පාර්ලිමේන්තුව තුළ හඬක් නඟන මන්ත්‍රීවරුන්ව ඉතාම කුමන්ත්‍රණකාරී ලෙස දඩයම් කිරීම සඳහා වන දැවන්ත, මර්දනකාරී, ෆැසිස්ට් ක්‍රියා පිළිවෙතක් මේ ආණ්ඩුව අනුගමනය කරනවා. ඒ බව පැහැදිලියි. මා මේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ අයිතිය වෙනුවෙන් මේ අවස්ථාවේ ඉදිරිපත් කරනවා, 2010 පෙබරවාරි 13වැනි දා නිකුත් කර තිබෙන අංක 1901/20 දරන රජයේ ගැසට් පත්‍රයේ-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ගරු කථානායකතුමා විසින් ඔබතුමාට අවසර දෙන ලද ප්‍රකාශය පමණයි වරප්‍රසාද ප්‍රශ්නය යටතේ ඔබතුමාට කියවන්න පුළුවන්.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
නමුත්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අවශ්‍ය වැඩිමනත් දේවල් ඔබතුමාගේ කථාවේදී ප්‍රකාශ කරන්න පුළුවන්. [බාධා කිරීම්]

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඉන්න. මිනීමරු, ෆැසිස්ට්වාදී විධියට හැසිරිලා මන්ත්‍රීවරු බිල්ලට ගන්න දෙන්න බැහැ, තමුන්නාන්සේලාට. මේ රටේ මන්ත්‍රීවරුන්ට -මහජන නියෝජිතයන්ට- පාර්ලිමේන්තුව ඇතුළේ හෝ පිටත වැඩ කරන්න දෙන්නේ නැත්නම්, තමුන්නාන්සේලාට ඕනෑ විධියට මේ රටේ මිනිසුන් දඬු කඳේ ගහන්න, දඩයම් කරන්න ලැහැස්ති වනවා නම්, -[බාධා කිරීමක්] බුද්ධ ශාසන අමාත්‍යාංශය ගත්තාට තමුන්නාන්සේ දන්නවා, අපි 1989 ඉඳන් මිනීමරු ප්‍රේමදාසගේ ආණ්ඩුව යටතේ හිටපු මිනිස්සු බව. ඒ නිසා-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේ දී යෝජනා. [බාධා කිරීම්]

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මේ රටේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද ආරක්ෂා කරන්න දැන ගන්න ඕනෑ. මන්ත්‍රීවරුන්ට අයිතියක් තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ අයිතියක් තිබෙනවා. [බාධා කිරීම්] අපි අභියෝගවලට මුහුණ දිය යුතුයි. [බාධා කිරීමක්] තමුන්නාන්සේ කවුද එහෙම කියන්න? මේ රටේ මිනිසුන් වෙනුවෙන් අපට පාර්ලිමේන්තුවේ කථා කරන්න බැරි නම් -[බාධා කිරීම්] තමුන්නාන්සේලාට පුළුවන් එල්ලන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
සටහන් කර ගන්න.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
යහ පාලනය කියලා මිනීමරු පාලනයක් හදලා, ෆැසිස්ට් ආණ්ඩුවක් හදන්නයි මේ යන්නේ. ඒක නිසා ගරු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද පිළිබඳව කථා කරන්න අයිතිය තිබෙන්න ඕනෑ. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
හොඳයි, බොහොම ස්තුතියි. ගරු සභානායකතුමා. [බාධා කිරීම්]

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
තමුන්නාන්සේ කවුද එහෙම කියන්න?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේ දී යෝජනා. [බාධා කිරීම්]

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා (ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா - உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. M. Joseph Michael Perera - Minister of Home Affairs)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! ගරු ජෝශප් මයිකල් පෙරේරා අමාත්‍යතුමා. [බාධා කිරීම්]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா )
(The Hon. M. Joseph Michael Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ ඔබතුමා කියන දේ අහන්නෙත් නැහැ නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කියන්න, ගරු අමාත්‍යතුමා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா )
(The Hon. M. Joseph Michael Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන ක්‍රමවේදයක් තිබෙනවා. ඒ ක්‍රමවේදය තමයි, ගරු කථානායකතුමාට ලිඛිතව ප්‍රශ්නය ඉදිරිපත් කරලා - [බාධා කිරීමක්]

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ලිඛිතව ඉදිරිපත් කරලායි තිබෙන්නේ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா )
(The Hon. M. Joseph Michael Perera)
පොඩ්ඩක් ඉන්න. මොකද මේ? ඔබතුමා හිටපු අධ්‍යාපන ඇමති නේද? [බාධා කිරීම්]

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඔබතුමා හිටපු කථානායකවරයෙක් නේද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කිසිම සංවරයක් නැහැ.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா )
(The Hon. M. Joseph Michael Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු කථානායකතුමා අවසර දුන් ප්‍රකාශය විතරයි කියවන්න පුළුවන්. පාර්ලිමේන්තුවේ ඒක ඉදිරිපත් කරමින් දීර්ඝ විස්තරයක්, කථාවක් කරන්න අවසරයක් නැහැ. ඒක නිසා මා ඔබතුමාගෙන් කරුණාවෙන් ඉල්ලනවා, ඒ ලියවිල්ලට අමතරව කියපු සියලුම දේ හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියලා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ස්ථාවර නියෝගවලට පටහැනිව යමක් ප්‍රකාශ කර තිබේ නම්, ඒ ප්‍රකාශ හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කිරීමට තීන්දු කරනවා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் கொள்கை உருவாக்கம், பொருளாதார அலுவல்கள், சிறுவர், இளைஞர் மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremasinghe - Prime Minister, Minister of Policy Planning, Economic Affairs, Child, Youth and Cultural Affairs)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මේ කාරණය සම්බන්ධයෙන් ඔබතුමාටත්, සභාවටත් සහාය වෙන්න මා හිතුවා.

මේ රටේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විශේෂ තැනක් තිබෙනවා. ඒ තිබෙන්නේ පාර්ලිමේන්තුවට තිබෙන ස්ථානය. ඒක අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4.(ඇ) ව්‍යවස්ථාව යටතේ මෙසේ සඳහන්ව තිබෙනවා:

> "නීතිය අනුව පාර්ලිමේන්තුව විසින් ම ක්‍රියාත්මක කළ හැකි පාර්ලිමේන්තුවේ සහ එහි මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද, පරිහාර හා බලතල සම්බන්ධයෙන් විනා ජනතාවගේ අධිකරණ බලය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති කොට පිහිටුවන ලද හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගන්නා ලද නැතහොත් වෙනත් යම් නීතියකින් ඇති කොට පිහිටුවන ලද අධිකරණ, විනිශ්චය අධිකාර සහ ආයතන මඟින් පාර්ලිමේන්තුව විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය;"

මම හැම තිස්සේම කියා තිබෙන්නේ, පාර්ලිමේන්තුවේ වරප්‍රසාද ආරක්ෂා කිරීම පාර්ලිමේන්තුවට අයත්, අධිකරණයේ වැඩ කටයුතු අධිකරණයට අයත් කියලායි.

විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 67වන ව්‍යවස්ථාවේ මෙසේ සඳහන් කරලා තිබෙනවා:

> "පාර්ලිමේන්තුවේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ වරප්‍රසාද, පරිහාර සහ බලතල පාර්ලිමේන්තුව විසින් නීතියෙන් නිශ්චය කොට විධිමත් කළ හැකි අතර, එසේ නිශ්චය කොට විධිමත් කරන තෙක් පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතෙහි විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ සම්බන්ධයෙන් අදාළ වන්නේ ය."

අපට අද තිබෙන්නේ පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත. ඒ පනතේ පළමුවෙනි කොටසේ තිබෙනවා, අපට තිබෙන අයිතිවාසිකම් මොනවා ද කියලා. ඊට අමතරව තිබෙනවා, එක්සත් රාජධානියේ මහජන මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරුන්ට තිබෙන වරප්‍රසාද මේ සභාවේ මන්ත්‍රීවරුන්ට අයිතියි කියලා. ඒ වාගේම විශේෂයෙන්ම පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 4වෙනි වගන්තියේ මෙසේ සඳහන් වෙනවා. I quote:

> "Freedom from arrest in civil proceedings"

ඒ අනුව තමයි අපට වැඩ කටයුතු කරන්නට තිබෙන්නේ. ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය මේ පනත යටතේ අදාළ වෙනවාද නැද්ද කියන කාරණය තමයි ඉස්සෙල්ලාම තීරණය කරන්න තිබෙන්නේ. ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාම කිව්වා, එතුමා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගියේ එතුමා පිළිබඳ ප්‍රකාශයක් කරන්න කියලා. ඒ ප්‍රකාශය අවසන් කරලා එන ගමන් හිටපු ආරක්ෂක ලේකම්තුමා එළියට එන විට එතුමා සමඟ එළියට ආවා කියලා එතුමා කිව්වා. ඒ වාගේම, ඊට පෙර උසාවියෙන් නියෝගයක් ලබා දීලා තිබුණා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පරිශ්‍රයේ රැස් වෙන්න බැහැ කියලා. මොකද, එතැන කණ්ඩායම් දෙකක් හැප්පෙන්නට යන නිසා. එහෙම නම්, ඒ සිද්ධිය වෙන තැනට ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා ගිහින් තිබෙනවා. එතුමා කියන්නේ එතුමා ගියේ හිටපු ආරක්ෂක ලේකම් සමඟ වාහනයේ යන්න කියලා. ඒ කියන්නේ එතුමාගේ වැඩ කටයුතු අවසන් කරලා වෙනත් පුද්ගලයෙක් සමඟ එතුමා ගිහින් තිබෙනවා, එතැනට. එතුමා එතැනට ගිහින් මොනවත් නොකළා නම් ප්‍රශ්නයක් නැහැ. මට පෙනෙන විධියට පොලීසිය කරලා තිබෙන දේ තමයි එතැන සිටි අයගේ නම් ටික දීලා තිබෙන එක. උසාවියට ගිහින් ඒක වාර්තා කරන්න ඕනෑ. ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාත් වැරැද්දක් කළා. එතුමාට එතුමාගේ වැඩ කටයුතු ඉවර කර ආපහු යන්න තිබුණා. ඇයි වෙනත් කෙනෙකු සමඟ යන්නේ? [බාධා කිරීමක්] ඇයි වෙනත් කෙනෙකු සමඟ එළියට යන්නේ? [බාධා කිරීමක්] එතුමා කර තිබෙන්නේ එපමණයි නම් -ඒ වැරැද්ද විතර නම්- උසාවියට කියලා ඒක බේරුමක් කර ගන්න. අපි එක දෙයක් කරන්න ඕනෑ. මේ ගරු සභාව පෙන්වන්න ඕනෑ, "අපි හොරු වෙනුවෙන් හොරු නොවෙයි" කියලා; අපි ඒවා ආරක්ෂා කරන්නේ නැහැ කියලා. [බාධා කිරීමක්] මේ ගරු සභාවට මෙතුමා ඇවිල්ලා- [බාධා කිරීමක්] මම කිව්වේ නැහැ. [බාධා කිරීමක්] ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා නේ ගිහින් තිබෙන්නේ Bribery Commission එකට. මහ බැංකුවේ අධිපතිත් ගිහින් තිබෙනවා. ඔබ දෙදෙනා එතැනදී හමු වෙලා ඒ ගැන කථා කර ගන්න. මේ ගරු සභාවට ඇවිල්ලා මට ඒවා කියන්න එපා. [බාධා කිරීමක්] ඒවා මගේ නොවෙයි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව තීරණය කරයි, කවුද අල්ලස් ගත්තේ, කවුද ගත්තේ නැත්තේ කියලා. මේ ගරු සභාවේ අපි "හොරු වෙනුවෙන් හොරු" නොවෙයි කියලා පෙන්වමු. ඇයි ඔබතුමා ඔච්චර කලබල වෙන්නේ? [බාධා කිරීමක්] මම කිව්වේ, හොරු වෙනුවෙන් හොරු හැටියට අපි පෙනී සිටින්නට ඕනෑ නැහැ කියලායි. ඔබතුමා jack-in-the-box වාගේ නැඟිටිනවා. ගෙම්බා වාගේ පැන්නා නේ. හොරුන් ආරක්ෂා කරනවා කියන විට ගෙම්බා වාගේ පැන්නා. ඔබතුමා වැරදීමකින් හෝ එතැනට ගියා නම්, උසාවියට ගියාම උසාවියෙන් ඔබතුමා නිදහස් කරයි. ඒක ප්‍රශ්නයක් නැහැ. කියන්න, "මම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගියේ මට තිබෙන අල්ලස් චෝදනා සම්බන්ධයෙන් ප්‍රකාශයක් දෙන්න. මමයි මහ බැංකුවේ අධිපතියි, ඒ ප්‍රශ්න විසඳා ගන්නම්. මම හිටපු ආරක්ෂක ලේකම්තුමා සමඟ එතැනට ගියේ නිකම්" කියලා. ඇයි ඔබතුමා හිටපු ආරක්ෂක ලේකම්තුමා සමඟ කාර් එකේ ආවේ? අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පරිශ්‍රයේ තිබුණේ එතුමා වෙනුවෙන් උද්ඝෝෂණයක්. ඒ නිසා මේ ප්‍රශ්නය මේ ගරු සභාවට නොවෙයි උසාවියට දාලා විසඳා ගන්න කියලා මම කියන්න කැමැතියි.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගැසට් නිවේදනයක් තිබෙනවා. මේකයි ඒ ගැසට් නිවේදනය:

"පොලිස් ආඥාපනත

"පොලිස් ආඥාපනත (53 අධිකාරිය වූ) පොලිස් ආඥාපනතේ 55 වන වගන්තිය යටතේ අමාත්‍ය මණ්ඩල තීරණවලට යටත්ව විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව පොලිස්පති විසින් සාදනු ලබන ශ්‍රී ලංකා පොලීසිය තුළ බරපතල ගණයේ මූල්‍යමය අපරාධ විමර්ශනය කිරීම සඳහා පිහිටුවනු ලබන නව පොලිස් කොට්ඨාසය ඇති කිරීම පිළිබඳව කරන දැනුම් දීම.

2015 පෙබරවාරි මස 13 වැනි දින,
කොළඹ දී ය.

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව තුළ නව පොලිස් කොට්ඨාසයක් ස්ථාපිත කිරීම

01. 2015.01.21 සහ 2015.02.12 දිනයන්හි දී කැබිනට් මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයන්ට ප්‍රකාරව මහජන සාමය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට අනුව බරපතල ගණයේ මූල්‍යමය අපරාධ විමර්ශනය කිරීම සඳහා වෙනම පොලිස් කොට්ඨාසයක් ස්ථාපිත කර ඇති බව ප්‍රකාශයට පත් කිරීමට අදාළ නිවේදනය මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

02. වංචා හා දූෂණ සඳහා ඒකකයක් ස්ථාපිත කිරීම මැයෙන් ගරු අමාත්‍ය තුමා විසින් 2015.01.21 වැනි දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව ශ්‍රී ලංකාවේ කවර ප්‍රදේශයක හෝ සිදු වී ඇති පහත සඳහන් අපරාධ මෙම විමර්ශන කොට්ඨාසය මගින් විමර්ශනය කළ යුතු වේ.

   (i) මහා පරිමාණ මුල්‍යමය අපරාධ, දූෂණ හා විශාල ප්‍රමාණයේ අනවසර ව්‍යාපෘති.

   (ii) මහා පරිමාණයේ මහජන මුදල් හා දේපළවලට එරෙහි අපරාධ.

   (iii) ජාතික ආරක්ෂාව, රාජ්‍ය මුල්‍යය, සෞඛ්‍ය හා පරිසරයට එරෙහිව සිදුකර ඇති විශාල ප්‍රමාණයේ මුල්‍යය අපරාධ.

[ගරු ගාමිණී ලොකුගේ මහතා]

(iv) නීති විරෝධී ආකාරයෙන් ධනවත් වීම සහ නිල බලය සීමාව ඉක්මවා පාවිච්චි කිරීම.

(v) මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම සහ නීති විරෝධී ගණුදෙනු පිළිබඳව විමර්ශනය කිරීම.

03. මෙම ඒකකය පොලිස්පතිවරයාගේ අධීක්ෂණය යටතේ නියෝජ්‍ය පොලිස්පතිවරයකු සහ අධ්‍යක්ෂවරයකු යටතේ ක්‍රියාත්මක වන අතර, ඉහත වැරදි විමර්ශනය කිරීම සඳහා ශ්‍රී ලංකාව පුරාම පිහිටුවා ඇති අධිකරණ බල සීමාවල දී විමර්ශනය කිරීමට බලතල ඇත්තේ ය.

04. අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව පිහිටුවා ඇති, අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් කැබිනට් අනු කමිටුව මගින් ස්ථාපිත කර ඇති ලේකම් කාර්යාලය විසින් මෙම පැමිණිලි විමර්ශනය කිරීම සඳහා පොලිස්පතිවරයාට යොමු කරන අතර, ඊට අමතරව විශේෂිත පැමිණිලි කැබිනට් අනුකමිටුව මගින් සෘජුවම මෙම කොට්ඨාස භාර නියෝජ්‍ය පොලිස්පති වෙත යොමු කරනු ලැබේ."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙමනම්, යහ පාලනය කියන්නේ මොකක්ද? අද කමිටුවක් පිහිටුවා මේ කර ගෙන යන්නේ, තමන්ට ඕනෑ අය දඩයම් කිරීමේ වැඩ පිළිවෙළකුයි. CID එකට, පොලීසියට විමර්ශන කටයුතු කරන්න පුළුවන් වුණත් අගමැතිතුමා අද කොමිටියක් පත් කර ගෙන නියෝග කරනවා, "අහවලා අල්ලාගෙන එන්න" කියලා. "මේකද, යහ පාලනය කියන්නේ?" කියා මා අහන්න කැමැතියි. මේ රටේ ශුද්ධ නීතියක් තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අගමැතිතුමා පොලිස්කාරයෙක් වෙලා.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ඔව්. අගමැතිතුමා පොලිස්කාරයෙක් වෙලා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ගරු මන්ත්‍රීතුමා, කථා කරලා අවසන්ද?

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ඔව්.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
මම පොලිස්කාරයෙක් නොවෙයි. අද මේ රටේ අපරාධ ගණනාවක් සිදු වී තිබෙනවා. ඒවා මුදල් අපරාධ හා බරපතළ දූෂණ; serious crimes and serious frauds. මේවා මිනී මැරීම හෝ අනෙක් සාමාන්‍ය වැරැදි නොවෙයි. ඒ අපරාධ කර තිබෙන්නේ විශේෂයෙන්ම ඒවාට අදාළව ව්‍යාපාරික දැනුමක් ඇතිවයි. කොටස් වෙළඳ පොළේ මුදල් ඉවත් කර ගැනීම ඒ අතරින් එකක්. ඒ වාගේම නීති විරෝධීව පිට රටවලට සල්ලි ගෙන ගිහින් තිබෙනවා. ඉංග්‍රීසියෙන් කියනවා නම්, you have played around in financial markets. You have done money laundering. එක එක ටෙන්ඩර් දාලා බොරුවට සල්ලි අරගෙන තිබෙනවා. ටෙන්ඩර්වලට ඕනෑවට වඩා මුදල් දාලා තිබෙනවා. මේවා විභාග කරන්න වුවමනා දැනුවත්කම අපේ ලංකාවේ පොලීසියට තිබුණේ නැහැ. ඒ නිසා එකී දැනුම ලබා දීම සඳහා අපි තීරණය කර තිබෙනවා. එංගලන්තයේ serious frauds and financial crimes සම්බන්ධයෙන් විභාග කිරීම සඳහා එහි තිබෙනවා, Serious Fraud Office කියලා ආයතනයක්. විශේෂයෙන් එවැනි අංශයක් මෙහි ආරම්භ කිරීම තමයි ඒ ලේකම් කාර්යාලයේ පළමුවැනි පියවර වෙලා තිබෙන්නේ. එක්සත් රාජධානියේ තිබෙන Serious Fraud Office එකේ කණ්ඩායම් ඇවිල්ලා, විශේෂයෙන් අධිකරණ ඇමතිතුමාත් මුණගැහිලා දැන් අපේ ඒ නිලධාරීන්ට පුහුණුව ලබා දී තිබෙනවා. ඒ වාගේම, ඉන්දියාවේ Financial Crimes Investigation Department එකේ පුහුණුවත් ඒ අයට ලබා දෙනවා. මීට අමතරව, ලෝක බැංකුවේ ඊට අදාළ අංශය සමඟ සාකච්ඡා කරනවා. ඇමෙරිකාවේ අධිකරණ දෙපාර්තමේන්තුවෙන් ඇවිල්ලා තිබෙනවා. ඒ විධියට කටයුතු කර තිබෙන්නේ තිබෙන දූෂණ ගැන සොයන්නයි. අපට දැනුම නැත්නම් ඒ දැනුම පිටතින් ගෙනෙන්න අපට බැහැ. ඒ අදාළ අංශය ඇති කළාට පස්සේ අපි මෙතැනට නීති ගෙනෙන්නම්; රෙගුලාසි ගෙනෙන්නම්, පොලීසියේ විශේෂ අංශයක් ඇති කරන්න. පොලිස්පතිතුමා එක්ක කථා කරලා එතැනට යොමු කර තිබෙන්නේ කොට්ඨාස භාර නියෝජ්‍ය පොලිස්පතිවරයෙක්. කොටස් වෙළෙඳ පොළේ සිදු කළ අපරාධ සම්බන්ධයෙන් කටයුතු කරන්නේ කොහොමද ආදි වශයෙන් අදාළ සියලු දැනුම ඒ අයට ලබා දිය යුතුයි. මේ සෙල්ලම් ටික වහගෙන ගියේ කිසි දවසක ඒවා හසු වන්නේ නැහැ කියලායි. දැන් මේවා සොයන්න පටන්ගත්තාම බඩ යනවා. මට එතැන කරන්න වැඩක් නැහැ. එච්චරයි කියන්න තිබෙන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, ඕනෑ නම් ඔබතුමාත් ඊළඟ රැස්වීමට එන්න. මට අවශ්‍ය, වුවමනා සම්පත් ටික දීමට සහ වුවමනා පහසුකම් සැපයීමටයි. ඊට වඩා කරන්න දෙයක් මට නැහැ. පොලීසිය තීරණය කරන්න ඕනෑ, පොලීසිය කොහොමද කටයුතු කරන්නේ කියන එක. නීතිපති දෙපාර්තමේන්තුව සහ පොලීසිය තමයි නඩු දමන්නේ. කවුද තොරතුරු දෙන්නේ? ඒ තොරතුරු දෙන මිනිසුන් කවුද කියලා දැනගත්තොත් තමුන්නාන්සේලා පුදුම වේවි. ඒවාට සම්බන්ධ වූ අයයි අද තොරතුරු දෙන්නේ. රජයේ සාක්ෂිකාරයන් බවට පත් වෙන්න ඕනෑ කියා සමහරු කියනවා. ඔන්න ඕකයි තත්ත්වය. මට ඒවායින් වැඩක් නැහැ. අපි මේ අංශය ඇති කරනවා. මේ අංශය ඇති කරන්නේ ආපසු මේ රටේ හොරකම් කරන්න බැරි වන විධියටයි. අන්න ඒ සඳහායි අප කටයුතු කරන්නේ. "හොරු වෙනුවෙන් හොරු" කියන කථාව පිළිගන්නා අය "හොරු වෙනුවෙන් හොරු" කියලා මේ අංශය ඉදිරියට යයි. මට ඒකට කරන්න දෙයක් නැහැ. නමුත් මේ අවුරුද්ද අවසාන වීමට කලින් serious frauds -

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මේක කැබිනට් තීරණයක්.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)
ඔව්, මේක කැබිනට් තීරණයක්. මගේ තීරණයක් නොවෙයි. මේ අවුරුද්ද අවසන් වීමට කලින් serious frauds කාර්යාලයක් ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව යටතේ අපි ඇති කරනවා කියන එකත් මා කියන්න කැමැතියි. සමහර අය පුහුණු කිරීමට එංගලන්තයට යවනවා. සමහර අය අනිත් රටවලට යවනවා. මෙය ඉක්මනින්ම ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ සඳහා අපට දැනුම තිබෙන්න ඕනෑ. අවුරුදු දහයක් තිස්සේ පොලීසියටවත්, කාටවත් මේ හොරකම් ගැන සොයන්න ඉඩ දුන්නේ නැහැ. අවුරුදු දහයක්

නිදා ගෙන සිටි අයට තමයි දැන් ඒක කියන්න සිදු වෙලා තිබෙන්නේ. එතකොට ඒ ගොල්ලන් කියන්නේ, අවුරුදු දහයක් අපේ අත් බැඳ තිබුණා කියලායි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ලිපි ගොනු 1,900ක් තිබුණා. මේවා ගැන කියන කොට - [බාධා කිරීමක්] මේවා ගැන සොයන එක නවත්වන්න කියලා ද කියන්නේ? මේවා ගැන සොයන්න එපා කියලා කියනවා ද? බලන්න, දැන් අපි කොන්ත්‍රාත්කරුවන් සමඟ කතා කරලා සමහර ව්‍යාපෘතිවල මිල අඩු කර ගෙන යනවා. අන්න ඒ ටික කරන්නයි, මෙය ඇති කරලා තිබෙන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම් දීම.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු විමල් වීරවංශ මහතා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රකාශය අනුව මතු වෙන කාරණය මේකයි. එවැනි අංශයක් පොලිස්පතිවරයා යටතේ පොලීසියේ ස්වාධීනව ආරම්භ කරලා, ඒ අවශ්‍ය කරන දැනුම ඔවුන්ට ලබා දීලා පොලීසිය ස්වාධීනව ක්‍රියාත්මක වෙනවා නම් ඒක එකක්. නමුත් මෙතැනදී සිදු වෙන්නේ අග්‍රාමාත්‍යවරයා ඇතුළු ඇමතිවරුන් සිටින අනු කමිටුවකින් ඒ අංශය මෙහෙය වන එකයි. 1901/20 දරන 2015 පෙබරවාරි 13 දිනැති මේ ගැසට් නිවේදනයේ තිබෙනවා, පොලිස්පතිවරයා හරහා නොවෙයි, කෙළින්ම ඒ නියෝජ්‍ය පොලිස්පතිවරයාට උපදෙස් දෙමින් ඒ මෙහෙයුම කරන්න පුළුවන් කියලා. එතකොට එය තනිකරම දේශපාලනමය වශයෙන් තීන්දු කරලා සිදු වෙන මෙහෙයුමක් විතරයි. සමහර වෙලාවට අග්‍රාමාත්‍යතුමාගේ ආණ්ඩුවට සහයෝගය දෙන කෙනෙකු ගැන පැමිණිල්ලක් ලැබුණොත් මේ කමිටුවෙන් එය ඉදිරිපත් වෙන්නේ නැහැ. ඒ වාගේම එම ආණ්ඩුවට සහයෝගය නොදෙන කෙනෙකු සම්බන්ධයෙන් නම් වරදක් නැතත් වරදක් ඇති කෙනෙකු සේ සලකා මේ මෙහෙයුම කරන්න පුළුවන්.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු අග්‍රාමාත්‍යතුමනි, මගේ කථාව ඉවර නැහැ. මට විනාඩියක් දෙන්න. මෙතැන දේශපාලන මෙහෙයුමක් තිබෙනවා. ඒකයි මෙතැන තිබෙන බරපතළ වරද. මේ අනු කමිටුව සම්පූර්ණයෙන් තමන්ට අභිමත ආකාරයට ඒ පොලිස් යන්ත්‍රණය මෙහෙය වනවා. එක පැත්තකින් තමුන්නාන්සේලා ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතට එකඟව අත ඔසවන්නය කියනවා. අනිත් පැත්තෙන් පොලිස් කණ්ඩායමක් තමුන්නාන්සේලා යටතේ වෙනම තබා ගෙන මේ කටයුතු මෙහෙයවනවා. මට ආරංචි විධියට ඒ නියෝජ්‍ය පොලිස්පතිවරයාට ඊළඟට පොලිස්පති තනතුර දෙනවාය කියලා බලාපොරොත්තුවක් දීලා තිබෙනවා. එහෙම බලාපොරොත්තු දුන්නාම එතුමන්ලා එම රාජකාරි කටයුතු හොඳින් සිදු කරනවා. දැන් එහෙම තමයි මේ මෙහෙයුම සිදු කරන්නේ. මෙය තනිකර තමුන්නාන්සේලාට සහ තමුන්නාන්සේලා අනාගතයේ කරන්න යන මෙහෙයුමට ඉඩ නොදෙන බලවේග මැඩ පැවැත්වීම සඳහා දරන මෙහෙයුමක් මිසක් රටේ ඔය කියන ඇත්ත මූල්‍ය අපරාධ සොයන මෙහෙයුමක් නොවෙයි.

ඒ අතරතුර මම තව කාරණයක් කියන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඊයේ ගරු අග්‍රාමාත්‍යතුමා මේ ගරු සභාවේදී කිව්වා, නේපාලයට ආරක්ෂක හමුදා සහන සේවා කණ්ඩායම් යැවීම ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට සිදු වුණු දෙයක් කියලා. මම එය කරුණුමය වශයෙන් නිවැරදි කරන්න ඕනෑ. මීට පෙර ජපානයේ සුනාමි තත්ත්වයක් ඇති වුණු අවස්ථාවේදී මේජර් ජනරාල් කරන්නාගොඩ එරට තානාපති ධුරයේ සිටියදී ඒ රටට අපේ හමුදා කණ්ඩායම් යැව්වා. එම රටේ එක ප්‍රදේශයක සහන සේවා කටයුතු සම්පූර්ණයෙන්ම අපේ හමුදාව විසින් ස්වේච්ඡාවෙන් ඉටු කළා. එම නිසා එය නිවැරදි කරන්න ඕනෑ. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. මීළඟට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාද සම්බන්ධ අදාළ වගන්තිය ගරු අගමැතිතුමා කියෙව්වා. මේ කාරණයේදී මම ගරු අග්‍රාමාත්‍යතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු කියන්නේ ජාතික පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් කියන එක. ජාතික පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකුට රටේ ඕනෑම තැනකට ගමන් කරන්න, මහ ජනයා වෙනුවෙන් මැදිහත් වෙන්න වරප්‍රසාදයක් දීලා තිබෙනවා. අපි මේ පාර්ලිමේන්තුවට ඇවිත් තිබෙන්නේ දිවුරුම් දීලායි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුවයි අපි දිවුරුම් දෙන්නේ. දැන් ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලා මතු කළ ප්‍රශ්නයේදී මම හිතන්නේ හුදෙක් අපි අපේ විරුද්ධවාදියෙක් කියලා, ආණ්ඩුවට විරුද්ධයි කියලා බන්දුල ගුණවර්ධන අහක දැමීම නොවෙයි, කළ යුත්තේ. මෙය පාර්ලිමේන්තුව හැටියට සලකන්න ඕනෑ. මෙහි නරක නාමය අවසානයේදී භුක්ති විඳින්නේ ගරු අගමැතිතුමා ඇතුළු ජනාධිපතිතුමායි.

මන්ත්‍රීවරුන්ට පාරේ ගමන් කරන්න බැරි නම්, කාර්යාලයකට ගිහින් එන්න බැරි නම්, මහ ජනයා රැස් වෙලා සිටින තැනකට යන්න බැරි නම් එතැනදී අපි ඉතා බරපතළ ප්‍රශ්නයකට මුහුණ දෙනවා. අපි දේපළකට හානියක් කරනවා නම්, අපි පොදු දේපළක් විනාශ කරනවා නම් රටේ නීතිය ක්‍රියාත්මක වෙන්න ඕනෑය කියන එකට මම එකඟයි. නමුත් මේ දෘෂ්ටි කෝණයෙන් බලලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මහ ජනයාගේ ප්‍රශ්නයක් තිබෙන තැනකට - [බාධා කිරීමක්] ඊයේ අති පූජනීය සෝභිත හාමුදුරුවෝ උපවාස කළා. ඒ උපවාසය බලන්න මන්ත්‍රීවරුන්ට යන්න පුළුවන්. නමුත් අන්තිමේ දී උපවාසය කළේ නැහැ. උන් වහන්සේ හිටපු ජනාධිපතිතුමියත් එක්ක පෙළපාළියක ආවා.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

ඒකත් කමක් නැහැ. නමුත් ඒ පෙළපාළියට ඉඩ දෙනවා, සාමාන්‍ය මහ ජනයා එන පෙළපාළියකට ඉඩ දෙන්නේ නැහැ. ලංකා පාර්ලිමේන්තුවේ අවුරුදු 23ක් විරුද්ධ පක්ෂයේ ඉඳලා කථා කරපු දේ අග්‍රාමාත්‍ය පුටුවට ගියාට පසුව ඔබතුමා වෙනස් කරන්න එපා, ගරු අග්‍රාමාත්‍යතුමනි. එය ඔබතුමාට හොඳ නැහැ. නොයෙක් නොයෙක් අය කියයි, මෙහෙම කරන්න කියලා.

වැඩිපුර කාලය ගත කරන්නේ නැතුව මේ අවස්ථාවේ දී මා මේ කාරණය ගැනත් කියන්නම්.

There is a book titled, “The Value of Dissent: Civil Rights Movement of Sri Lanka”. You know that dissent cannot be suppressed by the State. You must allow dissent; to express what they want. මා විශේෂයෙන් තව කොටසක් කියවන්නම්. The Preface of the above book states, "Threats to the free exchange of ideas certainly do not come from governments alone. They can and do come from other sources too; from various social, political, opposition groups and others, even from majority public opinion. The suppression of opposing views by the State is often with the support of sections of society at large;"

මෙය කියවන්න කියලා මා ඔබතුමාට කියනවා. මෙය ඉතාම වැදගත් පොතක්. I have only one copy , but I will present this to you because His Excellency the President in his speech to mark the end of the 100-Day Programme, talked about coming out of slavery. Here, the whole book is about a man who was - [*Interruption*.] Exactly. You also know about this book. There is also an article by Adam Hochschild.

ආණ්ඩුවක් තිබෙන කොට විරෝධයන් පානවා. විරෝධයට ඉඩ දෙන්න. විරෝධය තුළින් පොදු දේපොළවලට හානියක් සිද්ධ වනවා නම් නීතිය මැදිහත් විය යුතුයි. අපේ හිත මිත්‍ර එස්.බී. දිසානායක මැතිතුමා මේ පැත්තේ ඉන්න කාලයේ එතුමා අධිකරණය සම්බන්ධයෙන් කියපු දෙයක් නිසා එතුමාගේ මන්ත්‍රී ආසනය අහෝසි කළ බව මට මතකයි. ඔබතුමා ඒ වෙනුවෙන් සටන් කළා. සටන් කළා ද කියා මා දන්නේ නැහැ, සටහන් කළාය කියා මා විශ්වාස කරනවා. මොකද, ඔබතුමා ඒ වෙලාවේදීත් පාර්ලිමේන්තුවේ කෑ ගැහුවා. අද මෙය හුදෙක් බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි. මුළු පාර්ලිමේන්තුව මෙතෙක් භුක්ති වින්ද අයිතිය - මහ ජනතාවගේ ප්‍රශ්නයකට ඕනෑම තැනකට යන්න, ජාතික වශයෙන් සිදු වන කාර්යන් සඳහා ඕනෑම තැනකට යන්න, එන්න, සවන් දෙන්න, එයට සහයෝගය ප්‍රකාශ කරන්න, ඒ සම්බන්ධයෙන් කරුණු සොයා පාර්ලිමේන්තුවට වාර්තා කරන්න මන්ත්‍රීවරයකුට තිබෙන අයිතිය - මේ විධියට යටපත් කරන්න එපා, අග්‍රාමාත්‍යතුමනි.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින මේ පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද ප්‍රශ්නය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද හා ක්‍රියාකාරිත්වයට අදාළව ඉතාමත් වැදගත් වූ ප්‍රශ්නයක්. ඇත්ත වශයෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ජනතාව එක් රැස්වන ස්ථානවලට යාමට තිබෙන අයිතිය, ඒ වාගේම විරෝධය ප්‍රකාශ කිරීමට තිබෙන අයිතිය අපි කිසිසේත්ම යටපත් කළ යුතු නැහැ. යම් ආකාරයකින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කලහකාරී ලෙස හැසිරෙනවා නම්, පොදු දේපොළ විනාශ කරනවා නම්, එවැනි ක්‍රියාවල යෙදෙනවා නම්, ඒවාට ඉඩ දිය යුතුයි කියලා අපි කියන්නේ නැහැ. මෙවැනි කාරණයකදී රජය වඩාත් ප්‍රායෝගික ලෙස හා සාධාරණ ලෙස මේ ප්‍රශ්නය සඳහා විසඳුමක් සොයා ගත යුතුයි.

විශේෂයෙන්ම අපේ පාර්ලිමේන්තු ඉතිහාසය තුළ නිදහසට පෙරත්, නිදහසින් පසුවත් - එදා වමේ ව්‍යාපාරයේ සිට අද දක්වා - මේ රටේ ඇති වුණු විවිධ සිද්ධීන් පිළිබඳව සමහර විට එක් පක්ෂයක් එකඟ නොවන්න පුළුවන්. නමුත් විරුද්ධත්වය ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලිය නිරන්තරයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ සිදු වෙලා තිබෙනවා. එම නිසා මේ පිළිබඳව දැඩි ප්‍රහාරාත්මක සටනකට එන්නේ නැතුව, - අද ආණ්ඩු පක්ෂයේ ඉන්න ඔබතුමන්ලා හෙට විපක්ෂයට එන්න පුළුවන්- ඒ පිළිබඳව ඉතාම නම්‍යශීලිව කල්පනා කරලා, වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියා මාර්ගයක් අනුගමනය කරන්නය කියලා මා රජයෙන් ඉල්ලා සිටිනවා. මේ ඇති වුණු සිද්ධිය පිළිබඳව අපි දැඩි කනගාටුව පළ කරන්නට ඕනෑ. මෙවැනි දේවල් ඉදිරියටත් ඇති නොවන්නට වැඩ කටයුතු කරන්නය කියා මා ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் கொள்கை உருவாக்கம், பொருளாதார அலுவல்கள், சிறுவர், இளைஞர் மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremasinghe - Prime Minister, Minister of Policy Planning, Economic Affairs, Child, Youth and Cultural Affairs)

ලංකා ඉතිහාසයේ පළමුවෙනි වතාවට හමුදා ගුවන් යානයකින් හමුදාවේ අය වෙනත් රටකට -නේපාලයට- ගිහිල්ලා සහන කටයුතු කරනවා. මීට ඉස්සෙල්ලා ජපානයේ භූමි කම්පාවක් සිදු වුණු අවස්ථාවකදී අපේ සිවිල් ගුවන් යානාවලින් එක එක කණ්ඩායම් යෙදවූ බව අපි දන්නවා. එහෙම යැව්වේත් පළමුවෙන්ම ජපානයට නොවෙයි. වසන්ත කරන්නාගොඩ ඇවිල්ලා ඔහු තමයි මේ දේ ඉස්සෙල්ලාම කළේ කියලා කියන්නේ මොකක් නිසාද කියලා මම දන්නේ නැහැ. ඔහු එතැන කරපු දෙයක් නැහැ. ඔහු තානාපති වශයෙන් කටයුතු කරන කාලයේ මොකක්ද වුණේ කියලා මම දැන් මෙතැනදි කියන්න යන්නේ නැහැ. ඒ පිළිබඳව මම පස්සේ කියන්නම්.

නේපාලයේ සිදු වූ භූමි කම්පාව අවස්ථාවේදී පළමුවෙනි වතාවට අපේ ගුවන් හමුදාව කිව්වා, "අපි මේක බාර ගන්නම්" කියලා. ඒ අනුව ඒ සිද්ධිය ඇති වුණු අවස්ථාවේදී අපි කෙළින්ම නේපාලයට කථා කළා. එතකොට නේපාල ආණ්ඩුව මේ සිද්ධිය සම්බන්ධයෙන් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වෙලා තිබුණේත් නැහැ. ඒ අවස්ථාවේදී නේපාලයේ අගමැතිතුමා හිටියේ බැංකොක් නුවර. ඒ අනුව අපේ ගුවන් හමුදාව පළමුවෙන්ම නේපාලයට ගියා. අපේ ගුවන් හමුදාපතිත්, යුද හමුදාපතිත් දෙදෙනාම කිව්වා, "අපි යන්න ලෑස්තියි. අපට ඒකට අවසර අරගෙන දෙන්න" කියලා. ඒ අනුව අපි අවසර අරගෙන දුන්නා. ඒ අය නේපාලයට ගියා. ඔහොම කටයුතු කරපු හමුදාව පහළට දමන්න එපා. [බාධා කිරීම්] වසන්ත කරන්නාගොඩ අසත්‍ය ප්‍රකාශ කළ අවස්ථා ඕනෑ තරම් තිබෙනවා. කරන්නාගොඩ ගැන තවත් කරුණු පසුව ඔප්පු වෙයි. මම ඒවා පිළිබඳව මේ අවස්ථාවේදී කියන්න යන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ හමුදාව පිළිබඳව අපි ආඩම්බර වනවා. පසු ගිය කාලයේ තණ කොළ කපන්න දැමූ හමුදාව දැන් නේපාලයේ නගර බේරා දෙනවා.

දෙවෙනි කරුණ, බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා පිළිබඳවයි. එතුමා කියපු කාරණය හරි. එතුමා එම ස්ථානයට ගියේ උද්ඝෝෂණයට සහභාගි වන්න නොවෙයි. එතුමා ගියේ එතුමාගේ වැඩ කටයුත්තක් කරන්න. එම වැඩ කටයුත්ත අවසන් කරලා එළියට එනකොටයි මේකට පැටලිලා තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒක උසාවියට කියන්න. එතැනින් අසාධාරණයක් වුණොත්, මේ සභාවට එම ප්‍රශ්නය ගන්න පුළුවන්. මොකද, ඉස්සෙල්ලා මේ සම්බන්ධයෙන් උසාවි නියෝගයක් තිබෙනවා. මේක විසඳා ගන්න පුළුවන්. විසඳා ගන්න බැරි වුණොත් තමයි මේ සභාව එතැනට එන්න වුවමනා කරන්නේ.

අනික, මම නියෝජ්‍ය පොලිස්පතිතුමාට කිසිම නියෝගයක් දීලා නැහැ. පොලීසිය තිබෙන්නේ අදාළ ඇමතිතුමා යටතේ. පොලිසියට නියෝග දෙන්න එතුමාට පුළුවන්. මම ක්‍රියා කරන කොට පොලිස්පතිතුමාටත් කථා කරලා තිබෙනවා, නීතිපතිතුමාටත් කථා කරලා තිබෙනවා. නියෝජ්‍ය පොලිස්පතිතුමාට නියෝග දෙන්න පුළුවන් වන්නේ පොලිස්පතිතුමාටයි, නීතිපතිතුමාටයි පමණයි. අනික, මම එතුමාට මොකුත් පොරොන්දු වුණේ නැහැ. යාපනයට ගිහිල්ලා මෛත්‍රීපාල සිරිසේන මහතාට විරුද්ධව ක්‍රියා කරලා ඡන්ද දමන එක නැවැත්වූවොත් තනතුරක් ලබා දෙනවා කියලා එතුමාට පොරොන්දු වෙලා තිබෙනවා. ඔබතුමන්ලාගේ හිතේ තිබෙන සැකය තමයි දැන් මෙතැනට දමන්නේ. "යාපනයට ගිහිල්ලා දෙමළ මිනිස්සු ඡන්දය දෙන එක නවත්වන්න, එතකොට ඔබතුමාට තනතුරක් ලබා දෙනවා" කියලා ඔබතුමන්ලා එතුමාට පොරොන්දු දුන්නේ ඇයි? ලජ්ජයි. මම ඒ විධියට පොරොන්දු වෙලා නැහැ. මට එහෙම පොරොන්දු වන්නත් බැහැ.

ඒ පොරොන්දුව ජනාධිපතිතුමාට පමණයි දෙන්න පුළුවන්. මේ කරුණ තවත් දිගට ගෙන යන්න වැඩක් නැහැ. මම අපේ මන්ත්‍රීවරුන්ටත් කිව්වේ එක දෙයයි. බන්දුල ගුණවර්ධන මැතිතුමාගේ ප්‍රශ්නය ගැන මම කනගාටු වනවා. මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් මොකක්ද සිදු වුණේ කියලා අපි බලන්නම්. ඒ එක්කම මම මේ සභාවේදී විශේෂයෙන්ම කිව්වා, "හොරු ආරක්ෂා කරනවාය" කියන අදහස දෙන්න එපාය කියලා. මම එපමණයි කිව්වේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ පොත මට ලබා දුන්නා. ඇත්ත වශයෙන්ම dissent ගැන තිබෙන ඒ පොත හොඳයි. මොකද, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ දවල්ටත් අන්ධකාරය - darkness at noon - තිබුණා. දැන් ඒක නැති වෙලා තිබෙන්නේ. ඔබතුමන්ලා මෙතැන කෑ ගහන එකෙන් පෙනෙනවා, ඒක ක්‍රියාත්මක වනවාය කියලා. අපි කැමැතියි. මේකට එකතු වන්න කියලා කවුරුත් කියන්නේ නැහැ.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඩලස් අලහප්පෙරුම මහතා.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂය විධියට අපි මතු කළ කාරණාව සම්බන්ධයෙන් ගරු අගමැතිතුමා නිශ්චිත පිළිතුරක් දුන්නේ නැහැයි කියන එකයි මගේ විශ්වාසය. අපි හඳට ඇඟිල්ල දිගු කළාම එතුමා අපේ ඇඟිල්ල දිහා බැලුවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැනදී ප්‍රධාන වශයෙන් මතු කළේ මේ ගැසට් නිවේදනයේ අංක 04 පිළිබඳවයි. අංක 04හි තිබෙන්නේ මොකක්ද?

2015 පෙබරවාරි මාසයේ 13වන සිකුරාදා පොලිසිය සම්බන්ධයෙන් නිකුත් කරන ලද ගැසට් පත්‍රයේ අංක 04හි මෙසේ සඳහන්ව තිබෙනවා:

> "අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව පිහිටුවා ඇති, අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් කැබිනට් අනුකමිටුව මඟින් ස්ථාපිත කර ඇති ලේකම් කාර්යාලය විසින් මෙම පැමිණිලි විමර්ශනය කිරීම සඳහා පොලිස්පතිවරයාට යොමු කරන අතර, ඊට අමතරව විශේෂිත පැමිණිලි කැබිනට් අනුකමිටුව මඟින් ඍජුවම මෙම කොට්ඨාස භාර නියෝජ්‍ය පොලිස්පති වෙත යොමු කරනු ලැබේ."

එම නිසා රටට, මහජනතාවට වැරදි අර්ථකථනයක් දෙන්න උත්සාහ කරන්නට එපා. මේ පාර්ලිමේන්තුවේ ජනතා නියෝජිතයින්, දූෂණයට එරෙහිව කටයුතු කරන ක්‍රියාවලිය නතර කරන්න එවැනි ආකාරයක බලපෑමක් කරනවාය කියන වැරදි අර්ථකථනයක් දෙන්නට උත්සාහ ගන්නට එපා. අප සියලු දෙනාම එක හඬින් මතු කරන්නේ මෙන්න මේ අංක 04 යටතේ තිබෙන කාරණාව පිළිබඳ අර්බුදයයි. මෙය, පොලිස් රාජ්‍යයක් කරා යන ගමනක එක පියවරක් ද කියන සැකය සාධාරණව සමාජය තුළ මතු වෙනවා. එම නිසායි මේ කාරණාව පිළිබඳව අප ඔබතුමාගේ අවධානය යොමු කරවන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමා.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන් මා මේ කාරණය කියන්න කැමතියි. එහිදී කිව්වේ පැමිණිලි කිරීම ගැනයි. අදත් අපට පැමිණිලි එනකොට අප ඒවා පොලීසියට යොමු කරනවා. මේ නියෝජ්‍ය පොලිස්පතිතුමාට යොමු කරන්නත් පුළුවන්, වෙනත් තැනක නියෝජ්‍ය පොලිස්පතිතුමෙකුට යොමු කරන්නත් පුළුවන්. එය නීතියෙන් ඕනෑම කෙනෙකුට තිබෙන අයිතියක්. පැමිණිල්ල යොමු කරනවා විතරයි. කැබිනට් මණ්ඩලයේ අනුකාරක සභාවට පොලීසියේ අය වාඩි වෙන්නේ නැහැ. අපි මේවා පොලීසියට යොමු කරනවා විතරයි. අවශ්‍ය නම් ඔබතුමාටත් පුළුවන් ඕනෑම පැමිණිල්ලක් යොමු කරන්න. අවුරුදු 10ක් සිදුකළ දූෂණ ගැන සොයා ගන්න මේ රටේ ජනතාව මේ ආණ්ඩුවට බලය දුන්නා. මේ දූෂණ සෙවීම ගැන භය වෙලායි තිබෙන්නේ. එච්චරයි වෙලා තිබෙන්නේ. අද දූෂණ සෙවීම ගැන භය වෙලා තිබෙන්නේ. කොහොම ද හම්බ කළේ? කොහොම ද මුදල් ගත්තේ? දූෂණයක් කළේ නැත්නම් ඕක ප්‍රශ්නයක් නැහැ. මම දන්නවා, දූෂණ ගණනාවක් සොයා බලා ඒවායේ ඇත්තක් නැහැ කියලාත් කියා තිබෙනවා. අපි කියන්නේ නැහැ, මේකේ පිටිපස්සෙන් යන්න කියලා. මට කවුරු හෝ දූෂණ චෝදනාවක් දුන්නොත් මා ඒක එතුමාට නැත්නම් වෙනත් පොලිස් නිලධාරියෙකුට භාර දෙනවා. ඒ ගැන ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා හොඳට දන්නවා. දැන් එතුමා ඒ ගැන කියාවි. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු සභානායකතුමා. [බාධා කිරීම්] - යෝජනා පිළිබඳව දැනුම් දීම -යෝජනා අංක 1-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, [බාධා කිරීම්] නැහැ. නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! [බාධා කිරීම්] ගරු සභානායකතුමා. [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ මේ පාර්ලිමේන්තුවේ විවාදය කරන අවස්ථාවේදී අපේ හිතවත් ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා තර්කයක් ඉදිරිපත් කළා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පාර්ලිමේන්තුවට වග කියන්නේ නැහැ කියලා. මම එතුමාට මතක් කරන්නට කැමතියි, විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ගරු අගමැතිතුමා ඉන්නවා, ගරු විපක්ෂ නායකතුමා ඉන්නවා, ගරු කථානායකතුමා ඉන්නවා කියලා. [බාධා කිරීම්] ඇයි? පාර්ලිමේන්තුවේ ප්‍රධානම - [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමාගේ කථාවට කලින් ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා ඉදිරිපත් කිරීම අවශ්‍යයි. යෝජනා අංක 1.

## පාර්ලිමේන්තුවේ කටයුතු
### பாராளுமன்ற அலுவல்
### BUSINESS OF THE PARLIAMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That the Business of Parliament be exempted at this day's sitting from the provisions of Standing Order No. 7 and the motion agreed to by Parliament on 27.04.2015."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
### பாராளுமன்ற அமர்வு
### SITTINGS OF THE PARLIAMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I move,

"That this Parliament at its rising this day do adjourn until 1.00 p.m. on Tuesday, May 19th, 2015."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු -දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත පිළිබඳ කල් තබන ලද විවාදය. ආරම්භ කරන්නේ ගරු ජෝන් සෙනෙවිරත්න මහතා.

## දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත
### அரசியலமைப்புக்கான பத்தொன்பதாம் திருத்தச் சட்டமூலம்
### NINETEENTH AMENDMENT TO THE CONSTITUTION BILL

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.***
***ඊට අදාළ ප්‍රශ්නය [2015 අප්‍රේල් 27 ]***
***'පනත් කෙටුම්පත දැන් දෙ වන වර කියවිය යුතු ය" [ගරු රනිල් වික්‍රමසිංහ මහතා]***
***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*சம்பந்தப்பட்ட வினா - [ 2015 ஏப்பிரல் 27]*
*"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப்படுமாக" [மாண்புமிகு ரணில் விக்கிரமசிங்க]*
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*

*Order read for resuming Adjourned Debate on Question - [27th April, 2015]*
*"That the Bill be now read a Second time".- [The Hon. Ranil Wickremasinghe]*
*Question again proposed.*

[පූ.භා. 10.15]

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ මෙම ගරු සභාවේ විවාදයට ලක් කළ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සම්බන්ධයෙන් නොයෙක් පැතිකඩ අද මතු වෙමින් පවතිනවා. මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත ගෙනාවාය කියා අපේ නීති පද්ධතියේ හෝ වෙන යම් ආකාරයක සමාජයීය වශයෙන් හෝ වෙනසක් ඇති වන්නට ඉඩක් නැහැ කියන එක පැහැදිලිව කියන්නට ඕනෑ. මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත ගෙන ඒමට පෙරාතුව පසු ගිය ජනාධිපතිවරණය පැවතුණ කාලයේ මහත් ආන්දෝලනයකට තුඩු දුන් කාරණයක් තමයි විධායක ජනාධිපතිගේ බලතල නැති කරලා, ඒ වාගේම මේ රටේ නව මැතිවරණ ක්‍රමයක් ඇති කරලා, මේ රටේ අමුතුම වෙනසක්, යහ පාලනයක් ඇති කරනවාය කියන එක. මේ රටේ භික්ෂූන් වහන්සේලා, නොයෙක් සමාජ සංවිධාන, බහුජන සංවිධාන, දේශපාලන පක්ෂ මේ සියලු දෙනාම එක හඬින් කිව්වේ ප්‍රධාන වශයෙන් ඔය කරුණු දෙක ගැනයි. ඊට පස්සේ තමයි, ඔය ස්වාධීන කොමිෂන් සභා ඇති කිරීමේ කාරණය සම්බන්ධවත් යොමු වුණේ. ඒ අවස්ථාවේදී එක්සත් ජාතික පක්ෂය ප්‍රධාන තේමාව කර ගත්තේ මේ විධායක බලතල නැති කිරීම හා මැතිවරණ ක්‍රමයේ වෙනසක් ඇති කිරීමයි. ඒ කියන්නේ කේවල

ක්‍රමයත්, සමානුපාතික නියෝජන ක්‍රමයත් මිශ්‍ර ක්‍රමයකට -වඩා ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයකට- පිවිසෙනවා කියන එකයි. ඉතින්, මේක තමයි දේශපාලන වේදිකාවේ ප්‍රධානම තේමාව වුණේ. ජනාධිපතිවරණය තමුන්නාන්සේලා ජයග්‍රහණය කළා. ඊට පස්සේ තමුන්නාන්සේලා ගෙනාවා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත ගෙනෙනකොට තමුන්නාන්සේලා දන්නවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4වන ව්‍යවස්ථාව 3වන ව්‍යවස්ථාවත් සමඟ කියවෙනකොට කවදාවත් මේ විධායක බලතල ජනමත විචාරණයක් නැතුව ක්‍රියාත්මක කරන්න බැහැ කියා. ඒක තමුන්නාන්සේලා දන්නවා.

තමුන්නාන්සේලාගේ පැත්තේ බොහොම දක්ෂ නීතිඥයෝ සිටිනවා. ජයම්පති වික්‍රමරත්න මහත්මයා වාගේ අය සිටිනවා. අගමැතිතුමාත් නීතිඥයෙක්. ඒ සියලු දෙනාම දන්නවා, මෙය referendum එකක් නැතුව ක්‍රියාත්මක කරන්න බැරි බව. නමුත් තමුන්නාන්සේලා මොකද කළේ? මේ සංශෝධන ගැසට් කරලා ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ඊට පස්සේ සුපුරුදු පරිදි ශ්‍රේෂ්ඨාධිකරණයේ අවධානයට යොමු කළා. ශ්‍රේෂ්ඨාධිකරණයේ බලතල අනුව ඒක විශ්ලේෂණය කරලා අන්තිමේදී තීන්දුවක් ලැබුණා, ජනමත විචාරණයකට භාජනය කළ යුතු සංශෝධන ජනමත විචාරණයකට නොගොස් ක්‍රියාත්මක කරන්න බැහැ කියා. ඒකට හේතු වුණේ මොකක්ද? ඒකට ප්‍රධාන වශයෙන් හේතු වුණේ මේ කාරණයයි. විධායක බලතල ජනාධිපතිගෙන් ඉවත් කර ප්‍රධාන වශයෙන්ම තමුන්නාන්සේලා බලාපොරොත්තු වෙන්නේ අගමැතිවරයාට ඒ බලතල දෙන්නයි. ජනාධිපතිතුමාට දීලා තිබෙන බලතල ජනමත විචාරණයක් නොමැතිව කිසිම විධියකින් තවත් කෙනෙකුට දෙන්න බැහැ. ඒක මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණය මීට පෙර දීපු තීන්දුවලින් පවා ප්‍රකාශ වෙලා තිබෙනවා.

දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය විග්‍රහ කරද්දී ඒ වෙලාවේ හිටපු පූර්ණ විනිශ්චයකාර මණ්ඩලයක් - full bench - මඟින් ඒ සම්බන්ධයෙන් තීන්දු කර තිබෙනවා. එහෙම තිබෙද්දීත් මේ විධියට තමුන්නාන්සේලා කළේ මොකක්ද? ජනමත විචාරණයකට භාජනය වෙන, ජනමත විචාරණයක් අවශ්‍ය වෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයකට අපි යන්නේ නැහැ කියන කාරණයත් තමුන්නාන්සේලා ප්‍රකාශ කර තිබුණා. එහෙම තිබෙද්දී තමයි ඒ සංශෝධන තමුන්නාන්සේලා ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළේ. ඒකේදී තමුන්නාන්සේලා ප්‍රධාන වශයෙන්ම බලාපොරොත්තු වුණේ, කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා වශයෙන් අගමැතිවරයා පත් කරන්නයි; ඊළඟට අමාත්‍ය මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව හා ඒ ඇමතිවරුන්ගේ විෂය පථය සම්බන්ධව තීන්දු ගැනීම අගමැතිවරයාට ලැබෙන්නයි; ඕනෑම අවස්ථාවක අමාත්‍ය මණ්ඩලය විෂය පථයන් සහ කාර්යයන් සහ සංයුතිය සහ ඇමතිවරු වෙනස් කිරීමට අගමැතිවරයාට පුළුල් බලතල පැවරෙන ආකාරයට විධිවිධාන සැලැස්වීමයි. මෙවැනි කරුණු රාශියක් අඩංගු කර තමයි තමුන්නාන්සේලා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හැදුවේ. මේක ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු වුණාම ඒ අය මේක විග්‍රහ කර පෙන්වා දුන්නා, "ජනාධිපතිවරයාට දීපු බලතල තව කෙනෙකුට ක්‍රියාත්මක කරන්න බැහැ" කියා. ඒක මීට පෙර තීන්දු වෙලා තිබෙනවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4වැනි ව්‍යවස්ථාව අනුව විධායක බලතල තිබෙන්නේ අපේ රටේ ජනාධිපතිවරයාටයි. විධායක බලතලත්, රටේ ආරක්ෂාවත් තිබෙන්නේ ජනාධිපතිවරයාටයි. ඒක තමුන්නාන්සේලා නොදැන නොවෙයි, මේ සංශෝධන ශ්‍රේෂ්ඨාධිකරණයට යැව්වේ කියන එකයි මම කියන්නේ. ඒකෙන් තමුන්නාන්සේලා කළේ ජනතාව නොමඟ යැවීමක්. ජනමත විචාරණයකින් තොරව කරන්න බැරි දෙයක් ජනමත විචාරණයක් නොමැතිව කරන්න පුළුවන් කියා තමුන්නාන්සේලා යෝජනා කර, ශ්‍රේෂ්ඨාධිකරණයේ අවධානයට යොමු කළා. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීන්දු කරනු ලැබුවා, ඒ සංශෝධන ජනමත විචාරණයකින් සිදු කළ යුතුයි කියා.

අපි ඇත්ත වශයෙන්ම ආඩම්බර වෙනවා, අපේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණය ගැන. ඒ අය මේක විග්‍රහ කර පෙන්වූවා, කොයිම විධියකින්වත් මේක ක්‍රියාත්මක කරන්නට බැහැ කියා. මේ සම්බන්ධයෙන් හිටපු අග්‍ර විනිශ්චයකාර සරත් නන්ද සිල්වා මහත්මයා පැහැදිලි කර තිබෙනවා, ශ්‍රේෂ්ඨාධිකරණය දීපු තීන්දුව සියයට 100ක් නිවැරදියි කියා; මොනම විධියකින්වත් ජනාධිපතිවරයාගේ විධායක බලතල ජනමත විචාරණයකින් තොරව -ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83වැනි ව්‍යවස්ථාව යටතේ දක්වා තිබෙනවා.- ක්‍රියාත්මක කරන්න බැහැ කියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණය මේ සම්බන්ධයෙන් දීර්ඝ විස්තරයක් කර තිබෙනවා.

The Supreme Court in examining paragraphs (i) to (vi) of Clause 11 of the gazetted Bill in relation to powers held by the President under Article 30 of the Constitution, namely, the proposal to make the Prime Minister the Head of the Cabinet and to be the sole authority in determining the number of Ministers in the Cabinet; assignments of subjects and functions of such Ministers; change of assignments given to them; changes in the composition in the Cabinet et cetera, held as follows. I quote:

> "If the inalienable sovereignty of the people which they reposed on the President in trust is exercised by any other agency or instrument who do not have any authority from the President then such exercise would necessarily affect the sovereignty of the People. It is in this backdrop the Court in the Nineteenth Amendment Determination came to a conclusion that the transfer, relinquishment or removal of a power attributed to one organ of government to another organ or body would be inconsistent with Article 3 read with Article 4 of the Constitution. Though Article 4 provides the form and manner of exercise of the sovereignty of the people, the ultimate act or decision of his executive functions must be retained by the President. So long as the President remains the Head of the Executive, the exercise of his powers remain supreme or sovereign in the executive field and others to whom to such power is given must derive the authority from the President or exercise the Executive power vested in the President as a delegate of the President. The President must be in a position to monitor or to give directions to others who derive authority from the President in relation to the exercise of his Executive power. Failure to do so would lead to a prejudicial impact on the sovereignty of the People."

Having made this pronouncement, the Supreme Court vetoed the sixth paragraph under Clause 11 of the Nineteenth Amendment to the Constitution Bill and recommended that these changes need a referendum in addition to a two-thirds majority of Parliament.

Now, Sir, I must say,-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒක ඔබතුමාගේ අත්දැකීම.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

That is right. There was no other alternative. You had to withdraw the clauses. The Hon. Prime Minister rightly came to the House and withdrew the clauses where referendum was needed. That situation arose because of your recklessness. That is what I say. This is something which you promised the country. You went from village to village; you went from stage to stage and thereafter, you gave an undertaking to the people that you will remove the executive powers of the President. You also said that you will bring a new system of elections. But, you forgot all that and in order to satisfy the people and to say that at least you made an effort, you brought this Bill. But, the Bill is erroneous. Ultimately, you were forced to withdraw those clauses which required a referendum.

So, Sir, at the end, there were some ugly incidents that happened. අවසානයේ මොකක්ද වුණේ? රජය වෙනුවෙන් පෙනී සිටි නීතිපතිවරයාත්, පෙත්සම් ඉදිරිපත් කළ අයගේ නීතිඥ මහත්වරුත් ඉදිරියේ තමුන්නාන්සේලා එදා සුප්‍රීම් උසාවියට සංශෝධන වගයක් ඉදිරිපත් කළා. ඒක මුළු රටම දන්නා දෙයක්. ඒ සංශෝධනත් ප්‍රතික්ෂේප වුණා. ඒ සංශෝධන ශ්‍රේෂ්ඨාධිකරණයේ සැලකිල්ලට භාජනය වුණේ නැහැ. ඒ සංශෝධනවලින් කියැවුණේ මොකක්ද? ජන මත විචාරණයක් නොමැතිව අනුමත කරන්නට බැහැ කිව්ව යම් යම් කරුණු ඒ සංශෝධන මඟින් ගෙනෙන්න හැදුවා. එය වැරැදි ක්‍රියාවක්. එතැනදී මොකක්ද වුණේ? අප ඒ ගැන බොහොම සැලකිලිමත් වුණා. ඇත්ත වශයෙන්ම බොහොම අවිශ්වාස සහගත තත්ත්වයක් ඇති වුණා. ඉස්සරහ දොරෙන් ගෙනෙන්න බැරි වුණු දේ පිටු පස්ස දොරෙන් ගෙනෙන්න තැත් කිරීමක් වැනි දෙයක් තමුන්නාන්සේලා කරන්න හැදුවා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාත්, මමත් ඒ අවස්ථාවේ හිටියා. එදා සුමන්තිරන් මහත්මයා කිව්වේ මොකක්ද? එතුමා කිව්වා, මේ සංශෝධන ගෙන ඒම කාටවත් වළක්වන්න බැහැ කියලා, that nobody can prevent these Amendments being brought in at the Committee Stage. True, as the general policy is that anybody can bring in any amendment, that possibility is there. But, in regard to an amendment to the Constitution, such a thing is never done. So, we said, "You could bring amendments at the Committee Stage in respect of any Bill, but as far as the Constitution is concerned, that is not permitted. Nevertheless, he insisted that it could be done. But, now I am happy that the Government has given up the idea of bringing in those Constitutional Amendments.

රජය - තමුන්නාන්සේලා - මුල ඉඳලාම ප්‍රදර්ශනය කරන දුර්වලකම් රාශියක් තිබෙනවා. මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත තමුන්නාන්සේලා ගෙනාවේ මැතිවරණය දිනන්න ජනතාවට දුන් පොරොන්දුවක් අනුවයි. ඒ පොරොන්දුව ඉෂ්ට කරන්න පුළුවන් වුණා හෝ බැරි වුණා හෝ ජනතාව සතුටු කිරීමේ අභිලාෂයෙන් තමයි මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත ගෙනාවේ. එහෙම නැතිව එය සම්මත කර ගැනීමට අවශ්‍ය කරන වැඩි ඡන්ද සංඛ්‍යාව තමුන්නාන්සේලාට නැහැ.

මේ රටේ මෑත කාලයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා දෙකක් සම්මත වුණා. එකක් තමයි, 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. එදා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය අගමැතිනිය වශයෙන් සිටියදී එතුමියට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් තිබුණා. එතුමිය බය නැතිව එදා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගෙනැල්ලා සම්මත කළා. ඊළඟට 1978 ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා අගමැතිවරයා වශයෙන් සිටියදී එතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනාවා. එතුමාට හයෙන් පහක වැඩි ඡන්ද සංඛ්‍යාවක් තිබුණා. අද අප ක්‍රියා කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව එදා එතුමා ගෙනැල්ලා සම්මත කළා. නමුත් තමුන්නාන්සේලා ඊයේ - පෙරේදා බලයට පත් වුණාට පස්සේ තමුන්නාන්සේලාට අමතක වුණා, "අපට වැඩි ඡන්ද ගණනක් තිබෙනවාද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ජන මත විචාරණයක් නොමැතිව සම්මත කරන්න වුණත් අපට මන්ත්‍රීවරු සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක් තිබෙන්නට ඕනෑ, එහෙම හැකියාවක් අපට තිබෙනවාද" කියන කරුණු ගැන. තමුන්නාන්සේලා ඒ කරුණු ගැන සැලකිලිමත් වුණේ නැහැ. තමුන්නාන්සේලා මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත ගෙනැල්ලා ඊට පස්සේ තමුන්නාන්සේලා අපේ සහාය බලාපොරොත්තු වුණා. දින සියය වැඩ සටහනට සහාය දෙන්න අප එකඟ වුණා. ඒ සඳහා සහාය දෙන්න එකඟ වෙලා අප යම් යම් සහායන් ලබා දුන්නා. තමුන්නාන්සේලා ඒ ගැන දන්නවා. සාමාන්‍යයෙන් ඉතිහාසයේ නොකළ ආකාරයට අප එකතු වෙලා ඒ වෙනුවෙන් ක්‍රියා කළා.

අපේ සමහර ඡන්ද දායකයින් ගම්වලට ගියාම අපට බණිනවා, "එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් බලයේ තියා ගන්න උදව් කරන්නේ ඇයි?" කියලා. ඒ ප්‍රශ්න සියල්ල මැද්දේ අප තමුන්නාන්සේලාට සහයෝගය ලබා දුන්නා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත ඉදිරිපත් කළ වෙලාවේත්, ඒ සඳහා සංශෝධන ඉදිරිපත් කරන වෙලාවේත්, විශේෂයෙන් මේ කොමිෂන් සභා ඒකට ඇතුළත් කරලා තිබෙන නිසාත් අප ඒ සඳහා ඡන්දය දීලා මේ පනත් කෙටුම්පත අනුමත කරන්න බලාපොරොත්තු වුණා. නමුත් තමුන්නාන්සේලා හැම දාම මොකක්ද කළේ? අපේ මන්ත්‍රීවරුන්ට, අපට පුළුවන් තරම් අපහාස කරන්න, පුළුවන් තරම් මඩ ගහන්න කටයුතු කළා. සුහදතාවක් නැති වන විධියට කටයුතු කළා. ඇත්ත වශයෙන් අපේ මන්ත්‍රීවරුන්ට ඔවුන්ගේ හිතට එකඟව මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතට ඡන්දය දීලා, මේ පනත් කෙටුම්පත අනුමත කරන්නට පුළුවන්ද කියන ප්‍රශ්නයට උත්තර දෙන්න බැරි වන විධියට තමුන්නාන්සේලා ඒගොල්ලන්ට මඩ ගැහුවා.

බුද්ධිමත් ආණ්ඩුවක් ඒ විධියට ක්‍රියා කරන්නේ නැහැ කියන එකයි මම කියන්නේ. තමුන්නාන්සේලා ඕනෑ පරීක්ෂණයක් කරන්න. නමුත් මේ ඒ සඳහා අවස්ථාව නොවෙයි. අපේ මන්ත්‍රීවරුන්ට මඩ ගහලා, ඒ අය බිත්තියට තියලා හේත්තු කරලා, ඒ අයගේ ඡන්දය බලෙන් ගන්න තමුන්නාන්සේලාට බැහැ. අද වෙලා තිබෙන්නේ ඒකයි. මේ කාරණයේදී අපට විශාල මහන්සියක් ගන්න සිදු වෙලා තිබෙනවා. මොකද, තමුන්නාන්සේලා හැමදාම පාර්ලිමේන්තුවට ඇවිල්ලා නැඟිටලා කියනවා, හොරු ආරක්ෂා කරනවා කියලා. "හොරු වෙනුවෙන් හොරු" වැනි ප්‍රකාශයක් අගමැතිතුමා නිතරම කරනවා. මේවා නිසා අද අපේ සුහදතාව නැති වෙලා තිබෙනවා. අප අතර තිබිය යුතු සුහදතාව, අප අතර ඇති විය යුතු සුහදතාව නැති වන විධියට කටයුතු කරනවා මිසක්, එය ආරක්ෂා කරන්න, එය නිර්මාණය කරන්න තමුන්නාන්සේලා අද කටයුතු කරන්නේ නැහැ. මේ කාරණය මම තමුන්නාන්සේලාට විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම තමුන්නාන්සේලාට සහයෝගය දක්වන සමහර අය අද පෙළපාළි යනවා. ඊයේ ලොකු පෙළපාළියක් ගියා. ඒ පෙළපාළියේ අපේ හිටපු ජනාධිපතිතුමිය ගියා; මාදුළුවාවේ සෝභිත හාමුදුරුවන් ගියා. පෙළපාලි යන්න අවශ්‍ය නැහැ. කිසිම පෙළපාලියක් ඕනෑ නැහැ. මොකද, අපි ඡන්දය දෙන්න තමයි හිටියේ.

අපි 2001 වසරේදී දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා. තමුන්නාන්සේලායි, අපියි, ජනතා විමුක්ති පෙරමුණයි ඔක්කෝම එකතු වෙලා 2001 වසරේදී දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා. එතැනදී එක ප්‍රශ්නයක් මතු වුණා. ඒ වෙලාවේදී අවසාන මොහොතේදී අපි යෝජනා කළා, ජනාධිපතිවරයා වෙනුවෙන් නියෝජිතයෙක් පත් කරන්න ඕනෑ කියලා. එදා ඒ වෙලාවේ තමුන්නාන්සේලාත් අපේ පැත්තේ හිටියා. 2001 වසරේ දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාපු වෙලාවේ ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාත් අපේ පැත්තේ තමයි හිටියේ. අපි ඔක්කෝම ඒ වෙලාවේ පක්ෂව ඡන්දය දුන්නා. හැබැයි බොහොම වැරදි සහගත විධියට තමයි එය කෙටුම්පත් කර තිබුණේ. තමුන්නාන්සේලා දන්නවා, දවල් රෑ නොබලා දින කිහිපයකදී කෙටුම්පත් කළ ඒ පනත් කෙටුම්පත සම්මත කළ බව. සම්මත කළාට පස්සේ ක්‍රියාත්මක කරන්න ගියාම ක්‍රියාත්මක කරන්න බැහැ. මොකද, එහි හුඟාක් අඩු පාඩුකම් තිබුණා. කෙනෙකුගේ නම යෝජනා කළාම, ජනාධිපතිනිය ඒ පුද්ගලයාව පත් කළේ නැහැ. යම් යම් දේශපාලන හේතු උඩ එතුමිය ඒ පුද්ගලයාව පත් කළේ නැහැ. පත් කරන්නේ නැතුව එතුමිය අවුරුදු දෙකහමාරක් ඒ පත් කිරීම සාක්කුවේ දමා ගෙන හිටියා. තමුන්නාන්සේලා දන්නවා, සුළු පක්ෂවලින් නියෝජිතයෙක් පත් කරන්න ඕනෑ බව. සුළු පක්ෂවලින් පත් කරන නියෝජිතයා සම්බන්ධව TNA එකටයි, ජනතා විමුක්ති පෙරමුණටයි එකඟතාවකට එන්න බැරි වුණා. ඒ ගොල්ලන් කඹ ඇද ඇද හිටියා. ඒ නිසා දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන්ම නිරර්ථක වුණා; ව්‍යර්ථ වුණා; වැඩක් නැති තත්ත්වයට පත් වුණා. ඒක එතැනින් අවසන් වුණා.

ඊළඟට තමයි දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ. දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාපු හැටි තමුන්නාන්සේලා හැමදාම අපට කියනවා. හැමදාම අහන්නේ දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාපු හැටි මතක නැද්ද කියලායි. අපට මතකයි. අපි දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා. අපේ පක්ෂයේ සමහර අය ඒ සඳහා කැමැත්තෙන් ඡන්දය දුන්නා. සමහර අය අකමැත්තෙන් ඡන්දය දුන්නා. මොකද, ආණ්ඩුවක ඉන්න කොට ආණ්ඩුවේ ප්‍රතිපත්ති අනුව කටයුතු කරන්න ඕනෑ. ආණ්ඩුවේ ඉන්න කොට අපට පෞද්ගලික වශයෙන් කටයුතු කරන්න බැහැ. ඒ නිසා දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හොඳ නරක මොනවා වුණත්, අපි ඔක්කෝම ඒ සඳහා පක්ෂව ඡන්දය දුන්නා. දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන කියමින් අපට මඩ ගහන තමුන්නාන්සේලාට මතක් කරන්න ඕනෑ, 1978 වසරේදී ජේ.ආර්. ජයවර්ධන මහත්මයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගෙනාපු වේලාවේදී එය අනුමත කරන්න එතුමා අනුගමනය කළ ක්‍රියා කලාපය ගැන. ඇමතිවරුන් තුන් දෙනාටයි කථා කරන්න ඉඩ දුන්නේ. අනෙක් අයට කථා කරන්න ඉඩ දුන්නේ නැහැ. සම්පූර්ණයෙන්ම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගැසට් කරලා දින දෙකකින් පාර්ලිමේන්තුවේදී එය සම්මත කළා. අගමැතිවරයාගේ බලතල සම්පූර්ණයෙන්ම එතුමාගේ අතට අර ගෙන තමයි එතුමා ඒ කටයුතු කළේ. ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තමයි දැනටත් ක්‍රියාත්මක වෙන්නේ.

මෙවැනි තත්ත්වයක් අද දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙනුත් ඇති වෙලා තිබෙනවා. ලෝකයට දීලා තිබෙන්නේ මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කළාම ඔක්කොම හරි කියන පණිවුඩයයි. මෙය සම්මත වුණාම අපේ රටේ ඔක්කෝම දේවල් හරි කියලායි කියන්නේ. ඒ නිසා මිනිසුන් පෙළපාළි යනවා; cut-outs ගහනවා; බෝඩ් ගහනවා. ඒකට කමක් නැහැ. ජනතාව තුළ උනන්දුවක් ඇති කිරීම හොඳයි. නමුත් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කළාට පස්සේ මිනිසුන් බලාපොරොත්තු වන විධායක ජනාධිපති ධුරය නැති වෙනවාද? නැහැ. යම් කිසි සීමා කිරීමක් පමණක් සිදු වන බව අපි පිළිගන්න ඕනෑ. ජනාධිපතිතුමාගේ ධුර කාලය අවුරුදු පහට අඩු වෙලා තිබෙනවා. අවුරුදු හයක් තිබුණු ධුර කාලය අවුරුදු පහට අඩු වෙලා තිබෙනවා. ජනාධිපතිවරයාට තරග කරන්න හැකි වාර ගණන අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම කොමිෂන් සභාවල යම් යම් පත් කිරීම් සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට තිබුණු අයිතිය නැති වෙලා තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක කමිටුවේ නිර්දේශ අනුවයි එම පත් කිරීම් කරන්නට ඕනෑ. එවැනි යම් යම් පියවර කිහිපයක් තිබෙනවා. ඒක නිසා තමයි ඇත්ත වශයෙන්ම මේ සඳහා අපි සහයෝගය දෙන්නේ.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන තවත් එක අඩුවක් පිළිබඳව මේ වෙලාවේදී මම කියන්න ඕනෑ. මේක මාගේ පෞද්ගලික මතයක්. මම මෙය සංශෝධනයක් වශයෙන් ගෙනෙන්න හැදුවා. නමුත් බැරි වුණා. අවුරුදු හතරහමාරක් යනකල් පාර්ලිමේන්තුව විසුරුවන්න බැහැ කියලා තිබෙනවා. පාර්ලිමේන්තුව අවුරුදු හතරහමාරක් යනකල් විසුරුවා හැරීමට නොහැකි වීම තුළ යම් යම් ආදීනව තිබෙනවා. මොකද, යම් කිසි විධියකින් ආණ්ඩුවක් දුර්වල වුණොත්, මන්ත්‍රී සංඛ්‍යාව අඩු වෙලා ආණ්ඩුව ගෙනයන්න බැරි තත්ත්වයට පත් වුණොත් ජනාධිපතිවරයා මොකද කරන්නේ? අද නම් ඒකට ක්‍රමයක් තිබෙනවා. මොකද, අවුරුද්දක් ගියාට පස්සේ පාර්ලිමේන්තුව විසුරුවන්න පුළුවන්. තමුන්නාන්සේලා දන්නවා, බණ්ඩාරනායක මහත්මයා ඉන්න කොට එතුමාගේ ඇමති මණ්ඩලයේ සමහර ඇමතිවරු කැබිනට් රැස්වීම් වර්ජනය කළා; කැබිනට් රැස්වීම්වලට ආවේ නැහැ. බණ්ඩාරනායක මහත්මයා ගිහිල්ලා වාඩි වෙලා ඉන්නවා, ඇමතිවරු නැහැ. ඊට පස්සේ මොකද කළේ? එතුමාත් යනවා. එහෙම කාලයක් තිබුණා.

තමුන්නාන්සේලා දන්නවා, නොයෙක් අවස්ථාවලදී අපේ අය කල්ලි ගැහෙනවා; කණ්ඩායම් ගැහෙනවා. කණ්ඩායම් ගැහිලා සමහර වෙලාවට නායකත්වයට විරුද්ධව නැඟී සිටිනවා. ඒ වාගේ අවස්ථාවක ආණ්ඩුව ගෙන යන්නේ කොහොමද? ආණ්ඩුව ගෙන යන්න බැරි තත්ත්වයක් උදා වුණොත් අවුරුදු හතරහමාරක් යන තෙක් ජනාධිපතිවරයාට ඒ සඳහා විසඳුමක් නැහැ. එතුමාට තුනෙන් දෙකක බලයක් ගන්න පුළුවන් නම් කිසි ප්‍රශ්නයක් නැහැ. තුනෙන් දෙකක බලයක් ගන්න පුළුවන් නම් පාර්ලිමේන්තුව විසුරුවන්න පුළුවන්. තුනෙන් දෙකේ බලයක් ගන්නත් බැරි නම්, අවුරුදු හතරහමාරක් ගෙවිලාත් නැත්නම් ඒ ජනාධිපතිවරයාට දෙවියන්ගේම පිහිටයි. එවැනි තත්ත්වයන් ඇති වෙන්න පුළුවන්. ඒ නිසා ඇත්ත වශයෙන්ම මේක අවුරුදු දෙකකට විතර සීමා කළා නම් හොඳයි කියලා මට හිතෙනවා. මොකද, ජනාධිපතිවරයෙක් ආවාටගියාට ආණ්ඩුවක් විසුරුවන්නේ නැහැ. බැරිම වුණොත් තමයි විසුරුවන්නේ. මොකද, 2002දී, 2003දී තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේ එවැනි තත්ත්වයක් ඇති වුණා. ඒ වෙලාවේ හිටපු ජනාධිපතිතුමිය ආණ්ඩුව විසිරෙව්වා. ඒකට පාඩමක් තමයි දැන් තමුන්නාන්සේලා උගන්වන්න හදන්නේ. මොකද, එවැනි තත්ත්වයක් නැවත ඇති වෙන්න පුළුවන්. නමුත් එදා එහෙම තත්ත්වයක් තිබුණා.

තමුන්නාන්සේලා දන්නවා, එදා ජනාධිපතිතුමිය වශයෙන් චන්ද්‍රිකා මැතිනිය එන කොට එතුමියගේ බෑග් එක පරීක්ෂා කරනවා බෝම්බ තිබෙනවාද කියලා. එතුමිය ඇතුළු වෙන්න හදන කොට සමහර අය කිව්වා, "හා, හා ඇතුළට එන්න බැහැ, ඔබතුමිය ඇතුළු වෙන්න ඉස්සෙල්ලා අපට ඔබතුමියගේ බෑග් එක පරීක්ෂා කරන්න ඕනෑ, මොකද, ඔබතුමියගේ බෑග් එකේ බෝම්බ තිබෙනවාද කියා බලන්න."කියලා. මේ වාගේ දේවල් වුණා. එතුමියට නොයෙක් විධියේ අපහාස, උපහාසවලට ලක් වෙන්න සිදු වුණා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ජනාධිපතිතුමියගේ සුරතල් බල්ලාට-

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කියන්නේ චන්ද්‍රිකා බණ්ඩාරනායක ජනාධිපතිතුමිය සුරතලයට බල්ලෙක් හැදුවාලු. අපි කැබිනට් මණ්ඩලයේ ඉන්න කොටත් එතුමිය බල්ලාත් එක්ක තමයි කැබිනට් රැස්වීමට එන්නේ. බල්ලා එතුමියගේ පුටුව ළඟින් වාඩි වෙනවා. ඒක සාමාන්‍ය සිරිතක්. තමුන්නාන්සේලා ඒකට ඔච්චම් කරන්න පටන් ගත්තා. "ඔය බල්ලා එක්ක එන්න බැහැ, කැබිනට් මණ්ඩල රැස්වීම්වලට බල්ලෝ ගේන්න බැහැ, දොර ළඟ බල්ලා තියලා එන්න" කියලා තමුන්නාන්සේලා කිව්වා. මේ රටේ හිටපු ජනාධිපතිනියට තමුන්නාන්සේලා සැලකුවේ එහෙමයි. අවසානයේදී එතුමියට කරකියා ගන්න දෙයක් නැතුව, එතුමියගේ ආත්ම ගෞරවයත් ආරක්ෂා කරගන්න එතුමිය මොකද කළේ? ආණ්ඩුව විසුරුවා හැරියා. එවැනි තත්ත්වයක් ඇති වුණා.

එවැනි තත්ත්වයක් ඇති වුණොත් මොකද කරන්නේ? ජනාධිපතිවරයාට අවනත නැති, ජනාධිපතිවරයා උපහාසයට ලක් කරන, අපහාසයට ලක් කරන ඇමති මණ්ඩලයක්, මන්ත්‍රී කණ්ඩායමක් තමුන්ගේ ආණ්ඩුවේ හිටියොත් මොකද කරන්නේ? එවැනි තත්ත්වයක් මම තමුන්නාන්සේලාට කියන්නම්. 1970දී එවැනි තත්ත්වයක් ඕස්ට්‍රේලියාවේ ඇති වුණා.

In the 1970s, the Labour Party in Australia formed a government under Prime Minister, Gough Whitlam. He encountered a Parliamentary crisis. Then, what happened? The Governor-General dissolved Parliament and held an election. Then, the incumbent Prime Minister lost that election. That was because of his irresponsible administration of the country. Such incidents can happen. Therefore, there must be some provision which the President could make use of. So, in such circumstances, I find that there is no remedy permitted to the President in the Constitution. In fact, I was very desirous of bringing in an amendment, but failed since there were some objections from my party. But, my personal view is that four-and-a-half years is too long a time to prevent a President from dissolving Parliament in case a dissolution is necessary.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට මේ මැතිවරණ ක්‍රමය ගැනත් මම කියන්න ඕනෑ. නව මැතිවරණ ක්‍රමයක් ගැන අපි කවුරුත් කථා කළා. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් මේ මැතිවරණ ක්‍රමය ඇති වුණාට පස්සේ, ඉස්සෙල්ලාම අපි මේ ක්‍රමය අත්හදා බැලුවේ 1989දීයි. 1989දී තමයි අපි බොහෝ දෙනෙක් පාර්ලිමේන්තුවට ආවේ. 1989දී අපි පළමුවෙන්ම මේ මැතිවරණ ක්‍රමයට, දැනට පවතින සමානුපාතික මැතිවරණ ක්‍රමයට මුහුණ දුන්නා. ඊට පස්සේ හැම මැතිවරණයක්ම පැවැත්වුණේ ඒ ක්‍රමයට. මේ මැතිවරණ ක්‍රමය ඉතාම අපහසුයි. ඒවාගේම නොයෙක් ප්‍රශ්නවලින් පිරුණු මැතිවරණ ක්‍රමයක්.

අපි දිස්ත්‍රික්කයක් ගැන කථා කළොත්, අපේ රත්නපුර දිස්ත්‍රික්කය අවිස්සාවේල්ලේ සිට හම්බන්තොට දක්වා තිබෙනවා. අනෙක් පැත්තෙන් බදුල්ල කිට්ටුවට තිබෙනවා. මේ විධියට තමයි ඒ දිස්ත්‍රික්කය පිහිටා තිබෙන්නේ. මැතිවරණයට තරග කරන අපේක්ෂකයා මේ මුළු දිස්ත්‍රික්කය පුරාම යන්න ඕනෑ. ඔහු හැම ප්‍රදේශයෙන්ම ඡන්ද ගන්න ඕනෑ. මේ මැතිවරණ ක්‍රමයේ තිබෙන්නේ එහෙමයි. මම අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ, තමුන්නාන්සේලා ඒක දන්නවා. මැතිවරණයෙන් ජයග්‍රහණය කරලා මන්ත්‍රීවරයකු විධියට හෝ නියෝජ්‍ය ඇමතිවරයකු විධියට හෝ ඇමතිවරයකු විධියට හෝ නිලයක් ගත්තාම ඔහු කොහොමද ඒ දිස්ත්‍රික්කය පුරා වැඩ කරන්නේ? ඔහුට කොහෙන්ද ප්‍රතිපාදන? ඔහු යම් යම් ප්‍රදේශවලට ගිහිල්ලා ඡන්දය ගත්තාම, ඊළඟ මැතිවරණයේදී තමයි නැවත ඒ ප්‍රදේශවලට යන්න වෙන්නේ. ඊට ඉස්සෙල්ලා යන්න අවශ්‍යතාවක් තිබුණත්, ඒ හැම තැනම තිබෙන අවශ්‍යතා ඉෂ්ට කරන්න ඔහුට ප්‍රතිපාදන නැහැ.

සමහර අය තමන්ගේ ආසනයේ සංවිධායකට වැඩ කරන්නේ නැතුව දිස්ත්‍රික්කයේ වෙනත් අපේක්ෂකයෙක් තෝරා ගෙන ඔහු බලයට පත් කරන්න වැඩ කරනවා. එතකොට ආසනයේ සංවිධායකවරයා එම පුද්ගලයා වෙනුවෙන් කිසි දෙයක් කරන්නේ නැහැ. එතකොට තමන් ඡන්දය දුන් අපේක්ෂකයාගෙන්ම තමයි තමන්ගේ ප්‍රශ්න විසඳාගන්න වෙන්නේ. ඒ නිසා මේ මැතිවරණ ක්‍රමය ප්‍රායෝගික නොවන ක්‍රමයක්. ඒ වාගේම, පාර්ලිමේන්තුවට පැමිණීමට සුදුසුකම් තිබෙන බොහෝ අයට පාර්ලිමේන්තුවට එන්න බැහැ. මොකද, ඒ අයට මැතිවරණයක් ජයග්‍රහණය කරන්න බැහැ. ඒ සඳහා විශාල වශයෙන් සම්පත් ඕනෑ වන නිසා.

මේ මැතිවරණ ක්‍රමය තුළ මනාප ක්‍රමයක් තිබෙනවා. මේ මනාප සඳහා එක පක්ෂයේම අය ගැටෙනවා. එහෙම ගැටීම නිසා නොයෙක් විධියේ ප්‍රශ්න ඇති වෙනවා. සමහරවිට එක පක්ෂයේම අය මරා ගන්නවා. එවැනි දේ අප අසා තිබෙනවා; දැක තිබෙනවා. ඒ නිසා මේ ක්‍රමය නැති වෙන්නට ඕනෑ. මීට වඩා ප්‍රජාතන්ත්‍රවාදී ජන සම්මත ක්‍රමයක් ඇති වෙන්නට ඕනෑ. එහෙම ඇති වෙන්න නම් අපි කවුරුත් එකතු වෙලා මේ ක්‍රමය වෙනස් කරන්න ඕනෑ. නව මැතිවරණ ක්‍රමය ගැන කථා කරනකොට සෑම දාම රවුෆ් හකීම් මහත්මයා විරුද්ධයි කියා මම දන්නවා. නමුත් එතුමා ඒ සඳහා විකල්පයක් යෝජනා කළාය කියලා මම දන්නේත් නැහැ. I read in the newspapers that you were opposed to it.

**ගරු රවුෆ් හකීම් මහතා (නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා)**
(மாண்புமிகு றவுப் ஹக்கீம் - நகர அபிவிருத்தி, நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்பு அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of Urban Development, Water Supply and Drainage)
They must consult us.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
That is right. They must consult you. I participated on one or two occasions in the discussions that were held at various places on this and I found that the system that has now been tabled before the Cabinet is the best for the minority parties because if it works out, every minority party will get their representatives. If they cannot get their representatives elected, there is a possibility of getting their representatives nominated through the Preferential System. That possibility is there; that provision is there. Hon. Yogarajan, you will be very much benefited. Do not worry. We particularly looked into the aspect of Indian Tamils in the Kandy District.

සමානුපාතික නියෝජන ක්‍රමයට 66දෙනෙක් පත් වෙන නිසා සියලු අඩු පාඩු සපුරා ගන්න පුළුවන් ක්‍රමයක් තිබෙනවා. ඒ වාගේම, බහු මන්ත්‍රී ආසන ගණනාවක් යෝජනා වෙලා තිබෙනවා. ඒ කියන්නේ මහ ජාතිය සහ සුළු ජාතිය සිටින තැන්වලට, ඒ ඒ

ප්‍රදේශවලට බහු මන්ත්‍රී ආසන යෝජනා වෙලා තිබෙනවා. බේරුවලට, පුත්තලමට, බදුල්ලට බහු මන්ත්‍රී ආසන යෝජනා වෙලා තිබෙනවා. මම හිතන්නේ ඒ ක්‍රමය තුළින් දැනට වඩා නියෝජිත සංඛ්‍යාවක් එනවා. සංඛ්‍යාත්මකව බැලුවත් එහෙමයි. ඒක කාටත් සාධාරණයි. මේ අවස්ථාවේදී තිබෙන සුළු සුළු මතවාද නිසා, "අපට එකඟ වන්න බැහැ" යනුවෙන් ප්‍රකාශ කරලා මේ කටයුත්ත ආපස්සට දැම්මොත් මොකද වෙන්නේ? එතකොට සමාජය තුළ නොඉවසිලි ගතියක් ඇති වනවා. ඒ නිසා අපි ඒ ගැන හිතන්න ඕනෑ. We must be very moderate and also consider the plight of the society. මේ හේතු නිසා මේ ගැන හිතන්න කියලා මම ඉතා ඕනෑකමින් ඉල්ලනවා.

අතිගරු ජනාධිපතිතුමා විසින් මේ නව මැතිවරණ ක්‍රමය සම්බන්ධව පත්‍රිකාවක් ඉදිරිපත් කළාය කියා මට දැන ගන්න ලැබී තිබෙනවා. ඊයේ එය ගැසට් කළාය කියලාත් දැන ගන්නට තිබෙනවා. ඒ ගැන සාකච්ඡා කරලා අවශ්‍ය නම් එයට යම් යම් සංශෝධන කර ගන්න පුළුවන්. ඒ සඳහා යුහුසුළුව කටයුතු කරන්න කියලා ඉල්ලනවා. අනිවාර්යයෙන්ම මෙය සමාජයට ඉතාම ප්‍රයෝජනවත්, වැඩදායක වැඩ පිළිවෙළක්. නැත්නම් මැතිවරණයක් කියන්නේ යුද්ධයක්. මැතිවරණයක් පැවැත්වෙන මාස එකහමාර, දෙක තුළ මුළු රටම යුද පිටියක් වනවා. එවැනි තත්ත්වයක් සිදු වීම අපි කාටවත් හොඳ නැහැ. විශේෂයෙන්ම යහ පාලනය ගැන කථා කරන තමුන්නාන්සේලා යහ පාලනය ක්‍රියාත්මක කරන්නත් ඕනෑ. මේ මැතිවරණ ක්‍රමය තියාගෙන කවදාවත් යහ පාලනය ක්‍රියාත්මක කරන්න බැහැ. You cannot have a good society while maintaining this system of election because there will be conflicts among the members of the same family. It will take one or two years for you to patch up. Some people have been enemies for ages. You become an enemy with the members of your party. Therefore, the present system should be done away with and we might implement the proposed system with some amendments if there are any deficiencies.

මේ කරුණු ටික තමයි මම කියන්න බලාපොරොත්තු වුණේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මම අවසාන වශයෙන් කියන්නට ඕනෑ මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කරන්නට තමුන්නාන්සේලා විශාල මහන්සියක් දරමින් කටයුතු කරන්න පටන් ගත්ත බව. ඒ ගැන අපට හරි පුදුම හිතුණා. මෙවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් සකස් කරන විට එසේ කඩිනමින් කිරීම අපේ අත් දැකීම් අනුව සුදුසු දෙයක් නොවෙයි. අපි දහහත් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හදිසියේ කෙටුම්පත් කළත්, අවසානයේ එය ක්‍රියාත්මක කරන්න බැරි විධියට අඩු පාඩුකම් තිබුණා. ඒ නිසා කඩිමුඩියේ මේ සංශෝධන සකස් කරන්නේ නැතිව, කවුරුත් කල්පනා කරලා, ඒ සංශෝධන පිළිබඳව සාකච්ඡා කරන්න ඕනෑ. මොකද, මෙම සංශෝධන කරන්නේ රට වෙනුවෙන්. දේශපාලන පක්ෂයක් වෙනුවෙන්, නැත්නම් පුද්ගලයන් වෙනුවෙන් කරන සංශෝධන නොවෙයි, රට වෙනුවෙන් තමයි මේ සංශෝධන ඉදිරිපත් කරන්නේ. රට වෙනුවෙන් ඉදිරිපත් කරන ඒ සංශෝධන අපි කවුරුත් සාකච්ඡා කරලා ඉදිරිපත් කරන්න ඕනෑ.

එක පුද්ගලයෙකු වටා බලය කේන්ද්‍රීය වීම සාමාන්‍යයෙන් ජනතාව අනුමත කරන්නේ නැහැ. අප ඒ කාරණයත් තේරුම් ගන්න ඕනෑ. විධායක බලයට -ජනාධිපතිතුමාගේ ඒ බලයට- විරුද්ධ වන්නේ මොකද, එක පුද්ගලයකුගේ අතට මේ බලය කේන්ද්‍රීය වෙලා තිබෙන නිසායි. අගමැතිතුමාට එම බලය තිබුණත් සිදු වන්නේ ඒකයි. අගමැතිතුමාටත් අනවශ්‍ය විධියට, අසීමිත විධියට බලය ගොඩනැඟුණොත් ජනතාව එයට එකඟ වන්නේ නැහැ. ඒ නිසා ඒ සියලු කාරණා ගැන අප කල්පනා කරන්න ඕනෑ.

It is not the enjoyment of power that we must aim at; we must have a system where everybody will be equal and there will be democracy in the society.

Thank you, Sir.

[පූ.භා.10.46]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Plantation Industries and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ හිතවත් ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මන්ත්‍රීතුමාගෙන් කථාවෙන් පසුව මට කථා කරන්න ලැබීම ගැන මම ඉතාම සතුටු වනවා.

මට මතක් වෙනවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ "විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න" කියන සටන් පාඨය අවුරුදු 40කට ආසන්න කාලයක් තිස්සේ අරගෙන ගිය බව. 1978දී මේ විධායක ජනාධිපති ධුරය ක්‍රියාත්මක වුණාට පසුව හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමා ඉදිරිපත් වුණු ජනාධිපතිවරණයේ, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ඉදිරිපත් වුණු ජනාධිපතිවරණයේ, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ ජනාධිපතිවරණයේ, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ජනාධිපතිවරණයේ ප්‍රධාන සටන් පාඨය වුණේ, "විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා" කියන එකයි. ඇත්ත වශයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ පැරණි වම අවුරුදු ගණනාවක් තිස්සේ අරගෙන ගිය වැඩ පිළිවෙළේ උච්චතම අවස්ථාවට අද අප ඇවිත් තිබෙනවා. මම විශේෂයෙන්ම මතක් කරනවා, පසු ගිය ජනාධිපතිවරණයේදී දුන් ජන වරම අනුව අද රටේ ජනතාව මේ වෙනස බලාපොරොත්තු වන බව. මම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කියන්නේ, "අපි මේ මල් වට්ටියට අත ගහමු" කියලායි. මේ මල් වට්ටියට අත ගැහුවොත් අපේ රටේ මිනිස්සු "සාධු! සාධු!!" කියයි. [බාධා කිරීමක්] මන්ත්‍රීවරුන්ට ප්‍රශ්න තිබෙන එක ඇත්ත. නැහැ කියලා මම කියන්නේ නැහැ. නමුත්, මේක ජාතික මට්ටමේ ක්‍රියාදාමයක්. පෞද්ගලික ප්‍රශ්න තිබුණා කියලා මේ ජාතික මට්ටමේ ක්‍රියාදාමයකට අවහිර කරන එක සුදුසු නැහැ කියලා මා විශ්වාස කරනවා. ඒකයි මා කියන්නේ. මේක ඓතිහාසික තත්ත්වයකට පත්වන අවස්ථාවක්. "අපි සියලු දෙනාම මේ මල් වට්ටියට අත ගහලා, මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඒකච්ඡන්දයෙන් සම්මත කරමු" කියන පණිවුඩය තමයි මම මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නේ. [බාධා කිරීමක්] මීට වඩා බලතල සහිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පතක් අප ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපට ඕනෑ වුණේ විධායක ජනාධිපතිතුමාගේ බලතල පාර්ලිමේන්තුවට ලබා ගන්නයි. ඒ බලතල රනිල් වික්‍රමසිංහට නොවෙයි, පාර්ලිමේන්තුවටයි. අප උත්සාහ කළේ පාර්ලිමේන්තුවට ඒ බලය ලබා ගන්නයි. නමුත්, අපේ අවාසනාවට ශ්‍රේෂ්ඨාධිකරණය එම පනත් කෙටුම්පතේ යම් යම් වගන්ති ඉවත් කර තිබෙනවා. ඉතින් මේ වෙලාවේ අප කරන්නේ මේ වෙලාවේ කරන්න පුළුවන් දේ. Politics is the art of the possible. අපට මීට වඩා කරන්න දෙයක් නැහැ.

ශ්‍රේෂ්ඨාධිකරණයෙන් පිළිගත් සංශෝධන අනුව ජනාධිපතිතුමාට අගමැතිතුමාගේ උපදෙස් අනුව කටයුතු කරන්න සිද්ධ වනවා. එතකොට අගමැතිතුමා කියන්නේ පාර්ලිමේන්තුව. එතුමා තමයි පාර්ලිමේන්තුවේ බහුතරය නියෝජනය කරන්නේ. අගමැතිතුමාගේ උපදෙස් අනුව වැඩ කරනවා කියන්නේ, පාර්ලිමේන්තුවේ උපදෙස් අනුව වැඩ කරනවා කියන එකයි.

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

ඊළඟට ස්වාධීන කොමිෂන් සභා ගැන මම කියන්නම්. වාසුදේව නානායක්කාර හිටපු ඇමතිතුමා ඊයේ කිව්වා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පාර්ලිමේන්තුවට වග කියන්නේ නැහැ කියලා. මම එතුමාට උත්තරයක් දෙන්න කැමැතියි. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තුළ අගමැතිතුමාත් ඉන්නවා; කථානායකතුමාත් ඉන්නවා; විපක්ෂ නායකතුමාත් ඉන්නවා; ජනාධිපතිතුමාගේ නියෝජිතයෙකුත් ඉන්නවා. ඒ අය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තුළ සිටීමෙන් පාර්ලිමේන්තුවේ අවශ්‍යතාව ඉෂ්ට වනවා කියලා මා විශ්වාස කරනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
සුළුතරය.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ සභාවේ අගමැතිතුමා ඉන්නවා නම්, කථානායකතුමා ඉන්නවා නම්, විපක්ෂ නායකතුමා ඉන්නවා නම් පාර්ලිමේන්තුවේ මතය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තුළ අරගෙන යන්න පුළුවන් වාතාවරණයක් තිබෙනවා කියන එකයි මම කියන්නේ.

ඒ වාගේම මම කියන්න ඕනෑ, the Constitutional Council will make rules and those rules will be gazetted and placed before Parliament. ඒගොල්ලන් නීති රීති හදලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ. මම හිතන විධියට 2001 ඉදිරිපත් කළ දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අපි දෙගොල්ලන්ම ඡන්දය දුන්නා. අපි දෙගොල්ලන්ම ඡන්දය දුන්නා කියලා මට මතකයි. ගරු කථානායකතුමා ඡන්දය පාවිච්චි කළේ නැහැ. ජාතික හෙළ උරුමය ඡන්දය පාවිච්චි කළේ නැහැ. මන්ත්‍රීවරු 223 දෙනෙක් ඒ සංශෝධනයට ඡන්දය දුන්නා. එදා තමුන්නාන්සේලායි අපියි එකතු වෙලා ඒ විධියට ඡන්දය දුන්නා නම් අද දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නරක් වෙන්නේ කොහොමද? අපි දෙගොල්ලන්ම ඡන්දය දුන්නා. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හැදුවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය තමයි දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නිර්මාණය කළේ, අපි නොවෙයි. තමුන්නාන්සේලා ඒක අහෝසි කළාට පස්සේ අපි එහි වටිනාකම තේරුම් ගත්තා. තමුන්නාන්සේලා තමයි දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හැදුවේ. මට මතකයි, එදා පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමාත්, ජාතික හෙළ උරුමය පක්ෂයත් හැරෙන්න අනෙක් සියලු දෙනාම ඒකට පක්ෂව ඡන්දය දුන්නා. ඉතින් මම කියන්නේ මේ ඉතිහාසගත වන අවස්ථාව පැහැර හරින්න එපා කියන එකයි. අපි ඒකමතිකව මේ සංශෝධනය සම්මත කර ගනිමු. මේ මල් වට්ටියට අත ගැහුවොත් තමුන්නාන්සේලාටත් විශාල ගෞරවයක් ලැබෙනවා.

ඒ වාගේම අපේ හිතවත් ගරු ජෝන් සෙනෙවිරත්න හිටපු ඇමතිතුමා මැතිවරණ ක්‍රමය ගැන කිව්වා. දැන් මැතිවරණ ක්‍රමය ගැන යම්කිසි එකඟතාවක් තිබෙනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමන්ලා කැමැතිද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒක තමයි මම කිව්වේ, පැහැදිලි එකඟතාවක් තිබෙනවා කියලා. මනාප ක්‍රමය වෙනස් වෙන්න ඕනෑ කියන මතයේ අපි ඉන්නවා. ක්‍රම ගණනාවක් තිබෙනවා. නමුත් මොන ක්‍රමයද පිළිගන්නේ කියන එකයි, ඇත්ත වශයෙන්ම ප්‍රශ්නය. මනාප ක්‍රමය නැති කරන්න ඕනෑ කියලා මම පිළිගන්නවා. මන්ත්‍රීවරයකුට කොට්ඨාසයක් තියෙන්න ඕනෑ. පසු ගිය ජනාධිපතිවරණයේදී මහනුවර දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාස 11ක් අපි දිනුවා. අපි වැඩි ඡන්ද 88,000කින් දිනුවා. [බාධා කිරීමක්] නැහැ. එහෙම තත්ත්වයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තව එක කාරණයක් කියන්න ඕනෑ. මේ මැතිවරණ ක්‍රමය හදන්න පුළුවන්. නමුත් ඒ ක්‍රමය හැම දේශපාලන පක්ෂයක්ම පිළිගන්නා විධියට තියෙන්න ඕනෑ. ඒකයි කරන්න බැරි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ හිතවත් ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා අවුරුදු 13ක් මැතිවරණ ප්‍රතිසංස්කරණ පිළිබඳ විශේෂ කාරක සභාවේ සභාපති හැටියට හිටියා. ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා තමයි කිව්වේ, මැතිවරණ ප්‍රතිසංස්කරණ ඕනෑ කියලා. 2002 දී ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා මැතිවරණ ප්‍රතිසංස්කරණ පිළිබඳ විශේෂ කාරක සභාවේ සභාපති හැටියට පත් කළේ එතුමායි. එක්සත් ජාතික පක්ෂයේ අපියි එතුමාව පත් කළේ. මැතිවරණ ප්‍රතිසංස්කරණ ඕනෑ කියලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කිව්වේ නැහැ. 2002 ආණ්ඩුව කාලයේ එක්සත් ජාතික පක්ෂය තමයි මේ කමිටුවට ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාව පත් කළේ. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා අවුරුදු 13ක් ඒ කමිටුවේ සභාපති හැටියට හිටියා. ඔබතුමන්ලාට තුනෙන් දෙකේ බලයත් තිබුණා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මෙතැන මගේ ආසනය නොවෙයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කමක් නැහැ, කමක් නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම අවුරුදු 13ක් ඒ කමිටුවේ සභාපතිවරයා හැටියට කටයුතු කළේ නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කොහොම හරි, ඒ කමිටුව තිබුණා නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කමිටුව තිබුණා, අවුරුදු හතරක්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
හරි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ කමිටුවේ ගරු ජෝශප් මයිකල් පෙරේරා මැතිතුමා එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් විශාල සේවාවක් කළා. [බාධා කිරීමක්] මම කියන එක අහන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම ඔබතුමාගේ සේවය අගය කරනවා. [බාධා කිරීමක්] නමුත් මම කියන්නේ තමුන්නාන්සේලාට තුනෙන් දෙකේ බලයක් තිබිලාත් මේ මැතිවරණ ක්‍රමය වෙනස් කරන්න දේශපාලන වුවමනාවක් තිබුණේ නැහැයි කියන එකයි. ඒක නේ ඇත්ත.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපි පළාත් පාලන මැතිවරණ ක්‍රමය වෙනස් කළා. ඒ පනත ගෙනාවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒක ක්‍රියාත්මක වුණේ නැහැ නේ. [බාධා කිරීම්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නීතිය සම්පාදනය කළා. ක්‍රියාත්මක කරන්න බැරි වුණේ, - [බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නැහැ, තමුන්නාන්සේලාගේ පක්ෂයේ ඉන්න ජ්‍යෙෂ්ඨ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු කිව්වා, ඒක ක්‍රියාත්මක කරන්න එපා කියලා. ඒක නේ වුණේ. [බාධා කිරීම්] ඒ පනත ක්‍රියාත්මක කරන්න ප්‍රාදේශීය සභාවල ඉන්න නායකයන්ට ඕනෑ වුණේ නැහැ. කෙසේ වෙතත් එදා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කැබිනට් මණ්ඩලයට පත්‍රිකාවක් ඉදිරිපත් කළා. ඒ නිසා මැතිවරණ ක්‍රමයේ සංශෝධනයක් ගැන අපි වපර ඇහින් බලන්නේ නැහැ.

මා කලින් කිව්වා වාගේ, මැතිවරණ ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් කෙරුවේ අපි. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාව එම කාරක සභාවේ සභාපති හැටියට පත් කෙරුවේ අපි. අපටයි මේ ප්‍රතිසංස්කරණය ඕනෑ වෙලා තිබුණේ. එම නිසා මැතිවරණ ක්‍රමයක් සකස් කිරීමේ දී අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා. එහෙමනම් මෙම දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත හරහා පාර්ලිමේන්තුවට බලය ලබා දෙන විට ඇයි විරුද්ධ වන්නේ? පාර්ලිමේන්තුවට යම් කිසි බලයක් ගන්නයි මේ සැරසෙන්නේ. මීට වඩා බලතල පාර්ලිමේන්තුවට ලැබෙන්න ඕනෑ. අපි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට, පාර්ලිමේන්තුවට බලය දෙන විට ඇයි විරුද්ධ වන්නේ? මෙම දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත අප සියලු දෙනාගේම සහයෝගය ඇතිව සම්මත කරලා, ජනතාවගේ ආශීර්වාදය ලබා ගෙන අලුත් ශ්‍රී ලංකාවක් බිහි කරන්න අපට ශක්තිය, ධෛර්ය ලැබේවා! කියා මම ප්‍රාර්ථනා කරනවා.

[10.56 a.m.]

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Mr. Deputy Speaker, I thank you for giving me this opportunity to speak on this Bill, the most important of all Constitutional amendments, I believe.

Five years ago, on the 8th of September, 2010, the lot fell on me to open the Debate for the Opposition on the Eighteenth Amendment and I remember the words that I spoke then. I said, "Within six months of me coming into Parliament, I am confronted with this Bill, which was a final nail on the coffin in which democracy had been laid in this country for some time". On that day, I did not expect that another Bill like the Nineteenth Amendment would be presented to the same Parliament within the period of five years, within the same term of office as a Member of Parliament for myself, wherein that Amendment would be repealed. So, this is indeed a momentous occasion, even personally for me, to speak on this Nineteenth Amendment.

One must place on record how this Amendment came to be. Many people are under a misapprehension that all of this started with the Presidential Election, from about November, last year. No, that is not true.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! Will an Hon. Member propose the Hon. Athauda Seneviratne to take the Chair?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I propose that the Hon. Athauda Seneviratne do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අතාවුද සෙනෙවිරත්න මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு,* பிரதிச் சபாநாயகர் அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* மாண்புமிகு அதாவுத செனெவிரத்ன அவர்கள் *தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. ATHAUDA SENEVIRATNE *took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. M.A. Sumanthiran, you may continue.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Thank you, Sir.

From the time the Eighteenth Amendment was passed, along with the passage of time, there was an agitation from all the progressive forces in this country to abolish the Eighteenth Amendment; to have it repealed.

The Minister, Hon. Karu Jayasuriya, would recall that there was a monthly movement after the Eighteenth Amendment was passed. Every month on that day there was a meeting. The Hon. Minister would also recall that

prior to that, when the Seventeenth Amendment and the Constitutional Council became non-functional, people took various efforts to get it moving; to get it working and the Hon. Minister, I remember, came to the Supreme Court every time the case with regard to the Constitutional Council came up. There were civil society leaders who were very concerned about the direction in which the country started moving since the Eighteenth Amendment and, most notably, the Venerable Maduluwawe Sobitha Thero who led a movement called the "National Movement for Social Justice" identified the Executive Presidential System as the root cause of this wrong direction in which the country was moving.

The Executive Presidential System is something that this country has been waiting to abolish for quite some time, from the early 1990s. The 1994 Election Manifesto of the PA Government and every election thereafter - as His Excellency the President enumerated yesterday when he spoke on this - everyone wanted to abolish the Executive Presidency and also they said they would, but when they came to office they did not do it.

President Maithripala Sirisena became the common Opposition Candidate after the agenda - if I might call it - of the democratic forces, progressive forces and the civil society of this country had all converged to identify two very important issues: one, the abolition of the Executive Presidency; and two, repeal of the Eighteenth Amendment to the Constitution and restore the independent commissions that were functioning under the Seventeenth Amendment. The Hon. Leader of the House just stated that when the Seventeenth Amendment was passed, 223 Members voted for that; no one voted against. That is the only Constitutional amendment approved by this House which did not have a single vote against it. Now, such an amendment that was widely accepted was thrown away by the Eighteenth Amendment. The whole movement for restoration of democracy was hinged on the abolition of the Executive Presidency. All the Left parties, I remember even last year at their party annual conventions, passed resolutions to abolish the Executive Presidency; to abolish it *in toto*. That is the wave that brought the common Opposition Candidate to the fore, and when he declared his candidacy he identified the Executive Presidential System as damaging and said "I will abolish it; I will bring back the Seventeenth Amendment and a few other things". Thereafter, when the Election Manifesto came out, it was stated that there was going to be a 100-Day Programme and whatever amendment to the Constitution that required a referendum in the process of abolition of the Executive Presidential System, will not be done. By that, it was very clear, what was being held out to the country was that whatever that did not require a referendum in the process of abolition of the Executive Presidency would be done within the 100 days. The 100 days passed a few days ago. Nevertheless, we have a Bill, an Amendment to the Constitution, before this House which identifies these two issues for which His Excellency got a very clear mandate from the country: one, abolish the Executive Presidential System as far as it is possible without a referendum; and two, restore the Constitutional Council and the Independent Commissions as they functioned under the Seventeenth Amendment.

The matter was sent to the Supreme Court. There were arguments in the Supreme Court that the Nineteenth Amendment affected the basic structure of the Constitution, because it was founded on the Executive being exclusively within the hands of the President; that the President was the sole repository of Executive Power. The Supreme Court said, "No, that is not the case". The Determination is available. They even cited Article 91 of the 1972 Constitution - our First Republican Constitution - which states, I quote:

> "The President shall be responsible to the National State Assembly for the due execution and performance of the powers and functions of his office under the Constitution and under other law, including the law for the time being relating to public security.",

which is almost identical to Article 42 of the Second Republican Constitution, which states, I quote:

> "The President shall be responsible to Parliament for the due exercise, performance and discharge of his powers, duties and functions under the Constitution and any written law, including the law for the time being relating to public security."

In fact, the words, "under other law," in the First Republican Constitution reads as "any written law" in the Second Republican Constitution. So, there was no change in the basic structure.

If, under the First Republican Constitution it was possible for the exercise of Executive Power of the State to be performed by the President on the advice of the Prime Minister - that is how the Government functioned between 1972 and 1978 - then, it is possible even under the Second Republican Constitution that we have today, for the exercise of country's Executive power to be performed by the President on the advice of the Prime Minister. That is the reason why in the Amendment to Article 43(2) states, "The President shall, on the advice of the Prime Minister, appoint from among Members of Parliament, Ministers to be in charge of the Ministries so determined" and two other Clauses where the phrase appears, "The President shall, on the advice of the Prime Minister" has been permitted by the Supreme Court to be passed without the necessity of a referendum.

The Supreme Court has struck down other provisions in the same Chapter, which envisaged the Prime Minister acting alone and the Court has said that cannot happen. But, it has specifically permitted the phrase, "The President shall, on the advice of the Prime Minister," at least in three places. And, that is a promise that has been held out to the people to make an amendment in the

direction of abolition of the Executive Presidency, to the extent that is permitted to be done without a referendum. So, it is before this House today for all of us to vote on; to do what the country wants us to do; a clear mandate that has been given on the first promise that the common Opposition Candidate and now the President, gave the people at the Election on the 8th of January, this year.

The question is: will this Parliament bow to the wishes of the people or will this Parliament, through a process of Committee Stage Amendments, seek to deny the people what has been promised and what has been held out in the gazetted Nineteenth Amendment to the Constitution that the Supreme Court has allowed to be enacted with only a two-thirds majority? I am asking this question because the Government does not have a majority in this House and using that as a ploy, there is a move to bring in Committee Stage amendments that negate the entire crux of reducing the executive power of the President, which the President himself wants to do, which the people of this country have mandated him to do. And, if the Parliament were to try that even today, that will be a serious violation by the Parliament on the mandate granted by the people.

The second issue of the Constitutional Council, as I said, this Parliament enacted it without a vote against it; of a Council of 10 members: three ex-officio, chaired by the Speaker, the Prime Minister, and the Leader of the Opposition. All other seven persons are supposed to be persons who are not members of a political party. To be a member of a political party is a disqualification. That was so in the Seventeenth Amendment. That is so in the Bill before us. On both occasions, the Supreme Court has permitted it. So, we have two Determinations of the Supreme Court spanning over a period of 15 years where the Supreme Court has said: "This can be enacted; this does not require a referendum" and we have promised the people that whatever that does not require a referendum will be enacted by this Parliament. There is a move to bring in Committee Stage Amendments that make the composition of the Constitutional Council to be Members of Parliament. It is a disqualification to be a member of a political party. And, Members on this side of the House are now propounding a theory that Members of Parliament who are necessarily members of political parties and politicians, most active politicians, should sit in the Constitutional Council. So, the whole process, the whole objective of depoliticizing this body will be totally lost.

So, Mr. Presiding Member, may I urge my Colleagues, the Hon. Members of this House, that these are too crucial issues that are before this House, today. You leave one of those out and you do not have a Nineteenth Amendment, you lose it. Without the "Advice" Clause that the Supreme Court has permitted and without the Constitutional Council being the composition that has been put in the draft Bill before us, it will be taking the people of this country for a ride; we might pass something that is totally hollow which has no content in it.

I urge the Members of this House not to practise that deceit on the people of this country who are very, very clear in their minds as to what they want. They want an abolition of the Executive Presidential System. Well, if that cannot be done totally without a referendum, do it as much as possible up to the referendum, and nothing less. Restore the Independent Commissions through the process of a Constitutional Council that is depoliticized, that has no political influence. Therefore, I appeal to those who have been urging these Committee Stage Amendments through which you negate the whole exercise in which we were indulged in for the last two days, to desist from this and to act honourably and with good intent and pass the Nineteenth Amendment to the Constitution, which is eagerly awaited by all the people of this country.

Thank you very much

[පූ.භා. 11.15]

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා (ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)**

(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா - உள்நாட்ட லு வல்கள் அமைச்சர்)

(The Hon. M. Joseph Michael Perera - Minister of Home Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ජනතාවගේ බලාපොරොත්තුවක් ඉෂ්ට කරන්න අද මේ පාර්ලිමේන්තුව සූදානම් වන වෙලාවේ ඒ පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. මේ රටේ මහජනතාව ඉල්ලා සිටියේ එක්සත් ජාතික පක්ෂයේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා 1978 දී ඉදිරිපත් කරපු ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරලා, වෙනස් කරලා අලුත් වැඩ පිළිවෙළකට යන්න කියලායි. ඉතින් ඔක්කෝම කිව්වා වාගේ මෙය හිටපු ජනාධිපතිවරු, අපේක්ෂකයෝ සියලු දෙනාමත් ජනතාව ඉදිරියේ තැබූ විශාල බලාපොරොත්තුවක්. නමුත් අවාසනාවකට කිසිම කෙනෙකුට එය ඉෂ්ට කරන්නට බැරි වුණා. එය ඉෂ්ට කිරීමට බැරි වුණේ ජනතාවගේ තිබුණු බාධාවකින් නොවෙයි. එය ඉෂ්ට කිරීමට බැරි වුණේ ඒ හිටපු ජනාධිපතිවරුන්ගේ වරදිනුයි. කෙසේ වෙතත් අද අපේ ගරු මන්ත්‍රීතුමන්ලා සියලු දෙනාම කිව්වා වාගේ අපි මේ ඉෂ්ට කරන්න යන්නේ ජනතාවගේ බලාපොරොත්තුවක්, ජනතාවගේ ඉල්ලීමක්. අපි ඒක කරනවාද නැද්ද කියන එක මේ අවස්ථාවේදී මේ පාර්ලිමේන්තුවේ ඓතිහාසික වැදගත්කමකින් යුතු තීන්දුවක් වෙනවා.

ඒ ඉල්ලීම මොකක්ද? ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමාත් ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කළා. ඒ ගැන මම ඉතාමත්ම සතුටු වෙනවා. ජනාධිපතිවරයාගේ බලතල සම්පූර්ණයෙන් ඉවත් කිරීම, එහෙම නැත්නම් ජනාධිපති ක්‍රමය සම්පූර්ණයෙන් ඉවත් කිරීම. ඒ වාගේම ජනාධිපතිවරයාට තිබෙන විධායක බලය, අධික බලය ඉවත් කිරීම. මේ කාරණා දෙක තමයි ජනතාව ඉදිරියේ තැබුවේ. මත දෙකක් තිබුණා. එකක් ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම. අනෙක විධායක බලතල අඩු කිරීම. ඒ වාගේ වේලාවකදී අපි පිළිගන්න ඕනෑ, ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න පාර්ලිමේන්තුවට බැරි බව. නමුත් විධායක බලතල අඩු කරන්න පාර්ලිමේන්තුවට පුළුවන්.

[ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

අපිට බැඳීමක් තිබෙනවා. ඒ බැඳීම ප්‍රධාන වශයෙන් තිබෙන්නේ පාර්ලිමේන්තුවටයි. අපි හුඟ දෙනෙක් මේ කාරණය අමතක කරලා කථා කරනවා. මේ මන්ත්‍රීවරු 225 දෙනාට තමයි මේ ජනතාවගේ පැතුම ඉෂ්ට කරනවාද කියලා තීන්දුව ගන්නට තිබෙන්නේ. මේ ගැන බලද්දී ඒකපාක්ෂිකව මේ ගරු සභාවේ එක්කෙනෙක්, දෙන්නෙක් මේ කාරණයට විරුද්ධ වෙද්දී මේ මතය මුළු රටෙන්ම ආවා. එදා තිබුණු පාලන ක්‍රමය තුළින් අත් දැකපු අති භයානක සිද්ධීන්වලින් පීඩනයට පත් වුණු ජනතාව, ගරු මහා සංඝරත්නය, කතෝලික පූජකතුමන්ලා, විද්වතුන් දේශපාලන භේදයෙන් තොරව මහා විශාල වෙනසක් අවශ්‍යයි කියලා දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන එන්න ඕනෑ කියලා කිව්වා. එහි ප්‍රතිඵලයක් හැටියට දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා. දැන් මේ දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන්නේ මොනවාද, අපි ඒ අනුව ගමන් කරනවාද කියන එක හුඟක් වැදගත් වෙනවා.

මම හිතන්නේ එක අවස්ථාවකදී අපිට මතකයි, අපේ ගරුතර සෝභිත නායක ස්වාමීන් වහන්සේ කිව්වා "මොකුත් නොවෙයි අපිට ඕනෑ, දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගෙන ඒමයි" කියලා. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගෙනෙන්න ඕනෑ කියලා පළමුවෙන්ම කිව්වේ උන්වහන්සේයි. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ජනාධිපතිවරයාගේ විධායක බලය අඩු කළා. ඒක තමයි පැහැදිලිම තත්ත්වය. එතැනදී අපට ඉදිරියට යන්න බැරිව ගියා නොයෙක් නොයෙක් කරුණු නිසා. නමුත් දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඇති කළා. එය ගොඩාක් අයට ප්‍රයෝජනවත් වුණා. මැතිවරණ තිබුණා. ඒ මැතිවරණවලදී පොලීසිය සාධාරණ විධියට රාජකාරි කළා. මේ පාර්ලිමේන්තුවේදී බොහෝ දේවල් අපි අත්දැක්කා. ඒ වාගේම මට පුළුවන් වුණා එදා පිහිටු වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපති ලෙස වැඩ කටයුතු කරන්න, කථානායක හැටියට. එදා රජය වෙනුවෙන් අගමැතිතුමා, විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා, ජනාධිපති නියෝජිතයෙක් වශයෙන් පාර්ලිමේන්තුව එතැන නියෝජනය වුණා. හැම අංශයක්ම නියෝජනය වුණා. තමුන්නාන්සේලා මන්ත්‍රීවරු පිරිසක් පත් කරන්න කියන කොට, මම ඒකට එපා කියන්නේ නැහැ. ඒ වෙනුවට මුළු පාර්ලිමේන්තුවම නියෝජනය වන ක්‍රමයක් එදා සම්මත කර ගත්තා. විරුද්ධ පක්ෂය හැටියට විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා සිටියා. අගමැතිතුමා සිටියා. ජනාධිපතිතුමිය වෙනුවට එදා හිටියේ එච්.එල්. ද සිල්වා නීතිඥතුමා. ඉතින් අපි ආපසු කොතැනටද මේ යන්නේ පාර්ලිමේන්තුවේ තවත් මන්ත්‍රීවරු පස් දෙනෙක් පත් කරන්න කියලා? පාර්ලිමේන්තුව හැදිලා තිබෙන්නේ ආණ්ඩු පක්ෂයෙන් සහ විරුද්ධ පක්ෂයෙන්. ආණ්ඩුවේ නායකයා ලෙස අගමැතිතුමා ඉන්නවා. විරුද්ධ පක්ෂය වෙනුවෙන් විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා ඉන්නවා. එහෙම නම් අපි මොනවාද මේ අලුත් දේවල් ගැන කතා කරන්නේ? ගරු ජී.එල්. පීරිස් මැතිතුමනි, ඔබතුමා හෘද සාක්ෂියට එකඟව හිතපු අවස්ථා තිබෙනවා, වැඩ කරපු අවස්ථා තිබෙනවා. අපිට හිතන්න තිබෙන්නේ මුළු පාර්ලිමේන්තුවම එතැන නියෝජනය වුණා කියලායි. හැබැයි ඒ නියෝජනය වුණු වෙලාවේ අපි සියලු දෙනාම සුහදව වැඩ කළා. කිසිම අර්බුදයක් තිබුණේ නැහැ. එක් වතාවකදී විතරක් පොලිස්පතිවරයෙක් පත් කිරීමේදී ගැටලුවක් ආවා. එතැනදී ජනාධිපති මතයත්, අපේ මතයත් අතරේ වෙනසක් තිබුණා. නමුත් පුදුම බලයක් තිබුණා. ජනාධිපතිට ඕනෑ කරන කෙනෙක් පත් කරන්න බැහැ කියන ස්ථාවරය දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් වෙලා තිබුණා. ව්‍යවස්ථාදායක සභාවට ඕනෑ දෙයක් කරන්න බැහැ කියන කොටසත් දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් වෙලා තිබුණා. මේවා ගොඩාක් දෙනෙක් දන්නේ නැහැ. එහෙම නම් ජනාධිපතිවරයාගේ බලතල එදා අඩු වුණේ කොතැනින් ද? දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්.

මම සභාපති වශයෙන් හිටපු කාලයේ ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අපි වැඩ කළ ආකාරය පිළිබඳ වාර්තාවක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. ඕනෑම කෙනෙකුට ඒක බැලුවොත් තේරේවි ව්‍යවස්ථා සභාවක් වැඩ කරන්නේ කොයි විධියකටද කියලා. එතුමන්ලා වැඩ කරපු ක්‍රමය පාර්ලිමේන්තුවේ දැන ගැනීම සඳහා මේ පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කළා. අද වනතුරු මේ වැඩ පිළිවෙළට කිසිම කෙනෙක් විරුද්ධ වෙලා නැහැ. සුහදව වැඩ කළා. එදා රනිල් වික්‍රමසිංහ මහතා අගමැති හැටියට, මහින්ද රාජපක්ෂ මහතා විරුද්ධ පාර්ශ්වයේ නායකයා හැටියට අපි හුඟාක් සුහදව වැඩ කළා. එහෙම නම් දැන් අපි ඉන්නේ තවත් වැදගත් අවස්ථාවක. අගමැතිතුමාගේ උපදෙස් අනුව ඇමතිවරු පත් කිරීම සුදුසු නැහැ කියන ස්ථාවරයේ සමහර අය ඉන්නවා. ඒක හිතට එකඟව කරනවා ද, නැද්ද මම දන්නේ නැහැ. අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා දෙස බැලුවොත් ඒ ව්‍යවස්ථා සෑම එකකම තිබෙන්නේ කුමන වචන පාවිච්චි කළත්, "අගමැතිවරයාගේ උපදෙස් පරිදි" කියායි. රාජ ආණ්ඩුවක් තිබෙන වෙලාවේදීත් අගමැතිවරයාගේ උපදෙස් අනුව තමයි ඒ පත් කිරීම් කර තිබෙන්නේ. මම මේ කියන්නේ වැරදි මතයක් ගන්න එපා කියලායි. රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ උපදෙස් මත නොවෙයි, අගමැතිවරයාගේ උපදෙස් මතයි කටයුතු කරන්නේ.

අද ප්‍රශ්නයක් තිබෙනවා, පාර්ලිමේන්තුවේ බලය අපිට නැති වෙලාවේදී කොහොමද රනිල් වික්‍රමසිංහ මහතා අගමැති හැටියට පත් කරලා තිබෙන්නේ කියලා. ඒ කාගේවත් උපදෙස් නැතිව, ඒ අවසරය ගත්තේ ජනාධිපතිවරණයේ දී අතිගරු ජනාධිපතිතුමා විසිනුයි. මෙයත් ඓතිහාසික සිද්ධියක්. කාගේවත් උපදෙසක් නැතිව, "මෙන්න අපි වැඩ කරන හැටි" කියලා ඒ අවසරය ගත්තේ මේ රටේ ජනතාවගෙන්. අපේ ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා කිව්වා වාගේ එතුමා කිව්වා, "අපි මෙන්න මේ විධියටයි කරන්න යන්නේ, එයට අවසර ලබා දෙන්න" කියලා. ඒ අවසරය ලබා දුන්නා. අද ඉදිරිපත් කරන දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතේ සංශෝධනයන් ගැන තමුන්නාන්සේලාගේ අවධානය නැවත යොමු කරන්න. ජනතාව දෙන ලද තීන්දුව අපි වෙනස් කරනවාද? එහෙම නැතිනම්, රනිල් වික්‍රමසිංහ මහත්මයා නිසා මෙම පනත් කෙටුම්පතට විරුද්ධ වෙනවාද කියන තීන්දුව තමුන්නාන්සේලාට ගන්න වෙනවා. මෙම වැඩ පිළිවෙළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට දීලා තිබෙන කාල සීමාව අවසාන වී ගෙනයි එන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන් වෙනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙන් විනාඩි දෙකක කාලයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. මට ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. ප්‍රධාන වශයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ඉදිරි කටයුතු කරන වැඩ පිළිවෙළ - criterion එක - මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුයි. ඒ නිසා තමයි පාර්ලිමේන්තුවට වග කියනවා කියලා කියන්නේ. එය දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවා. හැම Commission එකකටම පත් කිරීම් කරනකොට සුදුසුකම් මොනවාද කියා ප්‍රසිද්ධ කරන එක, විනිශ්චයකාරවරු පත් කරන එක මේ හැම දෙයක්ම මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවා. අන්න ඒ පදනම අප සැලකිල්ලට ගත යුතු වෙනවා. තනි බලයක්-

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ඔබතුමාගෙන් දැන ගැනීමට කැමැතියි-

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මගේ කථාවට කාල වේලාව තිබෙනවා ද දන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මගේ කථාවට වෙලාව දෙනවාද? ගරු මන්ත්‍රීතුමාගේ වෙලාවෙන් දෙනවා නම්-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාගේ කථාවේදී ප්‍රකාශ කරන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මට ප්‍රශ්නයක් තිබෙනවා අහන්න.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මගේ කථාවේදී-[බාධා කිරීමක්] ඒක හරි. මගේ කථාව විනාඩියක්, දෙකක් හෝ අතරමඟදී නතර වුණොත් අපරාදේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
එහෙනම් කථා කරන්න.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
මම බලන්නේ, මට ලබා දීලා තිබෙන වෙලාව තුළ -

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
පසුව අහමු. තමුන්නාන්සේට පුළුවන් මා සමඟ එළියේදී කථා කරන්න. අපිට දැන් තිබෙන්නේ රටේ ජනතාව ලබා දුන්නු වරම අනුව, ඒ ජනතාව තුළ තිබෙන බලාපොරොත්තු ඉෂ්ට කරනවා ද නැද්ද කියන එකයි. එච්චරයි. ඒ කාරණා දෙක තමයි තිබෙන්නේ. ජනාධිපති ක්‍රමය වෙනස් කරන්න පාර්ලිමේන්තුවට බැරි නම්, විධායක බලතල ජනාධිපතිගෙන් අයින් කරන්න පාර්ලිමේන්තුවට බලය ලබා දෙන්න. අවසාන වශයෙන් මම කියන්නේ මෙයයි. ජනතාවගේ පරමාධිපත්‍ය බලය තිබෙන්නේ ජනාධිපතිතුමා ළඟවත්, අගමැතිතුමා ළඟවත්, වෙන කොහේවත් නොවෙයි, පාර්ලිමේන්තුවේයි. මේ හැම කෙනෙක්ම වග කිව යුත්තේ මේ පාර්ලිමේන්තුවටයි. මෙතැන නැති ජනාධිපතිවරයෙක්, මෙතැන ඉන්න අගමැතිවරයෙක් සම්බන්ධ වන්නේ කොහොමද කියන එක, කාගේ මතයක් එක්කද කියන එක අපට පැහැදිලි කර ගන්න තිබෙනවා. මෙපමණයි කරන්න තිබෙන්නේ, වෙන එකක් නොවෙයි. ඔබතුමාට ස්තුතියි.

[පූ.භා. 11.28]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අලුත් සංශෝධනයක් ගෙනෙන අවස්ථාවේදී ඒ පිළිබඳව යම් කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියන්නේ අපේ රටේ මූලික නීතිය. අපි එම ව්‍යවස්ථාව පිළි ගත්තත්, නැතත් අපි කවුරුත් එම මූලික නීතියට යටත්. පසු ගිය කාලය පුරාවටම මේ මූලික නීතියේ අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයටත්, ප්‍රජාතන්ත්‍රවාදයේ පැවැත්මටත් අතිශය හානිකර බලතල නිර්මාණය කර තිබුණා. විශේෂයෙන්ම විධායක ජනාධිපති ධුරය තුළින්. විධායක ජනාධිපති ධුරය නිර්මාණය කළ දවසේ සිටම ප්‍රගතිශීලී බලවේගය, වමේ ව්‍යාපාරය මෙම විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළ යුතුයි කියන ස්ථාවරයේ හිටියා. පසු ගිය කාලය පුරාවටම අපේ රටටත්, අපේ රටේ ජනතාවටත් එම ධුරය විසින් අත්පත් කොට තිබෙන විනාශය දෙස ජීවිත අත්දැකීමෙන් බැලුවත් මෙය අහෝසි කළ යුතු තනතුරක්. ඒ වාගේම ඒ තනතුරේ වාඩි වූ අය දේශපාලනයෙන් කුණු බක්කියට ඇතුළු වන ඉතිහාසය දෙස බැලුවත් ජනතාවට රටට පමණක් නොව එම පුටුවේ වාඩි වුණු අයටත් අහිතකර තත්ත්වයක් මෙම තනතුරෙන් නිර්මාණය කර දී තිබෙන බව පෙනෙනවා.

ඒ විතරක් නොවෙයි. පසු ගිය ජනාධිපතිවරණ පහෙන් ජයග්‍රහණය කරපු අපේක්ෂකයන් මෙම විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම පිළිබඳ එකඟතාවකට ඇවිත් තිබෙනවා. චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය දෙවතාවක්, මහින්ද රාජපක්ෂ මැතිතුමා දෙවතාවක්, වර්තමාන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා එක් වතාවක්; මේ පස් වතාවේම විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම පිළිබඳව යෝජනාවක් සාකච්ඡා වෙලා තිබෙනවා, ඒ සඳහා ජන වරමක් ලැබිලා තිබෙනවා.

විශේෂයෙන්ම 2015 ජනවාරි මාසයේ 08 වැනිදා මේ රටේ ජනතාව ලබා දීපු ජන වරමේ එක් ප්‍රධාන සංයුතියක් ඇතුළත්ව තිබුණා. ඒ මොකක්ද? පැවැති පාලනය අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කරමින්, මාධ්‍ය ආයතනවලට බෝම්බ ගසමින්, මාධ්‍යවේදීන් ඝාතනය කරමින්, සිවිල් පුරවැසියන්ගේ උද්ඝෝෂණවලට පහර දෙමින්, වෙඩි තබමින්, සූදු වැනි සංස්කෘතියක් නිර්මාණය කරමින්, කැබිනට් මණ්ඩලය පඹයන් බවට පත් කිරීම තුළින්, පාර්ලිමේන්තුව හුදු සිග්නල් කණුවලින් පිරුණු ආයතනයක් බවට පත් කිරීම තුළින් තනි පුද්ගලයකු මේ ව්‍යවස්ථාවෙන් ලැබී තිබෙන බලය මොන තරම් අයුතු ලෙස උපයෝගී කර ගන්නවාද කියන සාධකය ඕනෑවටත් වඩා වැඩියෙන් අපේ රටට ඔප්පු කර දුන්නා. ඒ නිසා තමයි පසු ගිය මැතිවරණ වේදිකාවේ මෙය ප්‍රබල සටන් පාඨයක් බවට පත් වුණේ. ජාතික ප්‍රශ්නය පිළිබඳ විවිධ ස්ථාවරයන් තිබෙන, ආර්ථිකය පිළිබඳව විවිධ ස්ථාවරයන් තිබෙන, දේශපාලන පැවැත්ම පිළිබඳ වෙනම ස්ථාවරයන් තිබෙන දේශපාලන පක්ෂ මේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම පිළිබඳවත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ප්‍රජාතන්ත්‍රවාදයත්, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා වූ ව්‍යූහයන් ගෙන ඒම පිළිබඳවත් එක් එක් ආකාරයෙන් එක වේදිකාවකට ගොඩ වීමට හේතු සාධක වුණේ එයයි.

අපි පක්ෂයක් ලෙස කිසි සේත්ම පිළිගන්නේ නැහැ, ව්‍යවස්ථාවේ ප්‍රතිසංස්කරණවලින් පමණක් රටේ ප්‍රජාතන්ත්‍රවාදය ඇති වේවි කියා. අදත් අපේ රටේ දණ්ඩ නීති සංග්‍රහය තිබෙනවා, අපරාධ නීති සංග්‍රහය තිබෙනවා, මුදල් විශුද්ධිකරණ පනත

[ගරු අනුර දිසානායක මහතා]

තිබෙනවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත තිබෙනවා. ඒ පනත් හරි ලෙස ක්‍රියාත්මක වනවා නම් අප රටේ අපරාධ අඩු වෙන්න ඕනෑ, හොරකම් අඩු වෙන්න ඕනෑ, වංචනිකයන්ට දඬුවම් දෙන්න ඕනෑ, ඔවුන් නීතිය හමුවට පැමිණෙන්න ඕනෑ. නමුත් අපේ රටේ නීති කොපමණ තිබුණත් ඒ නීති ක්‍රියාත්මක වීමේ අඩුවක් තිබෙනවා වාගේම මේ ඇති වී තිබෙන සමාජ ක්‍රමය තුළ ව්‍යවස්ථාවකින් පමණක් ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කළ හැකියි, ව්‍යවස්ථාවකින් පමණක් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ කළ හැකියි, තිබෙන ගැටලු ව්‍යවස්ථාවකින් පමණක් විසඳිය හැකියි කියා කිසි සේත්ම අපි විශ්වාස කරන්නේ නැහැ. ඒ සඳහා පුළුල් සමාජ ප්‍රතිසංස්කරණයක් අවශ්‍යයි. නීතිමය ප්‍රතිසංස්කරයකින් පමණක් මෙය විසඳා ගත හැකි වේවි කියා විශ්වාසයක් අප තුළ නැහැ. කෙසේ වුවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමේ දිශාවට අලුත් යෝජනා ගෙන එන එක, ව්‍යුහයන් ශක්තිමත් කිරීම වැදගත්. ඒ අර්ථයෙන් ගත්තාම දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වැදගත් සංශෝධනයක් බවට පත් වී තිබෙනවා. නමුත් මේ සංශෝධනය පසු ගිය 10 වැනිදා සහ 11 වැනිදා යන දෙදින තුළ පාර්ලිමේන්තුවේ සම්මත කර ගන්න බැරි වුණේ ඇයි? පසු ගිය 20 වැනිදා සහ 21 වැනිදා සම්මත කර ගන්න බැරි වුණේ ඇයි? මේ මොහොත වන විටත් විවිධ සංවාද, සාකච්ඡා මතු වෙමින් තිබෙන්නේ ඇයි? ඒ කිසිවක් මතු වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිසංස්කරණ ප්‍රජාතාන්ත්‍රීයකරණය කිරීමේ දිශාවෙන් නොවෙයි. ඇත්තටම දැන් සිදු වී තිබෙන්නේ මොකක්ද? මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය දේශපාලන බල අරගළයේ, ගැටුමේ ප්‍රකාශනයක් බවට පත් වී තිබෙනවා. වර්තමාන අග්‍රාමාත්‍යවරයා කල්පනා කරනවා, ඊළඟට ඔහුට ආණ්ඩුව ගොඩ නැඟිය හැකියි; ඒ ගොඩ නැඟෙන ආණ්ඩුවේ අග්‍රාමාත්‍යවරයා ඔහු බවට පත් විය හැකියි; ඒ අග්‍රමාත්‍යවරයාට මොන තරම් බලතල ප්‍රමාණයක් අත්පත් කර ගත යුතු ද; මොන තරම් බලතල ප්‍රමාණයක් රැක ගත යුතුද කියා. ඉන්න ජනාධිපතිවරයා කල්පනා කරන්නේ මොකක්ද? ඔහුගේ පක්ෂය තුළ අර්බුදයක් නිර්මාණය වෙලා තිබෙනවා; ප්‍රධාන කේන්ද්‍ර දෙකක් ගොඩ නැඟිලා තිබෙනවා; ඒ කේන්ද්‍ර දෙකට මුහුණ දෙන්න නම් තමන් සතු බලතල ආරක්ෂා කර ගත යුතුයි කියන ස්ථාවරයක ඔහු සිටිනවා.

ඒ නිසා මේ දියත් වෙමින් තිබෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව හෝ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයන් ශක්තිමත් කිරීම පිළිබඳව හෝ විවාදයක් නොවෙයි. තමන්ගේ බල වුවමනාවන් ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් තමයි මේ සාකච්ඡාව, මේ සංශෝධන අද මේ දියත් වෙලා තිබෙන්නේ. ඒක කිසිසේත්ම අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සංශෝධනය පිළිබඳව කෙරෙන සාකච්ඡාවකදී, යෝජනාවලදී සැලකිල්ලට භාජනය කළ යුතු කරුණක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කවුද ජනාධිපති වෙන්නේ, කවුද අගමැති වෙන්නේ, අගමැතිගේ බලය කොහොමද තහවුරු වෙන්නේ, ජනාධිපතිවරයාගේ බලතල කොහොමද තහවුරු වෙන්නේ, තමන්ගේ පක්ෂයේ බලය ආරක්ෂා කර ගන්න පුළුවන් වෙන්නේ කොහොමද, තමන්ගේ බලය ගත්තාට පසුව තමන්ගේ ආණ්ඩුව ආරක්ෂා කර ගන්නේ කොහොමද කියන සාධක නොවෙයි වැදගත් වෙන්නේ.

මේ ව්‍යවස්ථාව වඩාත් හොඳින් ප්‍රජාතාන්ත්‍රීය කර ගන්නේ කොහොමද? විශේෂයෙන්ම විධායක ජනාධිපතිවරු අපේ රටට අත්පත් කර දී තිබෙන්නේ අතිශය විනාශයක්. අපි ජීවිතවලින් වන්දි ගෙවා තිබෙනවා. අපි දේපළවලින් වන්දි ගෙවා තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදී සියලු අහුමුළු විනාශ කර විධායක ජනාධිපති ධුරය ක්‍රියාත්මක වෙලා තිබෙනවා. මේක වෙනස් කළ යුතු නැද්ද? නමුත් මේ සංශෝධනය විධායක ජනාධිපති ක්‍රමය පිළිබඳව තබා තිබෙන්නේ ඉතාමත් අඩු මැදිහත් වීමක්. ඒක තමයි ඇත්ත. ඒ මොකක්ද? මෙය සම්මත කර ගැනීමේදී පාර්ලිමේන්තුවේ තමන් සතුව තිබෙන තමන්ගේ බලය ආරක්ෂා කර ගැනීමට කේවල් කරන්න මෙවලමක් බවට අද මෙය පත් කර ගෙන තිබෙනවා. ඒක තමයි යථාර්ථය. ඒ නිසා මේ සංශෝධනයෙන් මේ රටේ ජනතාව අපේක්ෂා කරන ලද ප්‍රජාතන්ත්‍රවාදය දිශාවට ශක්තිමත් පියවරක් අවශ්‍ය ප්‍රමාණයට ලබා දීලා නැහැ. නමුත් "නිකම් ඉන්න මට අහල ගියත් ඇති", "උන්නු හැටියට මළා මදැයි" කියනවා වාගේ යම් ප්‍රතිසංස්කරණ ප්‍රමාණයක් තිබෙනවා. මේ සංශෝධනයෙන් ඒ ප්‍රතිසංස්කරණ හෝ සම්මත කර ගත යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විධායක ජනාධිපති ධුරය සතුව තිබුණු බලතල සැලකිය යුතු ප්‍රමාණයක්, කිසිවෙකුටත් අයිති නොවන පරිදි අයින් කළ යුතුව තිබුණා. එහෙම කරන්න ඕනෑ. විශේෂයෙන්ම පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය කිසිවෙකුටත් අයිති නැහැ. ඒක හොඳයි. ඒ වාගේම අප හිතනවා, අපේ රටේ කිසිම පුරවැසියෙකුට මුක්තිය ලබා දිය යුතු නැහැ. නමුත් මුක්තිය ඉවත් කිරීමේදී සැලකිය යුතු ප්‍රමාණයක් ආරක්ෂා කරගෙන තමයි මුක්තිය ඉවත් කොට තිබෙන්නේ. එය කිසිසේත්ම සාධාරණ නැහැ. සෑම පුරවැසියෙක්ම නීතිය ඉදිරියේ සමාන විය යුතුයි. ඔහු ජනාධිපතිවරයා ද, ඔහු අග්‍රාමාත්‍යවරයා ද, ඔහු ඇමතිවරයෙක් ද, ඔහු ගමේ සාමාන්‍ය පුරවැසියෙක් ද කියන එක නොවෙයි විය යුත්තේ. නීතිය ඉදිරියේ හැම පුරවැසියෙක්ම සමානයි කියන සිද්ධාන්තය මේ සංශෝධනය තුළින් සම්මත කර ගන්න අසමත් වෙලා තිබෙනවා. සමහර බලතල ප්‍රමාණයක් කිසිවෙකුට අයිති නොවී ඉවත් වී තිබෙනවා, සමහර බලතල ප්‍රමාණයක් පාර්ලිමේන්තුවට පැවරෙනවා; සමහර බලතල ප්‍රමාණයක් ස්වාධීන කොමිෂන් සභාවලට පැවරෙනවා; සමහර බලතල ප්‍රමාණයක් කැබිනට් මණ්ඩලයට පැවරෙනවා; සමහර බලතල ප්‍රමාණයක් අග්‍රාමාත්‍යවරයාට පැවරෙනවා; සමහර බලතල ප්‍රමාණයක් ජනාධිපතිවරයාට පැවරෙනවා. අපේ ස්ථාවරය හරි පැහැදිලියි.

වර්තමාන ජනාධිපතිවරයාට ජනවරමක් තිබෙනවා. ඒක අපි පිළි ගත යුතුයි. හැබැයි, ඒ ජනවරම ඇතුළත විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවාය කියන ජනවරමත් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ යෝජනාව වුණේ විධායක ජනාධිපති ක්‍රමය මුළුමනින්ම අහෝසි වෙන, එහෙත් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකෙන් පමණක් සම්මත කරගෙන ඉවත් කළ හැකි සියල්ල ඉවත් කිරීමයි. ඒක නේ යන්න තිබෙන සීමාව. ජනමත විචාරණයකට යන්න බැහැ. පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බලය උපයෝගී කොටගෙන විධායක ජනාධිපති ධුරයේ අහෝසි කළ හැකි සියලු දේ අහෝසි කළ යුතුව තිබුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, එක්සත් ජාතික පක්ෂයත් පාර්ලිමේන්තුවේදී මෙය සම්මත කර ගැනීමේදී වැදගත් කාර්ය භාරයක් හොබවනවා. ඒ නිසා ඔවුන් අතර වැදගත් සාකච්ඡාවක් සිදු විය යුතුව තිබුණේ විධායක ජනාධිපති ධුරයේ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බලයෙන් ඉවත් කළ හැකි සියල්ල ඉවත් කිරීම වෙනුවෙනුයි. අනතුරුව සාකච්ඡාවක් පැවැත්විය යුතුව තිබුණා, වර්තමාන ජනාධිපතිවරයාට අන්තර්කාලීන විධිවිධාන යටතේ මොනවාද අයත් වෙන්නේ කියා. ඔහුට අවුරුදු පහක ධුර කාලයක් තිබෙනවා නම් ඔහුගේ ධුර කාලයට පමණක් සීමා වන පරිදි අන්තර්කාලීන විධිවිධාන හරහා ඔහුට ලබා දිය යුතු බලය ලබා දිය යුතුව තිබුණා. ඒක තමයි වැදගත් සංශෝධනය. ඒක තමයි අප විසින් ඉදිරිපත් කරපු සංශෝධනය. ඒක තමයි සාකච්ඡාවේදී දිගින් දිගටම අපි කිව්වේ.

පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බලයෙන් ඉවත් කළ හැකි සියලු බලය ඉවත් කරමු. හැබැයි, වර්තමාන ජනාධිපතිවරයාට පමණක් සීමා වන පරිදි බලතල ප්‍රමාණයක් ඒ අවුරුදු පහට පමණක් අන්තර්කාලීන බලතල යටතේ පවරමු. අවුරුදු පහ ඉවර වුණාට පසුව විධායක ජනාධිපති ධුරය කියන්නේ ඉතාමත් සීමිත බලතල ප්‍රමාණයක් සහිත බවට පත් වන, එය කිසිසේත්ම ජනාධිපතිවරණයක් හරහා තරගකොට කිසිසේත් බලය අත්පත්

කර ගත නොහැකි, එසේ අත්පත් කරගෙන වැඩක් නැති තත්ත්වයට පත් කළ යුතුයි කියන එකයි. නමුත් ඒ ප්‍රබුද්ධ සංශෝධන මෙහි නැහැ. මේ සංශෝධන බල පෙරළියක, බල ගැටුමක ප්‍රතිඵලයක්. බලය ආරක්ෂා කර ගැනීම වෙනුවෙනුත්, ගිලිහී යන බලය රැක ගැනීම වෙනුවෙනුත් ගෙනෙන ලද බල පොරයක ප්‍රතිඵලයක් බවට අද මෙය පත් වී තිබෙනවා. ඒ නිසා මේක විකෘති දරුවෙක්. ඒක ඇත්ත. මීට වඩා ප්‍රබුද්ධ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් අපේ පාර්ලිමේන්තුවට ගෙන ආ යුතුව තිබුණා. ව්‍යවස්ථාව පිළිබඳව මහා දැනුවත්, සමහර වියත් පුද්ගලයන් මේකෙදි සාකච්ඡාවට මැදිහත් වුණේ නව ව්‍යවස්ථාවක් ගොඩ නැගීම ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහය ශක්තිමත් කිරීමේ දිශාවෙන් නොවෙයි. තමන්ගේ දේශපාලන කෝණය දිශාවෙන් තමයි මැදිහත් වුණේ.

ව්‍යවස්ථා පිළිබඳ දැනුවත් මහාචාර්යවරු, ව්‍යවස්ථා පිළිබඳ විශ්වවිද්‍යාලවල උගන්වපු මහත්වරු, ව්‍යවස්ථා පිළිබඳව පොත් ලියපු මහත්වරු මේ පාර්ලිමේන්තුව ඇතුළේ හැසිරුණේ කොහොමද? ඔවුන් හැසිරුණේ වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී වූ ව්‍යවස්ථා සංශෝධනයක් කෙටුම්පත් කිරීම වෙනුවෙන් නොවෙයි; එය අවුල් කරන්නේ කොහොමද, එය කඩාකප්පල් කරන්නේ කොහොමද, මේ බල ගැටුමේ ප්‍රතිඵලයක් ලෙස තමන් නියෝජනය කරන බල කඳවුර ශක්තිමත් කර ගන්නේ කෙසේද කියලායි. ඔවුන්ට අනුව අපේ රටේ ව්‍යවස්ථාවක් සංශෝධනය විය යුත්තේද බල කඳවුරක, බල ගැටුමක වුවමනා වෙනුවෙනුයි. ඒ නිසා මේ සංශෝධනය මුළුමනින්ම බල ගැටුමක ප්‍රතිඵලයක් බවට පත් වී තිබෙනවා. නමුත්, විධායක ජනාධිපති ධුරය කෙසේ වෙතත් අනෙක් කරුණු පිළිබඳ යම් සාධනීය කරුණු ප්‍රමාණයක් මේ සංශෝධනයට ඇතුළත් කර ගන්න පුළුවන්කම ලැබුණා. හැබැයි, තමුන්නාන්සේලා දෙපාර්ශ්වය අතර එක ප්‍රශ්නයක දී ගැටුමක් ඇති වන්නේ නැහැ. ඒ මොකක්ද? මේ ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතේ තිබෙන හාස්‍යජනකම කරුණ තමයි, එළඹෙන ආණ්ඩුව ජාතික ආණ්ඩුවක් නම්, -ජාතික ආණ්ඩුවට අර්ථ කථනයක් දෙනවා- පළමුවැනියාට මන්ත්‍රී ධුර ගන්න සහ දෙවැනියාට මන්ත්‍රී ධුර ගන්න පක්ෂ දෙක එකතු වෙලා ආණ්ඩුවක් හදනවා නම් අමාත්‍ය ධුර සංඛ්‍යාව, ඇමතිවරු 45යි; රාජ්‍ය සහ නියෝජ්‍ය ඇමතිවරු 55යි. නමුත් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතේ තිබෙන්නේ, ඇමතිවරු 30යි; රාජ්‍ය සහ නියෝජ්‍ය ඇමතිවරු 40යි කියලායි. නමුත්, එළඹෙන ආණ්ඩුව ජාතික ආණ්ඩුවක් නම්, -පළමුවැනියාට සහ දෙවැනියාට මන්ත්‍රී ධුර ගන්න පක්ෂ දෙක එකතු වෙලා ආණ්ඩුවක් හදනවා නම්- ඇමති ධුර 45යි; නියෝජ්‍ය සහ රාජ්‍ය ඇමති ධුර 55යි. නියෝජ්‍ය අගමැතිවරයෙකුත් හැදෙනවා.

එහෙම ව්‍යවස්ථා හදනවාද? හැබැයි, ඒකට කවුරුවත් කට හොල්ලන්නේ නැහැ. ඇයි ඒ? එක් කෙනෙක් හිතා ගෙන ඉන්නවා, පළමුවැනියා වුණොත් තමන් අගමැති; දෙවැනියා වුණොත් නියෝජ්‍ය අගමැති කියා. මේ පැත්තේ කෙනා එහෙම කල්පනා කරනවා. ඒක ගැන සංවාදයක් මෙතැන නැහැ. ඇමති ධුර සංඛ්‍යාව 45ට වැඩි වුණොත්, එකතු වෙලා කොහොමද මට ඇමතිකමක් ලැබේද, නැද්ද කියලා කල්පනා කරනවා. මෙහෙම ව්‍යවස්ථා හදනවාද? එළඹෙන ආණ්ඩුව ජාතික ආණ්ඩුවක් නම්, දැන් ව්‍යවස්ථාව හැදෙන්න ඕනෑකම තිබෙන්නේ අමාත්‍ය ධුර මෙච්චරයි, නියෝජ්‍ය අමාත්‍ය ධුර මෙච්චරයි කියලායි. ඒක සංඛ්‍යාත්මකව කීයද කියලා ගැටලුවක් අපට තිබෙන්න පුළුවන්. ඒක සංවාද කරන්න පුළුවන්. හැබැයි, එළඹෙන ආණ්ඩුවට පමණක් එහෙම දමා ගන්නේ ඇයි? එළඹෙන ආණ්ඩුවේ කෙනෙක් කල්පනා කරයි, "මම අගමැති වෙයි; එයා අගමැති වුණොත් මට නියෝජ්‍ය අගමැති වෙන්න වෙයි. එළඹෙන ආණ්ඩුවේ ඇමති ධුරයක් මට ලැබෙයි. එහෙම ගන්න නම් ඇමති ධුර 45ක් තියා ගන්න වෙයි." කියා. එහෙම පාර්ලිමේන්තුවක්නේ මේ. මෙහෙම ව්‍යවස්ථා සංශෝධන හදනවාද? තමන්ගේ බල අරමුණු ඉලක්ක කර ගෙන මේ ව්‍යවස්ථා සංශෝධනය සකස් කර තිබෙනවා. එය අපේ රටේ ප්‍රබුද්ධ ව්‍යවස්ථා සංශෝධනයක් සඳහා වූ ගමනට බාධාවක් බවට පත් වෙලා තිබෙනවා.

මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතෙන්, ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කරන ලද හා ජනාධිපතිවරයාට අසීමිත බලතල පවරා ගන්නා ලද දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉවත් කරලා යම් ප්‍රජාතන්ත්‍රවාදී තැනකට පියවරක් තබා තිබෙන එක හොඳයි. නමුත්, ඒකත් හැකිලීම සඳහා තවමත් ලොබියේ සාකච්ඡාවක් පවතිනවා. එළියේ තිබෙන සාකච්ඡාව මේ ගරු සභාවේ තිබෙන සාකච්ඡාව නොවෙයි. එළියේ තිබෙන්නේ, අර කැල්ල ගලවන්නේ කොහොමද, මේ කැල්ල ගලවන්නේ කොහොමද, මේ කැල්ල අමුණන්නේ කොහොමද, මේ කැල්ලෙන් මෙයා බේරා ගන්නේ කොහොමද, මේ කැල්ලෙන් අරයා ආරක්ෂා කර ගන්නේ කොහොමද කියලායි. මෙහෙමද ව්‍යවස්ථා හදන්නේ? කෙනෙක්ව ඔළුවේ හදා ගන්නවා. ඔළුවේ ඉන්න චිත්‍රවලට අනුව ව්‍යවස්ථා හැදෙනවා. එසේ නොවී මේ සංශෝධනය මීට වඩා ප්‍රබුද්ධ සංශෝධනයක් බවට මේ පාර්ලිමේන්තුවේ පත් කර ගන්න ඉඩකඩ තිබුණා. විවිධ බල ගැටුමක ප්‍රතිඵලයක් ලෙස ඒ ඉඩකඩ ඇහිරිලා තිබෙනවා. ඒ වාගේම සමහර අය කල්පනා කරනවා, මේ ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ දී කිසි සේත්ම සම්මත වීමට ඉඩකඩ ලබා නොදිය යුතුයි කියලා. මේ සංශෝධන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත වුණොත් පාර්ලිමේන්තුවේ යම් ස්ථාවරභාවයක් ඇති වුණා කියලා රටට චිත්‍රයක් එනවා. ඒ චිත්‍රය ඒ ගොල්ලන්ට හිතකර නැහැ. ඒ ගොල්ලන්ගේ දේශපාලන ව්‍යාපෘතිය ගොඩ නඟලා තිබෙන්නේ අරාජිකත්වයක් නිර්මාණය වෙන්න ඕනෑ; කිසිවක් කර ගන්න බැරි තත්ත්වයට පත් වෙන්න ඕනෑ; පාර්ලිමේන්තුව කැඳවන්න බැරි තත්ත්වයකට පත් වෙන්න ඕනෑ; පාර්ලිමේන්තුවේ එළිවන තුරු බුදියන තත්ත්වයක් පත් කරලා තිබෙන්න ඕනෑ කියලායි. ඒ අරාජිකත්වයෙන් රට මුදා ගැනීම සඳහා හිටපු නායකයා යළි කැඳවන්න ඕනෑ කියලා ඔවුන් කල්පනා කරනවා. ඒ නිසා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව ඇති වුණු සාකච්ඡාව ප්‍රජාතන්ත්‍රවාදය දිශාවටත්, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමේ දිශාවටත් වෙනුවට තමන්ගේ බල කඳවුරු ශක්තිමත් කිරීමේ දිශාවට තම වුවමනා මෙම සංශෝධන පනත් කෙටුම්පතට ඇතුළත් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි එක කාලයක විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම පිළිබඳව විශාල සටන්වල නිරත වුණු අය. ඔබතුමාත් වමේ නායකයෙක් හැටියට එම සටන්වල නිරත වුණා. අපි කවුරුත් ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පෙනී සිටි අය. ඒ වෙනුවෙන් අරගළයක් තිබුණා. සටනක් තිබුණා. ඒ නිසා මේ පාර්ලිමේන්තුව අවම වශයෙන් හෝ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ මේ දරලා තිබෙන උත්සාහය, මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කිසි සේත්ම කඩාකප්පල් කරන්න, නතර කරන්න ඉඩ නොදී අපි හැම දෙනාගේම සහයෙන් මේ පනත් කෙටුම්පත සම්මත කර ගැනීම සඳහා උපරිම උත්සාහයක් දැරිය යුතුයි කියන අදහස ඉදිරිපත් කරමින් මා නතර වනවා. බොහොම ස්තුතියි.

[පූ.භා.11.43]

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதார மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health and Indigenous Medicine)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලාසනය හොබවන අවස්ථාවක මට කථා කිරීමට ලැබීම ගැන මම ඉතාම සතුටු වෙනවා. ඒකට හේතුව මම කියන්නම්. 1978දී ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා මේ කුරිරු ව්‍යවස්ථාව ගෙනෙන වෙලාවේ එදා වාමාංශික එක්සත් පෙරමුණ විධියට ආචාර්ය එන්.එම්. පෙරේරා, දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ, පීටර් කේනමන්, ආචාර්ය කොල්වින්

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

ආර්. ද සිල්වා ඇතුළු පිරිස හයිඩ්පාර්ක් පිටියේ තිබෙන පාර අහුරාගෙන වාඩි වෙලා සිටියා. එදා මමත් තරුණ වෛද්‍යවරයෙක් විදියට එතුමන්ලා සමඟ එතැන වාඩි වුණා. තමුන්නාන්සේත් එදා එතැන හිටියා. අපි මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගෙන ඒමට විරුද්ධව පාරවල් අහුරාගෙන ටිකක් වෙලා ඉන්න විට අපට ආරංචි වුණා, ලේක්හවුස් මන්දිරය ළඟ ඉඳලා එන පෙළපාළියට නායකත්වය දුන්නු ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වාව අත් අඩංගුවට ගත්තා කියලා. එදා තමයි ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා කියන නීතිවේදියාව ලංකා ඉතිහාසයේ පළමුවෙනි වතාවට අත් අඩංගුවට ගත්තේ. එදා එතුමාව අත් අඩංගුවට ගත්තේ Slave Island පොලීසිය මඟිනුයි. ඒ එක්කම අපට ආරංචි වුණා, ඒ පෙළපාළියට නායකත්වය දුන්නු වාසුදේව නානායක්කාරට පොලීසියෙන් ගැහුවා කියලා. පළමුවෙනි වරට මන්ත්‍රීවරයෙකුට පහරදීම ඒ වෙලාවේ අපට ආරංචි වුණා. හරි නම් අද වාසුදේව නානායක්කාර මන්ත්‍රීවරයා මට වඩා ඉදිරියෙන් කර උර දීලා මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගැනීමට ලැහැස්ති වෙන්නට ඕනෑ. මේ අවසාන කාලයේදී ඒකට එහෙන් මෙහෙන් පොඩි පොඩි ඇණ මුරිච්චි ගහන්න හදලා, ඒකට විරුද්ධව කථා කරලා ද්‍රෝහියෙක් වෙන්නේ නැතිව, මේ ස්වර්ණමය අවස්ථාව අත් දෙකෙන්ම බදා ගත යුතු අවස්ථාවකයි එතුමා ඉන්නේ. ඒ වාගේම එදා තව ටිකක් දවල් වෙන විට අපට ආරංචි වුණා, පේරාදෙනිය හන්දියේ කළු කොඩි ඔසවපු ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න ඇතුළු පිරිසක් අත් අඩංගුවට ගත්තා කියලා. එතැන ආචාර්යවරුන් දෙදෙනෙක් හිටියා. මට අනෙක් කෙනාගේ නම මතක නැහැ. ඒ දෙදෙනාගේම ආචාර්ය පදවි අහෝසි වුණා. ඉංජිනේරු විද්‍යාව පිළිබඳ හදාරලා වික්‍රමබාහු කරුණාරත්නට ආචාර්ය පදවි දෙකක් තිබුණා. එදා එතුමාගේ රක්ෂාව නැති වුණා. ඒ රක්ෂාව ආයේ කවදාවත් ලැබුණේ නැහැ. දැන් මම ලැහැස්ති වන්නේ එතුමාගේ ලිපිලේඛන අරගෙන එතුමාට අපේ රජයෙන් හෝ යම් කිසි වන්දියක් ලබා දීමටයි.

ඊට පසුවත්අපි මේ විදියට විශාල කැප කිරීම් කී වාරයක් සිදු කළාද? විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්නට ගත් උත්සාහවලදී අපි කී වාරයක් කඳුළු ගෑස් ප්‍රහාරවලට ලක් වුණාද? අපි කී වාරයක් baton chargeවලට ලක් වුණාද? මේ ගරු සභාවේ සිටින ගරු තිස්ස විතාරණ මන්ත්‍රීතුමා දන්නවා, මේ විධායක ජනාධිපති ක්‍රමය වෙනස් කර ගන්නට ගිහිල්ලා අපි කී තැනක පෙළපාළි ගියාද, කී වාරයක් ගුටි කෑවාද, කී තැනකදී කඳුළු ගෑස් ප්‍රහාරවලට ලක් වුණාද කියලා. එදා ඒ අරගලවලට සහභාගි වුණු ගරු ඩිව් ගුණසේකර මන්ත්‍රීතුමන්ලා, ගරු තිස්ස විතාරණ මන්ත්‍රීතුමන්ලා අද මේ සභාවේ අපත් සමඟ ඉඳීම ගැන අපි සන්තෝෂ වෙනවා. එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වඩා ඉදිරියෙන් සටන්කාමීව අපි මේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරෝධය පළ කළා. එදා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන ආචාර්ය එන්.එම්. පෙරේරා සහෝදරයා වෙනම පොතක් ලිව්වා. ඒ පොතේ ලිව්වා, මේ ව්‍යවස්ථාව යටතේ යම් කිසි දවසක පිස්සෙක්, මානසික ආතතියක් ඇති පුද්ගලයෙක් ජනාධිපති වුණොත් එදාට මොකක්ද සිද්ධ වෙන්නේ කියලා. එදා මෙදා තුර මේ වාමාංශික නායකයෝ ඇතුළු ප්‍රගතිශීලීන් සියලු දෙනාම හිටියේ එක ස්ථාවරයකයි.

බණ්ඩාරනායක මැතිනිය මිය යනතුරු එතුමිය කළ හැම කථාවකදීම ප්‍රකාශ කළේ, එතුමිය කළ හැම ක්‍රියාවකින්ම පෙන්නුම් කළේ, හැම මැතිවරණයකදීම පොරොන්දු වුණේ මේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්නටයි. ඉන් පසුව බලයට පත් වුණු චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්නට පොරොන්දු වුණා විතරක් නොවෙයි, 1994 ජූලි මාසයේ 31වෙනි දා වෙන විට දින වකවානුවක් ලබා දුන්නා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා කියලා. ඒ අනුව ජනතා විමුක්ති පෙරමුණේ ජනාධිපති අපේක්ෂක නිහාල් ගලප්පත්ති සහෝදරයා තරගයෙන් ඉවත් වෙලා එතුමියට ජයග්‍රහණය කරන්නට ඉඩ දුන්නා. එදා මහාචාර්ය ජී.එල්. පීරිස් මහත්මයලා මේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්නේ කොහොමද කිය කියා ඒ ගැන ලස්සන කථා පැවැත්වූවා. අද විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්නට නොවෙයි, ඒ බලතලවලින් කාලක් අඩු කරන්නට යන විට තමුන්නාන්සේලා තව න්‍යාය සූත්‍ර ගේනවා; නීති තර්ක ගෙනෙනවා. එදා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න කිව්ව මිනිස්සුයි මේ කථා කරන්නේ. මම දන්නේ නැහැ එතුමන්ලා මේ කථා කරන්නේ කොහෙන්ද කියලා.

මේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්නට 2000දී යෝජනාවක් ගෙනාවා. ඒ යෝජනාව ගෙනාවේ ජී.එල්. පීරිස් මහත්මයායි. ඒ යෝජනාව ඇතුළට දා ගත්තා "අවුරුදු දෙකක" කථාවක්. එහෙම දාලා ඒ යෝජනාව විනාශ කර ගත්තා. ඒකට එක්සත් ජාතික පක්ෂයේ තිබුණු එකඟතාව නැති කර ගත්තා. ඒ එකඟතාව නැති කර ගත්තේ තුට්ටු දෙකේ දේශපාලනය ඒක අස්සට රිංගවූ නිසායි. ඒකට වගන්ති රිංගවලා, 2000දී ඒ ලස්සන කටයුත්ත විනාශ කළා. එදා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් තුනෙන් දෙකක කැමැත්ත ගන්න තිබුණු ස්වර්ණමය අවස්ථාව නැති කර ගත්තා. එක අතකින් මම චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියට ස්තුතිවන්ත වෙනවා, 2000දී එවැනි යෝජනාවක් හෝ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා ඒ සඳහා උත්සාහ කිරීම ගැන. නමුත් එතුමිය ඒ යෝජනාව හකුළා ගත්තා. මොකද, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් තුනෙන් දෙකක බහුතර කැමැත්තක් නැති නිසා; පරාජයවීමට තිබුණු අකැමැත්ත නිසා.

ඊළඟට මහින්ද රාජපක්ෂ මහත්මයා මොකක්ද කළේ? එතුමාගේ කණ්ඩායම්වල ඉන්න මන්ත්‍රීවරුන් කථා කරන දේවල් ගැන මට පුදුමයි. එතුමා සමඟ උරෙන් උර ගැටිලා පාද යාත්‍රා ගිය මිනිහා මම. දවස් 18ම එතුමා සමඟ ඇවිද්දේ මමයි, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමායි, මහින්ද අබේකෝන් මහතායි විතරයි. මුළු දවස් 18ම නොනවත්වා ඒ පාද යාත්‍රාවේ එතුමා සමඟ ගමන් කළේ අපි තුන් දෙනා විතරයි. ඒ සඳහා අවශ්‍ය සියලුම මුදල් මම වියදම් කළා. එදා එහෙම කරපු අපගේ පළමුවන සටන් පාඨය වුණේ මොකක්ද? "විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරමු" කියන එක තමයි සටන් පාඨය. අපි මිනිස් දම්වැල් ගියා, රත්නපුරයේ සමන් දේවාලයට "විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරමු" කියලා. අපි ශබ්ද ඝෝෂා නැඟුවා. ලතින් ඇමෙරිකාවේ සටන් ක්‍රම ගෙනැල්ලා අපි ශබ්ද ඝෝෂා නැඟුවා. මොකක්ද අපේ පළමුවන සටන් පාඨය? "විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරමු" කියන එකයි සටන් පාඨය. මහින්ද රාජපක්ෂ මහත්මයා 2005දී ගෙනාවා ඒ යෝජනාව. නමුත් ඉටු කළේ නැහැ. එදා ඒක කරන්න බැරි වුණා යුද්ධය නිසා. යුද්ධය අවසන් කළාට පස්සේ මම කිව්වා, දැන් මේ යෝජනා ඉෂ්ට කරමු කියලා. නමුත් එතුමා කැමැති වුණේ නැහැ. 2010 ඉඳලා විධායක ජනාධිපති ක්‍රමය ශක්තිමත් කිරීම දක්වා ගිහින් එතුමා ජරාජීර්ණ වෙලා ඉතිහාසයේ කුණු බක්කියට යන්න කටයුතු ලෑස්ති කරගත්තා.

එදා, ඊඩන් හෝටලයේදී, මේ මහාචාර්ය ජී.එල්. පීරිස් මහත්මයා විධායක ජනාධිපති ක්‍රමයේ බලතල වැඩි කරන්න ඕනෑය කියන කොට, ඒ සඳහා වූ යෝජනා ගෙනෙන කොට මමත්, වාසුදේව නානායක්කාර ඇතුළු පිරිසත් ඒකට විරුද්ධව පැහැදිලිව සටන් කළා. අපි කිව්වා,"මේ වැඩේ කරන්න එපා. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න ඕනෑ. ජේ.ආර්. ජයවර්ධන වාගේ ඔබත් ඉතිහාසයේ කුණු බක්කියට දමන්න මේ අය හදනවා. එදා යූඑන්පී එකේ මන්ත්‍රීවරු ජේ.ආර්. ඉතිහාසයේ කුණු බක්කියට ගෙනාවා වාගේ මෙතැන සිටින අය තමුන්නාන්සේත් -මහින්ද රාජපක්ෂත්- ඉතිහාසයේ කුණු බක්කියට ගෙන යන්න හදනවා. මේකට රැවටෙන්න එපා." කියලා. එදා ඒ කථාව කරලා එළියට ආවාම එතුමා මටත්, වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාටත් කිව්වා, "රාජිත, අපි කොළඹට ගිහිල්ලා, දෙමළ මිනිසුන්ට කථා කරලා, දෙන දෙයක් දීලා, සති දෙකක් ඇතුළත මේ ඉතිරි වැඩ ටික කරමු." කියලා. නමුත් ඒ සති දෙක කවදාවත් ආවේ නැහැ. අපි, මේ ක්‍රමය අහෝසි කරන්න දායකත්වය දීපු මිනිස්සු.

එක්සත් ජාතික පක්ෂය 1999දී තමයි මේ ප්‍රතිපත්තියට ආවේ. එදා මම තමයි රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ හිතත් හදාගෙන, අපේ පක්ෂයේ නායකයාගේ ඒ යෝජනාව -දැනටත් තමුන්නාන්සේලාගේ පක්ෂයේ නායකයා- හම්බන්තොට සම්මේලනයට ගෙනෙන්න මූලික වෙලා සම්පූර්ණ දායකත්වය ලබා දුන්නේ. කොයි පක්ෂයේ හිටියත් අපි අපේ ප්‍රතිපත්ති වෙනස් කළේ නැහැ. ඒක මතක තියාගන්න. ඒ නිසා මට අද ඉතාම සන්තෝෂයි. එදා 1978දී විධායක ජනාධිපති ක්‍රමයට විරුද්ධව බිම වාඩි වෙන කොට මම කවදාවත් හිතුවේ නැහැ, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන දවසක පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු විධියට මට එයට දායකත්වය ලබා දෙන්න පුළුවන් වෙයි කියලා.

තමුන්නාන්සේලා අද මෙහිදී නොයෙකුත් කථා පවත්වනවා. නමුත් අපට අද කරන්න තිබෙන්නේ මොකක්ද? අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීමයි අද අපට කරන්න තිබෙන්නේ. මෙමඟින් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි වීමක් වන්නේ නැහැ. මොනවාද අපේ සටන් පාඨ? එකක් තමයි, "විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරමු" කියන එක. අනෙක තමයි, "විධායක බලය අහෝසි කරමු" කියන එක. එක්කෝ ක්‍රමය අහෝසි කරමු, එහෙම නැත්නම් අඩු ගණනේ විධායක බලය හෝ අහෝසි කරමු යනුවෙන් මත වාද දෙකක් තිබුණා. විධායක බලය අහෝසි කරනවා කියන්නේ මොකක්ද? විධායක බලය අහෝසි කිරීමේදී කරන්න ඕනෑ මූලිකම දේ මොකක්ද? එකක් තමයි, ජනාධිපතිවරයාට තිබෙන මුක්තිය ඉවත් කිරීම. අපි අද ඒ මුක්තිය ඉවත් කරනවා. අපි අද ඒ බලය ඉවත් කරනවා. දෙවැන්න තමයි, ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වග කියන්න ඕනෑය කියන කාරණය.

එදා ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වග කිව්වේ නැහැ. "මහින්ද රා.." කියන කොට ම "Point of Order" කියලා කථාව නවත්වනවා. "චන්ද්‍රිකා කු.." කියන කොට ම කථාව නවත්වනවා. ඒ කථාව කළොත් එහෙම හැන්සාඩ් වාර්තාවෙන් කපා දමනවා. එදා කථා කරන්නවත් බැරි වුණා ජනාධිපතිවරයා ගැන. ඒ තරම් උත්තරීතර මහා නායක හාමුදුරුවන් කෙනෙක් තමයි ජනාධිපති ධුරයේ ඉන්නේ. ජනාධිපති ගැන කථා කරන්න බැහැ, පව් සිද්ධ වෙනවා. ඒ තත්ත්වයයි මේ පාර්ලිමේන්තුවේ තිබුණේ. නමුත් අද මේ අලුත් යෝජනාවේ තිබෙන්නේ මොකක්ද? ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වග කියනවා විතරක් නොවෙයි, පාර්ලිමේන්තුවට උත්තරත් දිය යුතුයි. අපේ ජනාධිපතිතුමා අද වන විට කී සැරයක් පාර්ලිමේන්තුවට ඇවිල්ලා කථා පැවැත්වූවාද? අද ජනාධිපතිතුමා ලෑස්තියි ජනාධිපතිතුමාගේ බලය අත් හරින්න. ඒ බලය අතහරින්න එපාය කියන, එතුමාට වඩා ආදරේ කරන තවත් ජනාධිපතිවරු ඉන්නවා මේ පාර්ලිමේන්තුවේ. මෙච්චර කල් වුණේ මොකක්ද? ජනාධිපතිවරු කිව්වා, "මට බලය අතහරින්න බැහැ" කියලා. මන්ත්‍රීවරු කෑ ගැහුවා, "දීපිය, බලය" කියලා. අද ජනාධිපති කියනවා, "මම බලය අතහරින්න ඕනෑ" කියලා. ඒත් සමහර මන්ත්‍රීවරු කියනවා, "එපා බලය අතහරින්න මහත්තයෝ, එපා බලය අතහරින්න ජනාධිපතිතුමෝ" කියලා. එහෙම කියලා පක්කිලිකම් කරනවා.

ජනාධිපතිතුමාට මම කිව්වා, මේ ක්‍රමය අහෝසි කළත් කමක් නැහැ, මම එදාටත් තමුන්නාන්සේට සහයෝගය දෙනවා කියලා. ඉදිරියේදී පත් වන පාර්ලිමේන්තුවේදී මේ බලතල සියල්ල අහෝසි කරන්න ඕනෑ; එහෙම නැත්නම් ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න ඕනෑ. එදාට මම ආපසු නැඟිටිනවා. මා හිතන්නේ, එදාට තිස්ස විතාරණ මන්ත්‍රීතුමා නැඟිටියි; ඩිව් ගුණසේකර මන්ත්‍රීතුමා නැඟිටියි. මා හිතනවා වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාත් නැඟිටියි කියලා. එතුමන්ලා තුන්දෙනා ගැන මා කියන්නම්. මම දන්නේ නැහැ ජී.එල්. පීරිස් මහත්මයා ගැන. පරණ සමසමාජකාරයා හන්දා, අතාවුද සෙනෙවිරත්න මහත්මයාත් නැඟිටියි. එහෙම නැඟිටින්නේ නැතිව බැහැ. එදාට ඒ වෙනුවෙන් නැඟිටින්න ඉදිරි මැතිවරණයෙන් පසුව අපි අලුත් පාර්ලිමේන්තුවක් බිහි කළ යුතුයි. ජීවිතය පරදුවට දාලා, පාරට බැහැලා, "දිනන්න බැහැ" කියපු ජනාධිපතිවරණය දිනවන්න කර උර දුන්නු මම එදා කෙළින් සිටගෙන ඒ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට කිව්වා, "මේ රටේ ජනාධිපති ධුරය අහෝසි කරන්න ඕනෑ. එදාට ඔබතුමාට පුළුවන්, අගමැතිකමට තරග කරන්න" කියලා. මෙන්න මේ ස්ථාවරයේයි මා ඉන්නේ.

මේ සංශෝධනයෙහි තිබෙනවා, ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගවිය යුතු බව. අවුරුද්දකට පස්සේ ඕනෑ වෙලාවක පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිවරයාට තිබෙන බලයත් මේ සංශෝධනය මඟින් ඉවත් වෙනවා. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය එදා තනි මතයට, රෑ එළි වෙන කොට පාර්ලිමේන්තුව විසුරුවා හරින කොට, එතුමියගේ කැබිනට් මණ්ඩලයවත් දැන සිටියේ නැහැ, පාර්ලිමේන්තුව විසුරුවා හැරියා කියලා. එහෙම අත්තනෝමතික විධියටයි එදා එය කළේ. ඒ බලය අද අහෝසි කරලා තිබෙනවා. මේ බලය වැඩි කර ගත්තා, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතින්. අපිත් ඒ කුරිරු දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අත ගැසුවා. එසේ අත ගහපු එක ගැන ප්‍රගතිශීලී මිනිස්සු වශයෙන් අද අපි දුක් වෙනවා. ඒ කළු පැල්ලමට, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතට එකහව අත උස්සලා අපි මේ රටේ ඉතිහාසයේ කැත නමක් ඇති කරගත්තා.

මම හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ප්‍රතිපත්තිවලට විරුද්ධව නොයෙක් විධියට සටන් කළා. නමුත් එදා දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතට විරුද්ධව තනිවම හෝ නැඟී සිටීමට ඒ ආත්ම ශක්තිය නැති වීම පිළිබඳව මට ලජ්ජා හිතෙනවා. ඒක මතක තබා ගන්න. නමුත් මම දෙවැනි වතාවටත් ඉතිහාසයේ කුණු බක්කියට රිංගන්න නම් ලැහැස්ති නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තරුණ වියේ සිට කටයුතු කරලා මේ අවසාන කාලයේදී මෙයට විරුද්ධව කටයුතු කරන්න ගිහින් ප්‍රතිගාමී තත්ත්වයට පත් වෙන්න මම ලැහැස්ති නැහැ. ඒ නිසා මම කියනවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට කළු පැල්ලමක් ගෙනෙන්න එපා කියලා. "යූඇන්පී එකට වඩා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රතිගාමීයි" කියන නම දමා ගන්න එපා. යූඇන්පී එකට වඩා ප්‍රගතිශීලී පක්ෂයක් වශයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ධජය ඉහළින් ඔසවන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒ නිසා ඒ පාප කර්මයට අත තියන්න එපා. මේ පක්ෂය, ශ්‍රීමත් බණ්ඩාරනායක මහත්මයා හැදූ පක්ෂය. මේ පක්ෂය හැදුවේ පාදඩයන්ට නොවෙයි. මේ පක්ෂය හැදුවේ මැරයන්ට, දූෂිතයන්ට නොවෙයි. එදා වෝල්ටර් තල්ගොඩපිටිය කොමිසම ගෙනැල්ලා තමන්ගේම ඇමතිවරුන් පස් දෙනෙකුගේ සිවිල් අයිතිය අහෝසි කළේ, ඒ ප්‍රතාපවත් මිනිසායි; බණ්ඩාරනායක මහත්මයායි. ඒ නිසා අද මැරයන් වෙනුවෙන්, දූෂිතයන් වෙනුවෙන් කථා කරන්න එපා. බණ්ඩාරනායකගේ පක්ෂයේ නම්, බණ්ඩාරනායක වාගේ ඒ දූෂිතයන් පැන්නීමට වෝල්ටර් තල්ගොඩපිටිය කොමිසම ගෙනාපු අවස්ථාවේ වාගේ මෙයට පක්ෂව අත ඔසවා සහයෝගය දෙන්න. ඒකටයි, අපි පාර්ලිමේන්තුවට එන්නේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව දෙස බලන්න. අද විමල් වීරවංශ මන්ත්‍රීතුමා නොයෙකුත් ඒවා කියනවා. එතුමා දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාපු අවස්ථාවේ කරපු කථාව බලන්නකෝ. එතුමා තමයි ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමන්ලාගේ පැත්තේ නායකයා විධියට එදා කථා කළේ. ඇත්තටම අපි සියලු දෙනාම එකතු වෙලා තමයි එදා උදේ, දහවල්, රාත්‍රියේ ඒ ගැන සාකච්ඡා කරලා දහහත් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන් කටයුතු කළේ. රාත්‍රී දොළහ වෙනකම් ඒ විවාදය පැවතුණා. වරින් වර ඒ විවාදය නැවතුණා. එදාත් මේ වාගේම සංශෝධන ගෙනාවා. නමුත් අපි දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත ගෙනාවා. ගරු විමල් වීරවංශ මහතා එදා කිව්වේ මොකක්ද?

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

"එහිදී එකඟත්වයකට ආවා, එතුමා මතු කරන අග්‍රාමාත්‍යවරයා, විපක්ෂ නායකවරයා, කථානායකවරයා සිටින අතර, මේ දෙදෙනාට "කෝටා" ක්‍රමයට තුන්දෙනා, තුන්දෙනා, බැගින් පත් කරන ක්‍රමය වෙනුවට අග්‍රාමාත්‍යවරයාගේ සහ විපක්ෂ නායකවරයාගේ එකඟත්වයෙන් පස් දෙනෙකු පත් කරන්න..."

එහෙමයි එතුමා එදා කිව්වේ. එතකොට එතුමන්ලා කවුරුවත් කිව්වේ නැහැ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට මන්ත්‍රීවරුන් පත් කරන්න කියලා. මේ ක්‍රමය වෙනුවෙන් මුලින්ම කථාව පටන් ගන්නේ විමල් වීරවංශ මහත්මයායි. මේ ක්‍රමය ආරක්ෂා කරන්න මුලින්ම කථා කළේ විමල් වීරවංශ මහත්මයායි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එතකොට එතුමා ජේවීපී එකේ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔව්. එතකොට එතුමා ජේවීපී එකේ. ජනතා විමුක්ති පෙරමුණ අද ඉතාම හොඳ ස්ථාවරයකට ඇවිත් තිබෙනවා. මම ඒ ගැන ස්තුතිවන්ත වෙනවා. එතුමාගේ පක්ෂයට බැඳෙන්න මම කවදාවත් බලාපොරොත්තු නොවුණත්, ඉතාම හොඳ කාර්යභාරයක් මේ රටේ යහ පාලනය සඳහා ඔවුන් ඉටු කර තිබෙනවාය කියන එක කියන්න ඕනෑ. ජනතා විමුක්ති පෙරමුණ අපට පෙර සටන අරඹා, මේ රටේ ජන මතයක් ගොඩ නඟා, අද වෙනතුරු නොසැලී සිටීම ගැන මම ඔවුන්ට ගෞරව කරනවා.

අලුතින් සකස් කරන ලද දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතෙන් ජනාධිපතිවරයාට සම්පූර්ණයෙන් බලතල දීලා තිබෙනවා, කැබිනට් මණ්ඩලය කීයද, කැබිනට් මණ්ඩලයේ විෂයයන් කොපමණද කියලා තීන්දු කිරීමට. ඒ සියල්ල තීන්දු කළාට පසුව තමයි, advice එක දෙන්නේ කවුද පත් කරන්නේ කියලා. එම නිසා ඒ ගැන මහා විශාල ආන්දෝලනයක් කරන්නේ නැතුව අද මේ ස්වර්ණමය අවස්ථාවේ -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, වේලාවේ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ ස්වර්ණමය අවස්ථාවේ මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතට සහයෝගය ලබා දෙන්නය කියා මම ඉල්ලා සිටිනවා. 1978 වර්ෂයේ සිට කරන මේ සටන අද අවසාන කරන්නට මේ ස්වර්ණමය අවස්ථාවට සියලු දෙනාම සහභාගි වෙලා ඉතිහාසයේ ප්‍රගතිශීලීන්, දේශප්‍රේමීන් බවට පත් වෙන්නය කියලා හැම මන්ත්‍රීවරයෙකුගෙන්ම ඉල්ලා සිටිමින් මා නිශ්ශබ්ද වෙනවා.

[පූ.භා.11.58]

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසයේ ඉතා වැදගත්, ඓතිහාසික කටයුත්තකට සම්බන්ධ වෙන්නය කියලා යෝජනා කරන මේ අවස්ථාවේදී, අපේ රටේ ඉතිහාසයේ ගමන් මඟ වෙනස් කළ බොහෝ අවස්ථා තිබෙනවාය කියන එක කියන්නට ඕනෑ. ලාංකීය ඉතිහාසයේ ගමන් මඟ ප්‍රධාන වශයෙන් වෙනස් වුණේ, මීට අවුරුදු 200කට පෙර. අපේ රට ඇතුළේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසින් විවිධ ආකාරයට ඇති කරනු ලැබුවා වූ කුමන්ත්‍රණ හේතු කොට ගෙන අපේ රට ඇතුළේම බෙදිලා, බෙදිලා 1815දී කන්ද උඩරට ගිවිසුම අත්සන් කළා. ඒ අවස්ථාවේදී මේ රටේ හිටපු ඇතැම් බෞද්ධ භික්ෂූන් වහන්සේලා වාගේම වෙනත් විවිධ පිරිස් හිතුවා, බ්‍රිතාන්‍යයන් ඇවිල්ලා අපේ රටේ තිබෙන මේ ප්‍රශ්නය විසඳා දෙයි කියලා. නමුත් 1818 වන කොට මේ රටට ඇත්තටම ආදරය කරන මිනිස්සු ඒ ඇති වුණු ආණ්ඩුවට විරුද්ධව සටන් කරන්න පටන් ගත්තා. වීර කැප්පෙටිපොල වාගේ අය සුද්දාගේ කඩුවට තමන්ගේ බෙල්ල දුන්නා. 1848 වන කොට තත්ත්වය නරක් වුණා. වීර පුරන්අප්පු, විල්බාවේ, බූටාවේ, එදිරිල්ලේ රාල වැනි ජාතික නායකයන් ඇතුළු මේ රටේ නිරායුධ අවිහිංසක මිනිසුන් ලක්ෂ ගණනක් මරා දමා මේ රට ඇතුළේ බ්‍රිතාන්‍ය ආධිපත්‍යය ගෙන ගියා. ඊට අවුරුදු 100කට පස්සේ, එනම් 1915 දී විවිධ මත වාද ගෙන ගිහින් සිංහල-මුස්ලිම් කෝලාහලයක් ඇති කළා. ඒ සිංහල-මුස්ලිම් කෝලාහලය ඇති වුණේ බ්‍රිතාන්‍ය යටත් විජිතයෙන් අවුරුදු 100කට පස්සේයි. ඒ අවස්ථාවේදී උපන් බිම පැත්තේ හිට ගෙන තමන්ගේ ජාතියට මේ පටවන අහිතකර දේ පිළිබඳව මේ රටේ ජාතික වීරවරයෝ, ජාතික නායකයෝ දැන ගෙන සිටියා. ඒ අවස්ථාවේදී ඩී.එස්. සේනානායක, එෆ්.ආර්. සේනානායක, පියදාස සිරිසේන වැනි අයට හිරිහැර කළා පමණක් නොවෙයි, ලංකාවේ සිටියේ නැති ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමාත් අවුරුදු 6ක් කල්කටා නුවර බන්ධනාගාරගත කළා. ඒ අවස්ථාවේදී කොළඹ නගරයේ ආරක්ෂාව භාරව සිටි හෙන්රි පේදිරිස් සිංහලයන්ට වෙඩි තැබුවේ නැහැයි කියලා ඔහුට වෙඩි තබා මැරීමේ ප්‍රතිඵලයක් ලෙස තමයි "හෙන්රි පේදිරිස්" නමින් වීර උද්‍යානයක් නම් කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් අවුරුදු 100කට පස්සේ, එනම් 2015 දී මේ ගෙන එන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා ක්‍රියාත්මක වන සමහර දේවල් තුළින් අපේ රටේ මිනිස් අයිතියට, ප්‍රජාතන්ත්‍රවාදයට සහ මේ රටේ අනාගතයට ඇති විය හැකි තත්ත්වය පිළිබඳව ගැඹුරු සංවාදයක් ඇති විය යුතුයි කියා තමයි අපි විශ්වාස කරන්නේ. මක් නිසාද යත්, මේ යහ පාලනය මුවාවෙන් ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ඉතා සද්භාවයෙන් තමන්ගේ විධායක ජනාධිපති ධුරයේ බලතල අඩු කරන්න එකඟ වුණත්, එහි යටි අරමුණ තුළ තිබෙන්නේ ඊට වඩා වෙනස් දෙයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා විපක්ෂයේ හිටපු මහින්ද රාජපක්ෂ මැතිතුමා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වයෙන් මේ විධායක ජනාධිපති ක්‍රමයට හා මනාප මැතිවරණ ක්‍රමයට විරුද්ධව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, මහජන එක්සත් පෙරමුණ, සමසමාජ පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය වැනි පක්ෂවල නියෝජිතයන් සමඟ 1989 ඉඳලා 'පාද යාත්‍රාව', 'ජන ඝෝෂාව', 'මිනිස් දම්වැල' යන මේ සියල්ල කරමින් සටන් කිරීම පිළිබඳව ඔබතුමාට මතක ඇති. එදා මේ රටේ හිටපු පරිණතම දේශපාලන නායකයා ලෙස ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා උතුරු නැඟෙනහිර ප්‍රශ්නය විසඳන්න ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කරන කොට, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ඇතුළු පිරිස පිටකොටුවේ බෝ ගහ ළඟ ඉන්න කොට විධායක බලතල තිබෙන ජනාධිපති ක්‍රමය පාවිච්චි කරලා වෙඩි තබා දහස් ගණන් මිනිසුන් මරා දමා, මේ රට ලේ විලක් බවට පත් කිරීමේ කාර්ය භාරය විධායක ජනාධිපති ධුරය තුළින් එතුමා සිද්ධ කළා.

එක්සත් ජාතික පක්ෂය ලෝක කම්කරුවන්ගේ දිනය වන මැයි දිනය තහනම් කරලා, අභයාරාමයේදී කිත්සිරිමෙවන් රණවක, ආනන්දලාල් කිරිබත්ගොඩ වැනි අය වෙඩි තබා මරන කොට අද කථා කරන බොහෝදෙනෙක් එදා ඒ සටන්වල සිටියේත් නැහැ. මැයි දිනය තහනම් කරන්නත් ඒ විධායක ජනාධිපති ක්‍රමය පාවිච්චි කළා. ඊයේ පෙළපාළියේ හිටපු මාදුළුවාවේ සෝභිත හාමුදුරුවෝ අපි ඉතාම ගරු කරන, මේ රටේ ජාතික ප්‍රශ්නවලදී අභීතව සිටින නායක හාමුදුරුනමක් ලෙස අපි දකිනවා. මේ රටට ඇති වන ව්‍යසනය වෙනස් කර ගැනීම සඳහා එදා උන්වහන්සේ අපත් සමඟ විශාල සටන්වලට සහභාගි වෙලා අපට නායකත්වය දුන්නා. ධර්මිෂ්ඨ සමාජයක් ගොඩ නඟනවාය කියා බලයට පත් වූ ජේ.ආර්. ජයවර්ධන ආණ්ඩුව මාදුළුවාවේ සෝභිත හාමුදුරුවන්ට, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ට පිටකොටුවේ බිම පෙරළා ගෙන ගහන කොට විධායක ජනාධිපති ක්‍රමයේ ආදීනව සෝභිත හාමුදුරුවෝ දැන ගෙන සිටියා. මවුබිම සුරැකීමේ ව්‍යාපාරය හදලා, අභයාරාමයේදී වෙඩි තබන කොට සෝභිත හාමුදුරුවෝ දැන ගෙන සිටියා, විධායක ජනාධිපති ක්‍රමයේ ආදීනව. ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කරන වෙලාවේ උන්වහන්සේ බන්ධනාගාරයේ හිර කරලා තබන කොට උන්වහන්සේ බලන්න ගියේ උන්වහන්සේ ළඟ අද ඉන්න අය නොවෙයි කියන එකත් උන්වහන්සේට මතක ඇති කියා මා විශ්වාස කරනවා.

ඒ නිසා අද උන්වහන්සේලාව යොදා ගෙන මේ විධායක ජනාධිපති ධූරය අහෝසි කරනවා නම්, අපි ඒ අහෝසි කිරීමට පක්ෂව අත් දෙකම උස්සා ඡන්දය දෙන්න ලෑස්ති පිරිසක්ය කියන ටික මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. මේකෙන් විධායක ජනාධිපති ධූරය අහෝසි වෙන්නේ නැහැ. විධායක ජනාධිපතිතුමා රජයේ නායකයා, සේනාධි නායකයා සහ ආණ්ඩුවේ නායකයායි. ඒ අනුව ඇමතිවරු පත් කිරීම, ඇමතිවරු සංඛ්‍යාව තීරණය කිරීම, වෙනස් කිරීම කියන ඒ සියලු බලතල තිබෙන්නේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටමයි. විධායක ජනාධිපති ධූරය සම්පූර්ණයෙන්ම අහෝසි කරනවා නම්, ඒ සමඟම මේ මනාප ඡන්ද ක්‍රමයත් අහෝසි කරලා ජනතාවට වග කියන, පාර්ලිමේන්තුවට වග කියන, ඒ නියෝජිත මන්ත්‍රී මණ්ඩල ක්‍රමය නැවත ඇති වනවා නම්, ඒ සඳහා අපි අත් දෙකම උස්සා මේ සභාවේදී ඡන්දය දෙන්න කිසිම පැකිළීමක් කරන්නේ නැහැයි කියන එක හෘදය සාක්ෂියට එකඟවත්, අවංකවත් අපි ප්‍රකාශ කරනවාය කියන එක මම මතක් කරන්න ඕනෑ. නමුත්, අද ඒ මුවාවෙන් කරන්න යන්නේ කුමක්ද? ව්‍යවස්ථාවක් වෙනස් කරන විට මේ සභාව ඇතුළේ අද මේ ශාන්තුවරු ලෙස කථා කරන එක්සත් ජාතික පක්ෂයේ සමහර මහත්වරු එදා හැසිරුණු ආකාරය පිළිබඳව එවකට සිටි අතිගරු ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය සඳහන් කරලා තිබෙනවා. 2000 අගෝස්තු මාසයේ තුන්වෙනිදා පාර්ලිමේන්තුවේ තිබුණු තත්ත්වය එතුමිය විසින් සඳහන් කරනවා. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු පා පිස්ස යටට ගියාය කියන අයට මම මේ ටික කියන්න කැමැතියි.

චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය විසින් කියන ලද කථාවක කොටසක් ජනදාස පීරිස් මහතාගේ 'චන්ද්‍රිකා:දශකයක මතකය' නමැති කෘතියේ සියවන පිටුවේ මෙසේ සඳහන්ව තිබෙනවා:

"...ඒ නීතියෙන් තමයි රටේ තියෙන අනෙකුත් සියලුම නීති ගලාගෙන එන්නේ. ඒකට සලකපු හැටි බලන්න.

ඒ ව්‍යවස්ථාව කැලි කැලි, කීතු කීතු ඉරලා, මෙහෙම කරල විසිකරනව, අර මහුල්වල විසිකරන වාගේ. විසිපස් වතාවක් විතර විසිකෙරුව. මගේ ඇහටයි විසිකෙරුවෙ. මගේ ඇහේ ගැවුණේ නැහැ ඒවා. ඊළඟට ඒ ව්‍යවස්ථාව පිච්චුවා. පාර්ලිමේන්තුව ඇතුළේ. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ ගයිෆාක් කියන මනුස්සයා පාර්ලිමේන්තුවට ගින්දර තිබ්බ කියල ඒ මනුස්සයා එල්ලුම් ගස් ඇරියා. අපි බලාගෙන යනව නීතිමය වශයෙන් කොහොමද කටයුතු කරන්නේ කියල මේ අයට විරුද්ධව. එහෙත් මම කියන්නේ ඇත්ත වශයෙන් ම එදා කවුරු හරි දෙවියෙක් විසින් මේ රටේ ජනතාවට පෙන්නුම් කෙරුව එක්සත් ජාතික පක්ෂය නැවත වතාවක් බලයට ආවොත් මේ රටේ කරන්නේ මොකක්ද කියල. ටයර් සෑයවල යුගය පිළිබිඹු කරල අර ව්‍යවස්ථාව පිච්චුවා. මේ රටේ උත්තරීතර නීතියට එහෙමනම් සලකන්නේ, කැලි කැලි ඉරල විසි කරනවනම්, ඒ ගොල්ලෝ ආපු ගමන් අවනීතිය මේ රටේ ඇතිවෙන්නේ. ආයි වෙන ප්‍රශ්න දෙකක් නැහැ. පහුගිය අවුරුදු 17 ඇතිවෙච්ච දේ ආයි කිසි ම ප්‍රශ්නයක් නැතිව ඇතිවෙන බව, ඒගොල්ලන්ගේ හැසිරීමෙන් පිළිබිඹු කෙරුව. පිස්සෝ ටික වාගෙ හැසිරීමෙන්. ඉංග්‍රීසියෙන් කියනව. දෙවිවරු කවුරුහරි විනාශ කරන්නට පෙර ඔවුන්ව පිස්සු වට්ටනව කියල. ඒ පිස්සු වට්ටවල මුළු ජනතාව ඉදිරියේ පෙන්නුවා. මේ පිස්සො ගොඩටනම් ආයි තමුන්නාන්සේලා බලයට එන්න දෙන්න එපා කියල. මම කනගාටුවෙනවා. ඇත්ත වශයෙන් ම මේ බලය බෙදාගෙන ඒගොල්ලො එක්ක බලය බෙදාගෙන මේ රටේ ප්‍රශ්න විසඳගෙන පාලනය කරන්න ආරාධනා කරන්න මම බලාගෙන හිටියෙ."

ඒ නිසා තමුන්නාන්සේලා එදා පාර්ලිමේන්තුවට, ව්‍යවස්ථාවට සලකපු ආකාරයට අද මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේදී මේ ගරු සභාවේ විපක්ෂයේ කිසිම මන්ත්‍රීවරයෙකු හැසිරී නැහැයි කියන ටික මම ඔවුන්ට ගෞරවයක් ලෙස මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමන්ලා. ජාතික ලැයිස්තු මන්ත්‍රීවරු හැර වැඩි දෙනෙක් මේ උත්තරීතර සභාවට පත් වන්නේ සමස්ත ලංකා ජනතාවගේ මහජන නියෝජිතයෝ ලෙසයි. හඬක් නැතිය නොහැකි ලක්ෂ ගණන් නිරායුධ අවිහිංසක මිනිස්සුන්ගේ හඬ පාර්ලිමේන්තුව තුළ නඟන්නටත්, ඔවුන්ට සිදුවන අයුක්තිය, අසාධාරණය වෙනුවෙන් පෙනී සිටින්නටත්, ඒ වෙනුවෙන් සුවිශේෂ වරප්‍රසාද ප්‍රමාණයක් මේ ගරු මන්ත්‍රීවරුන්ට ලබා දීලා තිබෙනවා. අද මේ ව්‍යවස්ථා සංශෝධනයෙන් පස්සේ කරන්න බලාපොරොත්තු වන්නේ කුමක්ද?

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ඇඟට වැලි ගහලා කරන්න හදන්නේ මේකයි. මේ රටේ ලක්ෂ ගණන් මිනිස්සු මරා දැමූ, මේ රටේ පැවැති කුරිරු යුද්ධයෙන් ලැබූ අම්හිරි අත් දැකීම් අපට තිබෙනවා. අපට දශක තුනක් තිස්සේ යකඩ ගැටෙන අම්හිරි ශබ්දය ඇහුණා. උණ්ඩයේ අම්හිරි ශබ්දය, දුක් වේදනාව, මර ලතෝනිය ඇහුණා. මේ සියල්ල දැකලා ප්‍රභාකරන්ගේ කුරිරු ත්‍රස්තවාදය නැති කරලා, මේ රටේ සිංහල, මුස්ලිම්, දෙමළ, බර්ගර් සියලු මිනිසුන්ට අභය දානය ලබා දීමේ පිංකම කරපු ජාතික වීරයා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාය කියන එක අපි අමතක කරන්න හොඳ නැහැ. ජාතියක් විධියට අපි ඒක අමතක කරන්න හොඳ නැහැ. නමුත් ඒ යුද්ධයට සම්බන්ධ වුණු සේනාධිනායකයා, හමුදා නායකයින්, රණ විරුවෝ, එදා තීරණ ගත් කැබිනට් මණ්ඩලය ඇතුළු එයට සම්බන්ධ සියලු මිනිසුන්ගෙන් පළිගැනීමේ චේතාවකින් තමයි අද මේ ආණ්ඩුව මේ දින සියය ඇතුළත දී ක්‍රියා කර තිබෙන්නේ. ඒකට හිනැහෙන්නේ කාරණා දෙකක් නිසායි. තමන්ගේ ජාතිය විසින්ම මේ කුරිරු ත්‍රස්තවාදය විනාශ කරලා මේ රටේ ජනතාවට අභයදානය ලබා දුන් හා එයට සම්බන්ධ සියලු දෙනාගෙන්ම පළිගැනීමේ චේතනාවෙන් කටයුතු කිරීම මෙහිදී එක කාරණයක්. දෙවැනි කාරණය මෙයයි. ප්‍රභාකරන් බලාපොරොත්තු වෙච්ච දෙය කුමක්ද, ඒ දෙය නියම ආකාරයෙන් හෝ අනියම් ආකාරයෙන් අඩියෙන් අඩිය ලබා දීමේ කාර්ය භාරය සඳහා තමයි, මේ ගමන් කරන්නේ. ඒ වාගේම ඒ සියලු දෙනා හොරු, වංචාකාරයෝ, දූෂිතයෝ කියලා එලව එලවා පළිගන්න උත්සාහ කරනවා. සමස්ත රණවිරුවන්ට පමණක් නොවෙයි, මුළු සිංහල ජාතියටම සිනහ වෙලා කාලකණ්ණි සන්තෝෂයක් ලැබීමේ අරමුණ කරා තමයි, මේ ආණ්ඩුව දැනුවත්ව හෝ නොදැනුවත්ව පරිවර්තනය වන්නට උත්සාහ දරන්නේ.

එදා මේ තත්ත්වය තිබෙන කොට එල්ටීටීඊයට පක්ෂව හිටපු අය ක්‍රියා කරපු ආකාරය පිළිබඳව මා සඳහන් කරන්නට කැමතියි. චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපතිතුමිය ජනාධිපති ධූරයේ සිටියදී මාත් ඒ ආණ්ඩුවේ සිටියා. ඒ අවස්ථාවේදී අග්‍රාමාත්‍යතුමා පිළිබඳව

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය නෝර්වීජියානු රාජකීය ආණ්ඩුවට යවපු ලිපියේ සිංහල පරිවර්තනයෙන් කොටසක් මා කියවන්නට කැමතියි.

" ශ්‍රී ලංකාවේ රාජකිය නෝර්වේ ආණ්ඩුවේ තානාපති කාර්යාලයට ගුවන් විදුලි සම්ප්‍රේෂණ උපකරණ තොගයක් ගෙන්වා ඇති බවත්, ඒවා එල්.ටී.ටී.ඊ. සංවිධානයේ පාවිච්චිය සඳහා බවත් හෙළිදරවු වී තිබේ. මේ උපකරණ මෑතකදී ලැබී ඇති අතර තීරු ගාස්තු ගෙවීමකින් තොරව කොළඹ වරායෙන් ඒවා ඉවත් කර ගෙන තිබේ. මේ උපකරණ ඉවත් කර ගැනීම සඳහා තානාපති කාර්යාලය විදේශ අමාත්‍යාංශයෙන් අවසර ඉල්ලා ඇත.

තානාපති කාර්යාලයට ගෙන්වීම සඳහා අනුමත කර ඇති උපකරණ ලැයිස්තුවේ ඉතාම කුඩා - සූක්ෂ්ම - පණිවිඩ හුවමාරු යන්ත්‍රයක් ද ඇතුළත් ය. මෙය ආරක්ෂක තොරතුරුවලට සවන් දෙමින් හඬ සහ තොරතුරු රැස්කොට සම්ප්‍රේෂණ කළ හැකි ඉතාම නවීනතම විද්‍යුත් උපකරණයකි. මේ ගුවන් විදුලි පණිවිඩ හුවමාරුව සඳහා කිසිසේත් අවශ්‍ය වන්නක් නොවේ. ශ්‍රී ලංකා ආණ්ඩුවටවත් එවැනි උපකරණයක් නැත. මේ උපකරණය අනුමත ලැයිස්තුවට ඇතුළත් කර තිබුණ ද ආරක්ෂක ලේකම්වරයා විසින් පත් කරන ලද නිලධාරි කණ්ඩායම මගින් කන්ටේනරය පරීක්ෂා කර බලන විට එය තුරුදහන් වී තිබුණි. මේ හේතුව නිසා මේ උපකරණයට කුමක් වීද යන ප්‍රශ්නය තවදුරටත් මතු වී ඇත.

ශ්‍රී ලංකාවේ තීරුබදු ආඥා පනතක් යටතේ නෝර්වේ රාජ්‍ය ඇතුළු අදාළ විදේශ රාජ්‍යවල තානාපති නිලධාරින් හා කාර්ය මණ්ඩලය තීරු ගාස්තු වලින් නිදහස් කොට ඇත. මේ නිලධාරින්ගේ හෝ කාර්ය මණ්ඩලයේ හෝ ප්‍රයෝජනය සඳහා ගෙන්වන භාණ්ඩ තීරු ගාස්තුවලින් නිදහස් කොට තිබේ. 1961 තානාපති සම්බන්ධතාවලට අදාළ වියානා ප්‍රඥප්තියේ 36 වන වගන්තියෙන් හා 1963 ඒ ප්‍රඥප්තියේ 50 වන වගන්තියේ රාජ්‍ය තාන්ත්‍රික කටයුතුවලට අදාළ මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන බව ඔබතුමා දන්නවා ඇත.

1961 ප්‍රඥප්තිය 41.1 වගන්තියත්, 1963 මේ ප්‍රඥප්තියේ 55 වන වගන්තියත් කෙරෙහි උතුමාණන්ගේ අවධානය යොමු කිරීමට මම කැමැත්තෙමි.

මෙවැනි වරප්‍රසාද හා නීතිමය මුක්තීන් භුක්ති විඳින සියලු පුද්ගලයන් අදාළ රාජ්‍යයේ නීතිරීතිවලට ගරු කළ යුතු යැයි මේ ප්‍රඥප්තිවල දැක්වේ.

උතුමාණෙනි එල්.ටී.ටී.ඊ ය සමඟ දැන් පැවැත්වෙන සාකච්ඡාවලදී ඉතා ඉහළ කාර්ය භාරයක් රාජකීය නෝර්වේ ආණ්ඩුව ඉටු කරමින් සිටින අවස්ථාවක සාකච්ඡා සම්බන්ධයෙන් රාජකීය නෝර්වේ ආණ්ඩුවේ මධ්‍යස්ථභාවය පිළිබඳව බරපතළ ප්‍රශ්න මතු වේ. ශ්‍රී ලංකාවේ ජනතාව ඉතාමත් දැඩි ලෙස කලබලයට පත්ව සිටින්නේ මේ නිසා ය.

එල්.ටී.ටී.ඊ. පාලනය යටතේ පවතින මේ ගුවන් විදුලි මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ පමණක් නොව, අසල්වැසි රටවල දැඩි සංවේදීතාවට හේතු වේ.

ලෝකයේ ඉතාමත් කෲරතම මිනීමරු සංවිධානවලින් එකක් වන ත්‍රස්තවාදී සංවිධානයකට මේ අන්දමේ නවීන ගුවන් විදුලි උපකරණ මෙන්ම, සංකීර්ණ විද්‍යුත් පණිවුඩ හුවමාරු උපකරණ හා ගුවන් විදුලි තොරතුරු පද්ධතියක් ලැබීම කෙරෙහි මා දක්වන කනස්සල්ල උතුමාණන්ට අවබෝධ වනු නොඅනුමානය."

චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපතිතුමියගේ කාලයේ තීරු බදු ආඥාපනත උල්ලංඝනය කරලා කොටින්ට සම්ප්‍රේෂණ උපකරණ ලබා දීම පිළිබඳව ඊට පසුව බලයට පැමිණි ආණ්ඩු කෝ පර්යේෂණ කළාද? රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා විධායක ජනාධිපති ධුරය භාවිතා කරලා මහා භාණ්ඩාගාරයේ සල්ලි ටික කොටියාට යවන කොට පාස්කරලිංගම් අත්සන් කරපු ලිපිවල ඡායා පිටපත් ටික මා ළඟ තිබෙනවා.

මේ රට බෙදන්න, මේ රට කඩන්න හිටපු කොටියාට ප්‍රේමදාස ආණ්ඩුව සල්ලියි, ආයුධයි භාර දෙන කොට මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ දැන් ඉන්න සමහර මන්ත්‍රීතුමන්ලා එදා හිටියේ නැහැ. දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා, වාසුදේව නානායක්කාර මැතිතුමා ඇතුළු අපිත්, ඔය පැත්තේ හිටපු ලලිත් ඇතුලත්මුදලි, ගාමිණී දිසානායක වැනි විද්වත් ඇමතිවරුත් ප්‍රේමදාස මැතිතුමාට විරුද්ධව දෝෂාභියෝගයක් ගෙන එන්න කටයුතු කළා. එහි පළමුවැනි චෝදනාව තමයි, රට කඩන, රට බෙදන ත්‍රස්තවාදීන්ට මහා භාණ්ඩාගාරයේ සල්ලි - මහජනතාව ගෙවන බදු සල්ලි - ගෙනිහින් දීම. ඒකට තමයි, ලලිත් ඇතුලත්මුදලිලා, ගාමිණී දිසානායකලා දෝෂාභියෝගයක් ගෙනාවේ. අද මේ රටේ පළමුවැනි වතාවට හිටපු කැබිනට් ඇමතිවරයෙකු කිසිම වග කීමකින් තොරව හිරේට ගෙන යනවා. අමාත්‍යාංශවල ලේකම්වරු හිරේට ගෙන යනවා. පාස්කරලිංගම් මහත්තයා දැන් ඇවිල්ලා ඉන්නවා. අගමැතිතුමා දන්නවා; අපිත් දන්නවා. දැන් ඉන්නවා, මුදල් අමාත්‍යාංශයේ. එතුමාට විරුද්ධව මොන පනත යටතේද නීතිය ක්‍රියාත්මක කරන්නේ? මා ඒ ගැන අහන්න කැමතියි. මේ බලන්න. මේ නිවේදනයේ මෙසේ සඳහන් වී තිබෙනවා:

"රජයේ නිවේදන.

2015 පෙබරවාරි මස 13 වැනි දින, කොළඹදීය.

පොලිස් දෙපාර්තමේන්තුව තුළ නව පොලිස් කොට්ඨාසයක් ස්ථාපිත කිරීම. 2015.01.21 සහ 2015.02.12වැනි දිනයන්හි දී කැබිනට් මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයන්ට ප්‍රකාරව මහජන සාමය පිළිබඳ විෂයයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට අනුව බරපතළ ගණයේ මූල්‍ය අපරාධ විමර්ශනය කිරීම සඳහා වෙනම පොලිස් කොට්ඨාසයක් ස්ථාපනය කර ඇති බව ප්‍රකාශයට පත් කිරීමට අදාළ නිවේදනය මෙයින් ප්‍රකාශ කරනු ලැබේ."

බරපතළ ගණයේ මූල්‍ය අපරාධ විමර්ශනය කරන්න පොලිස් කොට්ඨාසයක් පත් කරනවා. මේ මොකකටද එන්න හදන්නේ? එහි වැඩි දුරටත් මෙසේ සඳහන් වෙනවා:

"03. මෙම ඒකකය පොලිස්පතිවරයාගේ අධීක්ෂණය යටතේ නියෝජ්‍ය පොලිස්පතිවරයකු සහ අධ්‍යක්ෂවරයකු යටතේ ක්‍රියාත්මක වන අතර, ඉහත වැරැදි විමර්ශනය කිරීම සඳහා ශ්‍රී ලංකාව පුරාම පිහිටුවා ඇති අධිකරණ බල සීමාවලදී විමර්ශනය කිරීමට බලතල ඇත්තේය.

04. අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව පිහිටුවා ඇති, අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් කැබිනට් අනු කමිටුව මඟින් ස්ථාපිත කර ඇති ලේකම් කාර්යාලය විසින් මෙම පැමිණිලි විමර්ශනය කිරීම සඳහා පොලිස්පතිවරයාට යොමු කරන අතර, ඊට අමතරව විශේෂ පැමිණිලි කැබිනට් අනුකමිටුව මඟින් සෘජුවම මෙම කොට්ඨාස භාර නියෝජ්‍ය පොලිස්පති වෙත යොමු කරනු ලැබේ."

මේකද ස්වාධීනකම? කවුද මේ කැබිනට් අනුකමිටුවේ ඉන්නේ? අපි දැන ගන්න කැමැතියි, -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයයි තිබෙන්නේ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

නැහැ. මට විනාඩි 30ක කාලයක් තිබෙනවා. සජිත් ද වාස් මන්ත්‍රීතුමාගේ විනාඩි 5කුත් තිබෙනවා. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ විනාඩි 10කුත් දීලා තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

නැහැ. විනාඩි 20යි ඔබතුමාට කථා කරන්න දීලා තිබෙන්නේ.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාගේ විනාඩි 10යි, සජිත් ද වාස් මන්ත්‍රීතුමාගේ විනාඩි 5යි; ඒ දෙකම එකතු වුණාම විනාඩි 15යි. ඒ 15යි, මට කථා කරන්න දීලා තිබෙන විනාඩි 20යි එකතු වුණාම විනාඩි 35ක් තියෙන්න ඕනෑ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

එහෙම නම් ඒ නම් ටික කපන්න වෙනවා නේද?

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ඔව්. ඒ නම් ටික කපන්න. ඔක්කෝම නම් ටික කපලා හෝ මට මේ ටික කියන්න ඉඩදෙන්න. අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පිහිටුවා ඇති අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් කැබිනට් අනුකමිටුව ස්ථාපනය කර ඇති අතර, එම කැබිනට් අනුකමිටුවට කටයුතු කරන්න පුළුවන් වන්නේ මූල්‍ය අපරාධ පිළිබඳව විතරක් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් සමහර අවස්ථාවකදී වග උත්තරකරුවකු බවට පත් වෙන්න පුළුවන්. ඒ නිසා මට මේ කාරණය පිළිබඳව කියන්න වේලාව ලබා දෙන්න. රාජ්‍ය මූල්‍ය, සෞඛ්‍යය, පරිසරයට එරෙහිව සිදු කරන විශාල මූල්‍ය අපරාධ, නීති විරෝධී ආකාරයෙන් ධනවත් වීම, නිල බලය ඉක්මවා පාවිච්චි කිරීම, මුදල් විශුද්ධිකරණය; ඒ සම්බන්ධයෙන් නම් ඉස්සෙල්ලාම පැමිණිල්ල ඉදිරිපත් කරන්න ඕනෑ, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ධුරය දරන අර්ජුන මහේන්ද්‍රන්ට විරුද්ධවයි. ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ධුරයට සිංගප්පූරු ජාතිකයෙකු පත් කර තිබෙනවා. ස්වාධීන මිනිසුන් පත් කරනවා කියලා ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයට පත් කරන්න හදන්නේ කාවද? මිනිසුන්ගේ ගනුදෙනු සියල්ල සිදුවන සල්ලි කොළය අච්චු ගහන ශ්‍රී ලංකා මහ බැංකුවට සිංගප්පූරු පුරවැසියෙකු ගෙනැල්ලා ඔහු මහ බැංකු අධිපති කරපු ආණ්ඩුවක් තිබෙනවාද? රාජිත සේනාරත්න මේකට විරුද්ධ වුණාය කිව්වා; පාඨලී චම්පික රණවක විරුද්ධ වුණාය කිව්වා. එතුමන්ලා විරුද්ධ වෙද්දී පෙබරවාරි මාසයේ 27 වැනිදා රුපියල් බිලියන 1ක් ණයට ගන්නවා කියලා ප්‍රසිද්ධියේ රටේ මහ ජනතාවට කියලා සියයට 900ක් වැඩි කරමින් රුපියල් බිලියන 10ක් ලබා ගත්තා. සියයට 9.5ට තිබුණු පොලී අනුපාතය සියයට 12.5ට වැඩි කරලා මේ වන කොට විතරක් කරලා තිබෙන අලාභය රුපියල් බිලියන 45යි; කෝටි 4,500යි. ඒක මූල්‍ය අපරාධයක් නොවෙයිද? මේ ආණ්ඩුව දවසකට රුපියල් කෝටි 4,500ක -රුපියල් බිලියන 45ක- පාඩුවක් කරනවා. එතකොට හිරේ දාන්න ඕනෑ කාවද? අර්ජුන මහේන්ද්‍රන් මොකද කළේ කියලා මේ විශේෂ ඒකකය හොයනවාද? නැහැ. නිල වශයෙන් නැතිව තුන් දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කළා. කමිටුව පත් කරලා කිව්වා, ඔහු සෘජුවම ඒ ගනුදෙනුවට සම්බන්ධ නැහැ කියලා. සෘජුවම ඒ ගනුදෙනුවට ඔහු සම්බන්ධ නැත්නම් ඔහු වක්‍රව සම්බන්ධයි. අද ඒ කටයුතු නොවෙයි කරන්නේ.

අමාත්‍යාංශයක මුදල් ගිණුම් මාරු කළා කියලා හිරේට දමනවා. එහි කොටස්කරුවන් ලෙස ජනතා විමුක්ති පෙරමුණ ලිපි ගොනුවක් ගෙනිහිල්ලා බාර දෙන කොට, මේ මර්දන පොලිස් ආණ්ඩු වැඩ පිළිවෙළ යටතේ මටත් චෝදනා පත්‍රයක් දුන්නා. මේ රටේ ඈත එපිට ගම්මානවල දරුවන්ට ගණිතය, විද්‍යාව, පරිගණක තාක්ෂණය, ඉංග්‍රීසි භාෂාව ඇතුළු විදේශ භාෂා උගන්වන්න මහින්දෝදය පාසල් දහස සහ මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර 251ක් හදන කොට කෝටි ගණන් හොරකම් කළාය කියලා මාව මූල්‍ය අපරාධ විමර්ශන ඒකකයට ගෙන යන්න පුළුවන්. අප කියනවා, මේ මර්දනය පාවිච්චි කරන්න කියලා. හැබැයි, අප මේ රටේ ජනතාවගේ වස්තුව නූල් පොටක්වත් හොරකම් කරලා නැහැ. රුපියල් ලක්ෂ දෙකක් නොවෙයි, සත 50ක කොමිස් මුදලක් ගත්තාය කියලා අධිකරණයක ඔප්පු කළොත් අප ගෙදර යන්නේවත්, පාර්ලිමේන්තුවට එන්නේවත් නැහැ, ගෝල්ෆේස් එකට ගිහිල්ලා දැලි පිහියකින් බඩ කපාගෙන මැරෙනවා කියන එක මම මේ වෙලාවේදී තමුන්නාන්සේලාට මතක් කරන්න කැමැතියි. ඒ නිසා මෙහෙම මහජන නියෝජිතයින්ව දඩයම් කරන්න යන්න එපා.

තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේ මිනිසුන් මරනවා අප දැකලා තිබෙනවා. රිචඩ් ද සොයිසාව අරගෙන ගිහිල්ලා අමු අමුවේ මරලා හෙලිකොප්ටරයකින් ගෙනිහිල්ලා තමයි මුහුදට දැම්මේ. මම ඒක ගැන චිත්‍රපටියක් හදන්න හැදුවා. චිත්‍රපටිය රූපගත කරන්න දෙන්නේ නැහැ කියමින් යහපාලන ආණ්ඩුව එය තහනම් කළා. ඒකයි අද යහ පාලනයේ තරම. මේ ගරු සභාවේ කුමන මතයක් දැරුවත් අප තමුන්නාන්සේලා මහජන නියෝජිතයන්. මහජන නියෝජතයින්ට තිබෙන අයිතිය රාජ්‍ය නොවන සංවිධානවලට ගෙන යන්න දෙන්න එපා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට සමහර අයව නම් කර තිබෙනවා. පාක්‍යසෝති සරවනමුත්තු, ශිරානි බණ්ඩාරනායක මැතිනිය, මාදුළුවාවේ සෝභිත හාමුදුරුවෝ නම් කර තිබෙනවා. මාදුළුවාවේ සෝභිත හාමුදුරුවෝ පත් වුණාට කමක් නැහැ. මේ තිබෙන මර්දනයත් එක්ක මේ ආණ්ඩුවෙන් මරන්න එන කොට අඩු ගණනේ හැංගෙන්නවත් යන්න පුළුවන් පන්සලට - නාග විහාරයට - නිසා උන්වහන්සේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පත් කිරීම ගැන අපට ප්‍රශ්නයක් නැහැ. නමුත් පාක්‍යසෝතිලා, අර සෝතිලා, මේ සෝතිලා වාගේ අය පත් කරනකොට මේ යටතේ සොත්ති උපාලිත් අරහේ මෙහේ පත් කරයිද දන්නේ නැහැ. මොකද, මහ බැංකු අධිපති ධුරයට සිංගප්පූරු ජාතිකයකු පත් කරලා මෙහෙම විනාශයක් කරලා තිබියදීත් නැවත වතාවක් මෙවැනි පත් කිරීම් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මහා ජාතික මූල්‍ය අපරාධය කරපු අර්ජුන මහේන්ද්‍රන්ට විරුද්ධව අප සියලුම මන්ත්‍රීවරුන් අත්සන් කරලා මේ පාර්ලිමේන්තුවේ යෝජනාවක් සම්මත කරනවා, වහාම මේ රටේ මුදල් ක්‍රමය, බැංකු ක්‍රමය ආරක්ෂා කරන්න නම්, මහ බැංකු අධිපතිවරයාව ඉවත් කරන්නය කියලා.

හිටපු ඇමතිවරුන් ගෙනිහින් හිරේ දමන එක නොවෙයි කරන්න ඕනෑ. මේ මුළු පාර්ලිමේන්තුවේම ඉන්න මහජන නියෝජිතයන් ගෙනිහින් හිරේ දමන්න. එල්ටීටීඊ කොටි ත්‍රස්තවාදය විනාශ කිරීමට නියම් ආකාරයෙන් හෝ අනියම් ආකාරයෙන් දායක වුණු සියලු මිනිසුන්ගෙන් පළි ගනිමින් මේ හිර ගෙවල් පුරවන්න. එහෙම පිරෙව්වාම මේ රට වෙනුවෙන් දිවි පිදූ රණ විරුවන්ගේ පැත්තේ ඉඳ ගෙන අපි සියලු දෙනාම ඒ හිර ගෙවල් ඇතුළේ කකුල් දෙකෙන්ම හිට ගෙන ඉන්නවාය කියන ටිකත් මම මේ අවස්ථාවේ දී මතක් කරන්නට කැමැතියි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තමයි ස්වාධීන කොමිෂන් සභා පත් කරන්නේ. මේ ස්වාධීන කොමිෂන් සභා පත් කරනකොට අඩු තරමේ විපක්ෂයේ සංශෝධනවලටත් එකඟ වෙන්න කියලා අපි ඉල්ලා සිටිනවා. මේ ස්වාධීන කොමිෂන් සභා පාර්ලිමේන්තුවටවත් වග කියන්නේ නැත්නම්, මහජන නියෝජිතයන් නොවෙයි මේ රටේ ආණ්ඩු කරන්නේ. රාජ්‍ය නොවන සංවිධානවලට, ඩොලර් කාක්කන්ට, ඒ වාගේම තානාපති කාර්යාලවල මිනිසුන්ට මේ පාර්ලිමේන්තුවේ බලය ගෙන යන්න දෙන්න එපා. මේ රටේ උත්තරීතර ආයතනය මේ පාර්ලිමේන්තුව නම්, ජනතා පරමාධිපත්‍ය බලය තිබෙන්නේ මේ පාර්ලිමේන්තුව තුළ නම්, ජනතා පරමාධිපත්‍ය බලය පාක්‍යසෝතිට දීලා හරි යනවාද? ඒ නිසා ජනතා පරමාධිපත්‍ය බලය ක්‍රියාත්මක කරන මේ පාර්ලිමේන්තුවේ තිබෙන බලය උදුරා ගන්න දෙන්න එපා. එදා

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

ධර්මිෂ්ට සමාජය පෙන්වලා සෝභිත හාමුදුරුවන්ව බිම පෙරළා ගෙන ගැහුවා වාගේ, මහචාර්ය සරත්චන්ද්‍රව බිම පෙරළා ගෙන ගැහුවා වාගේ යහ පාලනය පෙන්වලා මේ සංශෝධන අස්සට දමලා අග්‍රාමාත්‍යතුමා බලාපොරොත්තු වෙන විවිධ පටු අරමුණු ඉෂ්ට කර ගන්නට යන්න එපා. මහරාජා සංවිධානයේ සිරස මාධ්‍ය ජාලය - අපි කැමැති වෙන්න පුළුවන්, අකමැති වෙන්න පුළුවන් - අපි හැමෝටම ප්‍රහාර එල්ල කරනවා. නමුත් ඒ ආයතනයට අයිතියක් තිබෙනවා, තමන්ගේ මතය ප්‍රකාශ කරන්න. ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව තිබෙන අයිතියක්. එතුමාව විවේචනය කළා. ඒක ඇත්ත. නමුත් එතුමා ඒ වෛරය හිතේ තියා ගෙන මේ මාධ්‍ය සියල්ල දඩයම් කිරීම සඳහා, මාධ්‍ය අයිතිකරුවන්, මාධ්‍යකරුවන් ගෙනියලා හිරේට දැමීම සඳහා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට වගන්තියක් ඇතුළත් කළා.

මම මේ කාරණයත් මතක් කරන්න කැමැතියි. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාත් මේ සඳහා සාක්ෂි දරනවා ඇති. එදා විධායක බලය තිබුණු ප්‍රේමදාස ජනාධිපතිතුමා රංජිත් විජයවර්ධනට " විජයවර්ධන, උඹ බලා ගනිං" කියලා කරපු කථාව තිබෙන කැසට් පටය ගෙනැල්ලා, රොස්මීඩ් පෙදෙසේ දී එම කැසට් පටය දමලා පෙන්වලා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය අපට කිව්වා, ප්‍රේමදාස ජනාධිපතිවරයා රංජිත් විජයවර්ධනට - රුවන් විජයවර්ධනගේ තාත්තාට - තර්ජනය කරන්නේ මෙන්න මේ විධියටයි කියලා. ඒකම තමයි අද රනිල් වික්‍රමසිංහ මහත්මයා - අගමැතිතුමා - කරන්න හදන්නේත්.

2001 වසරේ ඉඳලා මහා භාණ්ඩාගාරයේ තිබෙන හොඳ "ෆයිල්" වගයක් පිළිබඳ විස්තර මගේ ළඟත් තිබෙනවා. Norwegian file එක තිබෙනවා, සුමී මුණසිංහගේ "ෆයිල්" එක තිබෙනවා. ඊළඟට මාව හිරේට දමපු දවසට නම් මම දෙන පළමු වැනි කට උත්තරයෙන්ම බදු සමා පනත යටතේ භාණ්ඩාගාරයේ තිබෙන - බදු සමා පනත ගෙනෙන කොට මම නියෝජ්‍ය මුදල් ඇමතිවරයා. බදු සමා පනත යටතේ බදු සමාවට අවශ්‍ය එකම ලියවිල්ලක්වත් මම ඉදිරිපත් කරලා නැහැ. චරිත රත්වත්තේ ඉදිරිපත් කරලාත් නැහැ. - ඒ ජාවාම්කරුවන්ගේ කෝටි ගණන් මුදල් පිළිබඳව සාක්ෂි ටික "ෆයිල්" පිටින්ම ඉදිරිපත් කරනවා කියලා මම මේ අවස්ථාවේ දී කියන්න කැමැතියි. ඒ නිසා වීදුරු ගෙවල්වල ඉඳගෙන ගල් ගහන්න එපා. තමුන්නාන්සේලාට පළි ගන්න ඕනෑ නම්, පළි ගන්න. මේ හිටපු ඇමති මණ්ඩලයම හිරේට දමන්න. මොකද, මේ හදා ගෙන තිබෙන පොලිස් බලය තිබෙන කමිටුව මඟින් ඕනෑම ඇමතිවරයෙක් හිරේට දමන්න පුළුවන්. සුමේධා ජී. ජයසේන මැතිනියව වුණත් හිරේට දමන්න පුළුවන්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යටතේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ වේලාව අවසන් වෙනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ඒ නිසා අපිව අන්දන්න බැහැ. එළියේ ඉඳලා ප්‍රශස්ති කිව්වාට, මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධව ඡන්දය දෙන ගරු සභාවේ මන්ත්‍රීවරුන්ට ගමට එන්න එපා කියලා තමුන්නාන්සේලා කොහොමද අපට කියන්නේ? අපට පාරේ යන්න බැරි නම්, උද්ඝෝෂණය කරන්න බැරි නම්, ජනතාව ඉස්සරහා හිට ගෙන ඉන්න බැරි නම්, ගමට නොවෙයි, හිරේට විතරයි අපට යන්න කියන්නේ. මේ සංශෝධනවලින් හිර ගෙදරට විතරයි යන්න කියන්නේ. රටට හිතවත්, රටට ජනතාවට බලය පවරන්න, එදා මේ රටේ හිටපු ඇස්. මහින්ද හාමුදුරුවෝ -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එතුමාට තව විනාඩි 10ක කාලයක් ලබා දෙනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇස්. මහින්ද හාමුදුරුවෝ එදා මෙහෙම කිව්වා:

"රටත් ජාතියත් සමයත් කරණ කොට
තුවක්කුවට කඩුවට ගල් මුල් වලට
ඉලක්කයක් වන්නට ඇත්නම් මෙමට
සැපක් තමයි නොතිබෙන නිවනින් මෙපිට"

එදා එහෙම කියද්දීත් එයින් පසුව බිහි වුණු ජාතික වීරයෝ අතර සිටි අනගාරික ධර්මපාලතුමා තමන්ගේ ඉඩකඩම්, යානවාහන, දේපළ සියල්ල මේ රටේ ජනතාවට වෙන් කරන කොට මාධ්‍ය හරහා එතුමාට කිව්වේ මොකක්ද? "හොරා, මුට්ටකාසිකාරයා" කියලා දිගටම පත්තරවලින් ගහන්න පටන් ගත්තා. සුද්දෝ මේ රටේ වීරයන් අවුරුදු 6ක් හිරේ දාන කොට පැනලා ගියේ නැති අනගාරික ධර්මපාලතුමා මේ විධියට මාධ්‍යවලින් ගහන කොට ඉන්දියාවට පැනලා ගියා. එතුමා ඉන්දියාවේදී ලිව්වා -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු පෙරුමාල් රාජදුරයි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු ජෝන් අමරතුංග මහතා (මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மக்கள் ஒழுங்கு மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சர்)
(The Hon. John Amaratunga - Minister of Public Order and Christian Religious Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු පෙරුමාල් රාජදුරයි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතු ය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අතාවුද සෙනෙවිරත්න මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු පෙරුමාල් රාජදුරයි මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு,* மாண்புமிகு அதாவுத செனெவிரத்ன அவர்கள் *அக்கிராசனத்தினின்று அகலவே,* மாண்புமிகு பெருமாள் ராஜதுரை அவர்கள் *தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. ATHAUDA SENEVIRATNE *left the Chair, and* THE HON. PERUMAL RAJATHURAI *took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු 700කට පස්සේ අපේ රටේ බිහි වුණු ජාතික වීරයා වූ අනගාරික ධර්මපාලතුමාට මෙලෙසින් මාධ්‍ය හරහා "හොරා, වංචාකාරයා, දූෂිතයා" කියලා ගහන කොට බොහෝ දේ දරා ගෙන සිටිය හැකි එතුමා මේ රට දාලා, "ඉතින් ආයුබෝවන් ලක් මවුනි ගරු" කියලා ඉන්දියාවට ගියා. එතුමා අත් අකුරින් ලිව්වා, "මා මළ පසු මගේ හිසවත් මේ ශ්‍රී ලංකාව පැත්තට හරවන්න එපා" කියලා. එතුමා දැනගෙන සිටියා, ඒ තරම් කෘතවේදී මිනිස්සු කට්ටියක් අපේ රටේ ඉන්නවා කියලා! එතුමා ප්‍රාර්ථනා කළා, "මා නැවත ඉපදෙන කොට දහසක් බුදුන් ඉපදුණු මේ ඉන්දියාවේම උපදින්න ලැබේවා" කියලා.

මේ රටේ සමස්ත බැංකු ක්‍රමය, සමස්ත මුදල් ක්‍රමය, ඒ වාගේම සමස්ත රටම විනාශ කරලා කටයුතු කරපු අය පිළිබඳව අද මේ සභාවේදී මම රනිල් වික්‍රමසිංහ මැතිතුමාට මතක් කරන්න කැමැතියි. 2002 ජූලි මාසයේ 21වැනිදා චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට ලියුමක් යවනවා. මගේ මේ ලිපි ගොනුවෙන් එකක් විතරක් මම කියවන්නම්. චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය තමයි මේ ලිපිය ලියන්නේ. ඒ ලිපිය මෙසේයි:

"හිතවත් අග්‍රාමාත්‍යතුමනි;

ඔබතුමා විසින් මා වෙත එවන ලද 2002 ජූලි මස 19 වැනි දින දරන ලිපිය ලදිමි. මා, මාගේ අත්බෑගයෙහි බෝම්බ ගෙනැවිත් තිබෙනවා යැයිද, මා එම බෝම්බ ගසා ඔබ ඝාතනය කරනු ඇතැයි හා විනාශ කරනු ඇතැයි යනාදී ලෙසින් කරුණානායක අමාත්‍යවරයා ඔබ හමුවේදී ම කීවේ නැතැයි ඔබ ප්‍රකාශ කිරීම ගැන මම ඇත්තෙන් ම කනගාටු වෙමි. එසේ ම පුදුම වෙමි. එසේ ම මවිසින් ඔබ අමතන ලද ඒ දාතම දරන ලිපියේ සඳහන් කරන ලද පරිදි එබඳු අසාධාරණ ප්‍රකාශ කිරීම ගැන හා එලෙසින් ම දිගින් දිගට ම කථා කිරීම ගැන ඔබ ඔහුට අවවාද කෙළේ නැතැයි කීමට ඔබ ඉදිරිපත් නොවන බව මට පෙනී යයි. තවද, 18 වනදා පෙරවරුවේ ඔබ මා හමුවූ අවස්ථාවේදී අමාත්‍යවරයා එසේ හැසිරීම බෙහෙවින් ම අනුචිත හා පිළිගත නොහැක්කක් බවට මා පළ කළ අදහස් ඔබ පිළිගත්තේ ය.

එහෙයින්, නිල වශයෙන් පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමක දී අමාත්‍යවරුන් බොහෝ දෙනෙකු ඉදිරිපිට කරුණානායක අමාත්‍යවරයා විසින් එසේ ප්‍රකාශ කරනු ලැබූ නමුත් ඔහු එසේ කීවේ නැතැයි ඔබ දැන් කියනු ඇසීමෙන් මා තුළ ඇති වන්නේ ඉමහත් කම්පනයකි, විමතියකි.

ඔබ ම තෝරා ගත් පුද්ගලයකු මෙලෙසින් අතිශයින් ම වැරැදි ලෙස හැසිරීම ප්‍රසිද්ධියේ ම පිළිගන්නට සිදුවීමෙන් පමණක් නොව ඔහු තවදුරටත් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස තබාගන්නට ඕනෑයැයි තරයේ කියා පෑමෙන් ඔබට හා ඔබගේ පක්ෂයට වන ලැජ්ජාව සලකා බලන විට, මේ කරුණ සම්බන්ධයෙන් පළමුව දරා සිටි මතයට ඔබ දැන් සපුරා පිටුපා සිටීම පැහැදිලිව ම දේශපාලන වාසි තකා කරන්නක් බව පෙනෙතත්, ඔබ ඔය කියන "නැතැයි" කීමෙන් මා කළ ප්‍රකාශය අසත්‍ය චෝදනාවක් හා ගෙතූ කථාවක් යැයි හැඟෙන්නට සැලැස්වීම ඔබට තරම් නොවන පහත් ක්‍රියාවක් බව කිය යුතුය."

චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය රනිල් වික්‍රමසිංහ මහතාට යවලා තිබෙන ලිපියක් මේ. මේ වාගේ ලිපි ගොඩක් තිබෙනවා. මාව ගෙනිහිල්ලා ඉස්සරහින් තියන්න. සාක්ෂි සඳහා මගේ මේ files ටිකත් අරගෙන යන්න ඉඩ දෙන්න කියලා මම මේ අවස්ථාවේදී මේ ගරු සභාවෙන් ඉල්ලා සිටින්න කැමැතියි.

වීදුරු ගෙවල්වල ඉඳ ගෙන ගල් ගහන්න එපා. තමන්ගේ යටි අරමුණ හිතේ තියා ගෙන, වෙන අරමුණක් එළියට දෙන්නේ නැතිව මේ විපක්ෂයේ සාධාරණ, යුක්ති සහගත ඉල්ලීමට ඉඩ දෙන්න. මෙම සංශෝධනයෙන් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි වෙන්නේ නැති බව අප දන්නවා. විධායක ජනාධිපතිවරයාගේ බලතල කිසිවක් අඩු වෙන්නේ නැති බවත් අප දන්නවා. බොහොම පොඩි සංශෝධන කිහිපයක් ඇතුළත අග්‍රාමාත්‍යතුමා කරන්න යන දේ තමුන්නාන්සේලාගේ හෘදය සාක්ෂිය හරියට දන්නවා. ජනාධිපතිවරණයයි අවසන් වුණේ. පාර්ලිමේන්තු මැතිවරණයක් තිබුණේ නැහැ. අපි මේ රටේ කැබිනට් මණ්ඩලයේ සිටි ඇමතිවරු. අප විතරක් නොවෙයි, සාමූහික වගකීම යටතේ ඒ කැබිනට් මණ්ඩලය විසින් කරන ලද මේ සෑම ක්‍රියාවකටම මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත් අප වග කියන සියලු දේට වග කිව යුතුයි කියන කරුණත් මේ අවස්ථාවේ මම මතක් කරන්නට කැමැතියි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ එතුමාත් අපත් හිටපු කැබිනට් මණ්ඩලය මේ රට ඉවර කළා, මේ රට විනාශ කළා කියා චෝදනා කරන්න එපා. අප එසේ කියන්නේ ඇයි? මේ රටේ ඉතිහාසයේ කිසිම ආණ්ඩුවක් මුහුණ නොදුන් ප්‍රධාන අභියෝග පහකට පසු ගිය කාලය තුළ, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාත් අපේ රජයත් මුහුණ දුන්නා. එතුමා භාර ගත්තේ සුනාමියෙන් විනාශ වුණු රටක්. මනුස්ස ජීවිත හැර අනෙක් සියල්ල නැවත ගොඩ නැඟීමේ වගකීමක් එතුමාට තිබුණා. සුනාමියෙන් මිනිස් ජීවිත 45,000ක් නැති වුණා. රටේ මුහුදුකරයේ සියලු දේ විනාශ වුණා. සම්පූර්ණයෙන් කොටසක් විනාශ වුණු රටක් මහින්ද රාජපක්ෂ භාර ගත්තේ.

අද වන විට නිම වෙලා තිබෙන යුද්ධයේ තීරණාත්මක පැයට ඇවිල්ලා, මහ පොළොවෙන් තුනෙන් එකක්, මුහුදු වෙරළෙන් තුනෙන් දෙකක්, සිංගප්පූරුව වාගේ රටවල් 18ක්, වර්ග කිලෝමීටර් 18,800ක් රටට නැති වෙන්න යන වෙලාවේ, ඒ කුරිරු ත්‍රස්තවාදය නැති කරලා මේ රටේ සිංහල, දෙමළ සහ මුස්ලිම් යන සියලු මිනිසුන්ට කැමැති තැනක ජීවත් වෙන්නට හා ජීවනෝපාය සලසා ගන්නට අයිතිය දෙන රටක් ඇති කිරීමේ අභියෝගය එතුමාට තිබුණා. තෙල් බැරල් එකක අද තිබෙන මිල අරගෙන බලන්න. එදා අපි මේ ජනතාවට දුන් සහන කොච්චරද කියන්න බැහැ. එදා තෙල් බැරල් එකක මිල ඩොලර් 127යි. මුළු ලෝකයම තෙලෙන් බැදෙන්නට තරම් ඛනිජ තෙල් අර්බුදය තිබුණා. ලෝකයට ආහාර නැතිව මුළු ලෝකයේම දැවැන්ත ආහාර අර්බුදයක් තිබුණා. මියුචුවල් බැංකුව කඩා වැටුණා. ලිවර් බ්‍රදර්ස් සමාගම කඩා ගෙන වැටුණා. මේ මුළු ලෝකයම කාඩ් කුට්ටමක් පෙරළෙනවා වාගේ කඩා ගෙන වැටුණා. එවැනි අභියෝග පහක් ජය ගත්ත රාජ්‍ය නායකයාට තමයි අද "වංචාකාරයෙක්, හොරෙක්, රට කාපු මිනිහෙක්" කියලා කියන්නේ. ඒක රට කෑම නම්, ඒ රට කෑමට මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට විතරක් නොවෙයි, කැබිනට් මණ්ඩලයේ හිටිය මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත්, මටත්, සුමේධා මැතිනියටත්, දිනේෂ් ගුණවර්ධන හිටපු ඇමතිතුමාටත් අප සියල්ලන්ටම තමයි මේ ප්‍රහාරය එල්ල කරන්නේ කියන එක මම තමුන්නාන්සේලාට මතක් කරන්නට කැමැති වෙනවා. ඒ නිසා ඒ දේ කරන්න එපා. අඩුම තරමින් මේ ගරු සභාවට වග කියන ස්වාධීන කොමිෂන් සභා පත් කරන්න ව්‍යවස්ථා සභාවේ බලය මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන්ට දෙන්න. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විනය කැඩුවොත් උසාවියට යන්න තිබෙන අයිතිය - Supreme Court එකට හැර- අහෝසි කර තිබෙනවා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක්, පළාත් සභාවක මන්ත්‍රීවරයෙක් පක්ෂයේ විනය කැඩුවා කියා චෝදනාවක් ඉදිරිපත් කළොත් ඔහුට උසාවියකට යන්න තිබෙන අයිතිය තහවුරු කර දෙන්න කියා අප ඉල්ලා සිටිනවා. පසු ගිය කාලයේ එහෙම කරන්න පුළුවන්කම තිබුණා. මේ ගරු සභාවේ සිටි වැදගත් මන්ත්‍රීවරුන්ට තමන්ගේ හෘදය සාක්ෂියට අනුව තීරණ ගන්න පුළුවන් වුණා.

එදා ගාමණී ජයසූරිය මැතිතුමා මේ ගරු සභාවේ හිටියා. එතුමා අනගාරික ධර්මපාලතුමාගේ මුණුබුරා; මහාබෝධි සංගමයේ සභාපති; එක්සත් ජාතික පක්ෂයේ ලේකම්. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒම එතුමාගේ හිතට එකඟ නැති වුණා. "මෙන්න මගේ කාර් එක. මෙන්න මගේ යතුර. මට මේ ඇමතිකමට වඩා රට වටිනවා" කියලා ආපු එකම ඇමතිවරයා විධියට ගාමණී ජයසූරිය මැතිතුමා මේ රටේ ඉතිහාසයට එකතු වෙලා තිබෙනවා. ඒ නිසා මන්ත්‍රීවරයෙකුට හෘදය සාක්ෂියට අනුව

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

තීන්දුවක් ගන්න තිබෙන අවස්ථාව අවහිර කරන්නට එපාය කියා අප ඉල්ලා සිටිනවා.

විපක්ෂයේ අප ඉදිරිපත් කළ සංශෝධන ඔබතුමන්ලා පිළි ගන්නේ නැති නම්, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුව එන දෙයකට -පැසිස්ට්, මිලිටරි, පොලිස් ආණ්ඩුවක් හදන්න- දැන දැනම අප කොහොමද අත ඔසවන්නේ කියන එක තමුන්නාන්සේලාගේ හෘදය සාක්ෂියෙන් අසා බලන්න කියන එකයි මට කියන්නට තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී වික්‍රම රාජසිංහ රජ්ජුරුවන්ගේ අවධියේදී ඉතාම ප්‍රවීණ කවියෙක් වූ අලගියවන්න මුකවෙටිතුමා අපේ පැත්තේ, කැලණි මිටියාවතේ තමයි ඉපදුණේ. එතුමා විසින් රචිත "සුභාෂිතය" කියන ග්‍රන්ථයේ මෙහෙම කවියක් තිබුණා.

"පින්මඳ පුතුන් සියයක් ලදුවත් නිසරු
ගුණ නැණ බෙලෙන් යුතු පුතුමය ඉතා ගරු
එක පුන් සඳින් දුරු වෙයි ලොව සන අඳුරු
නෙක තරු රැසින් එලෙසට නොම වේය දුරු"

මෙන්න මේ "නෙක තරු රැස" වෙන්න එපා. එක පුන් සඳක් වාගේ, මේ රටට ආලෝකය දෙන යහපත්, සාධනීය දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කරා අපි ගමන් කරමු කියන කාරණය මතක් කරමින්, මගේ වචන කිහිපය සමාප්ත කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.40]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඓතිහාසික අවස්ථාවේදී මේ උත්තරීතර සභාවේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන අදහස් ප්‍රකාශ කිරීමට මට ඉඩ ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

1978 දී පාර්ලිමේන්තුවේ හයෙන් පහක බලයක් දිනා ගත්ත ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ආර්ථික වශයෙන් කඩා වැටී තිබුණු රට ශක්තිමත් කිරීමට විධායක ජනාධිපති ක්‍රමය -ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව- මේ රටට හඳුන්වා දුන්නා. එහි ප්‍රතිඵලයක් වශයෙන් එදා විනාශ වුණු රට නිර්මාණය කරන්න ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ඇතුළු ඒ ආණ්ඩුවට හැකියාව ලැබුණා. නිවසක් නැතිව අඟු පිල්වල ලැගපු, නිවාස හිමියන්ගේ අඩන්තේට්ටම්වලට ලක් වුණු ජනතාවට තමුන්ගේ කියා නිවසක්, තමුන්ගේම කියා සෙවණක් ලබන්නට මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් අවස්ථාව ලැබුණා. ඒ විතරක් නොවෙයි, එදා සුදු ඇඳුමක්, පොත් ටිකක් අරගෙන දෙන්න බැරිව ළ තැවුණු දෙමව්පියන්ට තමන්ගේ දරුවා පාසලට ඇතුළත් කිරීමේ හැකියාව ලැබුණා. තුන් වේල බත් කන්න තහනම් කරපු රටක්, හාල් සේරු දෙකක් ගෙන යන්න බැරිව තිබුණු රටක් එදා මහවැලි ව්‍යාපාරය තුළින් ගොඩනැංවුවා. තුන් වේලම බත් කන්න විතරක් නොවෙයි. හාල් සේරු ලොරි ගණන් ගෙන යන්න, පිට රටටත් හාල් යවන්න පුළුවන් වාතාවරණයක් මේ රටේ නිර්මාණය වුණා. සීනිත් එක්ක තේ බොන්න බැරි වුණු, සීනි තහනම් කරපු රටක් තිබුණේ. හකුරු කෑල්ලක්, රටඉඳි සමඟ තේ බොන්න කියා බල කරපු රටක් තිබුණේ. ඒ ආර්ථිකය නැති කරන්න ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමත් වුණා. ගමට විදුලිය නැතිව ගම්වැසියන් අසරණ වෙලා හිටියා. ගමට විදුලිය ආවා. විරැකියාවෙන් තරුණ තරුණියන් අසරණ වෙලා සිටියා. විරැකියාව දුරු කර, රැකියා අවස්ථා ලබා දීලා, තරුණ තරුණියන්ට රිසි සේ ජීවත් වෙන්න පුළුවන් අත මිට සරු සමාජයක් නිර්මාණය කළා. රටට ගුවන් යානා එන්න පටන් ගත්තා. ගුවන් තොටුපළවල් පුළුල් වුණා. රටට නැව් එන්න යන්න පටන් ගත්තා. වරායවල් පුළුල් වුණා. එදා රටේ ගමනාගමනය දියුණු වුණා. මංමාවත් පුළුල් වුණා. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් රටේ දැවැන්ත විපර්යාසයක් ඇති කළා. හැම දෙනාටම කාලා, බීලා, ඇඳලා ඉන්න පුළුවන් සමාජයක් එදා රටේ නිර්මාණය වුණා.

අවුරුදු 13ක්, 14ක් කරගෙන යන කොට විපක්ෂය එම ව්‍යවස්ථාවේ අඩු පාඩු දැක්කා. "මේ ක්‍රමය නිසා ජනතාව යහ පාලනයෙන් තොර වෙනවා, මේ රටේ සදාචාරය පිරිහෙනවා, ඒකාධිපතිත්වයට මේ රට තල්ලු වෙනවා" කියා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය වෙන්න ඕනෑය කියා එදා විපක්ෂය ප්‍රකාශ කළා. අපත් තීරණය කළා අවුරුදු 13ක්, 14ක් තිබුණු මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් වන්න ඕනෑය කියා. රට වෙනස් වුණා, ලෝකය වෙනස් වුණා, ජනතාවගේ සිතුම් පැතුම් වෙනස් වුණා. එහෙම නම් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටත් සංශෝධනයක් එන්න ඕනෑය කියා එය ගෙනාපු එක්සත් ජාතික පක්ෂය පවා ඒ තීරණයට එකඟතාව දැක්වුවා. ඒ විධියට එදා ලස්සණ, ආකර්ෂණීය සටන් පාඨ කියා විපක්ෂය බලය තහවුරු කර ගත්තා. විධායක ජනාධිපති ක්‍රමය තිබෙන මේ ඒකාධිපති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අහෝසි කරනවා කියන එක තමයි එදා ඒ අයගේ බලය තහවුරු කර ගැනීමේ ප්‍රධාන සටන් පාඨය වුණේ. එහෙම ඇවිත් චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය රටේ බලය අත්පත් කර ගත්තා. නමුත්, එහෙම වෙනසක් කරන්න එතුමියට හැකියාවක් ලැබුණේ නැහැ. නැවත වතාවක් එතුමිය, "මගේ අවසන් වතාවට මම මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරනවා" කියා ඉදිරිපත් වෙලා ජනතා බලය ලබා ගත්තා. නමුත්, ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන්න එතුමියට හැකියාවක් ලැබුණේ නැහැ.

ඊට පසුව මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා හරි ලස්සණ සුරංගනා කථා කිව්වා, "මේ විධායක ජනාධිපති ක්‍රමය තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මම වෙනස් කරනවා. මට බලය දෙන්න" කියා. ඒ බලය ජනතාව එතුමාට ලබා දුන්නා. ඒත් ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කළේ නැහැ. එතුමාට ඒකට හැකියාවක් තිබුණේ නැහැ. නැවත වතාවක් බලයට පත් වෙන්න තරග කරද්දි -ජනාධිපතිවරණයට ඉල්ලනකොට- මහින්ද රාජපක්ෂ මැතිතුමා කිව්වා, "මම මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කර දැන් ගෙදර යන්න ලැහැස්තියි" කියා. එතුමාට ඒ සඳහා හැකියාව තිබුණා. එතුමා පාර්ලිමේන්තුව තුළ තුනෙන් දෙකේ බලයක් නිර්මාණය කරගෙන තිබුණා.

ජනතාවට දුන්න පොරොන්දු -අවුරුදු 10ක් තිස්සේ ජනතාවට දුන්න පොරොන්දු- එතුමා උල්ලංඝනය කළා. විධායක බලය වෙනස් කරනවා වෙනුවට මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා කළේ මොකක්ද? තමන්ගේ බලතල තවත් තහවුරු කරන, ඒකාධිපතිත්වය තවත් තහවුරු කරන ව්‍යවස්ථා සංශෝධනයක් මිස ජනතාවගේ සිතුම් පැතුම් ඉටු කරන අවස්ථාවක් එයින් උදා වුණේ නැහැ. මේ තුළින් එදා විපක්ෂය ආණ්ඩුවට පෙන්වා දුන්නේ මේ ව්‍යවස්ථාවේ අහිතකර පැත්තයි. නමුත් එදා විපක්ෂයේ අයත් ආණ්ඩුවට අර ගෙන මේ අහිතකර පැත්ත ක්‍රියාත්මක කරවීම නිසා මේ රටේ සදාචාරය අන්තයටම පිරිහුණා. දේශපාලන නායකයෝ, ජනාධිපතිවරු, "මේ ව්‍යවස්ථාව වෙනස් කරනවා, විධායක ජනාධිපති ක්‍රමය නැති කරනවා" කියමින් අවුරුදු විසිපහක් තිස්සේ

ජනතාව රවට්ටලා මේ රටේ සදාචාරය අන්තිමට පිරිහිලා මේ රට දුරචාරය සහිත රටක් බවට පත් කරන්න පටන් ගත්තා. කුඩුකාරයෝ, එතනෝල්කාරයෝ, කැසිනෝ ව්‍යාපාරිකයෝ තීන්දු තීරණ ගන්නා තත්ත්වයට මේ රට පත් කළා. මේ රටේ රජයට ගැති, පාලකයන්ට ගැති සමහර ජනතාව විතරක් නොව ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු, පළාත් සභා මන්ත්‍රීවරු ඇතුළු මහජන නියෝජිතයන් සැමියාව මරා දමලා බිරිඳව දූෂණය කරන තත්ත්වයට රටේ සදාචාරය පිරිහුණා. නීතිය අවනීතිය බවට පත් වුණා. රාජ්‍ය සේවකයන් ගස්වල බඳින තත්ත්වයට දේශපාලනඥයා පත් වුණා. රාජ්‍ය සේවකයන් නීතිය අකුරට ක්‍රියාත්මක කිරීම නිසා ඔහුගේ පෞද්ගලික වාහන ගිනිබත් කරන තරමට දේශපාලනඥයා මේ තුළ ශක්තිමත් වුණා. ඒ විතරක් නොවෙයි, පාසලට ගිහිල්ලා ගුරුවරයාව දණගස්වන තත්ත්වයට මේ ව්‍යවස්ථාව තුළ දේශපාලනඥයා ශක්තිමත් වෙන්න පටන් ගත් හැටි පසු ගිය කාලයේ අපි දැක්කා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යුක්තිය ඉෂ්ට කර ගැනීම සඳහා අසරණ ජනතාව වෙනුවෙන් යන්න තිබෙන තැන පොලීසිය. තමන්ගේ දුක කියන්න තිබෙන තැන පොලීසිය. නමුත් පසු ගිය කාලයේ පොලීසිය දේශපාලනීකරණය කර පොලීසිය කියන ආයතනය අසරණ ජනතාව ආරක්ෂා කරන, යුක්තිය ඉටු කරන ආයතනයක් නොව මිනීමරුවන්, ස්ත්‍රී දූෂකයන්, මුදල් ගසාකන්නන් ආරක්ෂා කරන ආයතනය බවට පත් වෙන්න පටන් ගත්තා. අසරණ වුණාම අපට අන්තිමටම ගිහිල්ලා දුක කියන්න තිබෙන්නේ අධිකරණයයි. මේ රටේ අධිකරණයත් දේශපාලනීකරණය වෙලා ජනතාව තුළ අධිකරණය පිළිබඳ විශ්වාසය නැති වෙලා ජනතාවට නොදකින දෙවියන්ගේ පිහිට පතන්න යන්න සිද්ධ වුණා. ඒක අපි දැක්කා. මේ විධියට ජනාධිපතිවරු අවුරුදු විසිපහක් තිස්සේ දිගින් දිගටම රැවටීම තුළ ජනතාව අසරණ වුණා. අපේ පැතුම් ඉෂ්ට කරන්නේ කවුද, ඒක කරන්නේ කොහොමද? මේ රටේ ඉන්න දේශපාලනඥයෝ සියලු දෙනාම හොරු, වංචාකාරයෝ. බොරු කියා ඡන්ද ගන්නවාය කියන එක ජනතාව කල්පනා කළා. දේශපාලනඥයා තුළ පවා ඒ කළු පැල්ලම ඇති වෙන්න පටන් ගත්තා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අන්තිමේදී ජනතාවට නායකයෙක් සොයන්න සිද්ධ වුණා. ඒ නායකයා උඩු රැවුල තිබෙන නායකයෙක් වෙන්න ඕනෑ නැහැයි කියා ජනතාව තීරණය කළා. හයයි හතරේ සයිස් එකේ ප්‍රතාපවත් නායකයෙක් වෙන්න ඕනෑ නැහැයි කියා ජනතාව තීරණය කළා. දරුවෝ වඩා ගෙන බඩ අත ගාන, ඔළුව අත ගාන "මල්ලියේ" කියන නායකයෙක් වෙන්න ඕනෑ නැහැයි කියා ජනතාව තීරණය කළා. ඇත්ත ඇති සැටියෙන් කියන පොරොන්දු ඉෂ්ට කරන නායකයෙක් වෙන්න ඕනෑ කියන එක ජනතාව තීරණය කළා. මේ මිනීමරු ඒකාධිපති රැල්ල, විධායක ජනාධිපති ක්‍රමය වෙනස් කරන නායකයෙක් සොයන්න ඕනෑ කියා තීරණය කර තමයි ජනතාව කල්පනා කළේ. ඒ වෙලාවේ වාසනාවට අපේ රටේ එහෙම පුද්ගලයෙක් හිටියා. ඒ අභියෝගය ජය ගන්නවා කියා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඉදිරිපත් වුණා. එතුමා දැරූ පක්ෂයෙන්, එතුමා ජීවිත කාලය තුළම පෝෂණය කළ පක්ෂයෙන් එතුමා අයින් වුණා. පාලක පක්ෂයේ මහ ලේකම් ධුරය එතුමා දැරුවා. ඒකෙන් අයින් වුණා. එතුමා දරපු ඇමතිකම පරිත්‍යාග කළා. අයින් වුණා. එතුමා මේ වෙනස දැන ගත්තා. ජනතාවගේ පැතුම ඉෂ්ට කරන්න පුළුවන් වන්නේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා එක්ක අත්වැල් බැඳ ගෙන මිසක්, එක්සත් ජාතික පක්ෂයත් එක්ක අත්වැල් බැඳ ගෙන මිසක්, ඒ සඳහා වෙනත් ක්‍රමයක් නැහැයි කියා. ඒ නිසා තමන් පෝෂණය කළ පක්ෂයෙන් අයින් වෙලා රනිල් වික්‍රමසිංහ මැතිතුමා ප්‍රමුඛ එක්සත් ජාතික පක්ෂය සමඟ අත්වැල් බැඳ ගෙන මේ කාර්යයට එකතු වුණා. එතුමා මේකට එන කොට තමන්ගේ ජීවිතය පිළිබඳ ආශාව අයින් කළා. තමන්ගේ දරුවන්ගේ, තමන්ගේ බිරිඳගේ ජීවත් වීමේ ආශාව අයින් කර මේ සටනට එකතු වුණා. ජනතාව එතුමාව විශ්වාස කළා. ඡන්දය දුන්නා. ජයග්‍රහණය කළා. ඊට පසුව අනෙක් නායකයෝ වාගේ එතුමා මේ අරමුණ අතහැරියේ නැහැ. ජනතාවගේ පොරොන්දු අමතක කළේ නැහැ. දින සියයක් තුළ ජනතා පොරොන්දු ඉෂ්ට කරන්නට ගන්න ඕනෑ ක්‍රියාදාම සියල්ලම එතුමා ගත්තා. අන්න ඒ පොරොන්දුව ඉෂ්ට කරන ඉතිහාසගත වන දවසයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ. නැවතත් මේ රටේ සදාචාරය, යහ පාලනය, විනීතව හැසිරීම, මානව හිමිකම් පිරි සමාජයක් ගොඩ නැඟීම ආරම්භ වන දවස අදයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද මේ රටේ-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දෙකක කාලයක් ලබා දෙන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
අනෙක් අයගේ වේලාවෙන් අඩු කරන්න තමයි වෙන්නේ.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මේ රටේ මෙතෙක් පැවති ඒකාධිපති වියරුව අවසන් කරලා ආයෙත් කිසි දවසක ඒකාධිපති පාලන ක්‍රමයක් නොඑන්නට ඒකාධිපති පාලන ක්‍රමයට තිත තබන දවසයි මේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. උගතුන්ට රිසි සේ මේ රටේ වැඩ කරන්න පුළුවන් වන, උගතුන්ගේ දැනුම මේ රටේ සංවර්ධනය වෙනුවෙන් යොමු කරන්න පුළුවන් වන, ඒ සඳහා වාතාවරණය සැකැසෙන දවසයි මේ ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි. එම නිසා මම අවසාන වශයෙන් කියන්නේ, මේ රටේ මහජන නියෝජිතයින් කෙස් පැළෙන තර්ක ගේන්නේ නැතිව, විවිධ විවිධ දේවල් කියන්නේ නැතිව අවුරුදු 25ක් තිස්සේ ජනතාව රවටමින්, ජනතාවට බොරු බේගල් කිව්ව එක තවදුරටත් කරන්නේ නැතිව මේ සංශෝධන පනත් කෙටුම්පතට අත උස්සලා ඡන්දය ලබා දීලා ඒ දවස මේ රටේ සමස්ත ජනතාවට උදා කර දෙන්න කියලායි. දේශපාලනඥයා -මන්ත්‍රීතුමා- බදාගෙන හිටපු බලය, ජනාධිපතිවරයා බදාගෙන හිටපු ඒකාධිපති බලය අවසන් කරන්න යන මොහොත මේ. එම නිසා මම කියනවා, අපේ රට ඉතිහාසයට එක් වෙයි කියලා. ලෝකයේ කිසිම නායකයෙක් තමන්ගේ බලය අඩු කර ගෙන නැහැ; නැති කර ගෙන නැහැ. නමුත්, ශ්‍රී ලංකාව ප්‍රජාතන්ත්‍රවාදී ජනතාවක් සිටින රටක් විධියට ලෝකය ඉදිරියේ බැබළෙන දවස අද වනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එම නිසා මම සියලුම මන්ත්‍රීවරුන්ගෙන් ආයාචනය කර සිටිනවා, මේ සඳහා කෙස් පැළෙන තර්ක ගෙන එන්නේ නැතිව, වාද භේද වෙන්නේ නැතිව මේ අවස්ථාවට එකතු වෙන්න කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවට එකතු වෙන්න බැරිනම්, මේ පනත් කෙටුම්පත් සංශෝධනයට අත උස්සන්නේ නැතිනම් ඒ අය ජනතා ද්‍රෝහීන් විධියට සලකන්න මේ රටේ ජනතාවට සිද්ධ වෙනවා. ඊළඟ මැතිවරණය එන විට ඔවුන්ට දේශපාලන කුණු බක්කියට යන්න සිද්ධ වීම වළක්වන්න බැහැයි කියා ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The next speaker is the Hon. (Dr.) Harsha De Silva. You have eight minutes.

[අ.භා.12.50]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - கொள்கை உருவாக்கம், பொருளாதார அலுவல்கள், சிறுவர், இளைஞர் மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of Policy Planning, Economic Affairs, Child, Youth and Cultural Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතාමත්ම වැදගත් දවසක්. අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය නැවත ස්ථාපනය කරන අද දිනයේදී විනාඩි 8ක පමණ සුළු කාල ප්‍රමාණයක් හෝ ලබා දීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වනවා. මෙම ව්‍යවස්ථා සංශෝධනය කළ යුත්තේ ඇයි කියන එක පිළිබඳව ඊයේත් අදත් මෙම පාර්ලිමේන්තුවේ දී විවාද කළා. ඊට කලින් අවුරුදු 10ක් තිස්සේ මේ පිළිබඳව සමාජයේ විවාද වුණා. අවසානයේදී, ජනවාරි 08වෙනි දා පැවැති ජනාධිපතිවරණයෙන් ලක්ෂ පනස් අටක් ජනතාව මහින්ද රාජපක්ෂ මැතිතුමාට ඡන්දය ලබා දෙන අවස්ථාවේදී, ලක්ෂ හැට දෙකක් ජනතාව මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ඡන්දය ලබා දීලා කිව්වේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න බලය ඔබට තිබෙනවා කියලායි. ඒ අවස්ථාවේදී එතුමා ජනතාවට කිව්වේ, "ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සහයෝගය ලබා ගෙන මෙම ව්‍යවස්ථා සංශෝධනය කර ගන්න මට පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා" කියලායි. අද සවස 6.00 වන විට, මේ පාර්ලිමේන්තුවේ ඇත්තවශයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පෙනී සිටින ගරු මන්ත්‍රීතුමන්ලා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සම්මත කර ගන්න සහයෝගය ලබා දෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. මූලික වශයෙන් මෙම ව්‍යවස්ථා සංශෝධනයෙන් අපි බලාපොරොත්තු වෙන්නේ කුමක්ද? පළමුවන කාරණය, තොරතුරු ලබා ගැනීමේ අයිතිය ජනතාවට ලබා දීමයි. ඒ පිළිබඳව මේ රටේ කාලයක් තිස්සේ සාකච්ඡා වුණා. තොරතුරු ලබා ගැනීම ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් බව මේ ලෝකයේ බොහෝ ප්‍රජාතන්ත්‍රවාදී රටවල තහවුරු වෙලා තිබෙනවා. ඒ අයිතිය අපේ රටේ ජනතාවට ලබා දිය යුතුයි කියන තැන අපි ඉන්නවා.

දෙවැනි කාරණය තමයි, ජනාධිපතිවරයාගේ කාලය අවුරුදු 6 සිට අවුරුදු 5 දක්වා අඩු කිරීම. මම හිතන හැටියට බොහෝ රටවල අවුරුදු හතරක, එහෙමත් නැතිනම් අවුරුදු 5ක කාල සීමාවක් තමයි තිබෙන්නේ. ලංකාවේ අවුරුදු 6ක කාල සීමාවක් තිබෙනවා. එය අසාමාන්‍ය කාල පරිච්ඡේදයක්. අවුරුදු 6 කාල සීමාව අවුරුදු 5දක්වා අඩු කිරීම සඳහා මෙම දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතින් සංශෝධන ඉදිරිපත් වෙනවා.

තුන්වැනි කාරණය තමයි, ජනාධිපතිවරයාගේ ධුර කාලය වාර දෙකකට සීමා කිරීම. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඒ ආකාරයෙන් තමයි තිබුණේ. නමුත් ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා හෝ එහි බලය අඩු කරනවා කියලා ඡන්දය ඉල්ලා ජනාධිපති වුණු මහින්ද රාජපක්ෂ මැතිතුමා ධුර කාල ඕනෑම සංඛ්‍යාවක් ලබා ගත හැකි වන අයුරින් දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගත්තා. එය නැවතත් ධුර කාල දෙකකට සීමා කිරීමට මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් බලාපොරොත්තු වෙනවා.

ඊළඟට ජනාධිපතිවරයාගේ මිය යෑම හෝ ඔහුට ක්‍රියා කිරීමට යම්කිසි අවහිරතාවක් තිබෙන අවස්ථාවකදී පුරප්පාඩුවක් තිබෙනවා නම්, කථානායකවරයා ජනාධිපතිවරයාගේ වැඩ බැලිය යුතුයි කියලා මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඉදිරිපත් කරනවා. ඊළඟට මේ සංශෝධනයෙන් ජනාධිපතිවරයාට වගකීම් වැඩි කරනවා. ඒ, ජනාධිපතිවරයා ජාතියේ සමගියේ සංකේතය විය යුතුයි කියන ස්ථානයේ ඉඳලා ඔහුගේ දැන් තිබෙන වගකීම්වලට වඩා, ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීම සඳහා වගකීම් කිහිපයක් ලබා දෙනවා.

ඊළඟ කාරණය මෙයයි. ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වග කිව යුතුයි කියන සංශෝධනය මෙහි ඉදිරිපත් කරනවා. දැන් තිබෙන ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට කිසි විධියකටවත් වග කියන්නේ නැහැ. ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා කථා කරමින්, සමහර අවස්ථාවලදී මේ පාර්ලිමේන්තුවේ ජනාධිපතිවරයාගේ නම කියන එක පවා ඉවත් කරනවා කියන කාරණය පෙන්වා දුන්නා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඔය පුටුවේ වාඩිවෙලා ඉඳගෙන සමහර වෙලාවට කියනවා, ජනාධිපතිවරයාගේ නම කියන්න බැහැයි කියලා. එවැනි තත්ත්වයක් තමයි මේ පාර්ලිමේන්තුවේ තිබෙන්නේ. එතැන ඉඳලා ඉතා විශාල වෙනසක් කරලා ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වග කිව යුතුයි කියන කාරණය මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අපි ඉදිරිපත් කරනවා.

ඊළඟට ජනාධිපතිවරයාගේ මුක්තිය පිළිබඳවත් සංශෝධන ඉදිරිපත් කරලා තිබෙනවා. දැන් තිබෙන තත්ත්වයට අනුව ජනාධිපතිවරයා නීතියට ඉහළිනුයි සිටින්නේ. එහෙම නොවිය යුතුයි. ජනාධිපතිවරයාට ඉහළින් නීතිය තිබිය යුතුයි කියන සංශෝධන අපි ඉදිරිපත් කරනවා. එය මුක්තිය සම්පූර්ණයෙන්ම අයින් කිරීමක් නොවෙයි, එය සංශෝධනය කිරීමක් හැටියට තමයි ඉදිරිපත් වෙන්නේ.

ඊළඟට මේ සංශෝධනයෙන් අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව නැවත හඳුන්වලා දෙනවා. මේ කාරණයේදී තමයි ප්‍රශ්නය පැන නැඟිලා තිබෙන්නේ. විපක්ෂ මන්ත්‍රී කණ්ඩායම කියනවා, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට මන්ත්‍රීවරු දස දෙනෙක් පත් කරන්න කියලා. එහෙම නොවෙයි මෙතැනදී අපි සංශෝධන ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ සංශෝධනයේ තිබෙන්නේ දේශපාලනයේ නිරත නොවන වැදගත් පුද්ගලයන් හත් දෙනෙක් සහ කථානායකවරයා, අගමැතිතුමා සහ විපක්ෂනායකවරයා පත් කරන්න කියලායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම කල්පනා කරලා බලන්න, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දස දෙනෙක් පත් කරලා කමිටුවක් පත් කරලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් ඇති කරන්නේ මොකටද? එහෙම නම් අපිට පාර්ලිමේන්තුවටම පුළුවන් ඒ ව්‍යවස්ථා සභාව හැටියට වැඩ කරන්න. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් මොනවාද කරන්නේ? අනෙක් ස්වාධීන කොමිෂන් සභා පත් කරන එකයි කරන්නේ. එහෙම නම් දස දෙනෙක් විතරක් කොමිෂන් සභා පත් කරන්නේ මොකටද? අපි 225 දෙනාටම මේ කොමිෂන් සභා පත් කරන්න පුළුවන් නේ. මේ අනවශ්‍ය, තේරුමක් නැති තර්ක ගෙනැල්ලා මේ කරන්න හදන්නේ මේ වැඩේ කඩාකප්පල් කරන එක පමණයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා අපේ මේ සංශෝධනයට ඉඩ දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඊළඟට මෙහි තිබෙන වැදගත් කාරණාවක් තමයි ජනාධිපතිවරයා, අගමැතිතුමා සහ ඇමැති මණ්ඩලය පිළිබඳව තිබෙන සංශෝධන. මෙහිදී ඇමැතිවරුන් නිර්දේශ කරන්න අගමැතිවරයාට බලය ලබා දීලා තිබෙනවා. අගමැතිවරයාගේ ඒ නිර්දේශ ජනාධිපතිවරයා සලකා බලා, අගමැතිවරයාගේ උපදෙස් මත ඇමැති මණ්ඩලය පත් කරන්න කියලා අපි මේ සංශෝධනයෙන් ඉදිරිපත් කරනවා. ඒ කාරණය ශ්‍රේෂ්ඨාධිකරණයට ගිය අවස්ථාවේදී එය කළ හැකි දෙයක් හැටියට ශ්‍රේෂ්ඨාධිකරණයත් පිළිගත්තා. දැන් ඒ වෙනුවට විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කියනවා "එහෙම කරන්න ඕනෑ නැහැ. අගමැතිතුමාගෙන් අහන්න ඕනෑ නැහැ. ජනාධිපතිවරයාට ඕනෑ ඕනෑ විධියට ඇමැති මණ්ඩලය පත් කරන්න පුළුවන්. එහෙම

නැත්නම් අයින් කරන්න පුළුවන්. එහෙමත් නැත්නම් වෙනස් කරන්න පුළුවන්." කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම් මේ සංශෝධනය ගෙනැල්ලා තිබෙන්නේ මොකටද? ඇත්ත වශයෙන්ම වැඩිම විශ්වාසය තිබෙන මන්ත්‍රීවරුන්ගේ නායකයා හැටියට අගමැතිවරයා පත් කරන්නෙත් ජනාධිපතිවරයායි. එහෙම තිබෙද්දී අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ මේ බලතල බෙදා ගැනීමක්. මේ බලතල බෙදා ගැනීම හරහා තමයි අගමැතිවරයාගේ උපදෙස් ජනාධිපතිවරයා සලකා බලා ඇමැති මණ්ඩලය පත් කරන්න ඕනෑ කියන තැන හරියි කියන එක ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිර්දේශ කරලා තිබෙන්නේ. අපි ඒක තමයි මේ ව්‍යවස්ථා සංශෝධනයෙන් ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ඊළඟට, පාර්ලිමේන්තුවේ ධුර කාලය අවුරුදු 6 සිට අවුරුදු 5ට අඩු කිරීම මේ සංශෝධනයෙන් සිදු කෙරෙනවා. ඊළඟට, මේ සංශෝධනය අනුව, අවුරුද්දකින් පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිවරයාට නොහැකි විය යුතුයි. අවුරුදු හතරහමාරකට පස්සේ ඔහුට ඒ අයිතිය ලැබිය යුතු බව මේ සංශෝධනයෙන් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම හදිසි පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීම අහෝසි කරලා තිබෙනවා. පාර්ලිමේන්තු විවාදයකට දවස් 7කට කලින් පනතක් සම්බන්ධ ගැසට් නිවේදනය කරන්න ඕනෑය කියන එක වෙනුවට, දවස් 14කට කලින් ඒ ගැසට් නිවේදනය කරන්න ඕනෑ බව මේ සංශෝධනයෙන් ඉදිරිපත් වෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමක් එතැනදී සිදු වෙනවා.

අවසාන වශයෙන් මම කියන්න ඕනෑ, මේ මූලික සංශෝධනවල පෞද්ගලික මාධ්‍ය සඳහා නීති පනවා තිබුණ බව. කිසිම හේතුවක් නොමැතිව ඡන්ද නීති උල්ලංඝනය කළහොත්, ඒවා ඔප්පු වුවහොත්, වසර 03කට බන්ධනාගාරයකට යවන්න පුළුවන් කියන සංශෝධන තිබුණා. ඒ සංශෝධන ජනාධිපතිවරයා සහ අගමැතිවරයා ඉල්ලා අස් කර ගෙන තිබෙනවා. ඒ අනුව, කිසිම විධියකින් මේ සංශෝධනවලින් මාධ්‍ය වාරණය කෙරෙන්නේ නැහැ කියන පොරොන්දුව අපි මෙතැනදී දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි ධනාත්මක වෙනස්කම් තමයි මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා අපි පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කරලා තිබෙන්නේ. අපි බලාපොරොත්තු වෙනවා පක්ෂ, විපක්ෂ සියලුම මන්ත්‍රීවරු මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත සම්මත කර ගන්න අත ඔසවයි කියලා. නමුත් යම්කිසි හේතුවක් නිසා මේ සංශෝධනය සම්මත කර ගන්න අපට තුනෙන් දෙකක ඡන්දය ගන්න බැරි වුණොත්, විපක්ෂය මෙය කඩාකප්පල් කරන තත්ත්වයකට පත් වුණොත්, අපි ඕනෑම වේලාවක මැතිවරණයකට යන්න සූදානම් කියලා ජනතාවට කියන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂයට කිසිම ගැටලුවක් නැතිව ඉදිරි මැතිවරණයේදී අතිවිශිෂ්ට ජයග්‍රහණයක් ලබා ගන්න පුළුවන්. නමුත් අද අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ ඊට වඩා වටිනා ව්‍යවස්ථා සංශෝධනයක් සම්මත කර ගැනීමයි. පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපනය කරලා, ඒ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කර ගන්න සියලුම දෙනා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට එකඟ වෙන්නය කියලා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

The next speaker is the Hon. D.M Swaminathan. You have eight minutes.

[1.00 p. m.]

**ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා (නැවත පදිංචි කිරීම, ප්‍රතිසංස්කරණය හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன் - மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு மற்றும் இந்து சமய அலுவல்கள் அமைச்சர்)
(The Hon. D.M. Swaminathan - Minister of Resettlement, Reconstruction and Hindu Religious Affairs)

Hon. Presiding Member, I am glad we are proceeding on the Debate on the Nineteenth Amendment to the Constitution Bill. There were many speakers before me. Today we are facing the same old situation that we faced a few months ago.

Sri Lanka, as you are well aware, is a unitary State. On the 2nd of March, 1815, a Convention called "The Kandyan Convention" had been prepared by John D' Oyly and there was a meeting summoned at the Governor's Audience Hall at the King's Palace in Kandy. Subsequent to that, there were recommendations of Colebrooke Commission in 1833. Then, there were recommendations of the Donoughmore Commission. Thereafter, we had the Soulbury Commission. Subsequently, we went on to the 1972 Constitution, 1978 Constitution, so on and so forth. The Sri Lankan Governments have passed their own legislations.

Today, we have before us a fantastic Bill termed "Nineteenth Amendment to the Constitution", which gives entire rights to a democratic system of this country. I do not understand why the Opposition is trying even to debate this subject. This is a Bill which should be accepted by the Opposition. This is a Bill that gives every democratic power to the country, to the President, and to the Prime Minister. If that cannot be accepted by the Opposition - they want to oppose it just for the sake of opposing it. Of course, that maybe the constitutional requirement. In Britain, they say that the right of the Opposition is to oppose. The Opposition opposes for no other reason but for a political motivation. The proposed Nineteenth Amendment to the Constitution Bill seeks to make the following amendments: inclusion of a right to information; reducing the term of office of the President; introducing a two- term limit on the number of terms a person can hold office as President, which is a very important factor. Then, provision for an acting President in the event of death/absence of the incumbent President; imposition of additional duties on the President; effective renumbering of Article 42 as Article 33A; the circumstances in which Presidential immunity will not apply; amendments relating to the time period within which an election shall be held if an election is determined to be void; reintroduction of the Constitutional Council; changes made to Chapter VIII with regard to matters concerning the Executive, the Cabinet of Ministers, the appointment of Ministers and the ceiling on the number of Ministers; reducing the term of Parliament; amendments relating to the prorogation of

[ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා]

Parliament; the jurisdiction of the Supreme Court relating to disciplinary actions against Members of Parliament; removal of the provisions relating to Urgent Bills; and provisions relating to the Independent Commissions - to be appointed based on the recommendations of the Constitutional Council.

Now, if you look at all these, the entire crux of a democratic system of a government has been introduced by this Nineteenth Amendment. I must say that the Constitutional Council is an important body in this Nineteenth Amendment. According to the Nineteenth Amendment, the Constitutional Council should be a pluralistic body comprising people of different vocations; competent people in their own professions to be appointed. The reason is that they should be in a position to advise the President, the Prime Minister, and the Cabinet of Ministers as to how the appointments should be made. That is why there needs to be a Constitutional Council. Now, the Opposition says that the Constitutional Council should be a political Constitutional Council. Then, what is the need for a Constitutional Council? The Constitutional Council should be an independent body and that was originally introduced by the Seventeenth Amendment. We need that Constitutional Council to embody the system of democracy in this country. If that is not there, there is no point in our bringing in this Nineteenth Amendment.

Then, the second point is this. As far as the Nineteenth Amendment is concerned, it has been referred to the Supreme Court and the Supreme Court has made a decision. In its determination, they have stated the provisions that may not be active or which may democratically not be accepted under this Constitution. Those provisions have been submitted to His Excellency the President, the Hon. Prime Minister, the Cabinet of Ministers and to Parliament. They have considered those matters and deleted all those provisions, which the Supreme Court had said needs a referendum. Those have been deleted. All those provisions regarding the appointments and the powers in respect of the Prime Minister have been deleted. "The Prime Ministers shall be the head of the Cabinet of Ministers", that has been deleted. "The Prime Minister shall determine the number of Ministers….", that has been deleted. "The Prime Minister shall determine the subjects and functions which are to be assigned to Ministers...", that has been deleted. "The Prime Minister may at any time change any assignment made under paragraph (2)", that has also been deleted. Then, "At the request of the Prime Minister, any Minister of the Cabinet of Ministers may by Notification published in the Gazette, delegate to any Minister..," that power has also been deleted.

People criticized that these powers are going to be given to the present Prime Minister. It is not so. It will be given to whoever the Prime Minister, it maybe the Hon. Ranil Wickremasinghe or it maybe someone else, those powers would be vested in him. We accommodated those provisions for a certain reason but the Supreme Court, with due diligence, has made those amendments and we are accepting that. Therefore, there is no reason for us to go back to the earlier position and argue on that issue. These are the two salient factors that have been studied by the Supreme Court and has made its determination accordingly.

Then, the provision of appointment of a Competent Authority by the Election Commission to monitor contravention of guidelines by the State or private media during an election, which is contained in Clause 26 - Amendment of Article 104B (5)(c), that has also been taken out. That is also an important factor which had been considered, but the Supreme Court has ordered that it should be taken out. The Supreme Court has said that this Clause does not set out the qualifications or the post that a person should hold in order to be appointed as a Competent Authority and also how he should be removed. Under those circumstances the Supreme Court had made an order to delete that Clause. We accept that position. Therefore, what are we trying to argue?

The most fundamental issue is, the President of this country who is vested with powers through the 1978 Constitution has come forward and told the people of this country, " I do not want these powers. I want power to run this country democratically". So, the President is not going to exercise those powers. He has come before this august Assembly and said, "Please take away my powers. I am going to run this country according to the democratic system of Prime Minister and the Cabinet of Ministers". If that cannot be accepted by the Opposition, then what are you asking for? What are the democratic powers you are asking for? What are you canvassing for? You are talking about the past, that someone had given certain things to certain people. There is no historical value to this argument. We also can talk about the political grievances we have had during the earlier Government, but we do not want to go into those factors.

There are so many issues. Even today a Member had brought up an issue regarding the appointment of a committee as far as the Governor of the Central Bank is concerned. I am also a lawyer, a practising lawyer for the last 44 years. That Committee consists of lawyers with 18 years, 23 years, and 27 years of practice. I do not understand this. They are not junior lawyers. They are people of a certain calibre. They cannot make any convincing remarks to say that these committees have been appointed politically or otherwise. Every lawyer who is appointed has a certain responsibility. When we take oath as lawyers, we have certain responsibilities to the Government of Sri Lanka and we are not going to intervene or do anything that is irregular as far as this matter is concerned.

Sir, the position here is, we have to have a democratic system in the country. We have gone through all these troubles for the last so many years. We all know in what way the former Government, the former regimes have misused their rights and powers and the amount of malpractices that have taken place in this country. Those malpractices are being looked into and at the correct moment, at the correct forum, they will be argued. I do not want to go into those issues.

Therefore, what I merely want to say is that this whole argument or the entire debate is not necessary. Why? Because this Nineteenth Amendment embodies a democratic system of government in this country, which gives privileges to the people and safeguards the sovereignty of the people. If that cannot be accepted by the Opposition, I would say that we do not need even a Parliament of this nature to consider this issue.

Today, even at the latter stages, probably the Opposition will bring in certain amendments, which will go fundamentally against the Constitution. If the Constitutional Council is not embodied with the right of independence, if it does not reflect a pluralistic composition, Constitutional Council is not necessary. The Constitutional Council plays a very important role as far as this Nineteenth Amendment is concerned. As far as the Prime Minister is concerned, his powers have been totally restricted and the President's powers have been very clearly enumerated. He is going to be the Head of the Government, Head of the Executive and Head of the Legislature. He is also the Commander-in-Chief of the Army. All those powers have been vested in His Excellency the President.

So, we should thank His Excellency the President and the Hon. Prime Minister for bringing in the Nineteenth Amendment to the Constitution Bill and I respectfully move that this Assembly accepts the provisions in the Bill.

Thank you.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

The next speaker is the Hon. Rauff Hakeem. You also have eight minutes.

[1.11 p. m.]

**ගරු රවුෆ් හකීම් මහතා (නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා)**
(மாண்புமிகு றவூப் ஹகீம் - நகர அபிவிருத்தி, நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்பு அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of Urban Development, Water Supply and Drainage)

*Bismillahir Rahmanir Raheem.*

Hon. Presiding Member, this historic piece of legislation, in my opinion, should have bipartisan support in this august Assembly. I have been in this House for the past 20 years and I have witnessed previous occasions where important amendments to the Constitution were passed with bipartisan support. But, unfortunately, today, we see a different situation, but yet, we have not lost all hope. We are hoping that the Hon. Members of the Sri Lanka Freedom Party would fully fall behind the plea of His Excellency the President, who made a very convincing speech last morning in moving this Constitutional amendment, which has been an effort, or rather, a culmination of a long struggle by various forces. It is only incidentally that the Bill is now before the House since the President and the Prime Minister collectively want to honour their pledge given to the people.

Mr. Presiding Member, it is important for us to realize that some of us have to atone for our past mistakes. To me, personally, to reverse my decision, to have supported the Eighteenth Amendment. This is a good opportunity for all of us to do so because we see the ill-effects of the Eighteenth Amendment; it was nothing but growing nepotism in the country; cronyism was rampant; abuse of power was untrammelled and there were xenophobic forces that went around even attacking places of religious worship. The type of culture of impunities some of these forces enjoyed was at the behest of those who were giving political patronage to them and all of us suffered immensely. The reputation of this country internationally suffered. But, yesterday, His Excellency the President very correctly enunciated the fact that the induction of this Government has resulted in the international community once again looking at this country's democracy with hope.

Therefore, it is up to us today to grasp this opportunity with both hands and see that we reverse our mistakes. In a sense, I am here to atone for my mistake in supporting the Eighteenth Amendment. Therefore, to reintroduce the Seventeenth Amendment and, together with that, to reduce certain powers of the Executive Presidency is also an important feature of this Constitutional amendment. It has been a long struggle by several forces as I told you before. But, unfortunately since there was one particular party in our coalition, which did not want a total abolition of the Executive Presidency, we have decided to retain it with reduced powers. But, of course, the National Movement for Social Justice headed by the Venerable Maduluwawe Sobhitha Thero, one of the respected Nayaka Theros of this country, yesterday held a big demonstration towards this House, to illustrate the need of the people to have this important amendment passed. Therefore, it is up to us to realize our past mistakes and pass this important legislation. To us, it looks like as if some are trying to sound too clever in order to harness their parochial objectives and are talking about certain amendments which will totally destroy the very essence of the purpose of bringing in this amendment to the Constitution.

[ගරු රවුෆ් හකීම් මහතා]

Therefore, there is no point in bluffing, bullying and disrupting Parliament and disobeying court orders in trying to scuttle this important attempt at changing some features of the Executive Presidency. Ultimately, it looks as if some, within this Chamber, who had criticized the J.R. Jayewardene Constitution are hell-bent on trying to pretend that they are saving JR's Constitution from the machinations of his own Party, the United National Party. They are trying to show the masses as if they are trying to save the J.R. Jayewardene Constitution from the machinations of the United National Party, which was Mr. J.R. Jayewardene's Party. This is what they are now telling the beleaguered Members of the Sri Lanka Freedom Party. I hope the earnest plea of His Excellency the President to see that his sincere effort to fulfil the pledge that he gave to the nation would end up in success this evening when we put it to Vote.

We also hope along with this to have certain other important steps to be taken. One is to try and strengthen the Public Petitions Committee by amending the Standing Orders, so that we will have some way in which we can supervise actions of the independent bodies that we are setting up. Therefore, we are not altogether sacrificing the powers of Parliament. This is what some of them are trying to make out. In fact, it is said that we are diluting the sovereignty of Parliament by appointing members from outside Parliament to the Constitutional Council and this is, in a sense, a very puerile argument to put forward whereas these very Members in the past have spoken otherwise.

There is also an effort to introduce Electoral Reforms. This is an issue which concerns the entire nation. There are parties which represent minority interests. There are parties which have minority political interests. They have all got to be consulted in a process in introducing electoral reforms. I am sure those people who argue that the stability of a future government must be protected by introducing a system which will ensure that a party which gets 50 per cent of the votes should have a stable government. But, that alone should not be the criteria. In my opinion, stability would be ensured also by accommodating minorities. If you do not accommodate minorities or minority political opinions within the Chamber of this House, that in itself can destabilize governments and destabilize the country and this we have experienced in the past.

Therefore, if at all we are going to replace the present Proportional Representation System and bring in a Mixed System where there is going to be the First-Past-the-Post System as well as the Proportional Representation System existing together as a hybrid model, then, we have got to ensure a fair system which has got to be at least 50:50 on Proportional Representation System as well as on constituency based. That would be the suggestion that we will be making to the Cabinet when this is taken up tomorrow.

Along with that, Mr. Presiding Member, I must point out that we have had an incident, which all of us have been quite aghast to witness, where the National Flag has been distorted. There is an organization called Swarna Hansa Foundation, which has seriously violated the law. I must thank the Hon. Dullas Alahapperuma, for being magnanimous enough to apologize for the mistake, whereas some others - among whom are prominent politicians - are trying to justify the right to wave such flags, which is a preposterous thing to do. Therefore, these are issues that should be taken into account. There are also attempts to destroy religious sites which have existed for ages. One such religious site is the Dafthar Jailani in the Balangoda area over which there has been some controversy recently.

So, I am sure that these are matters that we will be able to resolve after having passed this important piece of legislation and it is our wish that there would be complete bipartisan support to have this important amendment to the Constitution passed.

Thank you.

[1.21 p. m.]

**ගරු නවීන් දිසානායක මහතා (සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க - சுற்றுலா மற்றும் விளையாட்டுத்துறை அமைச்சர் )
(The Hon. Navin Dissanayake - Minister of Tourism and Sports)

Mr. Presiding Member, I would like to take this opportunity to express a few sentiments on this historic occasion.

This is indeed a historic occasion for all of us because we see the intrinsic value of the Nineteenth Amendment. This is because His Excellency President Maithripala Sirisena made it a very clear policy and the mandate from the people was also given for this policy.

මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ මැතිවරණ ප්‍රකාශනයේ ප්‍රධානම පොරොන්දුවක් වුණේ ජනාධිපති ක්‍රමයේ තිබෙන අනිසි බලතල අඩු කිරීමයි. මේක ඇත්ත වශයෙන්ම දීර්ඝ ඉතිහාසයක් තිබෙන ක්‍රියාදාමයක්. ඉතාමත්ම දීර්ඝ සටනක් කරලා තමයි, මෙම තැනට අද අපි ඇවිල්ලා ඉන්නේ. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එක් අංගයක් වුණා, විධායක ජනාධිපති ධුරය. ඒ වන විට මගේ පියාත් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ ප්‍රබල ඇමතිවරයෙක්. My father was one of the leading Cabinet Members of the United National Party Government at that time. Over a period of time, it became clear that the excessive powers of the Presidential System have to be curtailed and there have to be some amendments to do this. This thinking was there even

when the Presidential System was introduced. The Sri Lanka Freedom Party always opposed the Presidential System. Also, during President R. Premadasa's period, my father and the late Mr. Lalith Athulath Mudali spearheaded a movement and actually the thinking of that movement was so vibrant and dynamic that it spread to all sections of society. I was also a young man at that time. When we held the first meeting in Nugegoda, in the history of this country I have never seen a crowd like that; there were nearly 300,000 people. One of the main reasons why my father, the late Mr. Lalith Athulath Mudali and Mr. G.M. Premachandra were moving out of the United National Party was the excessive powers of the Executive Presidential System. So, that kind of thinking permeated not only in the Sri Lanka Freedom Party but also in the United National Party and I am happy to note that in 1999, under the leadership of the Hon. Ranil Wickremasinghe, in Hambantota, the United National Party formally accepted the position that the Presidential powers have to be curtailed. So, I was very happy when I walked into the Chamber today expecting that the Nineteenth Amendment would be passed.

We always had our suspicion about the motives of some people. Earlier, they said that the Nineteenth Amendment would go through if the Twentieth Amendment was also brought in. We accepted that; we wanted that and we cherished that because we also wanted an amendment to the electoral system. Once this was given, other so-called objections came.

Now, the latest one is regarding the Constitutional Council. The idea of the Seventeenth Amendment has always been that the Constitutional Council should be independent. Now, they want the Constitutional Council to be packed by politicians. Surely, Sir, this is not acceptable and it is not healthy for a vibrant democracy like Sri Lanka. Now, I heard there is a compromise of appointing five from Parliament and five from outside. I hope that is acceptable, otherwise, we will not accept these amendments that seek to dilute the effects of the Nineteenth Amendment.

Then, of course, the words "Advisory" and "Consultancy". We feel that there should be some powers given to the Prime Minister. This question is not about Ranil Wickremasinghe; it is not about Maithripala Sirisena. It is about somebody in the future being the President and somebody else being the Prime Minister. Surely, the President should act on the advice of the Prime Minister. This was there in the 1972 Constitution. So, why are these little words being interpreted as being too smart or too intelligent?

We know how the Eighteenth Amendment was rushed through. We were a part of it. Like I mentioned earlier in my speech, we want to absolve ourselves from this bad history, from this copious history and we want to start afresh for the democratic rights of the people of this country. That is why when I walked into the Chamber today in the morning, I was exceedingly happy because I was going to be part of a historic occasion. I do not have that sentiment now as I speak.

The Hon. Mangala Samaraweera is a person who reads history. He knows history. Politics should be about big issues and big things. Today, Sri Lankan politics is all about pettiness; about racial forces being unleashed; about dividing communities; about instigating hatred among communities. That is what Sri Lankan politics has come to, I am sad to say.

Although there are no Opposition Members, - I understand there is a group meeting going on - if they can hear this from somewhere, I appeal to them, do not think about politics, do not think about green and blue, think about the historic occasion that we can seize today because you will never, ever get a chance like this. So, do not be parochial, do not be divisive. The Leader of the Sri Lanka Freedom Party wants this; the leader of the United National Party wants this. So, what is the problem? The problem is a hidden hand that is guiding all these forces, trying to be destructive. They want to come back as the Executive President and some of these people also think that they can come back. So, the bigger occasion is lost; the democratic principle is lost. Instead, we are, of course, caught up in this web of lies and deception, which we are so used to in politics. The Hon. Vasudeva Nanayakkara is not here today. I respect him greatly as a politician. The Seventeenth Amendment is very clear; we raised our hands for the Seventeenth Amendment and said that the Constitutional Council has to be independent. Today, it is a different story. Why? Surely, we should go forward, not backwards. There is so much of acrimony and hatred on the figure of the Hon. Ranil Wickremasinghe. But, the fact of the matter is that the Hon. Ranil Wickremasinghe has conceded so much. If I was going to be the Prime Minister someday - I am not saying that I will - I would want the Members I nominate to get that assigned portfolio. Surely, I as the Prime Minister, should have that right.

Today, because of this Opposition and because the Hon. Ranil Wickremasinghe wants to get this through, he has compromised on that also. He has compromised on the fact that he cannot and he will not. He will give the names of the Cabinet Ministers to the President and the President will assign the functions, the subjects and the duties. Actually, it is a huge compromise. You have to accept and understand it in that context. Otherwise, what is the point in being a Prime Minister?

So, I would say that this historic occasion would be lost, if this kind of narrow, parochial, divisive, racially-instigated politics is done. Surely, we can express ourselves, there can be divisions of opinions but there must be a point of unison and I thought after two-and-a-

[ගරු නවින් දිසානායක මහතා]

half months of negotiations that we could achieve this today. So, while I speak right now, I am skeptical. I hope sanity prevails and the people of this country are not denied the opportunity to get rid of this evil system which has corrupted our society, corrupted our thinking and downgraded politics to a low game of schemes and plots.

Thank you.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

The next speaker is the Hon. Mangala Samaraweera. You have 10 minutes.

[අ.භා. 1.31]

**ගරු මංගල සමරවීර මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு மங்கள சமரவீர - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Foreign Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි ඓතිහාසික පනත් කෙටුම්පතක් විවාදයට ඉදිරිපත් කර තිබෙන මොහොතක විපක්ෂයේ අසුන් හිස් වී තිබීම තුළින්ම අද මේ රටේ විපක්ෂයේ සැබෑ කුහක මුහුණුවර මුළු රටටම හෙළිදරවු වෙමින් තිබෙනවා කියලායි මම හිතන්නේ.

2010 සැප්තැම්බර් මාසයේ 18 වැනිදා තමයි දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ. එදා මේ රටේ ඒකාධිපති පවුල් වාදයකට අත්තිවාරම දමමින් ස්වාධීන කොමිෂන් සභා අහෝසි කරන කොට, ජනාධිපති ධුරය දරන්න පුළුවන් වාර ගණන දෙකයි කියන සීමාව ඉවත් කරලා සදහටම ජනාධිපති ධුරයේ ඉන්නට කුමන්ත්‍රණය කරන කොට, අත් දෙකම උස්සලා එයට සහයෝගය ලබා දුන් පිරිස එදා කරපු ඒ වැරැද්ද අද නිවැරදි කර ගන්නට පුළුවන් අවස්ථාව මඟ හැරීම තුළින් තවමත් විපක්ෂයේ බහුතරයක් ඒකාධිපති වියරුවෙන් පෙළෙන බව මේ අවස්ථාවේ දී මුළු රටම තේරුම් ගන්නට ඕනෑ කියලා මා හිතනවා.

However, Mr. Presiding Member, I hope, as the Hon. Navin Dissanayake just said, that sanity or good sense will prevail even at the last moment and, today, the 28th of April, 2015, will go down as a historic day for Sri Lanka.

In fact, today should be remembered, Mr. Presiding Member, as the day which heralded the beginning of the end of the all-powerful Executive Presidential System in our country. Since introducing the First Republican Constitution in 1972, we have journeyed from a Westminster-style of governance to an all-powerful Executive Presidency introduced by the Second Republican Constitution in 1978. However, both these Republican Constitutions proved to be inadequate to meet the dreams and aspirations of all the communities, ethnic groups and religious groups living in our country. Having suffered the consequences, and realized our mistakes, we gathered here yesterday and today to make an important course correction.

In fact, Mr. Presiding Member, the Nineteenth Amendment to be passed today abolishes many of the executive powers of the presidency while retaining the executive nature of the presidency. That, of course, was because the Supreme Court held that in order to abolish some of the other powers, a referendum would be needed and therefore, the Cabinet decided that we will only present what does not need a referendum at the moment and what could be passed with a two-thirds majority.

However, as I said earlier, I still hope and pray that sanity will prevail even at the eleventh hour and that we are able to pass this Amendment. Even though it is not a total abolition of the Presidency, this Amendment is a right step in the right direction. However, it will be the task of the next Parliament, which is to be formed after the next general election, to completely abolish the Executive System in favour of a fully-fledged Parliamentary democracy.

In the course of this Debate, especially yesterday and this morning, it has become clear to all, that our country has suffered far too long from the corrosive and crippling effects that unchecked, centralized powers wracked on our democratic institutions and political culture. We know that this unaccountable system was in many ways at the root of many of the most pressing national problems. It is also at the root of the culture of impunity and the widespread corruption that we experienced over the last few years.

Sir, it is in this context of such experiences that President Maithripala Sirisena was given a mandate to abolish the Executive Presidential System. The citizens of Sri Lanka and, indeed future generations, will applaud President Sirisena for taking resolute action to fulfil his promises to the people within the parameters of the Supreme Court Ruling. However, if this is not to be, I am sure, likewise, future generations will curse all those who stood in the way of this very important Constitutional Amendment.

However, I would also like to stress, Sir, that this Amendment certainly is not the panacea for all our nation’s problems; this is not the solution to all the evils of our country. Reduction of the Executive powers of the Presidency is only one important step in the challenging journey that we, as a nation, must undertake in order to create “A New Sri Lanka”.

However, we must take heart from the fact that by working together in this House our nation has achieved so much in just 108 days. I am hopeful that the new Parliament to be elected by the people later this year, will shed divisive politics and unite on issues of national significance. In particular, I am hopeful that that new Parliament will do what many other governments attempted but failed to do: to introduce a new Constitution - the Third Republican Constitution of Sri

Lanka. This new Constitution will celebrate Sri Lanka's ethnic, religious and cultural diversity and pluralism and meet the aspirations of all the peoples of Sri Lanka; whether it is the tension between the Sinhalese and the Tamil communities or the Sinhalese and the Muslim communities, eradicating the motivation for terrorism, division and violence requires us to go beyond dealing with its symptoms. The root causes of ethnic conflict need to be addressed once and for all, constitutionally.

Along with democracy, rule of law and human rights, reconciliation and ethnic harmony must be the foundation for the new Sri Lanka we all dream about. Sir, a new Constitution that addresses the concerns and grievances of the minorities, while protecting the rights of the majority, is the urgent need to be addressed by the next Parliament. The resolution of our ethnic conflict which continues even after the war is a *sine qua non* for Sri Lanka's march forward towards peace and prosperity.

Sir, I am reminded of the Preamble to the Constitution of UNESCO which states, "Since wars begin in the minds of men, it is in the minds of men that the defences of peace also must be constructed". On 4th of February this year, the Government made a pledge to ensure that never again will we allow this country to be traumatized by the shedding of the blood of her own citizens. Let us not forget that injustice an inequality breed hatred, discontent and violence. To stand true to her word, the Government's pledge must be etched into the foremost sites of rebellion - the hearts and minds of her citizens. Under the leadership of the Sirisena-Wickremasinghe administration, I am certain that we will form and implement a consensus on the national question that has evaded previous governments. We will use our collective political will to construct great and enduring peace for our country. Sir, I am glad to see that the Hon. Anura Priyadharshana Yapa, the General Secretary of the SLFP coming back to his seat and I hope he brings us good news.

During the last several years, Sri Lanka pursued a policy of aggression towards the international community. We alienated our friends and also international organizations. In the process, we isolated ourselves.

But, within a short period of 108 days, we have managed to take some steps to steer our nation back on course. The visit by the Secretary of State of the United States of America to Sri Lanka on the 2nd and 3rd of May - this weekend - formally announced this morning in Washington, I would say is a very strong signal to the world that Sri Lanka is again back in the centre stage of international affairs. To refrain from opening up our nation to international ignominy and making ourselves once again vulnerable to intrusive external interventions, we must initiate a credible domestic investigation into allegations of violations of human rights and we now are in the process of putting forward such a mechanism before August this year. Such developments are also important to clear the name of our Armed Forces who have received international recognition as a professional and disciplined force. Today, our courageous soldiers are in the Himalayan Kingdom of Nepal saving the lives of those affected by the recent devastating earthquake and our sincere gratitude must also be expressed to our Armed Forces who are doing such a good job internationally.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Minister, your time is over.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Mr. Presiding Member, if I may say this very briefly, as I explained when I addressed the House on the 18th of March, the Sri Lankan diaspora, whether Sinhala, Tamil or Muslim, has a vital role to play not only in the reconciliation process but also in taking Sri Lanka forward as a nation. I spoke that day about initiating a process to review the individuals and entities in the diaspora community who were listed under the Extraordinary Gazette Notification of 21st March, 2014, and I am happy to say that this process has already been initiated.

Finally, Mr. Presiding Member, the time has come for all the people of Sri lanka who truly love their country to decide to work together to overcome their differences and reach consensus.

In fact, there may be a number of issues, which in a democratic society parties may disagree. But, when it comes to constitutional reforms that involves the country's long-term prosperity, let us continue to work together to overcome these differences and reach consensus; we cannot expect our people to be united if their representatives are to be fragmented. Therefore, I appeal to everyone, let not our short-term political goals hinder our nation's progress. Let us discard the rhetoric of hatred, mistrust and division on both sides of the Divide and stand together hand-in-hand as Sri Lankans to reap the fruits of the Asian Century.
Thank you.

[අ.භා.1.44]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම වැදගත් අවස්ථාවක වචන කීපයක් කථා කරන්න ලැබීම ගැන මා සන්තෝෂ වනවා.

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගෙන ආවේ 1972 ජනරජ ව්‍යවස්ථාවෙන් පසුවයි. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය සහිත රටක ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය යනුවෙන් බලය බෙදීම යටතේ ඉතාම ශක්තිමත් විධායකයක්

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

නිර්මාණය කර ගැනීම තමයි 1978 ව්‍යවස්ථාවේ ප්‍රධාන අරමුණ වුණේ. 1978 ව්‍යවස්ථාව නිර්මාණය වෙන්නේ විධායකය ශක්තිමත් කිරීමට පමණක් නොවෙයි. පාර්ලිමේන්තුව පවා විධායකය මුල් කර ගත් අධිකාරි බලයකට යටත් කිරීමකට තමයි උත්සාහ කළේ. ඒ නිසා එක පැත්තකින් විධායක ජනාධිපති ක්‍රමය අපේ රටේ සමහර අයගේ චෝදනාවට ලක් වනවා. අනෙක් පැත්තෙන් සමහර අයගේ ප්‍රශංසාවටත් ලක් වනවා. මම හිතනවා මේ පිළිබඳව මධ්‍යස්ථ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමේ යුතුකමක් තිබෙනවා කියලා. ඒ වාගේම විධායක ජනාධිපති ක්‍රමය අපි සම්පූර්ණයෙන් බැහැර නොකළ යුතුයි කියාත් මා හිතනවා. විධායක ජනාධිපති ක්‍රමය යම් යම් ක්‍රමවේද අනුව පවත්වා ගෙන යෑම ගැන තමයි අද අපි කල්පනා කරන්න අවශ්‍ය වන්නේ. කෙසේ වෙතත් ලංකාවේ විධායක ජනාධිපති ක්‍රමය අත්තනෝමතිකයි කියන මතය ඇති වන්න ප්‍රධාන හේතුව තමයි ඒ හා බැඳුණු වෙනත් ක්‍රමවේද නිර්මාණය නොවීම. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ සඳහා ගන්නා ලද එක්තරා වැදගත් ඉදිරි පියවරක් හැටියට දක්වන්න පුළුවන්.

ලෝකයේ රටවල ව්‍යවස්ථා වෙනස් වනවා. සාමාන්‍යයෙන් ගත්තොත් ලෝකයේ රටවල ව්‍යවස්ථා විවිධ අවස්ථාවල සංශෝධනය කරනවා. ලංකාවේ පමණක් නොවෙයි, අපි ගත්තොත් එක්සත් ජනපදයේ ව්‍යවස්ථාව විසිහත් වතාවක් සංශෝධනය වෙලා තිබෙනවා. ඒ වාගේම සමහර ව්‍යවස්ථා තිබෙනවා අටසිය වතාවක් සංශෝධනය වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ඉන්දියාවේ පවා ව්‍යවස්ථාව විවිධ කාලවල සංශෝධනය වෙලා තිබෙනවා. උදාහරණයක් වශයෙන් ගත්තොත් ඇමෙරිකාවේ Alabama State එකේ 1901 ඉඳලා අටසිය වාරයක් ව්‍යවස්ථාව සංශෝධනය වෙලා තිබෙනවා. සමාජය වෙනස් වනකොට, සමාජය පිළිබඳ මතවාද වෙනස් වනකොට, අදහස් වෙනස් වනකොට ඒක ව්‍යවස්ථාවක් සංශෝධනය කිරීම හරහා ඉදිරිපත් කිරීම නරක වැඩක් නොවෙයි. ඒ නිසා දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඒ වෙලාවේ ආපු ඉදිරි පියවරක් හැටියට අපි සැලකුවා. එදා මේ පාර්ලිමේන්තුවේ සිටි හැමෝම ඒකට අත් ඉස්සුවා. නමුත් පසුකාලීනව අපට තේරුණා මේ ක්‍රමවේදයේ යම් කිසි අඩු පාඩුවක් තිබෙනවා කියලා. එහි මා දකින ප්‍රධාන අඩු පාඩුව තමයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සංයුතිය මන්ත්‍රීවරුන්ගේ බහුතරයකට ලක් නොකිරීමේ අඩු පාඩුව. අපේ රටේ හුඟ දෙනෙක් කල්පනා කරනවා මන්ත්‍රීවරුන් බහුතරයකට තීන්දු ගන්න බැහැ කියලා. නමුත්, ඇමෙරිකාව වාගේ රටවල රජයේ උසස් නිලධාරියකු පත් කරනවා නම් ඒ පත් කිරීම පිළිබඳ අවසාන තීන්දුව ගන්නේ සෙනෙට් සභාවෙන් යුක්ත අනුකමිටුවක් මඟිනුයි. ඒ රටවල පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විශාල බලයක් ලබා දීලා තිබෙනවා. නමුත් දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව විධායක සභාව නම් කිරීමේදී පළමුවැනි වතාවට තමයි පාර්ලිමේන්තුවේ ඉන්න නියෝජිතයන්ට වඩා වැඩි ප්‍රමාණයක් පිටින් පත් කිරීමේ සම්ප්‍රදාය ආරම්භ වුණේ. ඒ අනුව පත් වුණු ස්වාධීන කොමිෂන් සභා කිසිම කෙනෙකු යටතට නැහැ. ඒවා ස්වාධීන කොමිෂන් සභා හැටියට වසර තුනක් ගත කරනවා නම් ඕනෑම තීන්දුවක් ගන්න පුළුවන්කම තිබුණා.

මහජනයා දුන්න වරම තමන්ට ඕනෑ විධියට කොමිෂන් සභා තුළ පාවිච්චි කරන්න පුළුවන්කම ලැබුණා. ඒ නිසා අපි විශ්වාස කරනවා, මේවා පාර්ලිමේන්තුවට වග කියන තත්ත්වයක් ඇති විය යුතුයි කියා. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව තිබුණු ගැටලුව මොකක්ද? සමහර ප්‍රායෝගික ප්‍රශ්නවලට උත්තර සෙවීමට දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටතේ පැවැති ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාව අපොහොසත් වුණා. මේ සම්බන්ධයෙන් බොහොම පැහැදිලි ප්‍රායෝගික ප්‍රශ්නයක් මා මතු කරන්න කැමැතියි. එක්තරා රාජ්‍ය නිලධාරියකුට චෝදනාවක් ආවා, ඔහු ඒ ප්‍රදේශයේ ගස් කපන්න permits දෙනවා කියා. සාමාන්‍යයෙන් අපේ ක්‍රමය අනුව කරන්නේ ඔහු එම ස්ථානයෙන් ඉවත් කර පරීක්ෂණයක් පවත්වන එකයි. නමුත් එදා අමාත්‍යාංශ ලේකම්වරයා ඔහු ස්ථාන මාරු කළා. ස්ථාන මාරු කළාම කොමිෂන් සභාව නියෝගයක් නිකුත් කළා, "ඔහු ස්ථාන මාරු කිරීම වැරදියි. වහාම ඔහු එම ස්ථානයටම යවන්න." කියා. ඒ නිසා පාර්ලිමේන්තුවට වග කියන ස්වරූපයක් ඇති කිරීමත් ඒ ව්‍යවස්ථා සභාවේ බහුතරය පාර්ලිමේන්තුව අතට ලබා දීමත් කියන එක ඉතා වැදගත් දෙයක් හැටියට අපි සියලු දෙනාම මේ අවස්ථාවේ දකිනවා. ඒ හරහා තමයි අපට මේ තත්ත්වය සම්පූර්ණයෙන්ම නිවැරදි කර ගැනීමට පුළුවන් වෙන්නේ.

මා දැකපු දෙවැනි කාරණය, මේ කොමිෂන් සභා තමන්ගේ බලය විමධ්‍යගත කරන්න කැමැති නැතිකම. අමාත්‍යාංශ ලේකම්වරයකුට බලය විමධ්‍යගත කරන්න කැමැති නැහැ. පොලිස් කොමිෂන් එක නම් පොලිස්පතිතුමාට ඒ බලය විමධ්‍යගත කරන්න කැමැති වුණේ නැහැ. විශේෂයෙන් අපේ ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමා නියෝජනය කරන ගාල්ල ආසනයේ ඒ කාලයේ පාසල්වලට විදුහල්පතිවරුන් පත් කිරීමේදී ජනතාවත් සමඟ විශාල ගැටුම් නිර්මාණය වුණා. ඒවා නැති කරන්න බලයේ යම් කිසි විමධ්‍යගත කිරීමක් කළ යුතුයි යම් නිලධාරියකුට ඒ පිළිබඳ තීන්දු ගැනීමක් ලබා දිය යුතුයි. ඒ තීන්දු වැරදි නම් පමණක් ක්‍රියා කළ යුතුයි. ඒ නිසා මේ කොමිෂන් සභාවල ගතිකත්වය යම් යම් අවස්ථාවල වෙනස් විය යුතුයි කියා මා විශ්වාස කරනවා.

ඒ නිසා මේ තත්ත්වයන් මත තමයි අපි අලුතින් ඒ දිහා බලන්න ඕනෑ. එක තර්කයක් තිබෙනවා, අපි දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන මේ කොටස එහෙම පිටින්ම ගෙනැල්ලා තියමු කියා. නමුත් අපි මේක අවුරුදු දෙකක්, තුනක් කළාම මේකේ අඩු පාඩු අපි දකිනවා. දකින අඩු පාඩු අපි වෙනස් කරන්නේ කොහොමද කියන එක ගැනත් මේ පාර්ලිමේන්තුව සැලකිල්ලට ගන්න ඕනෑ. මොකද, පාර්ලිමේන්තුවට වගකීමක් තිබෙනවා. අවසානයේ මේ පාර්ලිමේන්තුව වග කියන ජනතාවගේ එහෙම නැත්නම් මේ පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරු තෝරා පත් කර එවන ජනතාවගේ වුවමනා එපාකම් සියල්ලම මේ පාර්ලිමේන්තුවේ කරන පනත් සම්මතයන් හරහා ඉදිරිපත් විය යුතුයි කියා මා කල්පනා කරනවා.

මේ සියලු කාරණා මැද්දේ ජනාධිපතිවරයාගේ විධායක බලය ගනිමු. ජනාධිපතිවරයාට විධායක බලය පවරන්නේ මේ රටේ ජනතාවයි. ජනතාව විසින් ලංකාවේ ජනාධිපතිවරයා ඍජුවම පත් කරනවා. ඒ නිසා මට බොහොම සන්තෝෂයි ඒ මුල්ම කෙටුම්පතේ තිබුණු විශේෂයෙන් අග්‍රාමාත්‍යවරයා කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා විය යුතුයි කියා කළ යෝජනාව ඉවත් කරන්නට කටයුතු කර තිබීම ගැන. විශේෂයෙන් දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොටස් යම්කිසි ආකාරයකට වෙනස් කරන්න ක්‍රියා කළාම ඒවා වෙනස් කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය ක්‍රියා කළා. මේවා ඉතාමත්ම හොඳ අංග. ඒ නිසා ඇත්ත වශයෙන්ම අපි කල්පනා කරන්න ඕනෑ, විධායක ජනාධිපති ක්‍රමය වඩාත් මානුෂික මුහුණුවරක් ගන්නා තත්ත්වයකට පත් කරන්නේ කොහොමද කියා. එසේ කිරීමෙන් තමයි මේ රටේ ඒකීයභාවය සහ ස්වාධීනත්වය ආරක්ෂා වෙන්නේ කියන එක අප විශ්වාස කරනවා. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් අපි උත්සාහයන් ගණනාවක් අරගෙන තිබෙනවා, කථා කර තිබෙනවා. විශේෂයෙන්ම මාධ්‍ය පිළිබඳ යම්කිසි තහංචියක් තිබුණා මම දැක්කා. මැතිවරණයකදී මාධ්‍යකරුවන් මැතිවරණ කොමිසම විසින් දෙන ලද නියෝග ක්‍රියාත්මක නොකළොත් ඒ මාධ්‍යකරුවන්ට චෝදනා එල්ල කරමින් අධිකරණයක් ඉදිරියට ගෙන යා යුතුයි කියා. එම කොටස ඉවත් කිරීමට විශේෂයෙන් අපේ ජනාධිපතිතුමා කටයුතු කර තිබෙනවා. මේ ආදී වශයෙන් අපට පුළුවන් වෙලා තිබෙනවා, පසුගිය කාලය තුළ අප දෙපාර්ශ්වයම කථා කර, දෙපාර්ශ්වයම ඉතා ගෞරවයෙන් යුතුව කථා කර, සමහර අවස්ථාවන්වල ඉතා උණුසුම් අදහස් ප්‍රකාශ

වුණත් දෙපාර්ශ්වයටම එකතු වෙලා යම්කිසි ආකාරයක විසඳුමක් ඇති කර ගන්න. මම විශ්වාස කරනවා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් එලෙසින්ම ක්‍රියාත්මක කරාවිය කියා.

දෙවන වැදගත් කාරණය, මැතිවරණ ක්‍රමය. මේ විධියේ වැඩ පිළිවෙළක් කරනකොට මැතිවරණ ක්‍රමයත් සංශෝධනය විය යුතුයි කියා විශේෂයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සන්ධානයේ මතයක් තිබෙනවා. අනිවාර්යයෙන්ම තමන්ගේ ආසනයට මන්ත්‍රීවරයෙක් පත් කිරීමේ අයිතියත්, ඒ වාගේම සුළු පක්ෂ නියෝජනය සහතික කරන ක්‍රමයකුත් වශයෙන් මිශ්‍ර ක්‍රමයක් නිර්මාණය කරන්න තමයි අපි සියලු දෙනාම අදහස් කර තිබෙන්නේ. ඒ හරහා අපට අවශ්‍ය කරන කටයුත්තක් කරන්න පුළුවන් වෙතැයි කියා මම විශ්වාස කරනවා.

විශේෂයෙන්ම මම කියන්න කැමැතියි, ව්‍යවස්ථාදායක බලය රටක තිබෙන ඉතා වැදගත් බලයක්ය කියන එක. රටක පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුන් පත් කරන මහජනතාව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් බලාපොරොත්තු වෙන්නේ ඔවුන්ගේ කාර්යයන් කර ගන්නයි. ඔවුන්ගේ කාර්යයන් කර ගැනීමේදී තිබෙන අත්‍යවශ්‍යම කාරණය තමයි ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන ආකාරය බැලීම. සමහර අය කල්පනා කරන්නේ බොහොම උඩින්. ඒ අය හිතනවා, මෙන්න මෙවැනි ක්‍රමයක් හදා ගත්තොත් ඒක සාර්ථක වේවිය කියා. අපේ රටේ ඒක එහෙම සාර්ථක වෙන්නේ නැහැ කියා මම හිතනවා. ප්‍රායෝගික වශයෙන් අපේ ජනතාව තවමත් මහජන නියෝජිතයන් ළඟට ඒ අයගේ සියලු ප්‍රශ්න අරගෙන යනවා. මහජන නියෝජිතයන්ට පුළුවන් වෙන්න ඕනෑ, ඒ අයට යම් ආකාරයක උදව්වක් කරන්න අවශ්‍ය අවකාශය ඇති කරන්න. ඒ අවකාශය ඇති කිරීම සඳහා තමයි අප සියලු දෙනාම ක්‍රියාත්මක විය යුත්තේ. මේ රටේ විධායක ජනාධිපති ක්‍රමය පිළිබඳ විවේචන එල්ල වුණා. නමුත් විධායක ජනාධිපති ක්‍රමය තුළින්, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් සමඟ රටේ ඒකීයභාවයට එක්තරා ආකාරයක ආරක්ෂාවක් සපයනවා. ඒක තමයි වැදගත්ම කාරණාව. රටේ ඒකීයභාවයට ආරක්ෂාව සපයන වැදගත්ම දෙය ආරක්ෂා කර ගනිමින්ම විධායක ජනාධිපති ක්‍රමයේ යම් යම් ක්‍රමවේදයන් මහජනතාවට ලබා දීමට ක්‍රියා කිරීමෙන් විතරයි අපට පුළුවන් වෙන්නේ, හොඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කර ගන්න. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනය කිරීමේදී අපට පෙනුණා, විශේෂයෙන් එක්සත් ජාතික පක්ෂය තමන්ට ඕනෑ කරන සංශෝධන ටිකකුත් හෙමින් සීරුවේ තල්ලු කරන්න උත්සාහ කර තිබෙනවාය කියන එක. ඒක අපට පිළිගන්න බැහැ. මම ඒක, චෝදනා මුඛයෙන් කියනවා නොවෙයි. එක්සත් ජාතික පක්ෂයටත් ඕනෑ වුණා, හෙමින් සීරුවේ සමහර දේවල් ගෙනල්ලා, ඡන්දයෙන් පත් නොවී වුණත් යම් බල ප්‍රමාණයකට වග කියන්න කටයුතු කරන්න. ඡන්දයෙන් ආවා නම් අපට කිසි ප්‍රශ්නයක් නැහැ. නමුත් ඡන්දයෙන් ආවේ නැති වුණත් ඒ අය එහෙම කරන්න උත්සාහ කළා. ඒ නිසා ඒ පිළිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විශාල කැප වීමක් කළා. මම දැක්කා එක්තරා පුවත් පතක පළ වෙලා තිබුණා, -කවුරු හරි කීර්තිමත් කෙනෙක් තමයි ලියා තිබුණේ.- "පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ව්‍යවස්ථා සංශෝධනයට සහභාගි නොවී..." කියා. ඒ කියන්නේ, කවුරු හරි මොකක් හෝ ලියවිල්ලක් හදා දුන්නොත් අපට අත් උස්සන්නය කියායි කියන්නේ.

එහෙම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් මේ සභාවේ නැහැ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පිළිබඳව මතයක් තිබෙනවා, - ඒක NGOsවල අදහසක් - පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පාලනයේ යම් යම් අංශවලට සහභාගි කර ගැනීමට අවශ්‍ය නැහැ කියලා. ඒක දන්නේ ඒගොල්ලන් කියලා හිතාගෙන ඉන්නවා. මම විශ්වාස කරනවා, ඒක එහෙම නොවෙයි කියලා. මේ පාර්ලිමේන්තුවේ හැම මන්ත්‍රීවරයෙක්ම මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව විශාල වෙහෙස මහන්සියක් ගත්තා. පසු ගිය මාස කිහිපයේම අපි සියලු දෙනාම මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන සෑම අංශයක් ගැනම කථා කළා. මේ පාර්ලිමේන්තුවේ ඉන්න විපක්ෂයේ, ආණ්ඩු පක්ෂයේ සෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්ම මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ කාර්යයට සම්බන්ධ වුණා. ඒ සෑම කෙනෙකුගෙන්ම ඉතාම විශිෂ්ට අදහස් අපිට ලැබුණා. ඒ නිසා අපි සියලු දෙනාම ඉතාම වගකීමෙන් කියන්නට කැමැතියි, මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට, යම් යම් සංශෝධන සහිතව අපි සහාය දෙනවා කියලා. ඒ සංශෝධන මේ රටේ ජනතාවට අයහපතක් වෙන සංශෝධන නොවෙයි, ජනතාවට යහපතක් වෙන සංශෝධනයි. ඒවා හරහා ඉතාමත්ම හොඳ පාර්ලිමේන්තු ක්‍රමයකුත්, විධායකයේ යම් ආකාරයේ වෙනසකුත්, මේ රටේ ජනතාවගේ ඉදිරි පැවැත්ම වෙනුවෙන් අවශ්‍ය කරන වෙනසකටත් හැකියාව ලැබෙයි කියා විශ්වාස කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි.

The next speaker is the Hon. Ruwan Wijayawardhana. You have eight minutes.

[අ.භා.1.58]

**ගරු රුවන් විජයවර්ධන මහතා (ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ருவன் விஜயவர்தன - பாதுகாப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Ruwan Wijayawardhana - State Minister of Defence)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන මේ උත්තරීතර සභාවේදී වචන ස්වල්පයක් කථා කිරීමට ලැබුණු අවස්ථාව ගැන මම බෙහෙවින්ම සතුටු වෙනවා. ප්‍රථමයෙන්ම අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට මාගේ ප්‍රණාමය පුද කරන්නට කැමැතියි, විධායක ජනාධිපති ධුරයේ බලතල සීමා කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් පාර්ලිමේන්තුවට ගෙනැල්ලා එතුමා විසින්ම ඊයේ දින ඒ පිළිබඳ විවාදය ආරම්භ කිරීම ගැන. අපි කවුරුත් දන්නවා, අවුරුදු ගණනාවක් තිස්සේ එක එක නායකවරුන්, එක එක ජනාධිපතිවරුන් මේ විධායක ජනාධිපති ධුරයේ බලතල අඩු කිරීම ගැන කථා කළ බව. නමුත් ඒවා කථාවට විතරයි සීමා වුණේ. ඒවා ඡන්දවලදී දෙන බොරු පොරොන්දු බවට පත් වුණා. ප්‍රතිපත්ති ප්‍රකාශනවලට පමණක් ඒ වචන සීමා වුණා. නමුත් මම ගොඩාක් සතුටු වෙනවා, අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා විසින්ම එතුමාගේ ධුරයේ බලතල සීමා කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ගෙන ඒමට ඉදිරිපත් වීම ගැන. ඒ වාගේම මේ රටේ ප්‍රධාන පක්ෂ දෙකේ නායකවරුන් දෙදෙනාම, -අපේ ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත්, ගරු රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමාත්- එකතු වෙලා මේ රට ගැන හිතලා, රටේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන හිතලා ගත්ත පියවර ගැන මම ගොඩාක් සතුටු වෙනවා. ඒක මේ මුළු රටටමත්, මුළු ලෝකයටමත් ආදර්ශයක් කියලා මම හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ අවස්ථාවේදී එක පැත්තකින් සතුටු වන විට අනෙක් පැත්තෙන් ටිකක් කනගාටු වෙනවා. මොකද, මේ දවස් ටිකේම විපක්ෂය විසින් එක එක සංශෝධන ගෙනැල්ලා මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කල් දමන්නට උත්සාහ කිරීමක් කරනවා අපි දැක්කා. අපි මේ

[ගරු රුවන් විජයවර්ධන මහතා]

අවස්ථාව මහ හරින්නට හොඳ නැහැ. මේ රටට අවශ්‍ය මේ වෙනස කරන්නට අපට ඉතාමත් හොඳ අවස්ථාවක් ලැබී තිබෙන්නේ. මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කියන්නේ නිකම්ම නිකම් ඉලක්කයක් නොවෙයි. මේ රටේ ජනතාවගේ අපේක්ෂා ඉටු කරන දැවැන්ත පරිවර්තනයක් ඇති කරන්නට පුළුවන් අවස්ථාවක් තමයි මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඇති වන්නේ. නමුත් ඒකටත් එක එක සංශෝධන ගෙනැල්ලා ඒක වෙනස් කිරීමට උත්සාහ කිරීම අපි දකින්නේ, මේ ව්‍යවස්ථා සංශෝධනය කල් දමන්නට කරන උත්සාහයක් හැටියටයි.

විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ප්‍රශ්නය ගැන මම කනගාටු වෙනවා. ඇත්තටම දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අපි බලාපොරොත්තු වුණේ මේ රටට අවශ්‍ය වන ඒ කොමිෂන් සභාවල ස්වාධීනත්වයයි. ඒ ගැන අපි පාර්ලිමේන්තුවේදී ගොඩාක් කථා කළා. මම හිතන විධියට එදා ඒ දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට මේ පාර්ලිමේන්තුවේ සියලුම දෙනා අත උස්සලා, ඒක සම්මත කර ගත්තා. නමුත් දැන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ස්වාධීනත්වය පැත්තක තබා එයට දේශපාලනඥයන් දමන්න කියන සංශෝධනය ගැන මම ගොඩක් කනගාටු වෙනවා. මොකද, මා හිතන විධියට ප්‍රජාතන්ත්‍රවාදයට අහිතකර තත්ත්වයක් තමයි එයින් ඇති වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය ආණ්ඩුව මේ රටට අනවශ්‍ය සංශෝධනයක් ගෙනැවිත් තිබුණා. ඒ තමයි, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. එයින් මේ රටට, ප්‍රජාතන්ත්‍රවාදයට විශාල හානියක් වුණා. මේ උත්තරීතර සභාවේ මන්ත්‍රීවරුන් වන අප සියලුදෙනාට දැන් මහඟු අවස්ථාවක් උදා වෙලා තිබෙනවා කියා මම හිතනවා. පක්ෂ භේදයෙන් තොරව සියලුදෙනාට එකතු වෙලා, එදා වූ වැරැදි නිවැරැදි කරන්න අපට දැන් හොඳ අවස්ථාවක් ලැබී තිබෙනවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සියලු දෙනා එකතු වෙලා අද සම්මත කර ගනීවි කියා මගේ ලොකු බලාපොරොත්තුවක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මතකයි, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරගත් ආකාරය. ඒ සඳහා වාද විවාද කරන්නවත්, ඒ ගැන අපේ මතය මේ උත්තරීතර සභාවේ කියන්නවත් අපට කාලයක් තිබුණේ නැහැ. එක රැයකින් දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා මේ රට අඳුරු දිශාවකට යොමු කළා. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් රටට ලැබී තිබුණු ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ බලාපොරොත්තු වාගේම සාධනීය වෙනස්කම් ඇති කළ හැකි කොමිෂන් සභාත් දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් අහෝසි වුණා. අත්තනෝමතික බලයක් තිබෙනවාය කියා ජනතා උදහසට ලක් වී තිබුණු විධායක ජනාධිපති ධුරයේ බලතල, ත්‍රස්තවාදය නිමාවෙන් පසුවත් තවත් බලවත් වුණා. සමහර විචාරකයෝ, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කියවා සඳහන් කළේ, එය හරියට "අශ්වයන්ට අං දුන්නා වාගේ දෙයක්" කියලායි. ඒ නිසා රටට ජාත්‍යන්තර වශයෙන් තවත් අපවාද එල්ල වුණා. රට තුළ තිබුණු ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ බලාපොරොත්තු, නීතිය සහ යහ පාලනය පිළිබඳ බලාපොරොත්තු දුරස් වුණා. පසු ගිය ජනාධිපතිවරණයේදී ප්‍රජාතන්ත්‍රවාදය අගයන ජනතාව පෙළ ගැසුණේ රට අලුත් මාවතකට ගෙන යන්නටයි. මානව නිදහසට ගරු කරන ශීලාචාරසම්පන්න සමාජයක් ඇති කරන්න තමයි එදා රටේ ජනතාව ආණ්ඩු වෙනසක් සඳහා පියවර ගත්තේ. රටේ නූපන් පරපුර වෙනුවෙන් දුර දිග බලා යහපත් පරිවර්තනයක් කරන්න අපට දැන් අවස්ථාවක් තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන්න, මානව නිදහස හා අයිතීන් ආරක්ෂා කරන්න, දියුණු ප්‍රජාතන්ත්‍රවාදයක් ක්‍රියාත්මක වන ශීලාචාර රටක් බවට මේ රට පත් කරන්න අපට ඉතා වටිනා අවස්ථාවක් ලැබී තිබෙනවා. පාර්ලිමේන්තුවට වග නොකියන හිතුවක්කාර විධියට කටයුතු කරන දළඳඬු පුද්ගලයකු නිර්මාණය කරන විධායක ජනාධිපති ධුරයේ බලතල සීමා කරන්න අපට අවස්ථාවක් ලැබී තිබෙනවා. ඒ නිසා පක්ෂ විපක්ෂ මහ ජන නියෝජිතයන් සියලුදෙනාගේ වගකීම වන්නේ, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ රජය ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමට ගෙන තිබෙන මේ වැදගත් පියවරට සහය දීමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීමට එරෙහිව නොයෙකුත් බලවේග විවිධාකාරයේ වෙස් මුහුණු දාගෙන කරපු රංගන පසු ගිය දිනවල අපි දුටුවා. ප්‍රජාතන්ත්‍ර විරෝධී දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තවදුරටත් ආරක්ෂා කරන්න බල ලෝභී සුළු පිරිසක් රටේ විවිධ තැන්වල දහ අට සන්නිය නැටුවා. අද එම බලවේග හැඬූ කඳුළිනුයි සිටින්නේ. ඒ, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වුණොත් ඒ අයට විශාල පරාජයකට හා අවාසිදායක තත්ත්වයකට මුහුණ දෙන්න සිදු වේවි කියලායි. නමුත් මා එක දෙයක් කියන්න අවශ්‍යයි. මොන උපක්‍රම යෙදුවත් ඔවුන්ගේ උත්සාහය පරාජය කරන්න අද මුළු රටම පෙළ ගැසී සිටිනවා. අද වන විට මහා සංඝ රත්නය, පූජකතුමන්ලා, බහු ජන සංවිධාන, සිවිල් සංවිධාන, කලාකරුවන්, උගතුන් වාගේම මාධ්‍යවේදීන් මේ පරිවර්තනය සිදු කිරීමට විශාල දායකත්වයක් සහ කැප කිරීමක් කර තිබෙනවා. පසු ගිය ජනවාරි අටවන දා බහුතර ශ්‍රී ලාංකික ඡන්දදායක පිරිසක් විවිධ බලපෑම් හමුවේ, විවිධ තාඩන පීඩන හමුවේ, නොයෙකුත් මර්දන හමුවේ තමන්ගේ ඡන්දය පාවිච්චි කළේ, රාජපක්ෂ භීතිකාවෙන් මිදෙන්නට වාගේම ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරගන්නටයි.

දැන් තමයි අපට ඒ සඳහා කාලය උදා වෙලා තිබෙන්නේ. සමහර විට මේ ව්‍යවස්ථා සංශෝධනයෙන් අපට සියලු යහපත් දේ එක රැයකින් ඉටු කරන්නට බැරි වෙයි. නමුත් අඳුරට ශාප කරනවා වෙනුවට, ඒ අඳුරෙන් මිදීමට එක පහනක් දල්වනවා වාගේ යහපත් පියවරක් ගන්න අපට පුළුවන්. රජයක් විධියට මේ ගෙන තිබෙන්නේ ඒ පියවරයි. මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතින් ස්වාධීන කොමිෂන් සභා පිහිටුවා, ඒ තුළින් යහපත් අයුරින් කටයුතු සිදු කිරීමෙන් රටේ මුළුමහත් ජනතාවට ප්‍රතිලාභ ලබා ගන්නට පුළුවන් වෙනවා.

රාජ්‍ය සේවය තුළ දීර්ඝ කාලයක සිට තිබෙන අනිසි දේශපාලන මැදිහත්වීම් නැති කරන්නට අපට මේ හරහා පුළුවන් වෙනවා. පොලීසිය, අධිකරණය වැනි ආයතනවල වාගේම, මැතිවරණ ක්‍රමය තුළත් ස්වාධීනතාව ආරක්ෂා කර ගැනීමට අපට පුළුවන් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රජාතන්ත්‍රවාදය යටපත් කරන ඒකාධිපති මුරණ්ඩු පාලනයක් වෙනුවට රටේ මහජන මතයට සවන් දෙන, ගරු කරන, රටක් විධියට නැඟී සිටීමට කුමන දුෂ්කරතා බාධා තිබුණත් එක හඬින් යහපත් දේ ක්‍රියාත්මක කිරීමට අප පෙළ ගැසීම අවශ්‍යයි. ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන සදාචාර සම්පන්න මිනිසුන් විධියට සියලු දෙනාම මෙවැනි වෙනස්කම් සඳහා දායකත්වය ලබා දිය යුතුයි. යම් පුද්ගලයෙක් හෝ යම් කණ්ඩායමක් මේ වාගේ සාධනීය වෙනස්කම් සඳහා තමන්ට පැවරී තිබෙන යුතුකම හා වගකීම ඉටු නොකළහොත් ඔවුන් ඉතිහාසයේ වැරදිකරුවන් බවට පත් වෙනවාය කියන එක මට විශ්වාසයි. එසේ කියමින් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ රට තුළ ක්‍රියාත්මක වී ප්‍රජාතන්ත්‍රවාදය තවදුරටත් ශක්තිමත් වේවායි කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා.2.08]

**ගරු (මහාචාර්ය) රාජීව විජේසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ මිත්‍ර රුවන් විජයවර්ධන මන්ත්‍රීතුමා කිව්වා වාගේ ජනවාරි 08 වැනි දා විශාල බලාපොරොත්තුවක් සමඟ අලුත් ජනාධිපතිවරයෙක් පත් වුණා. ඒ අලුත් ජනාධිපතිතුමාගේ මූලික අදහස තමයි, ප්‍රජාතන්ත්‍රවාදය වර්ධනය කරන ප්‍රතිසංස්කරණ ගෙන එන එක. එවැනි ප්‍රතිසංස්කරණ කිහිපයක් තිබුණා. නමුත් අවාසනාවන්ත විධියට, දැන් ආණ්ඩුව උදුරා ගෙන සිටින අගමැතිතුමා මේ ප්‍රතිසංස්කරණ ගණන් ගත්තේ නැහැ.

ඒ දින සියයේ වැඩසටහන යටතේ ලබා දුන් පොරොන්දු කිහිපයක් මා කියවන්නම්. මා හිතන හැටියට අපි හැමෝටම දැන් මේවා අමතක වෙලා තිබෙන්නේ. අපි ඒවා පොරොන්දු වුණා. දින සියයේ වැඩසටහන යටතේ, ජනවාරි 12 වැනි දා ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම වෙනුවෙන් යෝජිත ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සඳහා පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු දේශපාලන පක්ෂ හා අනෙකුත් පුරවැසි සංවිධානවල නියෝජනත්වයෙන් යුතු ජාතික උපදේශක සභාවක් පත් කිරීමයි යෙදී තිබුණේ. අපේ ගරු පූජ්‍ය මාදුළුවාවේ සෝභිත හාමුදුරුවන් මා සමඟ බොහොම දුකෙන් කිව්වා, උන් වහන්සේත් එම සභාවට පත් කළේ නැහැ කියලා. අපව පත් කළේත් නැහැ. මක් නිසාද, ගරු අගමැතිතුමා බැලුවේ එතුමාට යටත් වෙන මිනිසුන් විතරක් මෙම ජාතික උපදේශක සභාවට පත් කරන්නයි. ඒ නිසා තමයි, ඉතාම හොඳ පදනමක් මත සකස් කළ යුතුව තිබුණු දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතට දැන් නොයෙක් නොයෙක් ප්‍රශ්න ඇති වෙලා තිබෙන්නේ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලේකම්තුමා කිව්වා වාගේ මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සම්මත කරන්න අවශ්‍යයි. එහෙත් මේ පනත් කෙටුම්පත සම්මත කරනකොට අපි ප්‍රජාතන්ත්‍රවාදය ගැන හිතන්න ඕනෑ; මූලික දේශපාලන ප්‍රතිපත්ති ගැන හිතන්න ඕනෑ. විධායක අංශයේ බලය අඩු කරන කොට අපි ඒ බලය තවත් අංශයට පරිවර්තනය කරන එක සම්පූර්ණයෙන් වැරදියි. රජයක තවත් අංශ තිබෙනවා. විශේෂයෙන් පාර්ලිමේන්තුව. එහෙත් අපේ අගමැතිතුමා පාර්ලිමේන්තුව ගණන් ගන්නේ නැහැ. මම පොඩි උදාහරණයක් කියන්නම්. අද පාර්ලිමේන්තුවේ රැස්වීම් අවසන් වුණාට පසුව නැවත රැස් වෙන්නේ තව සති තුනකින්. ඉතාම වැදගත් පනත් කෙටුම්පත් කිහිපයක් තිබෙනවා සම්මත කර ගන්න. ඒවා අපි ඉදිරිපත් කිරීමට පොරොන්දු වුණු පනත් කෙටුම්පත්. අපි පොරොන්දු වුණා, එම පනත් කෙටුම්පත් ජනවාරි මාසයේ, පෙබරවාරි මාසයේ ඉදිරිපත් කිරීමට. නමුත් දැන් ඒවා අමතක වෙලා තිබෙනවා. අගමැතිතුමාගේ ඔළුවේ තිබෙන්නේ පුළුවන් තරම් ඉක්මනට ඡන්දයක් ඉල්ලන්නයි. මම බලාපොරොත්තු වෙනවා, අපේ ගරු ජනාධිපතිතුමා ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කරයි කියලා. මක් නිසාද, අප ලබා දුන් පොරොන්දු කිහිපයක් සම්බන්ධයෙන් මොකුත් කරලා නැති නිසා.

ජාතික උපදේශක සභාව පත් කළාට පස්සේ පාර්ලිමේන්තුව කැඳවා ස්ථාවර නියෝග සංශෝධනය කිරීම සිදු කරන්නයි තිබුණේ. ඒකෙන් තමයි පාර්ලිමේන්තුව ශක්තිමත් කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මීට අවුරුදු දෙකකට කලින් බැලුවා, මේවා සංශෝධනය කිරීමට.

මා නොයෙක් ඉල්ලීම් කළා. එක් කෙනකු හැර වෙනත් කවුරුවත් මට උදවු කළේ නැහැ. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා සමඟ කථා කරන කොට එතුමා කිව්වා, "ඔව්, ඔව්. මේක කරන්න ඕනෑ" කියලා. නමුත් මොකුත් කළේ නැහැ. විපක්ෂ නායකතුමා මේවා ගැන හිතුවේ නැහැ. කථානායකතුමාත් මොකුත් කළේ නැහැ. අවුරුදු හතරක් තිස්සේ ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව රැස් වුණේ නැහැ. මා බොහොම ස්තුතිවන්ත වනවා, හිටපු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක දිනේෂ් ගුණවර්ධන මැතිතුමාට. එතුමා මට උදවු කළා. ඒ වාගේම ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාත් මට උදවු කරලා මගේ සංශෝධන පනත් කෙටුම්පතත් ඉදිරිපත් කළා. එහෙත් අගමැතිතුමා කියා තිබෙනවා, "නැහැ, නැහැ. මේක කරන්න එපා. පස්සේ කරන්න" කියලා. අපි පාර්ලිමේන්තුව ශක්තිමත් කරන ඉතාම වැදගත් සංශෝධන කිහිපයක් සම්මත කළා. ඊට පස්සේ රැස්වීමක් ඉල්ලන කොට කිව්වා, "නැහැ, නැහැ. අපි තවම sectoral committees ඉදිරිපත් කරනවාය කියා අගමැතිතුමා කිව්වා" කියලා. මා ප්‍රියාණි විජේසේකර හිටපු පාර්ලිමේන්තු මහ ලේකම්තුමියගෙන් මේ ගැන ඇහුවා. "මොකක්ද මේක? එතුමා ඉදිරිපත් කළා. එතැන හොඳ අදහස් කිහිපයක් තිබුණා. ඒක ඉදිරිපත් කරන්න දැන් අපේ ලේකම්තුමාට දෙන්න" කියලා එතුමියට කිව්වා. එතුමිය මට කිව්වා, "දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පස්සේ මේක කරන්න කියා රනිල් කිව්වා" කියලා. අගමැතිතුමාගේ ඔළුවේ තිබෙන්නේ එකම එක සංශෝධනයක් විතරයි; තමන්ගේ අතට බලය උදුරා ගෙන මැතිවරණයක් නොපවත්වා මේ රට පාලනය කරන්නයි. මේ දින 100 වැඩ පිළිවෙළ දිහා බලන කොට එකක්වත් කරලා නැහැ. අපි -අපේ දේශපාලන පක්ෂ- පොරොන්දුවක් දුන්නා. අපේ ගරු ජනාධිපතිතුමාට සහාය දුන්නේ මේවා සියල්ල කරන්නයි, එකක් විතරක් කරන්න නොවෙයි. මා ඉතාම දුක් වනවා, මේ වාගේ එක දෙයක් ගැන විතරක් හිතලා, බලය බෙදන සංශෝධන කිහිපය ගැන හිතලාවත් නැති එක ගැන. ඒ සංශෝධන ගැන මොකුත් කරන්නේවත් නැහැ. අපි ස්ථාවර නියෝග ශක්තිමත් කරන්න ඕනෑ.

තව අදහසක් මා කියන්නම්. අපි පොරොන්දු වුණා, "සියලුම මහජන නියෝජිතයන් විසින් පිළිපැදිය යුතු චර්යාධර්ම සංග්‍රහයක් නීතිගත කිරීම" කරනවාය කියලා. ඒ ගැනත් මොකුත් කරලා නැහැ. මා ඒ ගැන අද අපේ අනුර දිසානායක මන්ත්‍රීතුමාගෙන් ඇහුවා. එතකොට එතුමා මට කිව්වා, "මීට මාස 2කට උඩදී draft එකක් දුන්නා" කියලා. ඒ ගැනත් මොකුත් කරලා නැහැ. ජාතික උපදේශක සභාව රැස් වෙනවා; රැස් වෙන්නේ නැහැ. කිසිම පිළිවෙළක් නැහැ. ඇයි? හැම එකම කරන්නේ අගමැතිතුමාගේ කාර්යාලයේදීයි. අද දින සාකච්ඡාවට භාජන වූ ගැසට් නිවේදනය ගැන කියනවා නම්, ජනාධිපතිතුමා නොදැනුවත්ව එවැනි ගැසට් නිවේදනයක් ඉදිරිපත් කරන එක සම්පූර්ණයෙන්ම වැරැදියි. මෙවැනි ක්‍රියා කරන කොට අපි පිළිගන්නේ කොහොමද යහ පාලනයක් තිබෙනවා කියලා. එම නිසා මා එක්සත් ජාතික පක්ෂයෙන් ඉල්ලීමක් කරනවා. ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමාගේ කාලයේදී ඉතාම හොඳ අදහස් තිබුණා. Consultation, Compromise and Consensus යන ඒවා තේරුම් ගන්න බැරි නායකයෙක් ඉන්න කොට රටේ නායකත්වය ගන්නේ කොහොමද? මා දන්නවා, ඉතාම විශිෂ්ට, බොරු කරන්නේ නැති, අවංක මන්ත්‍රීවරු කිහිපදෙනෙක් එක්සත් ජාතික පක්ෂයේ ඉන්නවා කියලා. ඔබතුමන්ලා මේ පාලනය ගැන මොකක්ද හිතන්නේ? ඔබතුමන්ලා දුන්නු පොරොන්දුවලට මොකක්ද වෙලා තිබෙන්නේ? මේවා එකක්වත් ඉටු කරන්නේ නැත්නම් අපට ඉදිරියට යන්න හරි අමාරු වනවා. එම නිසා තමයි මා සංශෝධන කිහිපයක් ඉදිරිපත් කර තිබෙන්නේ. අද දින අපේ විපක්ෂ කණ්ඩායම රැස් වුණා. එහිදී නොයෙක් තීරණ ගත්තා. අපි මූලික වශයෙන් කියන්න ඕනෑ, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සම්මත කරන්න අපි බොහොම කැමැතියි කියලා. අපි මේ පනත් කෙටුම්පත සම්මත කරනවා, සංශෝධන සහිතව. මම බලාපොරොත්තු වනවා, එක්සත් ජාතික පක්ෂය පිළිගනියි කියලා මේ වෙනස්කම් කළ යුතුයි කියලා. ඊයේ එක් කෙනෙක් දෙදෙනෙක් අපට කිව්වා, "නැහැ, නැහැ. අගමැතිතුමාට බලය තිබෙන්නේ. දහනව වන ආණ්ඩුක්‍රම

[ගරු (මහාචාර්ය) රාජීව විජේසිංහ මහතා]

ව්‍යවස්ථා සංශෝධනයක් කරන්න බැහැ"යි කියලා. එහෙත් මේ මැතිවරණ ප්‍රකාශනය බලා රට වෙනුවෙන් ඒ ප්‍රතිසංස්කරණය කිරීම අවශ්‍යයි. ඒ නිසා මා බලාපොරොත්තු වනවා, අපේ සංශෝධන සම්මත වෙයි, ඊට පස්සේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සම්මත වෙයි කියලා.

Mr. Presiding Member, I would like to say a few words in English. Unfortunately, this Government seems to think its existence depends on the West. Yesterday, the Prime Minister came out with an outrageous statement that we needed the Constitutional Council in the way he had formulated it and it was because of the Eighteenth Amendment that we lost our status at the Human Rights Commission. I have to point out that this is not true. I do not think he was telling an untruth. I think he was simply confused because he says things to his advantage without thinking. We lost our status in 2008. The Eighteenth Amendment came through in 2010. Unfortunately, this total dependence on the West, the disgraceful manner in which Tamara Kunanayakam, who was the Chairperson of the Intergovernmental Working Group on the Right to Development of the UN, is being dismissed - her renomination is not being allowed by the Foreign Ministry - is typical of an approach that is not interested in non-alignment and not interested in our traditional foreign policies. But, unfortunately, the Government does not understand that Western governments also act in terms of certain principles and they are not in favour of the type of Gazette Notification that the Prime Minister produced today; they are not in favour of absurdities like trying to charge the former President and the former General Secretary of the United National Party for bribery for handing over a Ministry.

After all, it was the Prime Minister, himself, who told me on Christmas Day that he had to talk to someone who wanted money to cross over. He had told the Hon. M.A. Sumanthiran that the Cabinet had to include the Hon. Risad Badhiutheen - the Hon. M.A. Sumanthiran objected - because he had been promised a Ministry to cross over. I do not think that is bribery. That is what is called, "incentives". But, you cannot have double standards. You must have a situation where the same high principles are followed in all cases.

I am extremely sorry about what happened in the Central Bank. I would like to think that it was not deliberately done. But, we have to remember the sort of dishonesty that took place in 2002 and 2003 when loyal members of the United National Party were not appointed to promote personal pets who then encouraged dishonesty. People like the Hon. Karu Jayasuriya and Hon. Gamini Atukorale were sidelined. I hope that in November they would not appoint someone similar to the then Minister of Defence. I am very glad that they have, at least, a State Minister of Defence whose integrity is impeccable. But, when I said that the Hon. Tilak Marapana, the then Minister of Defence, had been really appalling, the Chairman of the UNP said, “No, it was not him. It was the other people who made the money”. But, this was tolerated. Sir, this should not be allowed.

To me, while I have no doubt that there were many abuses under the last Government which need to be looked at, I feel that must be done systematically, not in terms of political revenge and to have situations where there are efforts to politically victimize people without doing very simple mechanisms, like making Declarations of Assets and Liabilities public, so that the public can comment. I think we are not engaged in good governance.

Mr. Presiding Member, with regard to a Code of Conduct, I have written repeatedly to both the Minister of Public Administration, Local Government and Democratic Governance - who does respond but whose hands are tied - and to the Minister of Justice. I would like at this point to **table*** a document titled, "Pledge to Restore Public Confidence in the Justice System".

I did not even have the courtesy of a reply. The reason why I think all this is very important, Sir, is that while we want to establish Independent Commissions, we must also make sure that those Commissions, the Judiciary and the Parliament are accountable to the people. That is why I have for many years kept asking the Judiciary to make its own rules. I do not think it is necessary for Parliament to make rules for the Judiciary. But, the Judiciary must realize that they must work according to a system that will enable the people of this country to get justice swiftly, that will enable the people of this country not to waste time and that will allow the judges to be appointed on a very systematic criteria.

All these are essential. But, unfortunately there has been no effort whatsoever. I am very sorry because I had great confidence in the Minister for Democratic Governance that regulations should be issued. I made several suggestions. He did have a meeting. No one from his party turned up. I feel that one great mistake we made was to say that there would be an election in three months. The Party thought it had to fight elections and forgot completely the promises about good governance, the promises about accountability and the promises about developing systems.

As I mentioned in Sinhala, Sir, we have done nothing about strengthening the Standing Orders. We had managed because of the amendment I proposed and the suggestions put forward such as the need to have Opposition Members chairing the financial accountability committees and changing the impeachment procedure,

---

***** **පුස්තකාලයේ තබා ඇත.**

* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

which was a disgrace. It is a disgrace because the Standing Orders are a disgrace and the Prime Minister told me, “Well, we did not bother to change them because we terrified the last Chief Justice”. But, the way in which Mrs. Shirani Bandaranayake was impeached was wrong and for that reason, we should have worked quickly on changing the Standing Orders. None of that has been addressed; nothing has been done.

While it is important for us to recognize that the Nineteenth Amendment as important, I hope very much that the idealists currently in the Government will also work towards fulfilling the first 20 items in their list - three quarters of which have been ignored or belittled. So, while I hope the Nineteenth Amendment will pass with the amendments that will provide greater accountability to the people and we will also move forward in all the other areas which His Excellency the President pledged, I hope he will find a better manager to fulfil his pledges than the person with whom we now have to suffer.

Thank you.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The next speaker is the Hon. A.H.M. Fowzie.

[2.23 p.m.]

**ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)
(The Hon. A.H.M. Fowzie - Minister of Disaster Management)
Sir, I have great pleasure in participating in the Debate with the objective of adopting the Nineteenth Amendment to the Constitution and I wish to thank you, Sir, and this august Assembly for giving me this opportunity to express my views about it. I consider this as a very significant and decisive moment in the political history of Sri Lanka.

The main objective of this Nineteenth Amendment to the Constitution is to remove several excessive powers vested in the Executive Presidency by the 1978 Constitution and create a Presidential System with limited powers in accordance with the Supreme Court decision. I consider this as a very democratic system. I do not think that we will gain a vital opportunity and an environment of this nature again in the future. I feel that we all, as Members of this august Assembly, should consider this as the one and only opportunity we have and express our full support for this Constitutional Amendment for the sake of the welfare of the country and the future generations by disregarding all petty differences as to community, caste, creed or party affiliations.

We are all aware that the Executive Presidency was a subject of much controversy since the inception of the 1978 Constitution. History reveals that it was the main subject of discussion during several Presidential Elections held in the past. In 1994, Mrs. Chandrika Bandaranaike Kumaratunga contested the Presidential Election promising to abolish the Executive Presidency describing it as a curse on the nation. The former President Mahinda Rajapaksa also contested three previous Presidential Elections promising to curtail the power of the Executive Presidency.

It is in this context that President Maithripala Sirisena, who was the common candidate during the last Presidential Election, promised to transfer the executive powers of the President to the Cabinet of Ministers headed by the Prime Minister. Today, he has come forward to effect that change. It was a most praiseworthy action which should be valued and appreciated by all of us.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please!. The Hon. Deputy Chairman of Committees will now take the Chair.

***අනතුරුව ගරු පෙරුමාල් රාජදූරයි මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு பெருமாள் ராஜதுரை அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. PERUMAL RAJATHURAI *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Fowzie, please continue.

**ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා**
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி)
(The Hon. A.H.M. Fowzie)
It proves that he is presenting this Constitutional Amendment without any greed for power, purely in order to widen the democratic mechanism and infuse it with new dynamism. Another important proposal made in the Nineteenth Amendment to the Constitution is the annulment of the Eighteenth Amendment to the Constitution and limit the tenure of a President to only two consecutive terms and limit each term to five years. President Maithripala Sirisena said his term should be limited to four years. But, he later settled for a five-year term. This is a very important amendment. Moreover, we can describe this as a feature which will prevent a President from becoming a dictator, as it is said; "power corrupts and absolute power corrupts absolutely".

[ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා]

If the former President Mahinda Rajapaksa refrained from introducing the Eighteenth Amendment and continued in office for his second full term and thereafter introduced a Constitutional amendment in 2016 to abolish the Executive Presidency altogether and transfer executive powers to the Cabinet led by the Prime Minister, he would have succeeded and gone down in history as the President for having re-established democracy in the country.

But, his failure to do that and hurrying to seek a further term of office failed him. His failure, however, was not due to the loss of confidence in him by the people. It was due to people's urge for the return of democracy. People gave a massive approval to Maithripala Sirisena for his proposal to curb the Executive powers of the President. The mandate of the people is a clear directive to Members of Parliament to implement the same. We, as Members of Parliament, have therefore a duty to support the passing of the Nineteenth Amendment making the people's wish a reality. It has further a beneficial effect upon the country in that the international community appreciating Sri Lanka's return to democracy. Up to this time, Sri Lanka had been subjected to severe criticism by the international community over our human rights performances as well as the implementation of the democratic mechanism.

The return of democracy is further ensured by the establishment of Independent Commissions including Procurement Commission and the Audit Service Commission. The Procurement Commission will supervise various transactions made by the Government. The absence of an Audit Service Commission in the past has led to corruption and fraud in government spending and financial dealings. This was clearly evident in various ministries and departments in the past. Therefore, we can describe this as a very good amendment.

Another important proposal made in the Nineteenth Amendment is to empower the President to dissolve a newly- elected Parliament only after it completes four-and -a-half years, instead of one year as at present. The power vested in the President to dissolve a Parliament after one year duration is totally a dictatorial feature. Changing this is therefore a very positive action.

Another proposal made in the Nineteenth Amendment is the abolition of the President's power to bring in Urgent Bills. It is by utilizing this power that the former President presented the Eighteenth Amendment to the Constitution in Parliament as an Urgent Bill. Without knowing the actual harmful contents of the Bill, Ministers and Members of Parliament in the past Government raised their hands and approved it. We have been forced to face the bad repercussions of those wrong decisions, today.

Mr. Deputy Chairman of Committees, in this manner, the Nineteenth Amendment to the Constitution has put forward 16 proposals for democratic changes which would be very beneficial to the country. According to the interpretations of the Supreme Court, all these 16 proposed Amendments have no legal problems or impediments. All other proposals which needed approval by a referendum have been dropped. Therefore, let all of us in this Parliament join hands to adopt the Nineteenth Amendment to the Constitution. Please consider this as the one and only opportunity to limit the powers of the President. After adopting and implementing it, let us all join hands to take the second step of completely abolishing the Presidential System. I am saying this because the main election pledge held out by both President Maithripala Sirisena and Mahinda Rajapaksa at the last Presidential Election was to abolish the Presidential System. People gave them 6,200,000 votes and 5,800,000 votes respectively, so as to fulfil that pledge.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Minister, please wind up now.

**ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා**
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி)
(The Hon. A.H.M. Fowzie)
Please give me one more minute, Sir.

Therefore, a total of 12 million people have voted for the abolition of the Presidential System. As such, if we all join hands and hold a referendum to change the Presidential system, people would definitely vote in favour and support that move. President Maithripala Sirisena has declared that the 8th January Presidential Election is the last Presidential Election in this country.

Today, we have got the opportunity to fulfil that pledge, too. Therefore, let us all get together and support this Nineteenth Amendment so that the country will benefit.

Thank you.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Dullas Alahapperuma. You have 10 minutes.

[අ.භා.2.32]

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ වෙලාවෙන් වැඩි ප්‍රමාණයක් සහෝදර මන්ත්‍රීවරයෙකුට දන් දෙන්න සිද්ධ වුණා. ඉතා කෙටි වෙලාවක් තුළ වෙහෙසකර අදහස් දැක්වීමක්

නොවෙයි මා කරන්න බලාපොරොත්තු වන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ ඉතාම වැදගත් විවාදයේදී ඊට කොටස්කාරයෙක්, හවුල්කාරයෙක් වෙන්න ලැබීම ඓතිහාසිකව වැදගත්ය කියලා හිතපු නිසායි ඔබතුමා වෙන් කළ කෙටි කාලය ප්‍රයෝජනයට ගන්න මා බලාපොරොත්තු වුණේ.

ඊයේ ඉඳලා අපි -මේ පාර්ලිමේන්තුව- රැස් වෙලා විසඳන්නට උත්සාහ කරන ප්‍රශ්නයක් තිබෙනවා. අපි ඒ ප්‍රශ්නය "දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත" කියලා හඳුන්වා තිබෙනවා; නම් කරලා තිබෙනවා. එක එක්කෙනා තම තමන්ගේ පෞද්ගලිත මතය අනුව විශ්වාස කරන ප්‍රශ්නය දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා විසඳේවි කියලා අපි කල්පනා කරනවා. ඒ වාගේම මොකක්ද මේ සැබෑ ප්‍රශ්නය, මේ ප්‍රශ්නය නිර්මාණය කළේ කවුරුන්ද, මේ ප්‍රශ්නයට තිබෙන විසඳුම් මොනවාද කියලා අපි මේ අවස්ථාවේදී කල්පනා කර බලන්න ඕනෑ. රටේ ප්‍රධාන පුරවැසියා විධියට, රාජ්‍ය නායකයා විධියට අතිගරු ජනාධිපතිතුමා දකින ප්‍රශ්නය, ඒ වාගේම ආණ්ඩුවේ ප්‍රධානියා විධියට මේ පාර්ලිමේන්තුව ඇතුළේ ගරු අගමැතිතුමා දකින ප්‍රශ්නය, එහෙම නැත්නම් තවත් පැත්තකින් ගත්තොත් පසු ගිය ජනාධිපතිවරණයේදී වර්තමාන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ඡන්දය දුන් ඒ පාක්ෂිකයෝ කල්පනා කරන ප්‍රශ්නය ආදී වශයෙන් මේ ප්‍රශ්නයේ මුහුණු කීපයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ හැමෝටම පැහැදිලිව දැනෙන විධියට, අපි එක එක්කෙනා මේක කියව ගන්න විධියට මේ ප්‍රශ්නයේ ගැටලුකාරීභාවය පිළිබඳව සභාවේදී සාකච්ඡා කරන්න ප්‍රමාණවත් කාලයක් වැය කළේ නැහැ කියන එකයි මගේ පෞද්ගලික කල්පනාව. මොකද, සමහරු හිතන්නේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත කියන්නේ 1978 දී ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමා හඳුන්වා දීපු සමස්ත විධායක ජනාධිපති ක්‍රමයේම නිමාවක් විධියටයි.

මට හිතෙන විධියට ඊයේ අතිපූජනීය මාදුළුවාවේ සෝභිත හාමුදුරුවෝ කරපු අනුශාසනාව අනුව උන්වහන්සේ අදහස් කරන්නේ අද මෙම පනත් කෙටුම්පත සම්මත වීමෙන් අනතුරුව "විධායක ජනාධිපති ධුරය" කියන වචන කීපය අපේ දේශපාලන ශබ්ද කෝෂයෙන් ඉවත් වනවා කියලායි. නමුත්, සිද්ධ වන්නේ ඒක නොවෙයි කියලා අපි දන්නවා. ඒ කෙසේ වෙතත් අපි ඒ සිදුවීම ලඝු කරනවා නොවෙයි.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව තාක්ෂණිකව කථා කළොත්, සිරිමාවෝ බණ්ඩාරනායක හිටපු අගමැතිතුමියගේ සහ එවකට ව්‍යවස්ථා කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විධියට කටයුතු කළ කොල්වින් ආර්. ද සිල්වා මහතාගේ සුසංයෝගය සහිතව ඉදිරිපත් කළ 1972 ජනරජ ව්‍යවස්ථාවෙන් මේ පාර්ලිමේන්තුවට පවරා දීපු සමහර බලතල - පරමාධිපත්‍යය බලය - අපි 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් උදුරා ගත්තා. ඒක ලඝු කළා. එතකොට මේ දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා අපි උනන්දු වන්න ඕනෑ, උත්සාහ ගන්න ඕනෑ, ඒ පරමාධිපත්‍යය බලය නැවත මේ මහජන නියෝජිතයන් වෙත ලබා ගැනීමටයි. විපක්ෂය විධියට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට, සන්ධානය විධියට අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සංයුතිය පිළිබඳව දිගින් දිගටම කරුණු දැක්වූයේ ද්වේෂයෙන් නොවෙයි. එක්සත් ජාතික පක්ෂයත්, ගරු අගමැතිතුමාත් මේ පිළිබඳව පාර්ලිමේන්තුව තුළතදීත්, ඉන් පිටතදීත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපව විත්ති කූඩුවට නංවන්න තමයි උත්සාහ ගත්තේ. ඒක දේශපාලනය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ පෞද්ගලිකව මතය මේකයි. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය ප්‍රකාශ කිරීමෙන් පසුව ගරු අගමැතිතුමාටත්, එක්සත් ජාතික පක්ෂයටත් මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතෙන් ඇති වැදගත්කමක් නැහැ. මේකයි මගේ මතය. එම නිසා ඔවුන් මෙයින් බැහැර වෙන්න උත්සාහ ගන්නවාය කියලයි මා විශ්වාස කරන්නේ. මෙයින් බැහැර වෙන ගමන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අය නිසා තමයි මේක කරන්නට බැරි වුණේ කියලා ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් විත්ති කූඩුවට නංවන්නයි උත්සාහ කරන්නේ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට අප කිසි විටෙක මේ සංශෝධනයට එරෙහි වෙන්න, සංශෝධනය කඩාකප්පල් කරන්න, මේ සංශෝධනයෙන් බැහැර වෙන්න කිසිම උත්සාහයක් ගෙන නැති බව අවධාරණය කරන එක මගේ වගකීමක්. ඒ වාගේම අනෙක් පැත්තෙන් මේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරහා පරමාධිපත්‍ය බලය පැහැර ගැනීමෙන් අනතුරුව මේ බලය හරහා මේ රටේ දේශපාලන ආයතන ඇතුළු පුද්ගලයන්, මේ පනතේ නිර්මාපකයන් විසින් සිදු කරනු ලැබූ කාර්යයන් පිළිබඳවත් කෙටියෙන් හෝ අද දවසේ සටහන් වන්නට ඕනෑ. එහෙම වන්නට ඕනෑ ඇයි? අප විසකුරු යයි කියන මේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඡන්දය දීපු පුද්ගලයන් තුන් දෙනෙක් අද දවසෙත් මේ ගරු සභාව නියෝජනය කරන නිසා. අද මේ ගරු සභාවේ සිටින මන්ත්‍රීවරුන් 225 දෙනාගෙන් එම 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඡන්දය දීපු තුන් දෙනෙක් පමණයි සිටින්නේ. එක්කෙනෙක් ගරු අගමැතිතුමා. එම නිසාම ඔවුන් උත්සාහ ගන්නවා, "මේ වැරැද්දක් හරි ගස්සනවා නොවෙයි, අපි යහපතක් කරන්නයි යන්නේ" කියන අදහසක් දෙන්න. එතැනින් කරන්නේ මෙහි නිර්මාපකයන් සඟවන්නට ගන්නා උත්සාහයක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1980 වර්ෂයේ දී මේ 1978 ව්‍යවස්ථාව හරහා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රජා අයිතිය පැහැර ගත්තා. රුපියල් 10ක වැටුප් වැඩි වීමක් ඉල්ලා අසූවේ වැඩ වර්ජනයේ දී පාරට බැහැපු ලක්ෂ ගණන් සේවකයන් රක්ෂාවලින් දොට්ට දැම්මේ මේ ව්‍යවස්ථාව හරහායි. 1981 දී යාපනයේ සංවර්ධන සභා මැතිවරණය පැවැති කාලයේ යාපනයේ මහජන පුස්තකාලය ගිනි තබා විනාශ කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ නිර්මාපකයන් තමයි ඔබතුමා නියෝජනය කරන යාපනයේ තරුණයන්ගේ "බැලට්" එක පිළිබඳව තිබුණු විශ්වාසය එදා "බුලට්" එක දක්වා ගෙන ගියේ. 1982 පැවැති දූෂිත ජනමත විචාරණය තමයි මේ රටේ මැතිවරණ ඉතිහාසයේ එතෙක් මෙතෙක් තිබුණු බරපතළම කළු ලපය. මේවා 1978 ව්‍යවස්ථාවේ නිර්මාපකයන් විසින් අපේ සමාජයට එකතු කරපු දේවල්. 1983 පැවැති කළු ජූලිය අපේ සමාජයේ නිර්මාණය වූ බරපතළම ව්‍යසනයක්. 1989 දී දකුණේ තරුණයන් දස දහස් ගණනක් ඝාතනය කළා. ඒ වාගේම මේ කාරණයත් අමතක කරන්න එපා. අද මේ ගැන ගරු සභාවේ කථා කළේ නැහැ. 1978 ව්‍යවස්ථාවට විරුද්ධව එක්සත් ජාතික පක්ෂය ඇතුළේ කැරැල්ලක් මතු වුණා. ලලිත් ඇතුළත්මුදලි මහතා වැනි ශ්‍රේෂ්ඨ දේශපාලනඥයන් ඔවුන්ගේ ජීවිත පූජා කළේ මේ ව්‍යවස්ථාවට එරෙහි වෙන්න ගිය ගමනේ ප්‍රතිඵලයක් විධියටයි. දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාවේ නියෝජ්‍ය පුරපති කේසරලාල් ගුණසේකර මැතිතුමා ඊයේ මට කිව්වා, " ලලිත් ඇතුළත් මුදලි මැතිතුමා ළඟ හිටපු කට්ටිය විධියට අපි මාස දෙකක් හැංගිලා හිටියේ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ පාලනයෙන් බේරෙන්නයි" කියලා.

අමතක කරන්න එපා, අප නොයෙක් පරිත්‍යාග කැප කිරීම් කරනු ලැබුවා. අද එහි යම් පුංචි ප්‍රතිඵලයක් අත්පත් කර ගැනීමට අපට පුළුවන්කම ලැබී තිබෙනවා. එම නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මෙම දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතට එකඟ වන බව ප්‍රකාශ කරන අතර වඩාත් ප්‍රජාතන්ත්‍රීකරණය කිරීම සඳහා අවශ්‍ය සංශෝධන යෝජනා කරන්න කියලා අපි කියනවා. ඒ වාගේම අනෙක් පැත්තට අපි මේ කාරණයත් පිළිගන්නට ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ පෞද්ගලික මතය වන්නේ, මේ රටේ දේශපාලන සංස්කෘතිය විකල් වුණා නම්, මේ රටේ දේශපාලන

[ගරු ඩලස් අලහප්පෙරුම මහතා]

සංස්කෘතිය විපරීත වුණා නම්, ඒ විකල් කිරීමේ විත්ති කූඩුවට පළමුවැනි විත්තිකාරයා විධියට නඟින්නට ඕනෑ මේ විධායක ජනාධිපති ධුරය නොවෙයි කියන එකයි. පළමුවැනි විත්තිකාරයා මේ සමානුපාතික නියෝජන මැතිවරණ ක්‍රමයයි. ඒ නිසා මේ ව්‍යවස්ථා සංශෝධනය ඇතුළේ සමානුපාතිකයේ වෛරය වපුරන නාස්තිකාර, වියදම්කාර, විනාශකාරී මැතිවරණ ක්‍රමය පිළිබඳ කතිකාවතින් අපි බැහැර වෙන්න උත්සාහ ගන්න නරකයි. මට පෙනෙන්නේ එක්සත් ජාතික පක්ෂය උත්සාහ ගන්නේ එතැනින් බැහැර වෙන්න කියන එකයි.

එවකට සිටි එක්සත් ජාතික පක්ෂයේ නායකතුමා -අතිගරු ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා- සමානුපාතික නියෝජන මැතිවරණ ක්‍රමය හඳුන්වා දීලා විධායක සභාවට කරපු කථාව දැන් පාර්ලිමේන්තු පුස්තකාලයට ගියොත් බලන්න පුළුවන්. එතුමා ප්‍රසිද්ධියේ කිව්වා, "එක්සත් ජාතික පක්ෂයට දීර්ඝ කාලයක් බලයේ ඉන්න පුළුවන් මැතිවරණ ක්‍රමයක් අපි නිර්මාණය කළේ" කියලා. ඒ නිසා අපි ඒ මැතිවරණ ක්‍රමය වෙනස් කරන්න උත්සාහ කරන්න ඕනෑ. 1978 ව්‍යවස්ථාව සංශෝධනය කරනවා කියලා සියලු දෙනාගේම උදව් අරගෙන මැතිවරණ ක්‍රමය සංශෝධනය කරන්නේ නැතුව ඒකෙන් මඟ අරින්න උත්සාහ ගත්තොත් ඒකෙන් ලැබෙන්නේ විකෘති ප්‍රතිඵලයක්. එහෙම වුණොත් විකෘති ප්‍රතිඵලයක් ලැබේවි. හරියටම ගමේ භාෂාවෙන් කියනවා නම්, ශනි දසාව ලබපු වෛශ්‍යාවක් වාගේ අපට පෙනෙන්න ගනීවි; ශනි දසාව ලබපු වෛශ්‍යාවක් බවට පත් වේවි.

අපි මේ පාර්ලිමේන්තුවේ විපක්ෂය විධියට; පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට ජනතාවගේ පරමාධිපත්‍ය බලය මේ පාර්ලිමේන්තුවට කැඳවන ඕනෑම ක්‍රියාමාර්ගයකට කිසිදු එරෙහි වීමක් දක්වන කණ්ඩායමක් නොවෙයි. එය වඩාත් ප්‍රභූ පන්තියක් අතට යන්නේ නැති ක්‍රමයකට අපි එකඟයි. සැලසුම් කරපු සමහර තැන්වල තිබෙන විධියට මේ බලය 1978න් 1972ට යනවා නොවෙයි. 1978න් 1972ටත් එහා ගිහිල්ලා - 1948න් පසුව ඇති වුණු - මේ බලය යම් කිසි ප්‍රභූ කණ්ඩායමක් අතට යන්න තිබෙන මාර්ගයක් වළක්වා ගන්නටයි අපි පක්ෂයක් විධියට යම් යම් සංශෝධන ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉතාම කෙටියෙන් හරි කථා කරන්නට මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Arjuna Ranatunga. You have eight minutes.

[අ.භා.2.45]

**ගරු අර්ජුන රණතුංග මහතා (වරාය හා නාවික අමාත්‍යතුමා)**
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அமைச்சர்)
(The Hon. Arjuna Ranatunga - Minister of Ports and Shipping)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊයේ දිනය සහ අද දිනය අපේ පාර්ලිමේන්තු ඉතිහාසයේ ඉතාමත් වැදගත් දවස් දෙකක් හැටියට මම සලකනවා. විශේෂයෙන්ම අවුරුදු 35කට වැඩි කාලයක් "විධායක ජනාධිපති ක්‍රමය" කියන ඒ කතිකාව මේ රටේ කොතැනත් තිබුණා. මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනැල්ලා, අපේ රටේ විධායක ජනාධිපති ක්‍රමයේ තිබෙන විශාල බලතල අඩු කිරීමේ ක්‍රියාදාමයකට දායකත්වය ලබා දීම සඳහා සහභාගි වන්නට අපට අවස්ථාව ලබා දීපු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට අපේ ස්තුතිය හිමි කරන්නට ඕනෑ.

මේ ගැන කථා කරන කොට අපි කිවයුතු දෙයක් තිබෙනවා. පසු ගිය ජනාධිපතිවරණයට ඉස්සෙල්ලා මාදුළුවාවේ සෝභිත නායක ස්වාමීන් වහන්සේ මේ රටේ හැම දෙනාටම පෙන්වූවා, මේ විධායක බලතලවල තිබෙන කරදරය, එහෙම නැත්නම් පසු ගිය කාලයේ සිදු වුණු විනාශය. මට මතකයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය - අද ආණ්ඩුවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට වුණත්- මේ විධායක ජනාධිපති ක්‍රමයට විරුද්ධ වුණු පක්ෂයක් බව. 1978 ව්‍යවස්ථාව ගෙන එන කොට අනුර බණ්ඩාරනායක මන්ත්‍රීතුමා - මා දන්නා හැටියට විපක්ෂ නායකතුමා - ඇතුළු මන්ත්‍රීවරුන් හත් දෙනෙක් එම ව්‍යවස්ථාවට විරුද්ධ වුණා. එතැනින් පසුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියත් ඒ වාගේම චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියත් මේ ව්‍යවස්ථාවට විරුද්ධව ඒ කතිකාව දිගටම ගෙන ගියා.

මට මතක හැටියට 2000 වසරේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය මේ පාර්ලිමේන්තුවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනාවා. නමුත් ඒ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අපට සම්මත කර ගන්න බැරි වුණා. නමුත් අද අප සියලු දෙනාටම හොඳ අවස්ථාවක් ලැබිලා තිබෙනවා. අප එක් එක් කෙනා පසු ගිය ඉතිහාසය ගැන කථා කර කර ඉන්නවාට වඩා මේ ලැබුණු අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්න ඕනෑ. මේ අවස්ථාව අප අත් හැර ගන්න හොඳ නැහැ. සමහර කණ්ඩායම්වලට යම් යම් අවශ්‍යතාවන් තිබෙනවා. අද මේ රටේ සියලුම දෙනාට අවශ්‍ය වෙලා තිබෙන්නේ මේ විධායක ජනාධිපති ක්‍රමයේ බලතල අඩු කරන්නයි. මේ මැතිවරණයට ඉදිරිපත් වෙන්න ඉස්සෙල්ලා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේත්, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේත් ප්‍රතිපත්ති ප්‍රකාශනවල තිබුණු ප්‍රධානම දේ තමයි, මේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සහ එහි බලතල අඩු කිරීම. ඒ හරහා මේ රටේ මහ ජනතාවගෙන් සියයට 99ක් ඒකට එකඟ වෙලා තිබෙන්නේ, එහෙම නැත්නම් ඡන්දයක් හෝ ලබා දුන්නේ මේ විධායක ජනාධිපති ක්‍රමයෙන් පසු ගිය කාලයේ වුණු අවාසනාවන්ත සිද්ධීන් නිසයි. අද සමහර පක්ෂ, සමහර පුද්ගලයින් මෙතැනදී දේශපාලනය කරන්න හදනවා. නමුත් මෙම දින දෙකේ අපට කථා කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ මේ ක්‍රමවේදයේ වැදගත්කම පිළිබඳවයි. මේ දිනවල විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ගැන කථා වනවා අපට ඇහෙනවා. මම පෞද්ගලිකව හිතනවා, අප ඒ ක්‍රමයට ඉක්මනින් යා යුතුයි කියලා. නමුත් මෙතරම් කාලයක් අපට කරන්න බැරි වෙච්ච දෙයක් තිබුණා. අපට මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කවදාවත් කර ගන්න ලැබුණේ නැහැ. සමහර නායකයින් මේ කටයුත්ත කරන්න උත්සාහ ගත්තා. 2010 මහින්ද රාජපක්ෂ මැතිතුමාට තමයි ඒ සඳහා හොඳම අවස්ථාව ලැබිලා තිබුණේ. තුනෙන් දෙකේ බලයත් එක්ක මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැවිත් මැතිවරණයට ගියා නම්, සමහර වෙලාවට මේ තත්ත්වය උදා වන්නේත් නැහැ. මේ ඒකාධිපති බලය කියන එක හරහා පසු ගිය කාලය තිස්සේම මේ රට විනාශයට ගියා මිසක් කවදාවත් හොඳ දෙයක් වුණාද කියන එක පිළිබඳව අපට නැවත වරක් කතිකාවක් ඇති කර ගන්න සිද්ධ වෙලා තිබෙනවා.

විපක්ෂය වෙන්න පුළුවන්, ආණ්ඩු පක්ෂය වෙන්න පුළුවන්, අද අප සියලු දෙනාටම හොඳ අවස්ථාවක් ලැබිලා තිබෙනවා. මේ රටේ මහ ජනතාවට දැනුමක් නැහැයි කියලා අප හිතන්න හොඳ නැහැ. පසු ගිය සති කීපය ඇතුළත මේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම ගැන දහ දෙනෙකු සමඟ කථා කළා නම් ඒ දහ දෙනාම කිව්වේ මේ ක්‍රමවේදය ඉතාමත් හොඳයි කියලායි.

කිසිම පුද්ගලයෙකු තමන්ගේ බලතල අඩු කර ගන්න කැමැති නැහැ. පසු ගිය කාලයේ තමන්ට තිබෙන බලය අඩු කර ගන්න කාටවත් අවශ්‍යතාවක් තිබුණේ නැහැ. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා සිද්ධ වුණු විනාශය ගැන කල්පනා කර බලන්න. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ගෙනෙනවා නම් ඒ සංශෝධනය හරහා සිදු විය යුත්තේ රටට අවශ්‍ය දෙයක් මිස එක පුද්ගලයෙකුට, එක පක්ෂයකට, එක කණ්ඩායමකට අවශ්‍ය දෙයක් නොවෙයි කියලායි මම හිතන්නේ. අප පසු ගිය කාලයේ මේ පිළිබඳව අත්දැකීම් ලැබුවා. විශේෂයෙන්ම දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අත උස්සපු, ඒ වාගේම ඒ සඳහා විරුද්ධ වුණු සියලු දෙනාටම මම කියන්නේ මේකයි. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කවුද ගෙනාවේ, ඒකෙන් වෙච්ච දේවල් මොනවාද ආදී වශයෙන් ඉතිහාසයේ වුණු දේවල් ගැන කථා කර කර ඉන්නේ නැතිව, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට අද අප සියලු දෙනාම මේ වෙනස ඇති කරන්නට අපේ ජනාධිපතිතුමාට සහයෝගය දිය යුතුයි. මොකද, මෙය අපට ලැබෙන අවසාන අවස්ථාව. මම හිතන්නේ නැහැ, අපට ඉදිරියේදීවත් තමන්ගේ බලතල අඩු කර ගන්න කැමැති මෙවැනි නායකයෙකු ලැබේවි කියලා. ඒ නිසා මේ අවස්ථාව අප අත් හරින්න හොඳ නැහැ. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා දින සියයේ වැඩසටහන යටතේ එතුමාට තිබුණු බලතල කොයි විධියට පාවිච්චි කළාද කියන එකට හොඳ උදාහරණයක් තිබෙනවා. මොන බලතල තිබුණත්, ඒ බලතල හරි විධියට පාවිච්චි කරන්න පුළුවන් කියන එකත් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා අප සියලු දෙනාටම පෙන්වා දුන්නා. ඒක හොඳ උදාහරණයක්. අප හැම දාම මේ සියලු දෙනාගෙන්ම ඉටු වුණු දේවල් ගැන කථා කරනවා මිසක් ඉතිහාසය පිළිබඳවත් සොයා බලා ඉදිරියේදී වෙන්නේ මොකක්ද කියලා බලන්නේ නැහැ. ඉදිරියේදී සිදු විය හැකි දේවල් ගැනත් සාකච්ඡා කළ යුතුයි.

මමත් පෞද්ගලිකව කැමැති දෙයක් තමයි, මැතිවරණ පැවැත්වීමේදී ආසන ක්‍රමය අනුගමනය කිරීම. කවුරු මොනවා කිව්වත් අප දන්නවා, මේ මනාප ක්‍රමය හරහා මේ රටේ දූෂිතයින්, මංකොල්ලකාරයින්, කුඩුකාරයින්, එතනෝල්කාරයින්, කැසිනෝකාරයින්, බුකිකාරයින් වැනි අනවශ්‍ය පුද්ගලයින්ට පාර්ලිමේන්තුවට එන්න අවස්ථාව ලැබුණු බව. ආසනයක් වෙනුවෙන් නැතිව මුළු දිස්ත්‍රික්කය වෙනුවෙන්ම වියදම් කරලා ඔවුන්ට පාර්ලිමේන්තුවට එන්න පුළුවන් වුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට මේ වෙනස ඇති කිරීමට සියලුම දෙනාගේ කැමැත්තක් තිබෙනවා කියලා මම දන්නවා. පෞද්ගලිකවත් මම හිතනවා, ඒ තත්ත්වය ඇති විය යුතුයි කියලා. ඉතාමත් ඉක්මනින් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් ගෙනාවාම අප සියලු දෙනාටම අවශ්‍ය කරන දේශපාලන සංස්කෘතියක්, අපි හැමදාම කථා කරන වෙනස් දේශපාලන සංස්කෘතියක් ඇති කිරීමට අපට අවස්ථාව ලැබෙනවා.

අද අප සියලු දෙනාටම ඉතාම කෙටි කාලයක් තමයි කථා කරන්නට ලැබුණේ. තමන්ගේ බලතල අතහැරීමට සූදානමින් අපට මෙවැනි අවස්ථාවක් උදා කර දීම ගැන ඉතාමත් දක්ෂ නායකයෙක් වන මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාටත්, ඒ වාගේම ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ටත්, මේ සංශෝධනයට සහයෝගය දෙන විපක්ෂයේ සියලු දෙනාටමත් ස්තුතිවන්ත වෙමින්, මේ විවාදයට සම්බන්ධ වන්නට අවස්ථාව ලබා දීම ගැනත් ස්තුතිවන්ත වෙමින් මාගේ කථාව අවසන් කරනවා.

[අ.භා.2.53]

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி)சரத் வீரசேகர)
(The Hon. (Dr.) Sarath Weerasekara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇත්තෙන්ම සිංහල බහුතර ජනතාවට ඇති සාධාරණ අයිතිය උදුරා ගත හැකි ප්‍රතිපාදන තිබෙන මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන වචන ස්වල්පයක් කථා කිරීමට ලැබීම ගැන මා සතුටු වෙනවා.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ජයග්‍රහණය කරවිය යුතුයි කියා ඊයේ මිනිසුන් පෙළපාළි ගියා, ඒ වාගේම සෝභිත නායක ස්වාමීන් වහන්සේ ප්‍රමුඛ හාමුදුරුවරුන්, කලාකරුවන් පෙළපාළි ගියා; සත්‍යග්‍රහ කළා. ඇත්ත වශයෙන්ම ඒ පෙළපාළි ගිය එක් කෙනෙක්වත් දන්නේ නැතුව ඇති දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන්නේ මොනවාද කියලා. රූපවාහිනී මාධ්‍යයකින් සෝභිත හාමුදුරුවෝ පැවසුවා, "විරාත් කාලයක් තිස්සේ - වසර ගණනාවක් තිස්සේ - විධායක බලය අහෝසි කළ යුතුයි කියන ස්ථාවරයේ සිටියා, එවැනි සිහිනයක් තිබුණා, ඒ සිහිනය සැබෑ කරවන අවස්ථාවක් දැන් එළඹීලා තිබෙනවා, ඒ නිසා මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඡන්දය දිය යුතුයි" කියලා. ඡන්දය දෙන්නේ නැති අය දේශද්‍රෝහියෝ හැටියට ගණන් ගන්නවා කියලා මේ රටේ මතයක් මැව්වා. සෝභිත හාමුදුරුවෝ ඉතා විචිත්‍ර ධර්ම කථිකයෙක් බව අපි දන්නවා. උන්වහන්සේට මුළු රටම ගරු කරනවා; අපිත් ගරු කරනවා. නමුත් උන්වහන්සේ වුණත් දන්නේ නැතුව ඇති, මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ජනාධිපතිතුමාගේ විධායක බලය සම්පූර්ණයෙන්ම අහෝසි වෙන්නේ නැහැ කියලා. මම හිතන විධියට උන්වහන්සේ ඒ බව දන්නේ නැහැ. මොකද, ඒ අඩු වන බලතල සියල්ලක්ම සම්බන්ධයෙන් ජනමත විචාරණයකට යා යුතුයි කියලා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීරණයක් දීලා තිබෙනවා. මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අඩු වෙන්නේ ජනාධිපතිතුමාගේ බලතලවලින් සියයට 10ක් පමණයි. ඒ නිසා මෙය සම්මත වුවත්, නැතත් ජනාධිපතිතුමාගේ පූර්ණ විධායක බලය කවදාවත් නැති වෙන්නේ නැහැ. එහෙම නම් ඒ සත්‍යග්‍රහවල, පෙළපාළිවල කිසිම තේරුමක් නැහැ.

නමුත් මෙහි යම් කිසි කූට සැලැස්මක් හැංගිලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ මඟින් සිංහල බහුතරයට සිදු වන අගතිය දන්නවා නම් සෝභිත හාමුදුරුවෝ හෙට දිනයේ, නැත්නම් අද දිනයේ උපවාස කරන්නේ මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ජයග්‍රහණය කරවන්න කියලා නොවෙයි, පරාජය කරවන්න කියලායි. මොනවාද මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන්නේ? දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙනවා තොරතුරු දැන ගැනීමේ අයිතිය ගැන. මාධ්‍යවේදීන් හිරේ දමන එක අපි සංශෝධනයකින් නැවැත්වුවා. ජනාධිපති ධුර කාලය සහ මුක්තිය පිළිබඳ ප්‍රකාශන සහ හදිසි පනත් අහෝසි කිරීම, ඒ වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව යළි ස්ථාපිත කිරීම ඇතුළත්ව තිබෙනවා. අපි දන්නවා, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව කියන්නේ ඉතාම බල සම්පන්න එකක් කියලා. මේකේ ඉන්නේ කවුද? ඡන්ද බලයක් නැති කථානායකවරයා හැර ඉතිරි නවයෙන් හයක්ම ඇත්ත වශයෙන්ම සුළු ජාතීන්ගෙන් තමයි සමන්විත වෙන්නේ. ද්‍රවිඩ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරුන්ට එක් කෙනෙක් පත් කරන්න පුළුවන්. නමුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සහ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් 204 දෙනාටම එක් කෙනෙක්වත් ඡන්ද බලයකින් පත් කරන්න බැහැ. අගමැති හා විපක්ෂ නායක පස් දෙනෙක් නම් කරනවා. ඒකේ තිබෙනවා, "the Constitutional Council reflects the pluralistic character of Sri Lankan society" කියලා. එහෙම නම් සුළු ජාතීන් හතක් ඉන්නවා. ඒ හතෙන් පස් දෙනෙක් තමයි එතැනට දමන්නේ. එතකොට විපක්ෂ නායක සහ අගමැති සිංහල නම් ඒ පස් දෙනාම සුළු ජාතීන්. ද්‍රවිඩ ජාතික සන්ධානයෙන් පත් කරන එක්කෙනාත් සුළු ජාතිකයෙක්. එහෙම නම් ඇත්ත වශයෙන්ම නවයෙන් හයක්ම සුළු ජාතීන් තමයි පත් වෙන්නේ. ඒ වාගේම සුළු ජාතීන් නොවෙයි නම්, විද්වතුන් හැටියට ඒ ගොල්ලන් සලකන්නේ අපේ රටට ජාතියට ද්‍රෝහී වන, NGO කාරයින්ගෙන් යැපෙන, බටහිර රටවල න්‍යාය පත්‍රයට අනුව වැඩ කරන අය. එහෙම නම් ඒකෙන් ඇත්ත වශයෙන්ම සිංහල

[ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා]

බහුතර ජාතියට අනිවාර්යයෙන්ම අසාධාරණයක් වෙනවා. මොකද, ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ බහුතරය තමයි, රටේ නීතිපති තෝරන්නේ, රටේ පොලිස්පතිතුමා තෝරන්නේ, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් පත් කරන්නේ, අභියාචනාධිකරණ විනිසුරුවන් පත් කරන්නේ, විගණකාධිපති පත් කරන්නේ.

ඔවුන් තමයි ජාතික පොලිස් කොමිසම, මුදල් කොමිසම, අධිකරණ සේවා කොමිසම පත් කරන්නේ. මේ සිංහල ජාතිය නිවට නියාලු බෙල හීන තත්ත්වයට පත් කරන වැයමක් තමයි මේක. මේක දෙමළ ජාතික සන්ධානයේ පූර්ණ සහයෝගය දෙන එකක්.

ඊයේ චන්ද්‍රිකා මැතිනිය මොනවාද කිව්වේ? එතුමියගේ ප්‍රකාශයෙන් තමයි මේක වඩාත්ම සනාථ වෙන්නේ. චන්ද්‍රිකා මැතිනිය දෙමළ ජාතික සන්ධානයේ උත්සවයක ප්‍රධාන අමුත්තා හැටියට ගිහිල්ලා කියනවා, “We want to end the Sinhalese monopoly” කියා. ඒ කියන්නේ අපට මේ රටේ තිබෙන සිංහල අධිකාරිය නවත්වන්න, නැත්නම් විනාශ කරන්න අවශ්‍යයි කියන එකයි. චන්ද්‍රිකා මැතිනිය එහෙම කියනවා. ඒකෙන් තේරෙනවා ඒක මොන තරම් ජාතිද්‍රෝහී කියමනක්ද කියා. ඒක මේ කුමන්ත්‍රණයේම ප්‍රතිඵලයක් හැටියට තමයි අපි දකින්නේ. එහෙම නම් මාදුළුවාවේ සෝභිත ස්වාමීන් වහන්සේ උපවාස කරන්නේ චන්ද්‍රිකා මැතිනිය කියන විධියට රටේ සිංහල අධිකාරිය අවසන් කරන්නටද කියන ප්‍රශ්නය මම උන්වහන්සේගෙන් අහන්න කැමැතියි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9වැනි ව්‍යවස්ථාවේ තිබෙන "ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේ ය" කියන එක වෙනත් සංශෝධනයකින් හැල්ලුවට ලක් කරන්න යනකොට ඒකට තවත් සංශෝධනයක් දමා ඒක ඉවත් කරන්න කටයුතු කළේ අපියි. නමුත් මේවාටයි ප්‍රමුඛස්ථානය ගන්න ඕනෑ සෝභිත හිමි ඇතුළු මේ රටේ ස්වාමීන් වහන්සේලා. මේ වාගේ අවස්ථාවක, සිංහල ජාතියටත්, බුද්ධාගමටත් මේ වාගේ අසාධාරණයක් වෙනකොට මේ ව්‍යවස්ථා සංශෝධනය තහවුරු කරන්න සෝභිත ස්වාමීන් වහන්සේ වාගේ රටේ පිළිගත හැකි ස්වාමීන් වහන්සේලා උපවාස කරනවා නම් ඒකෙන් වෙන්නේ මොකක්ද? වසර 2,500ක ඉතිහාසය තුළ අපේ රටේ ව්‍යසනයන් ඇති වෙනකොට ඒවා නවත්වන්න දිවි කැප කළ, පෙරමඟ ගත් අපේ ආර්ය සංඝරත්නයට කරන නිග්‍රහයක් හැටියට තමයි මම ඒක දකින්නේ.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක වුණොත් රටේ සමස්ත පරිපාලනයට සිංහල ජනතාවගේ කිසිම දායකත්වයක් ඇති වෙන්නේ නැහැ. අපි අමතක කරන්න නරකයි, මේ රටේ බහුතරය විධියට සිංහල ජනතාව සියයට 72ක් සිටිනවා. නමුත් අප තුළ ජාතිවාදය නැහැ. යාපනයේ දෙමළ ජනතාව සිටියේ සියයට 48ක් පමණයි. සියයට 52ක දෙමළ ජනතාව ඉන්නේ සිංහල සහ මුස්ලිම් ජනතාව අතරේයි. නමුත් එදා යාපනයේ 25,000ක් සිංහලයෝ සිටියා, 15,000ක් මුස්ලිම් අය සිටියා. අද යාපනයේ එක සිංහලයෙක්වත්, එක මුස්ලිම් ජාතිකයෙක්වත් නැහැ. එතකොට ජාතිවාදී අපිද, එහෙම නැත්නම් කවුද කියන එක අපි කවුරුත් දන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට මුදල් කොමිසමක් පත් වෙනවා. වර්තමාන තත්ත්වය අනුව ඒ මුදල් කොමිසමේ සාමාජිකයන්ගෙන් බහුතරයක් වෙන්නේ සුළු ජාතීන්. මොකද, මහ බැංකුවේ අධිපති සිටිනවා, මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමා සිටිනවා. අනෙක් තුන්දෙනා පත් කරන්නේ ජාතීන් තුනෙන්. මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමා සහ මහ බැංකුවේ අධිපතිතුමා සුළු ජාතීන් වුණොත් එතැනත් බහුතරය වෙන්නේ සුළු ජාතීන්. එතකොට ඔවුන් තමයි රටේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම පාලනය කරන්නේ සහ පළාත් සභාවලට මුදල් ප්‍රතිපාදන වෙන් කරන්නේ. එහෙම නම් එතැනදීත් අපට හිතන්න වෙනවා, මේකෙනුත් සිංහල බහුතරයට සම්පූර්ණයෙන් අසාධාරණයක් වෙනවා කියන එක.

ජාතික පොලිස් කොමිසමක් පත් කරනවා. ජාතික පොලිස් කොමිසමේ සාමාජිකයෝ 7දෙනෙක් සිටිනවා. නමුත් පොලිස්පති තෝරන්නේ ජනාධිපතිතුමා නොවෙයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව. තමාට විශ්වාසවන්ත කෙනෙක්ව පොලිස්පති හැටියට පත් කිරීමට ජනාධිපතිතුමාට කිසිම බලයක් නැති වෙනවා. රටේ ව්‍යාකූල තත්ත්වයක්, රටේ කුමන්ත්‍රණයක් ඇති වුණොත් වර්තමාන තත්ත්වය අනුව ජනාධිපතිතුමා පොලිස්පතිතුමාව කැඳවා තමාට අවශ්‍ය බුද්ධි අංශයේ මහත්වරු, නැත්නම් පොලිස් නිලධාරින් ඒ ඒ ස්ථානවලට මාරු කර යවනවා. මේ තිබෙන තත්ත්වය අනුව පොලිස් කොමිසම ක්‍රියාත්මක වුණොත් වෙන්නේ ඒ වගේ දෙයක් කරන්න අවශ්‍ය වූ විට පොලිස් කොමිසමේ සිටින හත්දෙනාටම ඒක කියන්න සිදු වීමයි. පොලිස් කොමිසමේ සිටින හත්දෙනා අතර RAW එකේ agentsලා ඇති, කවුද ඒ ගැන දන්නේ? නැත්නම් NGOsවලින් පඩි ගන්න අය ඇති. එතකොට වෙන්නේ අපට කුමන්ත්‍රණය ව්‍යර්ථ කරන්න තිබෙන අවස්ථා සම්පූර්ණයෙන්ම වැළකී යාමයි.

ඒ වාගේම තමයි උතුරු පළාත් ප්‍රධාන ඇමතිට නියෝජ්‍ය පොලිස්පතිතුමා පත් කරන්න පුළුවන්. එතකොට බුද්ධි අංශයේ කෙනෙක් පොලිස් කොමිසමට කියා උතුරට යැව්වොත්, එම බුද්ධි අංශ නිලධාරියා සම්පූර්ණයෙන්ම යටත් වෙන්නේ ප්‍රධාන ඇමති යටතේ සිටින නියෝජ්‍ය පොලිස්පති යටතටයි. එහෙම වුණොත් අපට කිසිම බුද්ධි තොරතුරක් එකතු කරගන්න ලැබෙන්නේ නැහැ. එයින් සම්පූර්ණයෙන්ම ජාතික ආරක්ෂාවට අහිතකර ලෙස බලපාන තත්ත්වයක් ඇති වන බව තමයි අපට කියන්න පුළුවන් වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව මුල ඉඳලාම කළේ වංචාව. මොකද, ශ්‍රේෂ්ඨාධිකරණයට,- [බාධා කිරීමක්]

**ගරු ආර්. යෝගරාජන් මහතා**
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி)சரத் வீரசேகர)
(The Hon. (Dr.) Sarath Weerasekara)

ඔබතුමා වාඩි වෙන්න, මගේ කාලය ගන්න එපා. මුල ඉඳලාම කළේ වංචාව. ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළ දේ නොවෙයි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. දැන් සංශෝධනවලට සංශෝධන එකතු කර මේක jigsaw puzzle එකක් වෙලා තිබෙන්නේ. අපටත් ඇත්ත වශයෙන්ම එක එක තැන්වල කෑලි මූට්ටු කරන්න තමයි වෙලා තිබෙන්නේ. තව මට කොපමණ වෙලාවක් තිබෙනවාද?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Hon. Member, your time is over.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி)சரத் வீரசேகர)
(The Hon. (Dr.) Sarath Weerasekara)

තව විනාඩියක් ලබා දෙන්න.

රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා 2002 දී මේ වාගේම දෙයක් කළා. 2002 දී කොටින් සමඟ ඇති කර ගන්නා ලද ගිවිසුමේ අන්තර්ගතය අදවත් ජනතාව දන්නේ නැහැ. ඒ වාගේම, දසවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අන්තර්ගතය ජනතාව දන්නේ නැහැ. ඒවා ගැන ජනතාව දන්නේ නැතිව විධායක බලය අහෝසි කළ යුතුයි කියා දැවැන්ත ව්‍යාපාරයක් ගෙන යනවා.

ජනතාව මුළා කරමින් කරන දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට මාගේ පෞද්ගලික විරෝධතාව මේ අවස්ථාවේදී පළ කර සිටිනවා.

[අ.භා. 3.03]

**ගරු නිරෝෂන් පෙරේරා මහතා (තරුණ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிரோஷன் பெரேரா - இளைஞர் விவகாரங்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of Youth Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින පැවැත්වෙන දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත දෙවන වර කියැවීමේ විවාදයේදී මටත් අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබා දීම ගැන ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන තර්ක කරන මේ අවස්ථාවේදී ඒ දෙස ජාති වාදී කෝණයෙන් බලා ඒ ආකාරයට ජාති වාදය අවුස්සන තැනකට තල්ලු කර, මේ වැඩ පිළිවෙළ කඩාකප්පල් කරන්නට යාම ගැන අප කනගාටු වනවා.

අප දන්නවා - [බාධා කිරීම්] නැහැ, තනිවම නොවෙයි කියනවා නේ. [බාධා කිරීම්] අපේ ජාතික කොඩිය පවා විකෘති කර පාරවල්වල පෙන්නනවා පසු ගිය දිනවල අප දැක්කා. ඒ තුළින් ජාති වාදයක් අවුස්සා නැවතත් මේ රට යුද්ධයකට ගෙන යාමටයි සමහර බලවේග මේ අවස්ථාවේදී ක්‍රියා කරන්නේ. එහෙම යුද්ධයකට රට ගෙන ගියොත් සමහර වෙලාවට තමන්ගේ පරණ නායකයන් ගෙනැල්ලා ඒ තුළින් නැවත තමන්ට බලය අල්ලා ගන්න පුළුවන් කියන ආකල්පයක් තිබෙනවා.

පාර්ලිමේන්තුව හැටියට ඒ වැරදි නිවැරදි කරන්න අපට ඓතිහාසික අවස්ථාවක් තිබෙන බව මම මේ අවස්ථාවේදී කියනවා. මෙයයි ජනතාවගේ බලාපොරොත්තුව. විධායක ජනාධිපති ක්‍රමයේ තිබෙන බලතල අඩු කරන්න ඕනෑය කියා ජනාධිපතිවරණ ගණනාවක් තුළින් ජනතාව තීන්දුවක් ලබා දී තිබෙනවා. පසු ගිය ජනවාරි 8වැනි දා ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට මේ වාගේ ජන වරමක් ලබා දී තිබෙනවා. එතුමා ඒ අනුව ක්‍රියා කරමින් වැදගත් රජයක් හැටියට අද දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත දෙවන වර කියැවීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. පාර්ලිමේන්තුව තුළින් ජනතාවගේ බලාපොරොත්තු ඉෂ්ට කළ යුතු නම්, අනිවාර්යයෙන්ම දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ රටට ලබා දිය යුතුයි. අපේ රටේ අනාගත පරපුර මේ සඳහා බලා ගෙන ඉන්නවා. ඒ අනාගත පරපුරේ අනාගතය සහ හොඳ පාලන ක්‍රමයක් මේ රටට ලබා දීම දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අප කරනවා.

එදා දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මේ රටට ගෙන ආවා කියා අද වන විට අප දන්නවා. දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අත එසවූ පුද්ගලයන් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ යම් යම් අඩු පාඩු දක්වා, ඒ තුළින් විශාල වෙනසක් කරන්නට බලාපොරොත්තු වන අන්දමක් තමයි අප දකින්නේ.

විධායක ජනාධිපති ක්‍රමයේ තිබෙන යම් බලතලයක් හෝ අඩු කර අපට ඉදිරි මැතිවරණයකට ගිහිල්ලා ඒ තුළින් ජනතාවට ඕනෑ විධියට මේ රටේ පාලන ක්‍රමය හදා ගන්නට නැවතත් ජනතාවට බලයක් ලබා දෙන්න ඕනෑ. අද වන විට අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, එක්සත් ජාතික පක්ෂයත් ප්‍රමුඛ අනෙක් සියලු පක්ෂත් එකතු වෙලා ගෙනෙන දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සුළු සුළු තර්ක ගෙනැල්ලා අඩ පණ කරන්නට අප ඉඩ දිය යුතු නැහැ.

ඉතිහාසයේ අප අතින් යම් කිසි වරදක් සිදු වුණා නම් එය නිවැරදි කර අපේ රට නිවැරදි දිසාවට ගෙන යන්න අද සිටින පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වගකීමක් පැවරෙනවා. අපේ රට හරියාකාරව පාලනය වෙන්නේ නැත්නම් අපට අනාගතයක් ගැන කථා කරන්න බැහැ. අනාගතයක් ගැන අපට මේ රටට හඳුන්වා දෙන්න බැරි නම්, මේ පාර්ලිමේන්තුවටත්, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලාටත් නැවතත් ඒ වගකීම එන බව අප සිහිපත් කළ යුතුයි.

ඒ සමඟම, අප ගෙනෙන දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා ඉදිරියේදී විවිධ අංශ තුළින් යම් කිසි බලය බෙදා හැරීමක් කරන්නට අප බලාපොරොත්තු වනවා. මා හිතන විධියට ඇත්තටම ඒ තුළින් ශක්තිමත් වන්නේ පාර්ලිමේන්තුවයි. මොකද, ශක්තිමත්, ස්ථාවර පාර්ලිමේන්තුවක් තුළින් ඉදිරියේදී ආර්ථික පරිවර්තනයක් ඇති කරලා මේ රටේ දැවෙන ප්‍රශ්නවලට විසඳුම් සෙවීමට අප පටන් ගන්න ඕනෑ.

අප දන්නවා අද වන විට තාරුණ්‍යයට විරැකියා ප්‍රශ්නය විශාල වශයෙන් තිබෙන බව. ඒ වාගේම ඒ අයට අනාගතය ගැන හිතන්න වෙලා තිබෙනවා. ඒවාට විසඳුම් දෙන්න නම් අප මුලින්ම මේ තිබෙන ප්‍රශ්න ටික පාර්ලිමේන්තුව හරහා විසඳා ගන්න ඕනෑ. ඊට පසුව තමයි අපට රට සංවර්ධනය කරන්න පුළුවන් වන්නේ; රටේ අනාගතයක් ගැන හිතන්න පුළුවන් වන්නේ. නමුත්, අප හැම වෙලාවේම සුළු සුළු දේවල් ගැන තර්ක විතර්ක කරනවා නම්, අපේ ස්ථාවරය, අපේ බලය රැක ගන්න වෙනස් වෙනවා නම් ඉතිහාසයේ කුණු බක්කියට තමයි මේ පාර්ලිමේන්තුවත් යන්නේ. ඒ නිසා සියලු දෙනාටම මේ අවස්ථාවේදී මා මතක් කරනවා, අප ඉතිහාසයේ කරපු වැරදි අද නැවත කරන්න එපා කියලා. එදා යම්කිසි බලපෑමක් තියෙන්න ඇති. ගරු ජනාධිපතිවරයෙක් යම්කිසි බලපෑමක් කරන්න ඇති, මෙහෙම කරන්න කියලා. නමුත්, අද ඉන්න ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ලැහැස්තියි බලය දෙන්න. එතුමා ඇවිත් සද්භාවයෙන් මේ ගරු සභාව අමතලා කිව්වා, එතුමා ලැහැස්තියි, එතුමාගේ බලය කප්පාදු කරලා හැම කෙනාටම පිළිගත හැකි ක්‍රමයක් මේ රටේ ස්ථාපිත කරලා ඉස්සරහට යන්න කියලා. ඒක තමයි ජනවාරි 8වැනි දා ජනතාව ඉස්සරහට ගිහින් එතුමා පොරොන්දු වුණේ. ඒ පොරොන්දුව ඉෂ්ට කරන්න එතුමා දැන් ලැහැස්ති වෙලා තිබෙන වෙලාවේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරු වශයෙන් අප ඒ වගකීම භාර ගන්න ඕනෑ.

මොන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හැදුවත්, මොන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සංශෝධනය කළත්, එය පාවිච්චි කරන පුද්ගලයන්ගේ වැදගත්කමත් අප කියන්න ඕනෑ. මොකද, එය පාවිච්චි කරන පුද්ගලයන් ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වැරදියට පාවිච්චි කළොත්, රටේ අනාගතය ගැන හිතන්නේ නැතිව තමන් ගැනම සිතලා එය පාවිච්චි කළොත්, මා හිතන විධියට මොන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හැදුවත්, ඒකෙන් අපේ රට විනාශ වන එක බේරා ගන්න බැහැ. ඒ නිසා ජනතාව මේ වෙලාවේ බලාගෙන ඉන්නවා, පාර්ලිමේන්තුව මොනවාද කරන්නේ කියලා. දේශපාලනය කෙරෙහි ජනතාවගේ විශ්වාසය ක්‍රම ක්‍රමයෙන් අඩු වන මේ මොහොතේදී රටට ඉතාම අවශ්‍ය මෙවැනි සංශෝධනයක් අපට සම්මත කර ගන්න බැරිව ගියොත් විශේෂයෙන්ම මේ රටේ තරුණ කොටස්වල විශ්වාසය බිඳ වැටෙනවා. ඔබතුමන්ලා

[ගරු නිරෝෂන් පෙරේරා මහතා]

දන්නවා, මේ රටේ තරුණ කොටස් තුළ දේශපාලනය ගැන විශ්වාසය බිඳ වැටුණු විට මොනවාද වුණේ කියලා. ඒ තුළින් මේ රටේ බිහිසුණු අත් දැකීම් කීපයක්ම අප අත් විඳලා තිබෙනවා. ඒ තැනට අපේ ජනතාව තල්ලු කරන්න එපා. අපි නිවැරදි තීන්දු අරගෙන මේ අවස්ථාවේදී ජනතාවට සාධාරණයක් කරමු. මේ ක්‍රමය වෙනස් කරන තුරු ජනතාව අවුරුදු 30ක්, 35ක් තිස්සේ බලාගෙන ඉන්නවා. මේ විධායක ජනාධිපති ක්‍රමයේ තිබෙන ඒ බලතල අයින් කරලා, සියලුම ජාතීන්ට, සියලුම ආගමික කොටස්වලට එකතු වෙලා ඉදිරියට යන්න පුළුවන් රටක් අප නිර්මාණය කරන්න ඕනෑ. අප මේ දෙස එක් එක් කෝණවලින් නොබැලිය යුතුයි. මගේ ජාතියට, මගේ ආගමට මේකෙන් කර ගන්න පුළුවන් මොනවාද, අපේ බලය වැඩි කර ගන්නේ කොහොමද, අප මේවා කරන්නේ කොහොමද කියලා කිව්වොත්, අනිවාර්යයෙන්ම අවුලකට, අනිවාර්යයෙන්ම තවත් යුද්ධයකට අප අඩිතාලමක් දැමීමක් තමයි සිදු වන්නේ.

අවසාන වශයෙන්, මේ දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් අපේ රටටත්, ඒ වාගේම අපේ ජනතාවටත් සෙතක් සැලසේවා!යි කියා ප්‍රාර්ථනා කරමින්, මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 3.10]

**ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා**
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දිනය ශ්‍රී ලංකා ඉතිහාසයේ ඉතාම තීරණාත්මක දිනයක්. පසු ගිය ජනවාරි 8වැනි දා පැවැති ජනාධිපතිවරණයෙන් පසුව ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා එතුමාගේ බලතල පාර්ලිමේන්තුවට පැවරීම සඳහා ඊයේ දිනයේ එම පනත් කෙටුම්පත පිළිබඳ දෙවැනි වර කියැවීමේ විවාදය ආරම්භ කරනු ලැබුවා. ඒ පිළිබඳව මේ මොහොතේ අප විශේෂයෙන් සතුටු වෙනවා.

විධායක ජනාධිපති ක්‍රමය ගැන අප අසා තිබෙනවා; කියවලා තිබෙනවා. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් විධායක ජනාධිපති ක්‍රමයක් මේ රටේ ඇති කළේ ඇයි කියලා බැලුවොත්, ඒකට ලැබෙන උත්තරය තමයි, ශක්තිමත් ආර්ථික, සමාජයීය දියුණුවක් සඳහාත්, ක්ෂණික තීරණ ගන්නා දක්ෂ පුද්ගලයන් ඒ තනතුරුවලට පත් කරලා, තනි පුද්ගලයෙකු විසින් ශක්තිමත් ආර්ථිකයක් කරා මේ රට මෙහෙය වීමේ අවශ්‍යතාවත් උඩ තමයි මේ විධායක ජනාධිපති ක්‍රමය හදලා තිබෙන්නේ කියන එක. ඒ වුණත් ජේ.ආර්. ජයවර්ධන පළමුවැනි විධායක ජනාධිපතිතුමා අසූව දශකයේ ශක්තිමත් ආර්ථිකයක් මේ රට තුළ ඇති කරන්න යම් උත්සාහයක් ගත් බව අපි දන්නවා. නමුත් අවාසනාවකට විධායක ජනාධිපති ක්‍රමය හේතුවෙන්ම අසූව දශකයේ දැවැන්ත අර්බුද ගණනාවක් මේ රට තුළ ඇති වෙලා තමයි නතර වුණේ.

අපි දන්නවා, පළමුවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පවා ඇති කළේ ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගෙන් පළිගන්න කියලා. එහෙම ආදර්ශයක් තමයි මුලින්ම මේ රටට ලැබුණේ. 1980 වැඩ වර්ජනයේදී දහස් ගණන් සේවකයන් එළියට දැම්මා. 1983 වමේ පක්ෂ තහනම් කරන්න ජූලි කලබල ඇති කරලා අවුරුදු තිහක යුද්ධයකට මූලාරම්භය ලබා දුන්නා. ඇඳිරි නීතිය දමලා පළාත් සභා ක්‍රමය ඇති කළා. 1988-89 කාලයේ තරුණ සංහාරය ඇති වුණා. මේ විධියට ආර්ථික සමාජයීය දියුණුව කෙසේ වෙතත් විධායක ජනාධිපති ක්‍රමය නිසා දැවැන්ත අර්බුද ගණනාවක් ඇති වෙලා රට තිබුණු තැනට වඩා පහත් තැනකට ඇද වැටුණා. මොකද, සාපේක්ෂව බැලුවාම 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හඳුන්වා දෙන කොට ඉතාමත් සාමකාමී රටක් තිබුණේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊට පසුව බලයට පත් වුණු ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමා, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිතුමිය යුද්ධයක් එක්ක පොර බැදුවා. විධායක ජනාධිපති ක්‍රමය නිසාම ඇති වුණු යුද්ධයක් එක්ක පොර බදමින් ඒ දෙදෙනාම ජීවයේ ගොදුරු බවට පත් වුණා. ඒ වාගේ තත්ත්වයක් තමයි විධායක ජනාධිපති ක්‍රමයත් එක්ක ඇති වුණේ. ආර්ථිකයක් ගැන හිතන්නවත් වෙලාවක් තිබුණේ නැහැ. මේ තත්ත්වය උඩ 2005 මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මේ රටේ විධායක ජනාධිපතිවරයා විධියට පත් වෙන කොට දැවැන්ත අර්බුද ගණනාවක් තිබුණා. ඒ වෙන කොට විධායක ජනාධිපති ක්‍රමය හඳුන්වා දීලා අවුරුදු 27ක් ගෙවිලා තිබුණා.

තනි පුද්ගලයකුගේ නායකත්වය යටතේ රට ආර්ථික, සමාජයීය වශයෙන් ශක්තිමත් දියුණුවක් කරා යන්න තිබුණු බලාපොරොත්තු වෙනුවට, ඒ ක්‍රමය හඳුන්වා දීලා අවුරුදු 25ක් පමණ ගත වෙලා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා පත් වෙන කොට යුද්ධයක් ඇතුළු දැවැන්ත අර්බුද ගණනාවක් තිබුණා. මන්දගාමී සංවර්ධනය, සුනාමි ව්‍යසනය, ලෝක ආර්ථික අර්බුද නිසා රට තුළ දැවැන්ත ප්‍රශ්න ගණනාවක් තිබුණා. හැබැයි, අපි පැහැදිලිවම කියන්න ඕනෑ එතුමා මේ විධායක ජනාධිපති බලතල පාවිච්චි කරලා ඒ අභියෝගවලට ශක්තිමත්ව මුහුණ දුන් බව. පාර්ලිමේන්තුව ඒක රාශි කර ගෙන -සුළුතර පාර්ලිමේන්තුවක් තිබුණේ.- මේ රටේ ජනතාව ඒක රාශි කර ගෙන යුද්ධය ඇතුළු දැවැන්ත අර්බුදවලට මුහුණ දීලා එතුමා ඒවා සාර්ථකව ජයග්‍රහණය කළාය කියන කාරණය, එතුමා යටතේ වැඩ කළ මන්ත්‍රීවරයකු විධියට මේ අවස්ථාවේ පැහැදිලිවම කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අත උස්සපු කෙනෙක් විධියට මම කියන්න ඕනෑ, යුද්ධය ඉවර කරලා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට අවශ්‍ය වුණා වාගේ ශක්තිමත් ආර්ථිකයක් කරා මේ රට අර ගෙන යන්න එතුමාටත් අවශ්‍ය වුණා. ඒ සඳහා ඍජු තීරණ ගන්න, අවශ්‍ය සංශෝධන කරන්න බැරිව එක එක සභාවල, එක එක තැන්වල මාස ගණන් පල් වෙවී තිබුණා. ඒ විධියට තීරණ ගන්න බැරිව පල් වෙමින් තිබෙනවාට වඩා ඍජු තීරණ ගන්න ශක්තිමත් ගමනක් යන්න එතුමා දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා. ඒ වාගේම එතුමාගෙන් අපි ඉල්ලුවා, තුන්වැනි වරටත් ජනාධිපතිවරයා විධියට ඉල්ලන්න කියලා. ඒ නිසා දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අත උස්සපු අපි, ඒක අනුමත කරනවා කියලා අදත් කියනවා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා යටතේ ශක්තිමත් ආර්ථිකයක් කරා යන්න අපි එදා අත ඉස්සුවා. නමුත් අද තත්ත්වය වෙනස්.

මම මේ වෙලාවේ තවත් කරුණක් මතක් කරන්න ඕනෑ. සංවර්ධනය වෙමින් පවතින රටක් වන අපේ රටේ යහ පාලනය, මානව හිමිකම් ගැන දියුණු රටවල් කථා කරනවා. නමුත් ඒ රටවල් සංවර්ධනය වන කාලයේ යහ පාලනය, මානව හිමිකම් තිබුණේ කොහොමද? වහල්ලු දමලා එංගලන්තයේ උමං දුම්රිය මාවත් හදන කොට මේ මානව හිමිකම් ගැන කථා කළා ද? අපේ රටවලට ඇවිල්ලා දහස් ගණන් ජනතාව ඝාතනය කරලා, සම්පත් කොල්ල කාලා, මුළු ලෝකයේම අපේ වාගේ රටවල සම්පත් හූරා ගෙන ගිහිල්ලා තමන්ගේ රටවල් හදන කොට මානව හිමිකම් තිබුණේ කොහේද? කොහේද යහ පාලනය තිබුණේ? මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ අපි ශක්තිමත් ආර්ථිකයක් කරා යන කොට යම් යම් අඩු පාඩු තියෙන්න ඇති. නොයෙකුත් අඩු පාඩු තියෙන්න ඇති. ඒවා ගැන හිතලා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාව ජනාධිපති ධුරයට පත් කරන්න ජනතාව තීන්දුවක් දුන්නා.

2010න් පස්සේ ජෙනරල් සරත් ෆොන්සේකා මහත්මයාට ඇති වූ කනගාටුදායක තත්ත්වය අපි අනුමත කරන්නේ නැහැ කියලා තරුණයකු විධියට මම මේ වෙලාවේ කියනවා. ෆොන්සේකා

මහත්තයාට ජම්පරය ඇන්දවීම අපි අනුමත කරන්නේ නැහැ. ඒ ගැන මුළු රටම දුක් වුණා. ඒ වාගේම මා මේ මොහොතේ කියනවා, මේ අගමැතිතුමා shortcuts වලින් බලයට ඇවිල්ලා, යුද්ධය ඉවර කරපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට හෝ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට කුමන හෝ අයුරකින් මොනවා හෝ අනතුරක් කරන්න, ඔවුන්ගේ ගෞරවයට හානි කරන්න හදනවා නම් අපි ඒවාට කීයටවත් එකඟ වෙන්නේ නැති බව. ඒක පැහැදිලිවම කියන්න ඕනෑ. ඒ වාගේම, මේ විධියට නැඟිටලා පාර්ලිමේන්තුවේදී ෆොන්සේකා මහත්තයා වෙනුවෙන් කථා කරන්න නොහැකිවීම ගැනත් මම කනගාටු වනවා. මේ රටේ තිබුණු දරුණු ත්‍රස්තවාදයට දිවි හිමියෙන් මුහුණ දීලා අපේ රට නිදහස්, සාමකාමී රටක් බවට පත් කරපු ඒ නායකයන්ට ඒ විධියේ කටයුතු කරන්න ආවොත්, අපි අපට පුළුවන් උපරිම ශක්තිය යොදවලා ඒවාට එරෙහිව කටයුතු කරනවාය කියන කාරණයත් මේ අවස්ථාවේදී පැහැදිලිවම කියන්න ඕනෑ. ඒ වාගේම, බැසිල් රාජපක්ෂ මැතිතුමාත් ඇමතිවරයකු විධියට විශාල කාර්ය භාරයක් කළා. එතුමා රුපියල් 2,500ක මුදලක් නිවාසයක් හදාගන්න ගම්වල ජනතාවට දුන්නාය කියලා හිරේ දැම්මා නම්, අපත් අරගෙන ගිහිල්ලා හිරේ දමන්න කියලා අපි කියනවා. එහෙම කරන එක වැරැදියි.

වංචාව, දූෂණය කියන එක ලංකාවේ තිබෙන පොදු ප්‍රශ්නයක්. දේශපාලනයේ වෙන්න පුළුවන්, නිලධාරින් අතර වෙන්න පුළුවන් වංචාව සහ දූෂණය තිබෙනවා. මෙය කොන්දොස්තර මහත්තයාගේ ඉඳලා පෞද්ගලික අංශයේ සේවකයාගේ ඉඳලා හැම තැනම විසිරුණු පිළිකාවක්. අපි සමස්තයක් විධියට ඒකට මුහුණ දෙන්න ඕනෑ. ඒ කරුණ කියමින් මේ රටේ නායකයන් දඩයම් කරනවාට අපි විරුද්ධයි. අපි ඒක පැහැදිලිව මේ වෙලාවේ අගමැතිවරයාට කියන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය කටයුතු ජනාධිපතිතුමා යොදනු ඇතැයි කියා අපි මේ අවස්ථාවේදී විශ්වාස කරනවා.

අද මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මේ රටේ නායකයා විධියට පත් වෙලා සිටිනවා. අද තිබෙන්නේ වෙනස් තත්ත්වයක්. එතුමා වෙනස් ගමනක් යන්න බලාපොරොත්තු වෙනවා. අපි එතුමාට අවශ්‍ය ශක්තිය අනිවාර්යෙන්ම ලබා දිය යුතුයි. අපි ඉදිරියේදී එතුමාත් සමඟ එකට පෙළගැහිලා, එතුමාගේ නායකත්වය යටතේ පක්ෂයක් විධියටත්, පාර්ලිමේන්තුවක් විධියටත් එකතු වෙලා ශක්තිමත් ආර්ථිකයක් කරා ලංකාවට යන්න නොහැකි වූ ගමන යන්න ඕනෑ. එතුමාගේ ගමන වෙනස්. එතුමා කියනවා, මෙම විධායක බලතල නැවත පාර්ලිමේන්තුවට ගන්න කියලා. පාර්ලිමේන්තුව හරහා, කොමිෂන් සභා හරහා ගෙන යන වැඩ පිළිවෙළක් තමයි එතුමා යෝජනා කරන්නේ.

මෙම විධායක ජනාධිපති ක්‍රමය ගැන, එහෙම නැත්නම් 1972 ජනරජ ව්‍යවස්ථාව ගැන මේ රටේ ගමේ මිනිසුන් මොකද කියන්නේ? ගමේ මිනිසුන්ගේ දේශපාලනික තත්ත්වය මොකක්ද? අපි ගිහිල්ලා ගමේ මිනිසුන්ගෙන් ඇහුවොත්, "ඇයි පාර්ලිමේන්තු මන්ත්‍රී කෙනෙක් ඔබට ඕනෑ වෙන්නේ" කියලා, මොනවාද ඔවුන් දෙන උත්තර? පවතින නීතියෙන් බැහැරව, පවතින ක්‍රමවේදයෙන් බැහැරව රස්සාවක් ගන්න. පවතින නීතියෙන් බැහැරව, පවතින ක්‍රම වේදයෙන් බැහැරව උසස්වීම් ගන්න, මාරුවීම් ගන්න. පොලීසියත් එක්ක එකතු වෙලා හොර වැඩ කරන්න, නැතිනම් නීති විරෝධී වැඩක් කරලා ඒකෙන් ගැලවෙන්න. පවතින නීතියෙන් හෝ ක්‍රමවේදයෙන් බැහැරව ළමයි ඉස්කෝලවලට දමන්න. ඒවා තමයි දෙන උත්තර. අවසානයේදී බැලුවාම, නීතියෙන් පිට යම් කිසි දෙයක් කර ගන්න අවශ්‍ය වේද, එහෙම නම් ගිහිල්ලා හමු වෙන්න පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් කියන නිගමනය තමයි ලැබෙන්නේ. ඒක තමයි ඔවුන්ට තිබෙන මන්ත්‍රීවරයකුගේ අවශ්‍යතාව. ඒ නිසා අපි ගත්ත බලය පාවිච්චි කළ විධිය ගැන අපට ස්වයං විවේචනයක් තිබෙන්න ඕනෑ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විධියට අපි හරියට බලය පාවිච්චි කළේ නැති නිසා තමයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභා කොමිෂන් සභා ආදී නොයෙකුත් සභා අද ජනතාව ඉල්ලන්නේ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, please wind up. Your time is over.

**ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා**
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩියක් ලබා දෙන්න. මම රමේෂ් පතිරණ මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටියා එතුමාගේ වෙලාවෙන් මට විනාඩි කිහිපයක් ලබා දෙන්න කියලා. එතුමා කිව්වා දෙන්නම් කියලා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Ramesh Pathirana, is it okay by you?

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
විනාඩි දෙකක් ලබා දෙන්නම්.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Okay.

**ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා**
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)
අපි පසු ගිය කාලය පුරාවටම ජනතාවගේ විශ්වාසය දිනා ගත්තේ නැහැ. එම නිසා මේ වෙලාවේදී මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීමත්, එම කොමිෂන් සභා පත් කිරීම ගැනත් අපි සතුටු වනවා. මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පත් කරනු ලබන පුද්ගලයන් ජනාධිපතිතුමාගේ බලතල අරගෙන පාර්ලිමේන්තුවෙන් නතර වෙනවා හැර, එතැනින් එහාට වෙනත් නිලධාරින්ට හෝ වෙනත් පුද්ගලයන්ට ඒ බලතල දෙනවාට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට අපි විරුද්ධයි. කෙසේ වෙතත්, ඉතාම කැමැත්තෙන් මෙම දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට අත උස්සන්න අවශ්‍යයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ බහුතර බලය තිබෙන්න ඕනෑ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට. ඒ නිසා ඒ අය තමයි එතැන ඉන්න ඕනෑ. ඒ බලය, ජනතාවගේ පරමාධිපත්‍ය බලය, අපි වෙන අයට දෙන්න කැමැති නැහැ. හැබැයි, අපට ස්වයං විවේචනයක් තිබිය යුතුයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට පසු ගිය අවුරුදුවල අපි හැසිරුණු ආකාරය සම්බන්ධයෙන්. ඒ වාගේම විධායක ජනාධිපති ක්‍රමය පිළිබඳවත්.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

**ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා**
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කථාව අවසන් කරන්නම් .

[ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා]

අවසාන වශයෙන් මම කියන්නේ මේ ඔක්කෝටම වඩා ලොකු ප්‍රශ්නයක් තිබෙන බවයි. ඒක තමයි මේ මනාප ඡන්ද ක්‍රමය. එය අහෝසි විය යුතුයි. මම එක ප්‍රශ්නයක් අහලා මගේ කථාව නතර කරනවා. 2000න් පස්සේ පාර්ලිමේන්තු මැතිවරණ හතරක් තිබුණා. මම අහනවා, මේ ප්‍රශ්නය. ලංකාවේ විශ්වවිද්‍යාලවලින් එළියට ආපු උපාධිධාරින් කී දෙනෙක් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා ද? ගමක ඉස්කෝලේ මහත්තයෙක්, සාමාන්‍ය මනුස්සයෙක් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා ද? ගරු මන්ත්‍රීවරුනි, අපි ඒ කාරණයත් අනිවාර්යයෙන්ම අවධානයට ගත යුතුයි කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.22]

**ගරු ඩිලාන් පෙරේරා මහතා (නිවාස හා සමෘද්ධි රාජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு டிலான் பெரேரா - வீடமைப்பு மற்றும் சமுர்த்தி இராஜாங்க அமைச்சர்)

(The Hon. Dilan Perera - State Minister of Housing and Samurdhi)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඓතිහාසික වැදගත්කමකින් යුත් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව පාර්ලිමේන්තුවේ විවාද කරන වේලාවේ, මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුමත කර ගන්න කටයුතු කරන්න වුවමනා උදවිය ඒ පිළිබඳව නිවැරදිව කටයුතු කළා ද කියන ප්‍රශ්නය ඉදිරියේ තියාගෙන තමයි අපි කථා කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අපි අනුමත කර ගන්නවා නම්, ඊට මේ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් ඕනෑ. ඒක ව්‍යවස්ථානුකූලව තිබෙන්නම ඕනෑ අංගයක්. එහෙම නම්, ඒ තුනෙන් දෙකේ බලය විරුද්ධ පක්ෂයෙන් ගන්නා වූ අටියෙන් සහ අරමුණෙන් තමයි ආණ්ඩු පක්ෂය හැටියට අපි කටයුතු කරන්න ඕනෑ. එහෙම නැත්නම් මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගන්න බැහැ. ඉතින් ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු රජය විරුද්ධ පක්ෂයේ ඒ සහයෝගය ලබා ගැනීමේ අටියෙන්ද කටයුතු කළේ කියන ප්‍රශ්නය අසමින් තමයි අපි මේ විවාදයට සම්බන්ධ වෙන්න ඕනෑ. එහෙම නැතුව, දරදඬු විධියට, මුරණ්ඩු විධියට තමන්ට ඕනෑ ඕනෑ එක එක තාලයේ දේවල් මේ සංශෝධනයට එකතු කරන්න ගියොත්, අනිවාර්යයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සංශෝධනය කරන්නට අවශ්‍ය කරන ඒ තුනෙන් දෙකක බලය ලැබෙන්නේ නැහැ. ඉතින් ඒ බලය ලබා ගැනීම සඳහා තමයි අපි කටයුතු කරන්නට ඕනෑ. ආණ්ඩුවට තුනෙන් දෙකේ බලයක් නැහැ. තුනෙන් දෙකේ බලයක් ආණ්ඩුවට නැති නිසා තමයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ තීන්දුවක් අනුව, -එක්සත් ජාතික පක්ෂයේ අය "තොපි මොකටද අපේ ආණ්ඩුවට එන්නේ" කියලා අහනකොටත්, අපේ මිත්‍රයන් "තොපි මොකටද මස් කටු කන්න යන්නේ" කියලා අහනකොටත්- අපි කට්ටියක් ආණ්ඩුවට ඇවිල්ලා මේ කටයුත්තට ශක්තිය දීලා කටයුතු කරන්නට තීරණය කළේ.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයටත්, ඊටත් එහායින් ජනතාව ඉල්ලන මනාප ක්‍රමය නැති කරන මැතිවරණ ක්‍රමය සහිත ඒ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒම සඳහා ඒ තුනෙන් දෙකේ බලය ලබා දීමටත් තමයි මේ ආණ්ඩුවට ඇවිල්ලා ටිකක් හිරිකිතයකින් හරි මේ පැත්තේ ඉඳගෙන මේ ගැන කථා කරන්නේ. ඒ තුනෙන් දෙකේ බලය ලබා දෙන්න ඕනෑ නිසායි එසේ කටයුතු කරන්නේ. අපි ඒ ශක්තිය දෙන්න ලෑස්තියි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තමයි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධ කියලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට කොච්චර මඩ ගැහුවත්, ඒක බොරු. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අද මේ තිබෙන තත්ත්වයට ගෙනැල්ලා, මේ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බලය ලබා ගන්නා මට්ටමට ගෙන ඒමට පසු ගිය මාසය පුරාම කටයුතු කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි කියන එක මම බය නැතුව කියනවා. අපි තමයි කට්ට කාගෙන ඒ කටයුත්ත කළේ.

අද මේ මොහොත වන විට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තිබෙන අයිතිය හරහා එන ඒ සංශෝධනත් එක්ක මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරුන් 225දෙනාගේම සහයෝගයෙන් සම්මත කර ගැනීමේ අනගි අවස්ථාව උදාවෙලා තිබෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු ආණ්ඩුවට දැන් තිබෙන්නේ ඒ අනගි අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්න එකයි. නැතුව ඒකට පයින් ගහන එක නොවෙයි. ඒකෙන් ප්‍රයෝජන ගන්නට අවශ්‍ය කරන ඒ ආත්ම ශක්තිය එතුමාට තිබෙයි කියලා අපි විශ්වාස කරනවා.

ඉතිහාසයේ හිටපු කිසිම ජනාධිපතිවරයෙකුට හෝ ජනාධිපතිවරියකට නොතිබුණු ශක්තියක් තමාගේ බලය අත හරින්න අද මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට ලැබිලා තිබෙනවා. විවිධ අවස්ථාවල හිටපු ජනාධිපතිවරු, හිටපු ජනාධිපතිවරිය මේ බලය අතහැරීමට මැතිවරණ කාලයේදී පොරොන්දු වුවත්, එය සිද්ධ වුණේ නැහැ. ඒ පුටුවේ ඉඳ ගත්තාට පස්සේ ඒ බලය අතහරින්න කැමැති වුණේ නැහැ. නමුත් ඒ පුටුවේ ඉඳ ගත්ත වෙලාවේ ඉඳලා ඒ බලය අතහරින්න කැමැති විධායක ජනාධිපතිවරයෙක් අද ඉන්නවා. ඒ විධායක ජනාධිපතිවරයා මේ මොහොතේ මාගේ පක්ෂයේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයා වීම මට ආඩම්බරයක්; අභිමානයක්. අපි විශ්වාස කරනවා එතුමා ඒ බලය අතහරින්නට තිබෙන සූදානමම අගමැතිවරයාත් ආදර්ශයට අරගෙන, මේ සංශෝධන හරහා එතුමාටත් යම් බලයක් ලැබෙනවා කියා හිතනවා නම්, එයත් අතහරින්න සූදානමින් මේ සංශෝධනයට මුහුණ දෙයි කියලා.

විධායක බලතල අඩු කරලා අපි ඒ බලතල ගෙන එන්න හැදුවේ කොහේටද? ඒ බලතල අපි ගෙන එන්න හැදුවේ පාර්ලිමේන්තුවට. එහෙමනම් පාර්ලිමේන්තුවට විධායක බලතල ගෙනෙන්න අපි යෝජනා කරන වේලාවේ, පාර්ලිමේන්තුව ශක්තිමත් කරන්න යෝජනා කරන වේලාවේ පාර්ලිමේන්තුවේ ශක්තිය තවදුරටත් වර්ධනය කර ගන්න තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් බහුතරයක් ඉන්න ඕනෑ කියලා. විධායක ජනාධිපති බලතල අඩු කරලා, විධායක ජනාධිපති කියන කුරුල්ලාගේ තටු කපලා ඒ ශක්තිය ගන්න හදන්නේ පාර්ලිමේන්තුවට නම්, ඒ සංකල්පයට පිටුපස්ස පැත්ත හරවලා පාර්ලිමේන්තුවේ ශක්තිය පාර්ලිමේන්තුවේ නොවන නෝනලාට සහ මහත්වරුන්ට දෙන්න යෑම අර සංකල්පයට හාත්පසින්ම විරුද්ධයි. මම නම් ඔය NGO නෝනලා, මහත්වරු ආවාට භය නැහැ. ඒ නිසා මගේ විරුද්ධත්වය තිබෙන්නේ NGO නෝනලා, මහත්වරු මේ ව්‍යවස්ථා සංශෝධන හරහා මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට එන එකට නොවෙයි. ඔවුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට ආවා කියලා ඔවුන්ට කරන්න පුළුවන් කෙංගෙඩියක් නැහැ. මට තිබෙන්නේ එහෙම ප්‍රශ්නයක් නොවෙයි. මට තිබෙන්නේ ප්‍රතිපත්ති ප්‍රශ්නයක්. අපි පාර්ලිමේන්තුව ශක්තිමත් කරන්න නේ විධායක බලතල අඩු කරන්නේ. එහෙම නම් පාර්ලිමේන්තුවට දැන් තිබෙන ශක්තිය අඩු කර ගෙන ඒ බලය පාර්ලිමේන්තුවේ නොවන කට්ටියකට දෙන්නේ ඇයි? පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඉල්ලන්නේ නැහැ, කොමිෂන් සභාවලට යන්න. කොමිෂන් සභාවලට යන්න ඕනෑ ඒ නෝනලා, මහත්වරුන් හෝ රාජ්‍ය නිලධාරින්. හැබැයි අපි ළඟ තිබෙන කොමිෂන් සභා පත් කිරීමේ බලය ඇයි වෙන කාටවත් දෙන්නේ? ඒ බලය අපි ළඟ තියා ගනිමු. ඇයි, අපට අපි ගැන ආත්ම විශ්වාසයක් නැද්ද? අපි

දේශපාලනඥයන් කියලා කැලයේ ඉන්න සත්තු ද? නැහැ. කැලයේ ඉන්න සත්තු වාගේ දෙපැත්තේම සමහර අය ජාතිවාදී කතා කියනවා. හැබැයි බහුතරයක් අය එහෙම නොවෙයි. බහුතරයක් අය සිංහල, දෙමළ සහ මුස්ලිම් භේදයකින් තොරව, ජාති, කුල, ආගම් භේදයකින් තොරව, පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරන්නත්, ඒවාගේම විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් අනිවාර්යෙන්ම සම්මත කරන්නත් අත් දෙකම උස්සන්නයි බලාගෙන ඉන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අපට බැහැ.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
බැරි නම් කරන්න දෙයක් නැහැ. ඒක ඔබතුමාගේ වැඩක්.

හැබැයි දේශපාලනඥයන් වන අපි ඇයි අපටම නිග්‍රහ කර ගන්නේ? පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අපි ඇයි අපටම නිග්‍රහ කර ගන්නේ? අපට තිබෙන බලය වෙන කාටවත් දෙන්න කියලා කියන්නේ ඇයි? ඇයි, අපි අපක්ෂපාතී නැද්ද? ඇයි, අපි සාධාරණ නැද්ද? ඇයි, අපට තීන්දු ගැනීමට ආත්ම ශක්තියක් නැද්ද? නුවණ නැද්ද? දැනුම නැද්ද? අත් දැකීම් නැද්ද? ඒ සියල්ල තිබෙනවා. ඒක නිසා මේ සභාවට දේශපාලනඥයන් ආවොත් ස්වාධීන වෙන්නේ නැහැ කියන කතාව බොරු. ඔය ස්වාධීනයි කියන සෑම කෙනෙකුටම තමන් දරන දේශපාලන මතයක් තිබෙනවා. ස්වාධීනයි කියන සෑම කෙනෙකුටම යම් යම් දේශපාලන පක්ෂ ගැන මතයක් තිබෙනවා. තිබෙන එකම වෙනස, ඒ ස්වාධීනයි කියා ගන්නා උදවිය පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් නොවන එකයි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. State Minister, please wind up now.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா )
(The Hon. Dilan Perera)
මම අවසාන කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු රජයෙන් මම ඉතාම කරුණාවෙන්, ඕනෑකමින් ඉල්ලා සිටිනවා, මේ අනගි අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්න කියලා. තුනෙන් දෙකේ බලය නොවෙයි, පාර්ලිමේන්තුවේ 225 දෙනාගේම අත් දෙක උස්සලා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරන්න පුළුවන් අනගි අවස්ථාවක් ඇවිල්ලා තිබෙනවා. මන්ත්‍රීවරුන් 142ක් සිටින එක්සත් ජනතා නිදහස් සන්ධානය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ශක්තිමත් කරන මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුමත කරන්න ලැහැස්තියි. ඒකට පිටිපස්ස හරවන්න එපා, ඒකට පයින් ගහන්න එපා කියන ඉල්ලීම ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් ඉල්ලනවා. මොකද, පෞද්ගලිකව මටත්, මාත් එක්ක මේ සහයෝගිතා ආණ්ඩුවට ටිකක් හිරිකිතයකින් හරි එකතුවෙලා සිටින සියලු දෙනාටමත් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත්, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් ඉක්මනින්ම සම්මත කරලා අපේ ආදරණීය මිත්‍රයන් සමඟ නැවත විරුද්ධ පක්ෂයට යාමේ මහඟු වුවමනාවක්, ආශාවක් තිබෙනවා. එම නිසා මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉක්මනටම සම්මත කරලා ඒ අවස්ථාව අපට ලබා දෙන්න කියන ඉල්ලීමත් කරනවා. බොහොම ස්තුතියි.

[3.31 p.m.]

**ගරු ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
Mr. Deputy Chairman of Committees, I am honoured to speak at this momentous and historic occasion. As we all know, His Excellency President Maithripala Sirisena, made a pledge to the country that the powers of the Executive President would be curtailed or abolished. නමුත් අපට ජනාධිපතිවරයාගේ බලතල අත් හිටුවන්න පුළුවන් වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව අනුවයි.

අතිගරු ජනාධිපතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රී කණ්ඩායමට කිව්වා, "මගේ බලය මම දෙන්න ලැහැස්තියි, මම මේ ජනාධිපති පුටුවේ වාඩි වෙලා ඉන්න නිසා මේ දෙස වපර ඇසින් බලන්න එපා" කියලා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මන්ත්‍රී කණ්ඩායම දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව සලකා බලා හරයාත්මක නිගමනයකට ආවා. මෙතැන සමහර උදවිය වචන හුවමාරුවකට කතා කරනවා. හැබැයි ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේ හරය වන්නේ ජනාධිපතිතුමාගේ විධායක බලය වෙන ආයතනයකට හෝ වෙන පුද්ගලයෙකුට පවරන්න බැහැ කියන එකයි. He can delegate powers only on the recommendation of His Excellency the President. එම නිසා අපි මෙතැන විධායක බලය අහෝසි කිරීමක් කරන්නේ නැහැ. හේතුව, අතිගරු ජනාධිපතිතුමා ඍජුව මහජන ඡන්දයෙන් පත් වූ ජනාධිපති කෙනෙක්. ඒ නිසා අපට අයිතියක් නැහැ, එතුමාව 1972 නාමික විධායක ජනාධිපතිගේ තත්ත්වයට පත් කරන්න. අපි මතක් කළ යුතු දෙයක් තමයි අපි විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමක් කරන්නේ නැහැ කියන එක. එතුමාගේ බලතල අඩු කිරීමක් තමයි කරන්නේ. ඒ තත්ත්වය යටතේ තමයි අපි මේ කටයුතු සැලකිය යුත්තේ.

අපි අදාළ ගැසට් පත්‍රය දෙස බලන කොට එහි තිබුණා, "අගමැතිතුමා කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා විය යුතුයි" කියලා. ජනාධිපතිතුමා කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා හෝ එතුමා කැබිනට් මණ්ඩලයේ සාමාජිකයෙක් නොවන ආකාරයට තමයි මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සකස් කර තිබුණේ. ඒ නිසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට අපි සියලු දෙනාටම යුතුකමක් තිබෙනවා, ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව අනුව කටයුතු කරන්න. සමහර වගන්ති සම්මත කරන්න ජනමත විචාරණයක් අවශ්‍ය නැහැ කියන පදනමින් ඒ වගන්ති ඇතුළත් විය යුතුයි කියන එක සමහර අයගේ තර්කයයි. නමුත් අතිගරු ජනාධිපතිතුමා කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා සහ එහි සභිකයකු කරන අවස්ථාවකදී දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන අනෙකුත් වගන්තිත් ඊට අනුකූලව වෙනස් කළ යුතුයි කියන කරුණ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මතය වන නිසා Committee Stage එකේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ස්ථාවරය අනුව යම් යම් සංශෝධන අපි ඉදිරිපත් කරලා තිබෙනවා.

මෛත්‍රීපාල පාලනය වෙනුවෙන් අපි සියලු දෙනාම මාධ්‍ය සහාය ලබා ගත්තා; මාධ්‍ය නිදහස ගැන කථා කළා. නමුත් මේ පනත් කෙටුම්පතේ වගන්තියක් තිබුණා, ඡන්ද කොමසාරිස්ගේ රෙගුලාසි උල්ලංඝනය වන අවස්ථාවකදී කටයුතු කිරීමට බලය ලත් නිලධාරියකු පත් කිරීම අදාළව. ශ්‍රේෂ්ඨාධිකරණය කිව්වා, එවැනි වගන්තියක් ජනමත විචාරණයක් නැතිව ඇතුළත් කරන්න බැහැ කියලා. ඊට පස්සේ සංශෝධනයක් හැටියට රජය ඉදිරිපත් කරන්න හැදුවා, ඡන්ද කොමසාරිස්ගේ රෙගුලාසි උල්ලංඝනය වූ අවස්ථාවකදී සිර දඬුවමක් හෝ රුපියල් ලක්ෂයක දඩයක් නියම

[ගරු ෆයිසර් මුස්තාපා මහතා]

කිරීමට. නිදහස් මාධ්‍යවේදින් සහ ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් අතිගරු ජනාධිපතිතුමාට මේ ගැන කිව්වා. එතුමා තීරණය කළා, ඒ වගන්තිය ඉවත් කළ යුතුයි කියලා. ඒ නිසා මේ අවස්ථාවේදී අපි සියලු දෙනාම මාධ්‍ය නිදහස වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වන්න ඕනෑ, එවැනි වගන්තියක් ඉවත් කිරීම ගැන. හේතුව, මෛත්‍රී පාලනය දිනුවේ මාධ්‍ය නිදහස තුළිනුයි. ඒ නිසා දණ්ඩනීය අපහාස නීතිය අපි අයින් කරලා තිබෙන යුගයක මෙවැනි ප්‍රතිපාදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ තිබීම ප්‍රගතිශීලි නොවේය යන්න අපි සියලු දෙනාම පිළිගත යුතු කරුණක් හැටියට මා දකිනවා.

අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය දිහා බලන කොට, there are matters on which we can agree and there are matters on which we disagree. If you take the Constitutional Council, there is a view that it should not be politicized. There is also the view that we should not delegate our powers to third parties. But, with regard to the powers of His Excellency the President, the Sri Lanka Freedom Party has taken a stand that in view of the Supreme Court Judgement, certain clauses have to be changed. මා ඔබතුමන්ලා සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටින්නේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත දිහා වපර ඇසින් බලන්න එපා කියලායි. Wherever we can have a consensus, we should have a consensus. As regards the immunity of the President, everybody in this House is agreeable. As regards the provision that Parliament cannot be dissolved before four-and-a-half-years of its term, all are agreeable. We all are agreeable that we need Independent Commissions. Therefore, I beg every Member of this House to consider aspects that we are in agreement with, because we can always reach a consensus with regard to certain matters. Wherever there is a consensus, we should agree.

However, certain quarters are trying to put the blame on the Sri Lanka Freedom Party saying that we are trying to disrupt the Nineteenth Amendment. All that we say is we will never disrupt the Nineteenth Amendment. We will vote for the Nineteenth Amendment. But, as a Party, we have taken a decision that the Supreme Court Determination has to be adhered to and also, we have taken a decision that the right of the Members of Parliament should not be delegated to certain others. That is why we say that the Members of the Constitutional Council should consist of Members of Parliament. Therefore, I respectfully call on all of you to consider the Nineteenth Amendment. Wherever we can agree with, we should have a consensus because, as you know, in everything, in any matter, there are different views.

We have interpreted the Supreme Court decision in a particular manner, and we believe that is correct. However, the Government has interpreted the Supreme Court decision in another manner and says that as the Supreme Court does not strike off certain provisions, those provisions can remain. We state that those provisions should be kept in line. A simple example is, we had a Bill brought in to the effect that the President was not going to hold any portfolio. That is why through a transitional provision they have restricted the President other than the Minister of Defence to hold the portfolio of Minister of Mahaweli Development and Environment. However, consequent to the amendments we have suggested, and also the fact that the Government has accepted the position brought in by us that in view of the Supreme Court decision, His Excellency the President should be the Head of the Cabinet and also a Member of the Cabinet.

I would also like to mention another matter in this House. We all know what the Eighteenth Amendment did to the country. I, as one who voted for the Eighteenth Amendment, think that was a wrong decision and the country has paid the price. So, I apologize to this House with regard to that decision. If we are to be progressive, we need an Executive Prime Minister, but that cannot be done without a referendum. So, we have to do what we can do. If we are going to give full powers to the Prime Minister, we need to go to the people. I know that there is a cry from the people to give Parliament more powers and to have an Executive Prime Minister. However, unfortunately, we have to act in terms of the Constitution. A mandate of the people alone will not fulfil that aspiration. Therefore, I say that this Nineteenth Amendment could be the first step, but there is a lot more to be done to safeguard democracy in this country.

We know the disruption that the Eighteenth Amendment caused.

විධායක ජනාධිපති කියන භූතයා දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් ඇති වුණා. එයට පක්ෂව ඡන්දය දුන් කෙනකු හැටියට මාත් ඒ සම්බන්ධයෙන් වගකීමක් ගන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් මා සමාව ඉල්ලනවා. නමුත් අපි ප්‍රගතිශීලීව කටයුතු කළ යුතුයි. ඒ නිසා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේදී අපි එකඟත්වයකට එමු. නමුත් අපේ ඉලක්කය විය යුත්තේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරලා, අනාගතයේදී විධායක අගමැතිවරයකු - පාර්ලිමේන්තුවට වග කියන අගමැතිවරයකු- බිහි කිරීමයි. හැබැයි, අපි යථාර්ථය තේරුම් ගන්න ඕනෑ. අපට නිකම් මෙතැන කථා කරන්න බැහැ. අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව අනුව කටයුතු කළ යුතුයි.

ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඉතාමත් පරිත්‍යාගශීලී ලෙස කිව්වා, මගේ බලය මා දෙන්න කැමැතියි කියලා. මේක ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි; ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි; මේක ආණ්ඩුවේ ප්‍රශ්නයක් නොවෙයි; මේක විපක්ෂයේ ප්‍රශ්නයක් නොවෙයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව අනුව කටයුතු කිරීම අපි සියලු දෙනාගේම වගකීමක් හැටියටයි මා දකින්නේ.

Let us be progressive. I ask every Member in this House, wherever we can agree we will agree. We should not shelve the Nineteenth Amendment on the basis that we do not agree with some clauses. So, let us be progressive. This is part of democracy. There are a lot of positive and progressive steps in the Nineteenth

Amendment. Wherever we can agree, I beg all of you, not to throw this away just because you disagree with some of the clauses or, for that matter, that you disagree with some of the amendments.

As we know, all of us have to respect the will of the House. So, let the House decide at the Committee Stage what we have to do, because every Member of this House has a right to bring in amendments. That right cannot be taken away. We should respect the right of every Member in the House. That is what we should do. We cannot impose our will on a third party or on another Member of the House.

Hon. Deputy Chairman of Committees and Members of the House, I respectfully beg all of you that we should not throw away the Nineteenth Amendment. Let us be progressive and move forward.

Thank you.

[பி.ப. 3.42]

**ගරු එම්.බී. ෆාරුක් මහතා**
(மாண்புமிகு எம்.பி. பாறூக்)
(The Hon. M. B. Farook)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித்தவிசாளர் அவர்களே, அரசியலமைப்புக்கான பத்தொன்பதாவது திருத்தச் சட்டமூலம் மீதான இன்றைய விவாதத்தில் கலந்துகொண்டு பேசுவதையிட்டு நான் சந்தோசமடைகின்றேன். இலங்கை வரலாற்றில் இன்று ஒரு முக்கியமான, பொன்னான நாளாகக் கருதப்படுகின்றது. வரலாறுகாணாத, சரித்திரம் சொல்லக்கூடிய இந்த நாளில் இலங்கைத் திருநாட்டு மக்கள் அனைவரும் அரசியலமைப்புக்கான பத்தொன்பதாம் திருத்தச் சட்டமூலம் இந்தப் பாராளுமன்றத்தில் நிறைவேற்றப்படுமா, இல்லையா? என்று எதிர்பார்த்தவண்ணம் இருக்கின்றார்கள். கடந்த 37 வருட காலத்துக்கு முன்பு இலங்கைக்கு அறிமுகப்படுத்தப்பட்ட இந்த நிறைவேற்று ஜனாதிபதி முறைமையை ஒழிப்பதற்காக அல்லது அந்த முறைமையில் தனி ஒருவருக்கு அளிக்கப்பட்டிருக்கின்ற அதிகாரத்தைக் குறைப்பதற்காக இன்று பாராளுமன்ற உறுப்பினர்கள் கட்சி பேதமின்றி விவாதித்துக்கொண்டிருக்கின்றார்கள்.

நிறைவேற்று ஜனாதிபதியின் அதிகாரம் குறைக்கப்பட வேண்டும் அல்லது ஒழிக்கப்பட வேண்டும் என்ற கோஷங்கள் முன்னாள் ஜனாதிபதி சந்திரிகா அம்மையாரின் காலத்திலிருந்து எழுப்பப்பட்டு வந்துள்ளன. ஆனால், அந்தக் கோஷங்கள் ஜனாதிபதித் தேர்தல் காலத்தில் மாத்திரம்தான் எழுப்பப்பட்டன. சம்பந்தப்பட்டவர் ஜனாதிபதியாக வந்ததன் பின்பு அவ்வாறான கோஷங்கள் பெறுமதியற்றதாகப் போய்விடுகின்றன. நிறைவேற்று ஜனாதிபதி முறைமையின் காரணமாகப் பாராளுமன்ற இறைமை மற்றும் ஜனநாயக முறைமை என்பன கேள்விக்குட்படுத்தப்பட்டன. அதாவது தனியொருவரிடம் அதிகாரம் செறிந்திருந்தது. அதன் மூலமாக மக்களை ஆட்சி செய்ய வேண்டிய சரியான கொள்கையிலிருந்து மாறுபட்டுச் செயற்பட முடிந்தது. ஒரு தனி நபருக்கு அதிகாரம் இருந்ததன் காரணமாகவே அவ்வாறான ஓர் அவல நிலை ஏற்பட்டது.

கடந்த ஜனாதிபதித் தேர்தலின்போது கௌரவ மைத்திரிபால சிறிசேன அவர்கள் தனது தேர்தல் பிரசாரத்தில் இந்த முறைமையை ஒழிப்பதாக வாக்குறுதியளித்திருந்தார். அதன் பிரகாரமே இன்று இங்கு விவாதங்கள் இடம்பெறுகின்றன. இந்த அதிகாரத்தைக் குறைப்பதற்காக நாங்கள் திடசங்கற்பம் பூண்டிருக்கின்றோம். இந்தத் திருத்தத்தின் மூலமாக ஜனாதிபதிக்கு இருக்கின்ற சில முக்கியமான அதிகாரங்கள் குறைக்கப்படுவதனால் பாராளுமன்ற உறுப்பினர்களும் நிவாரணம் பெறுகின்றார்கள். ஏற்கெனவே உள்ள அரசியலமைப்பின்படி ஓர் அரசாங்கம் அமைக்கப்பட்டு ஒரு வருடத்தின் பின்பு ஜனாதிபதி அவர்கள் நினைக்கின்ற சந்தர்ப்பத்தில் பாராளுமன்றத்தைக் கலைப்பதற்கான அதிகாரம் அவருக்கு இருக்கின்றது. அது மக்களால் தெரிவுசெய்யப்பட்ட பிரதிநிதிகளைச் சுதந்திரமாக இயங்கவிடாத நிலைமையை, அவர்கள் தம்மைத் தெரிவுசெய்த மக்களுக்குச் சேவை செய்ய முடியாத நிலைமையை ஏற்படுத்துகின்றது. அரசியலமைப்புக்கான இந்தத் திருத்தத்தின்மூலம் பாராளுமன்றத்தை ஒரு வருடத்தின் பின்பு கலைப்பதற்கான அந்த அதிகாரம் இல்லாமல் செய்யப்படுகின்றது.

நிறைவேற்று ஜனாதிபதி முறைமை கொண்டுவரப்பட்டதன் பின்பு அரசியலமைப்புக்கான இரண்டு திருத்தங்கள் கொண்டுவரப்பட்டன. பதினேழாவது திருத்தம் ஜனாதிபதியின் அதிகாரங்களைக் குறைப்பதற்காகக் கொண்டுவரப்பட்டது. இருந்தபோதிலும் பதினெட்டாவது திருத்தத்தின்மூலம் மீண்டும் அந்த அதிகாரங்கள் ஜனாதிபதிக்குக் கொடுக்கப்பட்டு அவர் எதேச்சாதிகாரமாக நடப்பதற்கான சந்தர்ப்பங்கள் ஏற்படுத்தப்பட்டன. அத்துடன், ஜனாதிபதி ஒருவர் இரண்டு முறைகளுக்கு மேற்பட்ட காலம் ஜனாதிபதியாக இருப்பதற்கான தகுதியும் வழங்கப்பட்டது. குறித்த ஜனாதிபதி, ஜனாதிபதித் தேர்தலில் மீண்டும் போட்டியிட்டு மூன்றாவது முறையும் ஜனாதிபதியாக வருவதற்காகவே பதினெட்டாவது திருத்தம் கொண்டுவரப்பட்டது. இதன் மூலமாக ஒருவர் மூன்றாவது முறையாகவும் ஜனாதிபதியாக வந்து தான் விரும்பிய முறையில் எதேச்சாதிகாரமாக அதிகாரத்தைப் பிரயோகிப்பதற்கு வழிவகுக்கப்பட்டது. ஆனால், இந்தப் 19வது திருத்தச் சட்டமூலத்தின்படி, ஏற்கெனவே 18வது திருத்தச் சட்டத்தின்மூலம் ஏற்படுத்தப்பட்ட, மூன்றாவது முறையும் ஒருவர் ஜனாதிபதியாக வருவதற்கான அதிகாரமும் மற்றும் சுயாதீன ஆணைக்குழுக்களை இல்லாமல் ஒழித்த அந்தப் பிரிவுகளும் நீக்கப்பட்டுள்ளன. இன்று இந்த நாட்டிலுள்ள மக்கள் நீதித்துறையில் நம்பிக்கையிழந்திருக்கின்ற சந்தர்ப்பத்தில் இந்தத் திருத்தத்தின் வாயிலாக சுயாதீன குழுக்களாக நீதிச்சேவை ஆணைக்குழு, Constitutional Council என்பவை நிறுவப்படுவதன்மூலம் checks and balances - சமநிலைகளும் தடைகளும் உருவாக்கப்பட்டு பாராளுமன்றத்துக்குப் பொறுப்புக் கூறும் தன்மையும் ஜனநாயகத்தை மதிக்கின்ற தன்மையும் ஏற்படுத்தப்பட்டிருக்கின்றது.

இதுமாத்திரமல்ல, இந்தவிதமாக Right to Information Act உம் இந்த பாராளுமன்றத்தில் சமர்ப்பிக்கப்பட்டு நிறைவேற்றப்பட வேண்டும். அதன்மூலம் சாதாரண மக்கள் எங்கள் நாட்டில் உருவாக்கப்படுகின்ற சட்டங்களை, நிறுவனங்கள் இயக்கப்படும் முறைகளை அறிந்துகொள்ளக்கூடியதாக இருக்கும்.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Thank you. பேச்சை முடித்துக்கொள்ளுங்கள்!

**ගරු එම්.බී. ෆාරුක් මහතා**
(மாண்புமிகு எம்.பி. பாறூக்)
(The Hon. M. B. Farook)
*ஒரு நிமிடம் சேர்!*

கற்றறிந்த எனது நண்பர் ஒருவர் லண்டனில் இருந்தபோது அங்கு ஒரு library க்குச் சென்றிருக்கிறார். அங்கே அனைத்து நாடுகளினது Constitutionஉம் இருக்கின்றபோது, இலங்கையின் Constitution மாத்திரம் இல்லாதிருந்ததால் ஏன், இலங்கையின் Constitution வைக்கப்படவில்லையென்று அவர் கேட்டிருக்கிறார். அதற்கு அவர்கள், "periodical section இல் அது வைக்கப்பட்டிருக்கிறது; ஏனென்றால், அங்கு காலத்துக்குக் காலம் அரசியலமைப்பில் மாற்றங்கள் வருகின்றபடியால் அதனை அங்கு வைத்திருக்கின்றோம்" என்று கூறியிருக்கின்றார்கள். ஆகவே, அரசியலமைப்பில் அடிக்கடி மாற்றங்கள் செய்வதானது, அரசின் ஸ்திரத்தன்மையைப் பலவீனப்படுத்துகின்றது என்பதை நான் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
முடித்துக்கொள்ளுங்கள்! உங்கள் நேரம் முடிவடைந் துவிட்டது.

**ගරු එම්.බී. ෆාරුක් මහතා**
(மாண்புமிகு எம்.பி. பாறூக்)
(The Hon. M. B. Farook)
இன்னும் ஒருநிமிடம்!

இறுதியாக, அண்மையில் நடந்த ஒரு சம்பவத்தையும் இங்கு குறிப்பிட விரும்புகின்றேன். இந்த நாட்டில் சிறுபான்மையாக வாழ்கின்ற முஸ்லிம், தமிழ் மக்களின் பிரதிநிதித்துவத்துக்கான அடையாளம் இல்லாத தேசியக் கொடியைச் சிலர் தாங்கியிருந்தமையானது, சிறுபான்மையின மக்களின் மனங்களைப் புண்படுத்துகின்ற ஒரு சம்பவமாகும். இவ்வாறான சம்பவங்கள் இனிவரும் காலங்களில் இந்த நாட்டில் இடம்பெறக்கூடாது என்பதையும் இந்தச் சபையிலே கேட்டுக்கொண்டு, விடைபெறுகின்றேன். வணக்கம்.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is Hon. Sajin de Vass Gunawardena. You have only five minutes.

[අ.භා. 3.51]

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
Yes, Sir, I know that because I gave five minutes of my time to the Hon. Bandula Gunawardane.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ආණ්ඩු පක්ෂයේ බොහෝ ඇමතිවරුන් කථා කළේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ මූලික අවශ්‍යතාවක් වන විධායක ජනාධිපතිවරයා සතු බලයෙන් යම්කිසි එක්තරා කොටසක් මේ පාර්ලිමේන්තුවට ලබා ගැනීමේ ක්‍රියාදාමයක් ගැනයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට - අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා අපේ පක්ෂයේ සභාපතිතුමා හැටියට - අපි ඒකට විරුද්ධ වන්නේ නැහැ. මූලික වශයෙන්, ප්‍රතිපත්තිමය වශයෙන් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අපි එකඟ වෙනවා. ජනතාවගේ පරමාධිපත්‍යය තිබෙන්නේ පාර්ලිමේන්තුව තුළයි. එතකොට මේ පාර්ලිමේන්තුව සතුව තිබෙන බලය ශක්තිමත් කර ගැනීමට අපි අත් දෙකම ඔසවලා වුණත් සම්පූර්ණයෙන්ම කැමැත්ත ප්‍රකාශ කරනවා. ඒ ගැන කිසිම ගැටලුවක් නැහැ. මන්ත්‍රීවරුන් වන අප සියලු දෙනාම මෙහි සිටින්නේ ජනතාවගේ කැමැත්ත මත මහජන ඡන්දයෙනුයි. පාර්ලිමේන්තුව සතුව තිබෙන මේ බලය ව්‍යවස්ථා සභාවට පිටතින් එන, පරිබාහිරින් එන පුද්ගලයන් අතට සම්පූර්ණයෙන්ම පැවරීමට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වශයෙන් අපට එකඟ වන්න බැහැ. ඒ නිසා තමයි මේ සංයුතියෙන් බහුතරයක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විය යුතුයි කියන එක අපි ඊයේ දිනයේත්, අද දිනයේත් කියා සිටියේ. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක වන අවස්ථාවේ දී මහින්ද රාජපක්ෂ මැතිතුමා විපක්ෂ නායකතුමා හැටියටයි සිටියේ. එතුමා අග්‍රාමාත්‍යතුමා හැටියට සිටියදීත්, ව්‍යවස්ථා සභාවේ සාමාජිකත්වය දරන කාලයේ දීත් මම එතුමාගේ සම්බන්ධීකරණ ලේකම් හැටියට ක්‍රියා කළා. මේ තිබෙන ව්‍යාකූල තත්ත්වය අපි දැක්කා. ව්‍යවස්ථා සභාව වග වෙන්නේ කාටද? පාර්ලිමේන්තුව වග වෙනවා, මේ රටේ මහජනතාවට. මේ පාර්ලිමේන්තුවේ තිබෙන බලතල සියලු දෙයක්ම ව්‍යවස්ථා සභාවට පැවරුවාට පසුව ව්‍යවස්ථා සභාව වග වෙන්නේ කාටද? වග කියන්නේ කාටද? අපි මෙන්න මේ ප්‍රශ්නයට තමයි පිළිතුරක් සොයා ගන්නට ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අද පෙත්සම් පිළිබඳ කාරක සභාවටවත් මේ කොමිෂන් සභාවල කවුරුවත් එන්නේ නැහැ. මේක තමයි අපි හරිගස්සා ගන්න ඕනෑ. ප්‍රතිපත්තියක් වශයෙන් අපි මේකට විරුද්ධ නැහැ.

මම අද සංශෝධන කිහිපයක් යෝජනා කර තිබෙනවා. මේ ගැන හොඳම උදාහරණයක් තමයි පොලීසිය. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පොලිස් කොමිසම ක්‍රියාත්මක වෙනවා. දැන් පොලිස්පතිතුමාට විනයානුකූලව කිසිදු ක්‍රියා මාර්ගයක් ගන්න ඉඩප්‍රස්ථාවක් නැහැ. ඇයි? ඒ බලතල සියල්ලම පොලිස් කොමිසමට දීලා තිබෙනවා. එතකොට ඔළුව එක තැනක, කඳ තව තැනක. මෙන්න මේවා තමයි අපි වෙනස් කළ යුත්තේ. පොලිස්පතිතුමාට බලයක් තිබෙන්න ඕනෑ, තමන්ගේ පොලිස් දෙපාර්තමේන්තුව තුළ විනයානුකූල පියවර ගන්න. ඒ බලයත් අපි කොමිෂන් සභාවට අරගෙන දුන්නොත් එතකොට කොහොමද පොලිසියක් ක්‍රියා කරන්නේ? මෙවැනි සංශෝධනවලට විරුද්ධ වන්නේ ඇයි කියන එක ගැන ආණ්ඩු පක්ෂය හැටියට එතුමන්ලා මීට වඩා පැහැදිලි කිරීමක් කරනවා නම් හොඳයි.

මේ අවස්ථාවේ දී මා යෝජනාවක් කරන්න කැමැතියි. මේ සියලු කොමිෂන් සභා පාර්ලිමේන්තුවේ යාන්ත්‍රණයක් තුළින් ඒ වග වීම් ක්‍රියාත්මක කළ යුතුයි කියලා මා යෝජනා කරනවා. අප සියලු දෙනාටම ඒක රාශි වෙලා ඒ යාන්ත්‍රණය හදා ගන්න පුළුවන්. මේ පාර්ලිමේන්තුවේ තිබෙන බලය ජනතා නියෝජනයක් නැති පිටස්තර පුද්ගලයන් අතට පත් කළ විට ඒකට අර්ථකථනයක් දක්වන්න හදනවා, නිර්දේශපාලනීකරණය කියලා.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Member, please wind up now.

**ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
Please give me one more minute.

ඉතින් මේ නිර්දේශපාලනීකරණය කියන අවශ්‍යතාව අපි පිළිගන්නවා නම් මේ පාර්ලිමේන්තුවත් අපට අවශ්‍ය නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් මා කියා සිටින්නේ අපි මෙම සංශෝධනයට පක්ෂව ඡන්දය දෙන බවයි. අපි ඡන්දය නොදී ඉන්නේ නැහැ. අපට ඡන්දය දීලා තිබෙන මහ ජනතාවගේ සහ මේ පාර්ලිමේන්තුවේ පරමාධිපත්‍ය අනිවාර්යයෙන්ම ආරක්ෂා කර ගෙන තමයි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතට අපි ඡන්දය ලබා දෙන්නේ.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**

(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)

(Mr. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Nandimithra Ekanayake. Before he starts, will an Hon. Member propose the Hon. (Mrs.) Sriyani Wijewickrama to take the Chair?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - விமானச் சேவைகள் பிரதி அமைச்சர்)

(The Hon. Lakshman Yapa Abeywardena - Deputy Minister of Aviation)

Sir, I propose that the Hon. (Mrs.) Sriyani Wijewickrama do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**

(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Presiding Member)

ගරු රාජ්‍ය ඇමතිතුමා, කථා කරන්න.

[අ.භා. 3.57]

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා (සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க - கலாசார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)

(The Hon. Nandimithra Ekanayake - State Minister of Culture)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඉතාම වැදගත් වූ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත පිළිබඳවයි අද අපි මේ විවාද කරන්නේ. ඒ නිසා අද දිනය තීරණාත්මක දිනයක්.

මේ විවාදයේ අපි දකින සුවිශේෂී ලක්ෂණය තමයි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතට පාර්ලිමේන්තුවේ ඉන්න කිසිම මන්ත්‍රීවරයකු විරුද්ධ නොවීම. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට අපේ පක්ෂයේ තිබෙන ස්ථාවරය තමයි, ජනතා පරමාධිපත්‍යයෙන් පැමිණි මන්ත්‍රීවරුන්ගේ ගෞරවය ආරක්ෂා වන විධියට ව්‍යවස්ථාව සංශෝධනය විය යුතුයි කියන එක. ඒ නිසා තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිළිබඳව ගරු ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමා බොහොම හොඳ පැහැදිලි කිරීමක් කළේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව හදන කොට පාර්ලිමේන්තුවෙන් බාහිර පුද්ගලයෝ පත් කරන්නේ "නිර්දේශපාලනීකරණය" කියන මතයේ පිහිටා කටයුතු කිරීම නිසාය කියන එක එතුමා පැහැදිලි කළා. ඇත්තටම එහෙම වනවාද? මේ යුගය වන කොට රටේ පිටිසර පළාත්වල ඉන්න ගොවියාගේ ඉඳලා සෑම කෙනාටම දේශපාලන මතයක් තිබෙනවා. සෑම කෙනාම දේශපාලනයට බද්ධ වෙලා තිබෙනවා. සෑම කෙනාම යම් යම් දේශපාලන න්‍යායන් මත යම් යම් පක්ෂවලට සම්බන්ධ වෙලා තිබෙනවා. අපේ රටේ රාජ්‍ය සේවකයනුත් එහෙමයි. ඒ සියලු දෙනාම දේශපාලන මතිමතාන්තර දරනවා; මේ රටේ පවතින දේශපාලන පක්ෂත් එක්ක කටයුතු කරනවා. ඒ නිසා ඔය කියන සුපිරි පුද්ගලයෝ හොයා ගන්න එක තමයි අපට අමාරු වන්නේ. රාජ්‍ය නොවන සංවිධානවල ඉන්නේ නිර්දේශපාලිත පිරිස් ද කියලා අපට හිතා ගන්න බැහැ. මොකද, ඒ ගොල්ලන්ටත් දේශපාලන මතයක් තිබෙනවා. ඒ නිසා අපට මේ යුගයේ දී පෘථග්ජන මිනිසුන් එහෙම වර්ගීකරණය කරන්න බැහැ, මේ අය දේශපාලන මතයක් නැති අය; මේ අය දේශපාලන මතයක් තිබෙන අය කියලා. මෙතැන තිබෙන වෙනස මේකයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කියන අය ප්‍රසිද්ධියේම දේශපාලන මතයක් වැලඳ ගෙන ජනතාවගේ ඡන්දයෙන්, ජනතාව පිළිගන්න දේශපාලන මතයත් එක්ක පැමිණිලා ඉන්න අයයි. මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු දෙනාම එහෙමයි. ඒ නිසා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත තුළින් මේ පාර්ලිමේන්තුවට බලතල ගෙන ඒම ගැන මේ ගරු සභාවේ ඉන්න කිසිම කෙනෙක් විරුද්ධ වන්නේ නැහැ. ඒ සමඟම පාර්ලිමේන්තුවේ තිබෙන බලයත් පිටස්තර පුද්ගලයන්ට දීම ගැන තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට සංශෝධන ඉදිරිපත් කරලා තිබෙන්නේ. කාරක සභා අවස්ථාවේදී එම සංශෝධනවලට එකඟ වෙලා කටයුතු කළොත් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත වෙනුවෙන් බොහොම පැහැදිලි සම්මතයක් අද මේ ගරු සභාවේදී ලබා ගන්න පුළුවන් වෙනවා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ අපට ඉතිහාසයක් තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ගැන කථා කරන කොට 1972 දී විධායක නොවන ජනාධිපති ක්‍රමය ජනරජ ව්‍යවස්ථාව තුළින් ස්ථාපිත කළා. පාර්ලිමේන්තුවට ඒ බලය තිබුණා. ජනාධිපතිවරයා පත් කළේ අග්‍රාමාත්‍යවරයා. ඊට පස්සේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් තමයි විධායක ජනාධිපති ක්‍රමය ඇති වුණේ. ඒකේ ආදීනව අපි අවුරුදු ගණනක් භුක්ති වින්දා. මේක දෙපැත්ත කැපෙන කඩුවක් වාගෙයි. සාධාරණ පුද්ගලයකු අත තිබුණොත් විවේචනයක් නැහැ. මේ බලතල අසාධාරණ විධියට කටයුතු කරන, ස්වාර්ථය පමණක් හිතන, රට හා ජාතිය ගැන හිතන්නේ නැති පුද්ගලයකු අතට ගියොත් ඒකේ ආදීනවත් අපි භුක්ති විඳිනවා.

විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම පිළිබඳ මතය එදා ඉඳන්ම ආවා. 1978 දී විධායක බලතල සහිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉදිරිපත් කරන කොට මේ රටේ වමේ දේශපාලන පක්ෂ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු ප්‍රගතිශීලී කඳවුරේ අප සියලු දෙනාම ඒකට විරුද්ධ වුණා. 1988 දී දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා. ඒක ගෙනාවෙත් ජනතා සංවාදයකට කිසි සේත්ම ඉඩ තබා නොවෙයි. ඒ අවස්ථාවේ දී අපි සියලු දෙනාම ඒකට විරුද්ධව මහා විශාල පෙරළියක් කළා; විරෝධය පළ කළා. පිටකොටුවේ බෝධිය ළඟ එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, ජනතා විමුක්ති පෙරමුණත් ඒකාබද්ධ විරෝධතා ව්‍යාපාරයක් දියත් කළා. එහෙම තමයි මේ ගමන් මඟ ආවේ. අද මේ ඇවිල්ලා තිබෙන්නේ ඊට වඩා වෙනස් තැනකටයි. අද ඇවිල්ලා තිබෙන තැනේදී මොකක්ද කරන්නේ?

[ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා]

ජනතාවට විවාද කරන්නට, සංවාද කරන්නට, අදහස් පළ කරන්නට අවස්ථාව සලසා දීලා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කරලා තිබෙනවා. මේකෙන් ප්‍රයෝජනය ගත හැකි අවස්ථාවයි මේ. ලෝකයේ කිසිම රටක පුද්ගලයෙක් තමන් අතේ තිබෙන බලයක් අත හරින්නට කැමැති වෙන්නේ නැහැ. තිබෙන බලයට තවත් බලය වැඩි කර ගැනීම, එකතු කර ගැනීම තමයි පුද්ගල ස්වභාවය. හැම කෙනාම එහෙමයි. දේශපාලනඥයෝත් එහෙමයි. රජයේ සේවය කරන අයත් එහෙමයි. තිබෙන තනතුරට වඩා උසස් වීම් ලබා කටයුතු කිරීමටයි බලාපොරොත්තු වෙන්නේ. නමුත් අද අපේ රටේ වාසනාවට ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා, මේ පළපුරුදු දේශපාලනඥයා විධායක ජනාධිපති ධුරය හොබවන්නට වරම් ලබා, එතුමාම යෝජනා කරනවා, එතුමාම මෙහෙයවනවා මේ විධායක ජනාධිපති ධුරයේ බලතල අඩු කරන ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරන්න ඕනෑ කියලා. එතුමාට ඕනෑ නම් අපි කවුරු විරුද්ධ වුණත් මේක පවත්වාගෙන යන්න පුළුවන්. එතුමාට ඒ සඳහා අවුරුදු 6ක කාල පරිච්ඡේදයක් තිබෙනවා. "මගේ තටු මම කපා ගන්නට ඕනෑ, මේ බලතල අඩු කර ගන්නට ඕනෑ" කියන හඬ, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉක්මනින් සම්මත කරන්නට ඕනෑයි කියන කාරණය ආණ්ඩු පක්ෂයේ අයටත්, විපක්ෂයේ අයටත් පුන පුනා අවධාරණය කරන්නේ එතුමාමයි. එහෙම පරිත්‍යාගශීලී පුද්ගලයන් අපේ රටේ ඉන්නවාද කියන එකත් හිතන්නට අමාරුයි. විවිධ දේවලට නොබෙල් සාම ත්‍යාග දෙනවා. ඒ නොබෙල් සාම ත්‍යාගයට නිර්දේශිත නමක් විධියට ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ නම යෝජනා කරන්නට පුළුවන් තත්ත්වයක් තිබෙනවා කියන කාරණයත් මේ අවස්ථාවේදී මම මතක් කර දෙන්නට ඕනෑ.

විධායක ජනාධිපති ධුරයේ බලතල අඩු කිරීමෙන් අපි කාට හෝ පාර්ලිමේන්තුවට හෝ ඇති වෙන පාඩුවක් තිබෙනවාද? නැහැ. නමුත් මෙතැන තවත් තර්කයක් තිබෙනවා. අගමැතිවරයාට පාර්ලිමේන්තුවේ බලතල එන විට සමහරුන්ට වැරදි අදහසක් ඇති වෙලා තිබෙනවා. අගමැති ධුරයයි, රනිල් වික්‍රමසිංහයි කියන්නේ කාරණා දෙකක්. ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා දැන් සිටින අගමැතිවරයා බව ඇත්ත. නමුත් ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නමින් නොවෙයි මේ බලතල එන්නේ, අග්‍රාමාත්‍ය ධුරයටයි ඒ බලතල එන්නේ. වර්තමානයේ අග්‍රාමාත්‍යවරයෙක් ඉන්නවා. ඊළඟ ඡන්දයෙන් පසුව තවත් කෙනෙක් අග්‍රාමාත්‍ය ධුරයට පත් වෙන්නට පුළුවන්. එම නිසා පුද්ගලයා දිහා බලා මේ සම්බන්ධයෙන් තීන්දු ගත යුතු නැහැ. අපි කල්පනා කළ යුතු වන්නේ මේ වෙනස් වීම තුළ අගමැති ධුරයට ලැබෙන බලතල ගැන පමණයි. එදා සෝල්බරි ආණ්ඩු ක්‍රමය තුළත් අග්‍රාණ්ඩුකාරයා පත් කිරීම නිර්දේශ කළේ අගමැතිවරයායි. ඒ නිසා ආණ්ඩු ක්‍රම ගමන් මඟේ අග්‍රාමාත්‍යවරයාට තිබුණු විශේෂ බලතල-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමාගේ කථාව කෙටියෙන් අවසන් කරන්න.

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
මට විනාඩි කීයක් තිබුණාද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
විනාඩි 8යි.

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
හැරෙන්නත් මඳිනේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි මේ වෙලාවේදී බොහොම ප්‍රබුද්ධ විධියට හිතන්නට ඕනෑ. මේ අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්නට ඕනෑ. මේ සංශෝධනවලින් පිළිගන්නට පුළුවන් ඒවා අපි ආණ්ඩු පක්ෂය විධියට පිළිගන්නට ඕනෑ. මෙහි පොදු පරමාර්ථය තමයි, මේ පාර්ලිමේන්තුවට තිබෙන බලය වැඩි කරලා, විධායක ජනාධිපති ධුරයේ තිබෙන යම් යම් අසීමිත බලතල අඩු කරලා, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයට මේ රට පාලනය කරන්නට පුළුවන් විධියට නැවතත් පාර්ලිමේන්තුවේ බලයත්, අගමැති ධුරයේ බලයත් වැඩි කරලා මෙම දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගැනීම. එම නිසා ඒ සම්බන්ධයෙන් බොහොම කල්පනා කරලා, අනාගතය ගැන හිතලා මේ එන සංශෝධන අපි පිළිගන්නට ඕනෑ. අපේ ආණ්ඩු පක්ෂය ඒ තරම් නම්‍යශීලී වුණොත්, ඒ විධියට නම්‍යශීලී වෙලා මේ ඉදිරිපත් කරලා තිබෙන සංශෝධන කාරක සභා අදියරේදී පිළිඅරගෙන අපට මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගැනීමට පුළුවන් වුණොත් ඒකමතික තීන්දුවක් අනුව ඉතිහාසයේ ලොකුම පෙරළියක් ඇති කළ පිරිසක් විධියට මේ සභාවේ ඉන්න සියලු දෙනාම ඉතිහාසගත වෙනවාට කිසිම සැකයක් නැහැ කියලා මම හිතනවා. ඒ වාගේම ඒ පිරිස මහ ජනයාගේ ගෞරවයට ලක් වෙනවා. මේකට විරුද්ධ වෙන හැම කෙනෙකුම මහ ජනයාගේ ගෞරවය වෙනුවට මහ ජනයාගේ අගෞරවයට පාත්‍ර වෙනවා. එම නිසා බොහොම කල්පනාවෙන් කටයුතු කරන්නට ඕනෑ. දෙපක්ෂයෙන්ම ඉදිරිපත් කරන කරුණු බොහොම සාධාරණයි. ඒ සාධාරණත්වය තුළ පිහිටලා මේ දෙගොල්ලන් සාකච්ඡා සම්මුතීන් තුළින් මේවා විසඳා ගන්නට ඕනෑ කියන තැන තමයි අපි ඉන්නේ. මේ ඉදිරිපත් කරලා තිබෙන සංශෝධන පිළිබඳව අපි කාරක සභා අවස්ථාවේදී-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමාට ලබා දී ඇති කාලය අවසානයි, දැන් අවසන් කරන්න. ඔබතුමා කාලය වැඩියෙනුත් අරන් තිබෙනවා.

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
වැදගත් තීන්දුවක් අරගෙන මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරමුයි කියන යෝජනාව කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 4.05]

**ගරු වීරකුමාර දිසානායක මහතා**
(மாண்புமிகு வீரகுமார திசாநாயக்க)
(The Hon. Weerakumara Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන සාකච්ඡා කරන මේ වෙලාවේදී -දැන් වෙලාව සවස 4.00යි- මේ පිළිබඳව එළියේ බාල්දි තමයි ගොඩක් පෙරළෙන්නේ. මේ ගරු සභාව තුළ හොඳට වාඩි වෙලා සිටියාට එළියේ බාල්දි ගොඩක් පෙරළෙමින් සාකච්ඡා පැවැත්වෙනවා. විපක්ෂය ඉදිරිපත් කරන සංශෝධනවලට ආණ්ඩුවේ යහපත්ම වූ එකඟතාවක් නැතිව තමයි තවමත් ඒ සාකච්ඡා පැවැත්වෙමින් යන්නේ. ආණ්ඩුව දැනගන්න ඕනෑ, සුළුතර ආණ්ඩුවක් බව. විපක්ෂයේ සහයෝගය ඕනෑ වෙනවා, මෙය බහුතර ඡන්දයෙන් -තුනෙන් දෙකේ බහුතරයෙන්- සම්මත කරගන්න නම්. විපක්ෂයේ සහයෝගය අවශ්‍ය නම් විපක්ෂයේ සිටින, අත්දැකීම් තිබෙන, අවුරුදු 20ක් තිස්සේ ආණ්ඩුව කරපු මන්ත්‍රීවරුන්ගේ, මැති ඇමතිවරුන්ගේ, නායකයන්ගේ

අදහස්වලට සවන් දීම ඉතාම වැදගත් වෙනවා. ජනාධිපතිතුමාටත් බොහොම පැහැදිලිව වුවමනාව තිබෙනවා මෙය සම්මත කරගන්න. නමුත් අග්‍රාමාත්‍යවරයා ප්‍රමුඛ මේ ආණ්ඩුවට අද එවැනි පැහැදිලි වුවමනාවක් නැහැ කියා අපට පෙනෙනවා. මොකද, මේ සංශෝධනයට අදාළ කරුණු සම්බන්ධව උසාවියට ගිය වෙලාවේ ඉඳලා මේ දක්වා තත්ත්වය ගෙන බැලුවාම පෙනෙනවා, එතුමාගේ මූලික අරමුණු දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අද ඉටු වන්නේ නැති බව. බොහොම ප්‍රජාතන්ත්‍රවාදී විධියට පෙනුණාට ජනාධිපතිවරයාගේ බලතල අග්‍රාමාත්‍යවරයාට උරාගන්නා උත්සාහයක් තිබෙනවා. ආණ්ඩු පක්ෂයේ ඇමතිවරු බොහෝ දෙනෙක් කථා කළා. ඔවුන් කිව්වා, "අපට එහෙම වුවමනාවක් නැහැ." කියා. නමුත් ඒක තමයි වුවමනා වෙලා තිබෙන්නේ. "අධිකරණය විසින්ම එම සංශෝධනයේ ඇතැම් කොටස් ප්‍රතික්ෂේප කර තිබෙනවා, ඒවා සම්මත කරන්න බැහැ, ඒවා සම්බන්ධයෙන් ජනමත විචාරණයකට යන්න ඕනෑ." කියා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාපු වේගයෙන් එය සම්මත කර ගැනීමේ වුවමනාවක් අග්‍රාමාත්‍යවරයා ප්‍රමුඛ ආණ්ඩුවට නැහැ. එය හරි පැහැදිලියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ තිබෙන්නේ, 2015 පෙබරවාරි 13වන දා ගැසට් නිවේදනයයි. මෙහි බොහොම පැහැදිලිව සඳහන් වෙනවා, පොලිස් ඒකකයක් සහ අනු කමිටුවක් ගැන. අනෙක් කොමිෂන් සභා ගැන කෙසේ වෙතත් ජාතික පොලිස් කොමිෂන් සභාව ගැන අපි කථා කරනවා. මේ ගැසට් නිවේදනය පාර්ලිමේන්තුව තුළ හංගලා තිබිලා අපි බොහොම අමාරුවෙනුයි -පරිගණක තුළට ගිහිල්ලා තමයි- සොයාගත්තේ. මෙය, ඒ තරමටම වසන් කරපු ගැසට් නිවේදනයක්. මේ ගැසට් නිවේදනයේ තිබෙනවා පොලිස් ඒකකයක් සහ අනු කමිටුවක් ගැන. දැන් මහා ලොකුවට ස්වාධීන පොලිස් කොමිෂන් සභාවක් ගැන කථා කරනවා නේ. නමුත් මේ ගැසට් නිවේදනයේ මොනවාද තිබෙන්නේ? පොලිස්පතිවරයා හරහා තමයි මේ ගැසට් නිවේදනය නිකුත් කර තිබෙන්නේ. පොලිස්පතිවරයාට තිබෙන බලතල යටතේ මේ ගැසට් නිවේදනය නිකුත් කරවාගෙන තිබෙනවා. මෙහි අංක 04 යටතේ අගමැතිතුමා පොලිස්පතිවරයාගේ බලතල තමන් අතට ගෙන තිබෙනවා. මේ ගැසට් නිවේදනය ඉතිහාසගත වෙනවා. මේ ගැසට් නිවේදනයේ අංක 04 යටතේ සඳහන් වන්නේ මෙසේයි:

> "අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව පිහිටුවා ඇති, අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් කැබිනට් අනු කමිටුව මගින් ස්ථාපිත කර ඇති ලේකම් කාර්යාලය විසින් මෙම පැමිණිලි විමර්ශනය කිරීම සඳහා පොලිස්පතිවරයාට යොමු කරන අතර,.."

එසේ සඳහන් කරලා, ඊට පසුව කියැවෙන වාක්‍යයෙන් පොලිස්පතිගේ බලතලවලට පහර ගසා තිබෙනවා. එය මෙසේයි:

> "ඊට අමතරව විශේෂිත පැමිණිලි කැබිනට් අනුකමිටුව මගින් සෘජුවම මෙම කොට්ඨාස භාර නියෝජ්‍ය පොලිස්පති වෙත යොමු කරනු ලැබේ."

එහි පළමුවෙනි වාක්‍යයෙන් පොලිස්පතිට බලය දෙනවා. දෙවැනි වාක්‍යයෙන් විශේෂ අනු කමිටුව බලය අතට ගන්නවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙනුත් දිගින් දිගට කරන්න හැදුවේ මේ ගැසට් නිවේදනයෙන් කර තිබෙන දෙය වාගේම එකක්. එහෙම කරන්නේ, තමන් අතට බලය ගන්න තිබෙන වුවමනාවටයි. නමුත් අද විපක්ෂයේ බහුතර ඡන්ද ගන්න තරම්වත් ආණ්ඩුවේ නම්‍යශීලිතාවක් නැහැ. දැන් සවස 4.00යි. අග්‍රාමාත්‍යවරයා තවමත් මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙතැනත් ඉන්නේ අත්දැකීම් තිබෙන, පළපුරුදු දේශපාලන නායකයන් විශාල පිරිසකුයි. ඒ අයටත් අත්දැකීම් තිබෙනවා. ආණ්ඩු පක්ෂයේත් අත්දැකීම් තිබෙන අය සිටිනවා. අද මේ සංශෝධනය සම්මත කරගැනීමේ වුවමනාවක් ආණ්ඩු පක්ෂයට නැද්ද? දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරන්න ඔවුන්ට වුවමනාවක් නැහැ. ඔවුන්ගේ පරමාර්ථවලට දැන් මෙය අනුකූල නැහැ. පටන්ගත් තැන නොවෙයි සම්මත කරගන්නා වෙලාව වන විට -අද වන විට- මෙය තිබෙන්නේ. පටන්ගනිද්දී තිබුණු ඒ වුවමනාව නොවෙයි අද තිබෙන්නේ. ජනාධිපතිවරයා සතු බලතල අගමැතිවරයාට උදුරාගැනීම දක්වා වූ මෙහෙයුම අද නතර වෙලා තිබෙනවා. මේ සංශෝධන දෙස බලද්දී අද හැමෝටම එය තේරුම් ගොස් තිබෙනවා. විශේෂයෙන් අපි අධිකරණයට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අධිකරණය මේ සම්බන්ධයෙන් බොහොම නිවැරැදි තීන්දුවක් දුන්නා, මහජන පරමාධිපත්‍යය ආරක්ෂා කරලා. එතැනින් මෙහාට තමයි මෙය අනෙක් පැත්තට පෙරළුණේ. අද මේ සාකච්ඡා තවම යමින් තිබෙනවා. මෙය පස්සට අදිමින් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ වන කොට මේ ආණ්ඩුව දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් විධායක බලතල මහා විශාල ප්‍රමාණයක් ඉවත් කරනවා කියා රට හමුවේ බොරුවට රඟපාන්න උත්සාහ කරනවා.

එහෙම විධායක බලතල විශාල ලෙස කප්පාදු කරන්න බැහැ. ඊයේ වෙන කොට මහජනයා ගෙනැවිත් පාරේ උද්ඝෝෂණ සිදු කළා. දෙවියනේ, එසේ ගෙනැවිත් තිබුණේ ආණ්ඩුවේ මිනිසුන්. එසේ ගෙනැවිත් තිබුණේ පුහුණු කරපු අයයි. එසේ ගෙනා ආණ්ඩුවේ මිනිසුන්ට ගහන්න වතුර බවුසර් ගෙනැල්ලා, කඳුළු ගෑස් ගෙනැල්ලා මහා විශාල දෙයක් රටට පෙන්වන්න හදනවා. අපි ආණ්ඩු කරන කාලයේ අපේ මිනිසුන් ගෙනාවා නම් අපට වුවමනාවක් නැහැ, ඒ අයට ගහන්න. අපි ඒ අයට පිටුපසට යන්න කියන කොට පිටුපසට යනවා. ඔවුන් අපේ පාක්ෂිකයන් නම්, අපත් සමඟ සිටින ජනතාව නම් එහෙම නේ කටයුතු කරන්නේ.

ඊයේ දිනයේදී ඒ පැමිණ සිටි ජනතාවට ගැසීමට වතුර බවුසර් ගෙනැවිත් එක පැත්තකින් තබා තිබුණා. අනිත් පැත්තෙන් සෝභිත හාමුදුරුවෝ පෙළපාළියකින් වැඩම කළා. තව තැනක සත්‍යග්‍රහ සිදු කළා. මේවායෙන් රටට ලොකු මැජික් එකක් පෙන්වන්න උත්සාහ කරනවා. ඒ වාගේ මැජික් රට ඇතුළේ පෙන්වූවාට, අද දිනයේදී සවස 4.30, 5.00 වෙනකොටත් මේ සම්බන්ධව නම්‍යශීලිතාවක් හදා ගන්න බැරුව අග්‍රාමාත්‍යතුමා ප්‍රමුඛ ආණ්ඩුව තවම ළතැ වෙවී සිටිනවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත දිහා බොහොම පැහැදිලිව බලා, එය අධ්‍යයනය කර විපක්ෂයේ සිටින මන්ත්‍රීවරුන්, මැති ඇමතිවරුන්, ගරු මහාචාර්ය ජී. එල්. පීරිස් වැනි විද්වතුන් මේ සම්බන්ධයෙන් අදහස් විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කර තිබෙනවා. මම හිතන්නේ මේ සම්බන්ධයෙන් ගරු මහාචාර්ය ජී. එල්. පීරිස් මැතිතුමා තරම් විද්වතෙකු තවත් නැහැ. අපිට ඒ දැනුම නැහැ. ඒ අය පවා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කර තිබෙනවා. නමුත් මේ ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන්න වුවමනා වුණු පරමාර්ථය අද වන විට බැහැර වෙලා තිබෙනවා. මම ඒකයි කිව්වේ, මේකත් 2015 පෙබරවාරි 13 වැනි දා නිකුත් කළ ගැසට් නිවේදනය වාගේයි කියා. උඩින් තිබෙන්නේ වෙන එකක්. යටට යන කොට තව ඒවා ඇතුළත් කර තිබෙනවා. නමුත් අද ඒවා සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප වෙලා තිබෙනවා.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත ගෙනෙන්න තිබුණු දේශපාලන වුවමනාව, ඒ සඳහා අගමැතිතුමාට තිබුණු පරමාර්ථය අද සම්පූර්ණයෙන්ම මේකෙන් බැහැර වෙලා තිබෙනවා. ඒ අවශ්‍යතා ඉටු කර ගන්න බැරි වෙලා තිබෙනවා. අද ඒ වෙනුවට උත්සාහ කරනවා, පාර්ලිමේන්තුවේ බලය වෙන පැත්තකට යොමු කරන්න. පොලිස්පතිවරයාගේ බලයත් තමන්ගේ අතට උදුරා ගත් අයයි, මේ. අද අග්‍රාමාත්‍යතුමා ගැසට් නිවේදනයක් සම්බන්ධව සඳහන් කළා. අර පැත්තෙන් පොලිස් කොමිසමක් ගැන කථා කරනවා. පොලිස්පතිතුමා පත් කරන්නේ ජනාධිපතිතුමා. අද අග්‍රාමාත්‍යවරයා වෙනම ගැසට් නිවේදනයක් සම්බන්ධව සඳහන් කළා, පොලිස්පතිගේ බලතල තමන් වෙත පවරා ගැනීමට. අපි මෙය අතිගරු ජනාධිපතිතුමාටත් ඉදිරිපත් කළා. ජනාධිපතිතුමාගේ අවධානයටත් මේ ගැසට් නිවේදනය ලක් වුණා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

**ගරු වීරකුමාර දිසානායක මහතා**
(மாண்புமிகு வீரகுமார திசாநாயக்க)
(The Hon. Weerakumara Dissanayake)

මේ ගැසට් නිවේදනය සම්බන්ධව ජනාධිපතිතුමාගේ විශේෂ අවධානයත් යොමු කළා. මේ වාගේ තත්ත්වයක් තමයි, මේ රටේ තිබෙන්නේ. ඔබතුමාගේ බලතලත් ගන්නා තත්ත්වයක් තිබෙන්නේ. මේක තේරුම් ගන්න. ඒ වාගේම මාධ්‍ය ගැන කථා කරන කොට පසු ගිය කාලයේ මහා ලොකුවට කථා කළේ, මහින්ද රාජපක්ෂ ආණ්ඩුව කාලයේදී තමයි, මාධ්‍ය නිදහස නැති වුණේ කියායි. ඒ මාධ්‍ය නිදහසට අපි අත තිබ්බේ නැහැ. ඒ මාධ්‍ය නිදහස ගැන කථා කරපු මහත්වරුන් සම්පූර්ණයෙන්ම මේ කොමිෂන් සභා හරහා, පනත් හරහා තමන්ට අවශ්‍ය කරන මාධ්‍ය දඩයම් කිරීමේ මෙහෙයුමට අද මැදිහත් වෙලා සිටිනවා. එම නිසා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත ඉදිරිපත් වීම සම්බන්ධව මේ රටේ ජනතාව විතරක් නොව අපි කවුරුත් කැමැතියි. විධායකයේ බලතල අඩු වෙන්න ඕනෑ. විධායකය වෙනස් වෙයි කියන මතයේ හැමෝම සිටිනවා. හැබැයි, විධායකයේ බලතල අඩු කරනවා කියන මුවාවෙන් - මේක හරියට, "හක්කේ බුදු රැස් - බොක්කේ දඩ මස්" වාගේයි. ඒ සෙල්ලම මේ තිබෙන්නේ. හක්කේ බුදු රැස් - අග්‍රාමාත්‍යවරයාගේ බොක්කේ දඩ මස්. හෙට අනිද්දා වෙන කොට තමන්ට විරුද්ධවාදී දේශපාලනය මැඩ පැවැත්වීමට අවශ්‍ය බලතල තමන් අතට ගැනීමටත්, ඒ වාගේම තමන්ගේ බහුතරය සහිත ආණ්ඩුවක් හදා ගන්න ඕනෑ නම් එතැනට අදාළ බලතල හදා ගැනීමටත්, අවශ්‍ය වුණොත් ඒ තමන්ගේ බලය හදා ගෙන පුළුවන් නම් තමන් හදපු ජනාධිපතිවරයාටත් ගහන්න සැලැස්මක් සහිතව එන දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතක් තමයි, අපි මුල සිට අගට උසාවියට පැමිණි වෙලාවේ සිට දැක්කේ. එම නිසා ඔවුන්ගේ වුවමනාවලට අදාළව දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත වැඩ කරන්නේ නැති නිසා මම මේ කථා කරන වෙලාව වෙන කොටත් එළියේ බාල්දි පෙරළනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා කාලය වැඩියෙන් අරගෙන තිබෙනවා.

**ගරු වීරකුමාර දිසානායක මහතා**
(மாண்புமிகு வீரகுமார திசாநாயக்க)
(The Hon. Weerakumara Dissanayake)

මූලාසනාරූඪ මන්ත්‍රීතුමියනි ඔබතුමියට ස්තුතිවන්ත වෙමින්, අපේ සංශෝධනවලට එකඟ නම් විතරයි, මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සම්මත වෙන්නේ කියන එකත් බොහොම පැහැදිලිව ප්‍රකාශ කරමින් මා නිහඬ වනවා.

[අ.භා. 4.14]

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Lakshman Yapa Abeywardena - Deputy Minister of Aviation)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද මේ ගරු සභාවේ ඉතාම වැදගත්, ඒ වාගේම දීර්ඝ කාලයක් සමාජය තුළ කතිකාවතක් ඇති වුණු ව්‍යවස්ථා සංශෝධනයක් පිළිබඳව විවාදයක් පැවැත්වෙන වේලාවක්, මේ. මම හිතන්නේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතට ප්‍රතිපත්තියක් හැටියට අප සියලු දෙනාගේම එකඟතාවක් තිබෙනවා, සංශෝධනවලට යටත්ව. විශේෂයෙන්ම ව්‍යවස්ථාවක් කියන්නේ සජීවී එකක්. එය ලියවිල්ලකට සීමා වුණු දෙයක් නොවෙයි. 1970, 80 දශකවල තිබුණු සමාජය නොවෙයි, අද තිබෙන්නේ. ඊට වඩා වෙනස් වුණු සමාජයක් තමයි, අද තිබෙන්නේ. අද සමාජය තුළ කතිකාවතක් තිබෙනවා, ව්‍යවස්ථාව තුළ වෙනස් විය යුතු කාරණා සම්බන්ධයෙන්. විධායක ජනාධිපති ක්‍රමය මේ රටේ ඇති කළේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්. එය ඇති කළේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමායි. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ප්‍රංශයේ චාල්ස් ඩි ගෝල් ගේ ආණ්ඩු ක්‍රමයත්, ජනාධිපති ක්‍රමයත්, ඒ වාගේම ඇමෙරිකාවේ ජනාධිපති ක්‍රමයත්, බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු සම්ප්‍රදායත් පිළිබඳව අධ්‍යයනයක් කරලා විධායක ජනාධිපති ක්‍රමය මේ රටේ බිහි කළා.

විධායක ජනාධිපති ක්‍රමය තුළ අපි දැකපු දෙයක් තමයි, විධායක ජනාධිපතිවරයාට ඡන්දය දෙන්න හැම පුද්ගලයාටම පුළුවන් වීම. එතකොට හැම ජාතියකම, හැම ආගමකම කෙනකුට තමන්ගේ නායකයා තෝරා පත් කර ගැනීමේ සුවිශේෂී අවස්ථාවක් තිබෙනවා. ඒක තමයි විධායක ජනාධිපති ක්‍රමයේ පුද්ගලයාට තිබෙන වටිනාකම. ඒක උතුරේ වන්න පුළුවන්, දකුණේ වන්න පුළුවන්, දෙමළ වන්න පුළුවන්, මුස්ලිම් වන්න පුළුවන්, බර්ගර් වන්න පුළුවන්. ඒ හැම කෙනකුටම තමන්ගේ රටේ නායකයා තෝරා ගැනීමේ අයිතියක් තිබෙනවා. එම නිසා තමයි මේ අවස්ථාවේදී ශ්‍රේෂ්ඨාධිකරණය ජනමත විචාරණයකට යා යුතු වගන්ති පිළිබඳව තීන්දුවක් දුන්නේ. මොකද, මේ රටේ හැම පුරවැසියකු විසින්ම තෝරා පත් කර ගන්නා විධායක ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ තුනෙන් දෙකක බලයකින් පමණක් වෙනස් කරන්න බැහැ. මන්ත්‍රීවරුන්ට වෙනස් කළ හැකි කාරණා තිබෙනවා. මන්ත්‍රීවරුන්ට වෙනස් කළ හැකි කාරණාවලට පරිබාහිරව යන කොට ජනතාවගේ පරමාධිපත්‍යය තමයි ඉතාමත් වැදගත් වන්නේ.

මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට පනස්අටලක්ෂයක් ජනතාව ඡන්දය දුන්නා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට හැටදෙලක්ෂයක් ජනතාව ඡන්දය දුන්නා. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ මැතිවරණ ව්‍යාපාරයේදී ගෙයින් ගෙයට ගිහින් බෙදපු පත්‍රිකාවේත්, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ මැතිවරණ ව්‍යාපාරයේදී ගෙයින් ගෙයට ගිහින් බෙදපු පත්‍රිකාවේත් සඳහන් කර තිබෙනවා, විධායක ජනාධිපති ක්‍රමයේ වෙනසක් කරනවාය කියා. එම නිසා එහි ගැටලුවක් නැහැ. හැබැයි විධායක ජනාධිපති ක්‍රමයේ වෙනසක් කරන්නේ පාර්ලිමේන්තුවට බලය දෙන්නයි. ජනාධිපතිතුමා කැමැති වෙලා තිබෙනවා, පාර්ලිමේන්තුවට බලයක් දෙන්න. ශ්‍රේෂ්ඨාධිකරණයේ එකඟත්වය ඇතිව එතුමාගේ බලතලවලින් කොටසක් පාර්ලිමේන්තුවට දෙනවා. එතකොට පාර්ලිමේන්තුව තමයි උත්තරීතර වන්නේ. පාර්ලිමේන්තුව උත්තරීතර වන කොට හැම දෙයකටම වග කීමක් පාර්ලිමේන්තුවට තිබෙනවා. කැබිනට් මණ්ඩලය පාර්ලිමේන්තුවට වග කියන්න ඕනෑ නම්, ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වග කියන්න ඕනෑ නම්, මේ සංශෝධන තුළින් ඇති කරන අතුරු දේවල්වල බලය පාර්ලිමේන්තුවට වග නොකියන පිරිසකට දෙන්න බැහැ. පාර්ලිමේන්තුව උත්තරීතරයි. ජනතාවගේ වුවමනාව මෙතැනින් පිටතට දෙන්න අයිතියක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තිබෙන්න ඕනෑ.

කොමිෂන් සභාවලට ඇඟිලි ගහන්න කිසිම අවශ්‍යතාවක් නැහැ. හැබැයි, පාර්ලිමේන්තුවේ සංයුතියකින්, සංශෝධනයකින් ඉදිරිපත් කරන එකඟතාවක් තිබෙන මොන යම් හෝ සංයුතියකින් කොමිෂන් සභා පත් කිරීම තමයි ඉතාමත් වැදගත් වන්නේ. මොකද, ලෝකයේ හැම එක් කෙනාටම මතයක් තිබෙනවා. ඒ

මතය කොහොම වුණත්, ඒක පාලනය වන එක් ස්ථානයක් කොහේ හෝ තිබෙන්න ඕනෑ. ඒක දේශපාලනඥයා පාලනය කිරීම අවශ්‍ය වන්නේ නැහැ. නමුත් උත්තරීතර පාර්ලිමේන්තුවේ සියලුදෙනා -එක පක්ෂයක් නොවෙයි, පක්ෂ රාශියක්, ජාති රාශියක්, ආගමික ව්‍යුහයන් රාශියක්- එක්ව එක් ස්ථානයකට යම්කිසි වග කීමක් දීමේ අවශ්‍යතාව තිබෙනවා.

අනික් පැත්තෙන්, එකිනෙකාට වෙනස් සමාජයක් අද තිබෙන්නේ. ඒ සමාජය තුළ කථිකා වුණු දේ පිළිබඳවත් අපි අවබෝධ කර ගන්න ඕනෑ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කඩාකප්පල් කිරීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් ක්‍රියා කරාවිය කියා, ක්‍රියා කරනවාය කියා පෙර ඉඳලාම ලංකාව පුරා කථිකාවක් ඇති කරන්න සූදානම් වුණා. මෙම පනත් කෙටුම්පත සම්මත කිරීම කඩාකප්පල් කරන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කිසිම මන්ත්‍රීවරයකුට අවශ්‍යතාවක් තිබුණේ නැහැයි කියා මම ඉතාමත් පැහැදිලිව කියනවා. මන්ත්‍රීවරුන්ට අවශ්‍යතාව තිබුණේ මෙම පනත් කෙටුම්පත සම්මත කරන්නයි. හැබැයි ව්‍යංගාර්ථයෙන් තම තමන්ගේ පෞද්ගලික මතිමතාන්තරවලට ගැළපෙන දේවල් මෙම පනත් කෙටුම්පත තුළට රිංගවා, මෙය විනාශ කරන්න කටයුතු කළොත් එහි වගකීම ඒ අය භාර ගත යුතුයි. මොකද, මාධ්‍ය පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් පැහැදිලි කිරීමක් කළා. එතකොට එයට අතුරු කාරණයක් වශයෙන් මාධ්‍ය පාලනයක් ගෙනාවේ ඇයි? එවැනි දේවල් පනත් කෙටුම්පත තුළට රිංගෙව්වේ ඇයි? "සිරස" මාධ්‍ය ආයතනයත් එක්ක පෞද්ගලිකව ඇති වුණු ප්‍රශ්නයක් නිසා, "සිරස" මාධ්‍ය ආයතනය එක්ක විවේචනය කරපු නිසා, ඒ "සිරස" මාධ්‍ය ආයතනය මුල් කර ගෙන සංශෝධනයක් ගෙනෙන්න උත්සාහ කළා. හැබැයි, ඒ වාගේ දේවල් කරන කොට "සාමූහිකත්වය" කියන එක සම්පූර්ණයෙන් නැති වෙලා යනවා. පසු ගිය මාසයකට ආසන්න කාල පරිච්ඡේදයක් තිස්සේ අපි මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව සාකච්ඡා කළා. මේ සාකච්ඡා කරන හැම වෙලාවකම පෞද්ගලික අවශ්‍යතාවන් මේ ව්‍යවස්ථාවට රිංගවන්න උත්සාහ කළ ආකාරය අපි දැක්කා. ඒ නිසා අපි මේ පිළිබඳව මේ අවස්ථාවේදී අවධානය යොමු කරන්න ඕනෑ. කරුණාකර මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කියන එක පිළිබඳව එකඟතාවකට එන්න. අගමැතිතුමා ප්‍රමුඛ කණ්ඩායම මේ එකඟතාවට පැමිණියාට පස්සේ අපට ඉදිරියේදී තවත් කතිකා කරලා යමක් වෙනස් කරන්න ඕනෑ නම්, වෙනස් කරන්න පුළුවන්.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වාගේම විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක අවශ්‍යතාවකුත් අද තිබෙනවා. මේ සමාජයේ දූෂිත බවක් ඇති වුණා නම්, ඒ දූෂිත බව ඇති වෙලා තිබෙන්නේ මේ විධායක ජනාධිපති ක්‍රමයට වඩා ඉතාමත්ම භයානක වූ මනාප ක්‍රමය නිසායි. ඒ නිසා ඒක වෙනස් කරන්න විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් ගේන්න ඕනෑ. අද සංශෝධන සහිතව දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සම්මත කරන කොට විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පිට පනින්න සූදානම් වනවා නම්, අපිත් රටට ගිහිල්ලා කියනවා, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගේන්න දෙන්නේ නැත්තේ මේ අහවල් අය කියලා. හැම දෙනාටම එකඟතාවකට පත් වන්න පුළුවන් විධියට, අසාධාරණයක් නොවන විධියට මේ මැතිවරණ ක්‍රමය වෙනස් කරලා කේවල ක්‍රමයයි, මනාප ක්‍රමයයි එකට එකතු කරන විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගේන්න සහයෝගය නුදුන්නොත් ඒක තමයි මේ රටට කරන ලොකුම අපරාධය. අපි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට මේ සහයෝගය දුන්නේ මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයයි, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයයි කියන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන දෙකම එකට ගෙනැල්ලා අපි ආ ගමන් මාර්ගය ඔස්සේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළින් මැතිවරණයකට යන්නයි. මැතිවරණයකට ගියාම මේ ක්‍රමය තුළ අපි ඉන්න තැන කොතැනද කියලා ජනතාව තීන්දුවක් දෙයි. ඒ නිසා ඒ සඳහා ඔබ සියලු දෙනාගේම සහයෝගය ලැබෙයි කියන බලාපොරොත්තුවෙන් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 4.23]

**ගරු මහින්දානන්ද අළුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ විවාද කරන අවසාන දිනයයි. අද හවස් වරුවේ අපි මේ පිළිබඳව ඡන්දයකට යන්න බලාපොරොත්තු වෙනවා.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කියන්නේ මේ රටේ ජනතාව මහත් බලාපොරොත්තු තබා ගෙන සිටි සිද්ධියක්. මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පැහැදිලිව සඳහන් වෙලා තිබුණා. පසු ගිය ජනාධිපතිවරණයේදී මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට මේ රටේ ජනතාව ජන වරමක් ලබා දුන්නේ මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒම, ස්වාධීන කොමිෂන් සභා පත් කිරීම, ඒ වාගේම විධායක ජනාධිපති ධුරයේ බලතල අහෝසි කිරීම කියන මේ වැඩ පිළිවෙළටයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, නමුත් අද වනකොට ඉදිරිපත් වන්නේ ජනතාව බලාපොරොත්තු වූ දේ නොවෙයි. ජනතාව බලාපොරොත්තු වන්නේ විධායක ජනාධිපති ධුරය සම්පූර්ණයෙන්ම අහෝසි වෙයි කියලායි. හැබැයි, අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් වන්නේ ඒක නොවෙයි. පසු ගිය කාලයේ එක්සත් ජාතික පක්ෂය මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට විවිධ අර්ථකථන ගෙනාවා. මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විරුද්ධයි කිව්වා. මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගන්න උත්සාහ දරන විට රජය, එක්කෝ ජනාධිපතිතුමා කකුලෙන් අදිනවාය කියලා කිව්වා. මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පරාජය කරන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තව කණ්ඩායමක් සූදානම් වනවාය කියලා කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන අපට කිසි ගැටලුවක් නැහැ. මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය එන්න ඕනෑ, මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත වන්න ඕනෑ, ස්වාධීන කොමිෂන් සභා පිහිටුවන්න ඕනෑ, විධායක ජනාධිපතිවරයාගේ බලතල අඩු වන්න ඕනෑ. මෙතැන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපි ඉන්නවා. ඒ පිළිබඳව කිසිම ගැටලුවක් නැහැ. මේ ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන ප්‍රශ්නය මොකක්ද? ප්‍රශ්නය අගමැතිතුමායි. අගමැතිවරයා ප්‍රමුඛ ආණ්ඩුව මෙහිදී ජනාධිපතිතුමාගේ කකුලෙන් ඇද්දා. අගමැතිවරයා ප්‍රමුඛ ආණ්ඩුව මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා එතුමාට නැති බලතල ඇතුළත් කර ගන්න හැදුවා. පසු ගිය ජනාධිපතිවරණයේදී මේ රටේ ජනතාව ඡන්දය දුන්නේ රනිල් වික්‍රමසිංහ මහත්මයාට නොවෙයි. පසු ගිය ජනාධිපතිවරණයේදී මේ රටේ ජනතාව ඡන්දය දුන්නේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටයි. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ජන වරමක් අරගෙන දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාට බලය ගෙනෙන කුමන්ත්‍රණයක් තමයි මේ තුළින් ගේන්න ගියේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ පිළිබඳව මුල ඉඳලාම බලන්න. මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ගැසට් එකේ තිබුණු දේ නොවෙයි හැමදාම ගෙනාවේ. අන්තිම දවස වන හයවෙනිදාත් මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට සංශෝධන ගෙනාවා. එලෙස සංශෝධන ගෙනැල්ලා දවසින් දවස අගමැතිවරයාගේ බලතල ශක්තිමත් කරන්නයි හැදුවේ. මේක පිටුපස ඉන්නේ කවුද? මේ ගෙනෙන සංශෝධන පිටුපස ඉන්නේ NGO නඩ. මේක පිටුපස ඉන්නේ බෙදුම්වාදියෝ. ඒ බව ඉතාමත් පැහැදිලියි. මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කඩාකප්පල් කළේ අපි නොවෙයි.

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත ප්‍රමාද වුණේ, මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතට ඡන්දය නොදෙන්න කටයුතු කරන්නට උත්සාහ කළේ අගමැතිවරයාය කියන එක මේ පාර්ලිමේන්තුවේදී මුලින්ම කියන්න ඕනෑ.

ජනතා විමුක්ති පෙරමුණේ අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත පිළිබඳව අර්ථ කථනයක් ගෙනාවා. අගමැතිවරයාගේ සහ ජනාධිපතිවරයාගේ බල අරගලයක් හැටියට එතුමා මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හැඳින්වූවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමා අර්ථකථනය කළා, ජනාධිපතිතුමා තමන්ගේ බලය තියා ගන්න සටන් කරනවා, අගමැතිවරයා තමන්ගේ බලය වැඩි කර ගන්න සටන් කරනවා කියලා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත බල අරගලයක් හැටියට පෙන්වමින් තමයි අනුර දිසානායක මන්ත්‍රීතුමා මෙතැනදී කථා කළේ. අපි කියනවා, නැහැ, ඒක වැරදියි කියලා. මේ බල අරගලය තිබෙන්නේ ජනාධිපතිවරයා ළඟ නොවෙයි. මේ බල අරගලය තිබෙන්නේ අගමැතිවරයා ළඟයි. අගමැතිවරයා ප්‍රමුඛ ආණ්ඩුවට තමයි මේ බල අරගලය තිබෙන්නේ. අගමැතිවරයා තමයි තමන්ගේ බලය වැඩි කර ගන්න උත්සාහ කරන්නේ. ජනාධිපතිවරයා තමන්ගේ බලය අත හරිනවා. අගමැතිවරයා තමයි බලය වැඩියෙන් ඉල්ලා මේ වැඩපිළිවෙළ කඩාකප්පල් කරන්න කටයුතු කළේ. අගමැතිවරයා මුල ඉඳලාම, දින සියයේ වැඩ පිළිවෙළ ආරම්භ කළ දවසේ සිටම, ජනාධිපතිවරයාට විශ්වාසයක් නැති විධියටයි කටයුතු කළේ; මේ පාර්ලිමේන්තුවට විශ්වාසයක් නැති විධියටයි කටයුතු කළේ. පාර්ලිමේන්තුවේ සුළුතර අගමැතිවරයෙක් පත් වුණා. ජනාධිපතිතුමා කියපු නිසා අපි එතුමාට සහයෝගය දුන්නා. නමුත් අගමැතිවරයාට බැරි වුණා, දින සියය යනතෙක් මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් 225 දෙනාගේ විශ්වාසය දිනා ගන්න. අවසාන මොහොත වෙනකොටත් පාර්ලිමේන්තුවේ බහුතරය අගමැතිවරයාට විරුද්ධයි කියලා මන්ත්‍රීවරුන් 116 දෙනෙක් අත්සන් කළා. අගමැතිවරයා කෙරෙහි මේ පාර්ලිමේන්තුවට විශ්වාසයක් නැහැ. අගමැතිවරයා කෙරෙහි මේ රටට විශ්වාසයක් නැහැ. ඒ නිසා තමයි මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත ප්‍රමාද වුණේ.

ගරු නන්දිමිත්‍ර ඒකනායක අමාත්‍යතුමා කිව්වා, මේ ව්‍යවස්ථා සංශෝධනයේදී රනිල් වික්‍රමසිංහ හැටියට ගණන් ගන්න එපා, අගමැති ධුරය හැටියට ගණන් ගන්න කියලා. නමුත් ඒ ධුරයේ දැන් ඉන්නේ රනිල් වික්‍රමසිංහ මහත්මයායි. අපට තිබෙන ප්‍රශ්නය ඒකයි. රනිල් වික්‍රමසිංහ මහත්මයා නැතිව වෙන කෙනෙකු අග්‍රාමාත්‍ය ධුරයේ සිටියා නම්, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා විධායක ජනාධිපති ධුරයේ බලතල මීට වඩා බොහොමයක් අඩු කරලා, ඒ බලය අනිවාර්යයෙන්ම පාර්ලිමේන්තුවට දෙයි කියලා මා හිතනවා. අද අගමැතිවරයා කෙරෙහි තිබෙන අවිශ්වාසය නිසා, අඩු ගණනේ එතුමාගේ පක්ෂයටවත් එතුමා කෙරෙහි විශ්වාසයක් නැති නිසා තමයි මේ ප්‍රශ්නය තිබෙන්නේ.

ජනතා විමුක්ති පෙරමුණේ අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා බලය පිළිබඳව අගමැතිවරයාටයි, ජනාධිපතිවරයාටයි දෝෂාරෝපණ එල්ල කළා. අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා දැන් මේ ගරු සභාවේ නැහැ. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය බල අරගලයක් කියලා එතුමා කථා කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මෙය බලය බෙදා ගන්න බැරිව කරන අරගලයක් කියලා එතුමා කියනවා. අපි විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවොත් එතුමන්ලා ඒකට උදව් කරනවාද කියලා මා අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාගෙන් අහනවා. නමුත් උදවු කරන්නේ නැහැ. ජනතා විමුක්ති පෙරමුණ අද මැතිවරණ ක්‍රමය සංශෝධනය කරනවාට එකඟ නැහැ. ඇයි ඒ? බලය නිසා. එතැනත් තිබෙන්නේ බල අරගලය. ජනතා විමුක්ති පෙරමුණ දන්නවා, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා අපි මැතිවරණයකට ගියොත් ජනතා විමුක්ති පෙරමුණට ගෙදර යන්න වෙන බව. ඒක දන්න නිසා ඒ ගොල්ලෝ උත්සාහ කරන්නේ වෙන දෙයකට. ඒ නිසා අනුන්ගේ බල අරගලය ගැන කථා කරන්න කලින්, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව ජනතා විමුක්ති පෙරමුණ ඉන්න ස්ථාවරය මේ පාර්ලිමේන්තුවට කියනවා නම් හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ සංශෝධනය ගෙන ඒමේදී අග්‍රමාත්‍යවරයා කටයුතු කළ ආකාරය බලන්න. එතුමා දැන් දිගින් දිගටම උත්සාහ කරන්නේ අග්‍රාමාත්‍යවරයාගේ බලතල වැඩි කර ගන්නයි. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන්න රටේ ජනතාව බලය දුන්නේ ජනාධිපතිතුමාට. ජනාධිපතිතුමා හැම දෙයක්ම අගමැතිතුමාගෙන් අහලා කරන්න ඕනෑ. එහෙනම් මොකටද අපි මේ ජනාධිපතිතුමාට ඡන්දය දුන්නේ? ඒ ඡන්දය අගමැතිතුමාට දෙන්න තිබුණානේ. අගමැතිතුමාට ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙන්න තිබුණා නේ. තමුන්නාන්සේලාට තිබුණානේ අගමැතිතුමා ජනාධිපතිවරණයට දමන්න. එතුමා ඉදිරිපත් කරලා, එතුමා දිනවලා මේ සංශෝධනය කරන්න තිබුණානේ. මේ NGO නඩය, බෙදුම්වාදීන් දන්නවා, රනිල් වික්‍රමසිංහ මහත්මයා දමලා දිනන්න බැහැ කියලා. ඒ නිසා මෛත්‍රීපාල සිරිසේන මහත්මයා දිනවලා, මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා අගමැතිවරයා ශක්තිමත් කරලා, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට ගැහුවා වාගේම මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාටත් ගහලා එතුමාත් ගෙදර යවන්න හිතාගෙන මේ NGO නඩයයි, බෙදුම්වාදීන් ටිකයි එකතුවෙලා කරන සටකපට වැඩ තමයි මේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි අපට තිබුණු ප්‍රශ්නය ඒකයි. ගමෙන් ආපු මහින්ද රාජපක්ෂ මහත්මයාටත්, ගමෙන් ආපු මෛත්‍රීපාල සිරිසේන මහත්මයාටත් -මේ දෙන්නාටම- මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ගහන්න කල්පනා කරනවා. මැතිවරණයට කලින් මහින්ද රාජපක්ෂ මහත්මයාට ගැහුවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත ගෙනැල්ලා මෛත්‍රීපාල සිරිසේන මහත්මයාටත් ගහන්න තමයි මේ NGO නඩය, බෙදුම්වාදීන් උත්සාහ කළේ. ඒක තමයි අපට තිබුණු ගැටලුව. ඒ නිසා තමයි අපි ඉඩ දුන්නේ නැත්තේ. අග්‍රාමාත්‍යතුමාට මේ දින සියය ඇතුළත අපේ සහයෝගය දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අතිගරු ජනාධිපතිතුමා නේපාලයේ සිදු වෙච්ච ඛේදවාචකය පිළිබඳව ඊයේ ශෝකය පළ කළා. මිනිස්සු 3,200කට ආසන්න පිරිසක් මිය ගිහිල්ලා තිබෙනවා. ඒත් පාර්ලිමේන්තුවේදී ඒ පිළිබඳව අගමැතිතුමා මොනවාද කථා කරන්නේ? නේපාලයට සුදු වෑන් යවන්න ලු. මොකක්ද මේ කියන්නේ? එතුමා මේ රටේ අගමැතිවරයාද? නේපාලයට සුදු වෑන් යවන්න කියනවා. මේ වාගේ සිද්ධියක් ඇති වෙච්ච වෙලාවකදී අග්‍රාමාත්‍යවරයා කරන ප්‍රකාශය බලන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඉතින් කොහොමද අපි එතුමා විශ්වාස කරන්නේ? මේ වාගේ නායකයෙක්ද, මේ වාගේ කෙනෙක්ද මේ කටයුතු කරන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි නැවත නැවතත් මේ කාරණය කියනවා. පොඩි ළමයි වාගේ -හයේ, හතේ පන්තිවල ළමයි වාගේ- මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතට සංශෝධන ඇතුළත් කරලා තිබෙනවා. දැන් බලන්න, මාධ්‍යයට එරෙහිව ඒ ගෙනාපු සංශෝධනය. රනිල් වික්‍රමසිංහ මැතිතුමාට තිබෙනවා "සිරස" නාලිකාව ගැන ප්‍රශ්නයක්. එතුමාට "සිරස" නාලිකාව එක්ක බල අරගලයක් තිබෙනවා. ඒ නිසා "සිරස" නාලිකාවට ගහන්න ගෙනෙනවා, වෙනම සංශෝධනයක්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

විනාඩි දෙකක කාලයක පමණයි තව තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඉක්මනින් මගේ කථාව අවසන් කරනවා.

බලන්න මේ කරන දේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මීට වඩා මගේ කාලය ගන්නේ නැහැ. අපි නැවතත් ඔබතුමියට කියනවා, මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ යම් කණ්ඩායමක් හෝ කිසියම් පුද්ගලයෙක් හෝ විරුද්ධ වෙන්න හිටියේ නැහැ කියලා.

පසු ගිය ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට ගැහුවා වාගේම, මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා මෛත්‍රීපාල සිරිසේන මහතාටත් ගහන බව අපි දැන ගෙන සිටියා. ගමෙන් ආපු මිනිසුන්ටයි මේ ගහන්නේ. අග්‍රාමාත්‍යවරයා එක එක කකුල් මාට්ටු දමලා තමන්ගේ බලය හදාගෙන, බෙදුම්වාදීන්ට ඕනෑ දේ ඉෂ්ට කරන්නයි මේ හදන්නේ. ඒකට විරුද්ධව තමයි අපි සටන් කළේ. අපි විශ්වාස කරනවා, අද වෙනකොට අපි අපේ සටන ජයග්‍රහණය කරලා තිබෙනවා කියලා. අපට ඕනෑ තැනට මේ සංශෝධනය ගෙනැල්ලා තිබෙනවා. අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය පනත් කෙටුම්පත සම්මත කරනවා. හැබැයි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සම්මත කරන්නේ රනිල් වික්‍රමසිංහ අගමැතිවරයාට ඕනෑ විදියට නොවෙයි, මේ රටේ ජනතාවට ඕනෑ විදියටයි කියන එකත් මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 4.32]

**ගරු ලලිත් දිසානායක මහතා (වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Irrigation)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමා 1978දී මේ ව්‍යවස්ථාව හඳුන්වා දීලා මේ විධායක ජනාධිපති ක්‍රමය මේ රටේ ඇති කළා. එහෙම නම් අපි පළමුවෙන්ම කථා කරන්න ඕනෑ දේ තමයි, මේ සංශෝධනය තුළින් බලය යා යුත්තේ කොතැනටද කියන එක. ඒ බලය යා යුත්තේ බලය ගත්ත තැනට. ජේ.ආර්. ජයවර්ධන මහත්මයා එදා 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉවත් කරලා විධායක ජනාධිපති ක්‍රමයක් ගෙන ඒම තුළින් පාර්ලිමේන්තුවේ අපට තිබුණු බලයයි ගත්තේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ පිළිබඳව විවාදයක් නැහැ, ඒ ගත්ත බලය ගත්ත තැනටම දෙන්න ඕනෑ. එහෙම නම් ඒ ගත්ත බලය මේ පාර්ලිමේන්තුවට දෙන්න ඕනෑ. මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ බලය වෙනත් තැනකට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවකට, වෙනත් පුද්ගලයන්ට යොමු කරනවා නම් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අපි එකඟ නැහැ. මාදුළුවාවේ සෝභිත හාමුදුරුවෝත් ඒකට එකඟ නැහැ. මොකද, මේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරලා පාර්ලිමේන්තුව ශක්තිමත් කරන ක්‍රමයක් තමයි කවුරුත් ඉල්ලන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පාර්ලිමේන්තුවේ ලොබියේ කණුවලට කථා කරන්න පුළුවන් නම් කියයි, මේ විධායක ජනාධිපති ක්‍රමය තුළ වින්ද ශෝකාන්තය. අපි ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු විදියට දන්නවා, මේ විධායක ජනාධිපති ක්‍රමය තුළ තිබුණු අඳෝනා; ඒ මන්ත්‍රීවරු කියපු දේවල්. ඒ කණුවලට කථා කරන්න පුළුවන් වුණා නම් කියයි, ඒ මන්ත්‍රීවරු විධායක ජනාධිපති ක්‍රමයට කොච්චර විරුද්ධව කථා කළාද කියලා. ඒ නිසා විධායක බලය නැති කරන එක හොඳයි.

අද කළ කථාවලදී කිව්වා, මේ විවාදය තුළදී කිව්වා, අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඔවුන්ගේ කාලය තුළ විධායක ජනාධිපති ක්‍රමය සංශෝධනය කළේ නැහැ කියලා. ඒක ඇත්ත. 1994දී චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය මේ රටේ විධායක ජනාධිපතිනිය වුණා. නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනසක් කරන්න කලින් මේ රටේ න්‍යාය පත්‍රයේ කරන්න තිබුණු පළමුවැනි දේ තමයි ත්‍රස්තවාදයෙන් මේ රට බේරා ගැනීම. ප්‍රභාකරන්ගේ ඊළමෙන් මේ රට බේරා ගැනීම තමයි මේ රටේ නායිකාව හැටියට එතුමියට කරන්න තිබුණේ. දිවංගත අෂ්රොෆ් ඇමතිතුමාට පිං සිද්ධ වෙන්න එතුමා එක්ක එකතු වෙලා තමයි එදා රජය කරගෙන ගියේ. ඒ නිසා එදා මේ වෙනස කරන්න බැරි වුණා.

2005දී මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා පොරොන්දු වුණා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවාය කියලා. නමුත් එතුමාගේ න්‍යාය පත්‍රයේ පළමුවැනියට තිබුණේ මොකක්ද? එතුමා රජය භාර ගන්න කොට කථානායක හැටියට හිටියේ වි.ජ.මු. ලොකු බණ්ඩාර මැතිතුමා. එතුමා ආණ්ඩුවෙන් පත් වුණු කෙනෙක් නොවෙයි. හැබැයි, ජනාධිපතිතුමාට පුළුවන්කම ලැබුණා, ආණ්ඩුව ශක්තිමත් කරලා අවුරුදු තිස් ගණනක් තිස්සේ මේ රටේ තිබුණු ත්‍රස්තවාදය නැති කරලා අපට සාමකාමී රටක් හදලා දෙන්න.

මේ කාර්යය ඉෂ්ට කරනවාය කියා පොරොන්දු වෙලා 2005 සිට ආරම්භ කළ ඒ ආණ්ඩු කාලය තුළ මේ කටයුත්ත ඉෂ්ට කළේ නැහැ කියලා චෝදනා එල්ල කරනවා නම් වැරැදියි. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවාට වඩා කාර්ය භාරයක් එදා පැවරිලා තිබුණා. පාර්ලිමේන්තුව තුළ ප්‍රභාකරන්ට විරුද්ධව කථා කරලා එළියට යන කොට අපේ ජීවිත ගැන අපට ප්‍රශ්නයක් තිබුණා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා 2008 අවුරුද්දේ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා ඇමති වශයෙන් කටයුතු කරද්දී අපට මතකයි, එතුමාගේ ජීවිතයත් බේරුණේ නූලෙන් බව. එවැනි කාල වකවානුවක් තිබුණා. ඒ කාල වකවානුව ඉවත් කරලායි හිටපු ජනාධිපතිතුමා මේ රටට සාමය ලබා දුන්නේ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට චෝදනා කරන්න බැහැ, මේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළේ නැහැ කියලා. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය වාගේම මහින්ද රාජපක්ෂ මැතිතුමාත් දෙවතාවක් මේ රටේ ජනාධිපතිවරුන් වශයෙන් කටයුතු කළා. ඒ වාගේම අපේ පක්ෂයේ හිටපු ලේකම්තුමා වන මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආශීර්වාදයෙන් අද අපේ පක්ෂයේ සභාපති හැටියට පත් වෙලා ඉන්නවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට අද මා ඒ ගැන සතුටු වනවා. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියට හා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට කරන්න බැරි වුණු ඒ කාර්යය අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයා හැටියට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ආදර්ශයක් ලබා දෙමින් පාර්ලිමේන්තුවේ වැඩි බහුතරයක -140 ගණනක- මන්ත්‍රී කණ්ඩායමත් එක්ක මේ වෙනස කරන්න අද ඉදිරිපත් වෙලා සිටීම ගැන මම සන්තෝෂ වනවා. ඒකයි, මෙතැන තිබෙන වැදගත්කම. එතුමා එවැනි තැනකට අද ඇවිල්ලා, අවුරුදු හයක් ලෙසට තිබුණු විධායක

[ගරු ලලිත් දිසානායක මහතා]

ජනාධිපතිවරයකුගේ ධුර කාලය අවුරුදු පහකට අඩු කරන්න ලෑස්තියි. මේක ලොකු පරිත්‍යාගයක්. තමන්ට තිබෙන බලය, ජන වරමකින් ලැබුණු බලය කෙනෙකු ආපසු ලබා දෙන්නේ නැහැ. ඒ වාගේම අවංක නායකයෙක් හැටියට එතුමා කියනවා, "මම මේ අවුරුදු පහ විතරයි මේ ධුරයේ ඉන්නේ" කියලා. එතුමා එවැනි අවංක නායකයෙක්. අපි එතැනටයි යන්න ඕනෑ. මේ දින සියයේ වැඩසටහනේදී කොත්තමල්ලි ටිකේ මිල අඩු කරන එක, ඩීසල්වල මිල අඩු කරන එක ගැසට් එකෙන් කරන්න පුළුවන්. නමුත් එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව හැටියට එදා මේ ව්‍යවස්ථා සංශෝධනයට මුල් තැන දෙන්න තිබුණා. එහෙම වුණා නම් අද මෙච්චර තක්කුමුක්කු වෙන්න අවශ්‍යතාවක් වන්නේ නැහැ. දින සියය පටන් ගන්න කොටම මේ කටයුත්ත ආරම්භ කළා නම් මේ ගැන තවත් සාකච්ඡා කරන්න වුවමනා නැහැ, මේ ගැන හොඳ මතයක් ඇති කරන්න තිබුණා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

මේ අවස්ථාවේදී මම මේ කාරණයත් කියන්න ඕනෑ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ බලතල වෙනස් කරන්න යන්නේ නැහැ. මොකද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කවදාවත් කියලා නැහැ, විධායක ජනාධිපති ක්‍රමය විතරක් අහෝසි කරන්න ඕනෑ කියලා. මොකද, හිටපු ජනාධිපතිතුමා 'මහින්ද චින්තන ඉදිරි දැක්ම' කියන පොතේ 52වන පිටුවේ, "පාර්ලිමේන්තුව රාජ්‍ය සභාවක් බවට" කියන තේමාව යටතේ ඉතා පැහැදිලිව මෙසේ සඳහන් කරලා තිබෙනවා:

> "පාර්ලිමේන්තුවට නියෝජිතයන් තෝරා පත්කර ගැනීමේ අනුපාත ඡන්ද ක්‍රමවේදය වෙනස් කිරීමට යෝජනා කරමි.සමාජයේ ධනවත් සුළු පිරිසකට පමණක් පාර්ලිමේන්තුවට පැමිණීමේ තත්වයක් ද, එමනිසාම දූෂණය, වංචාව කුළුගැන්වීමේ ප්‍රවණතාවයක් ද අනුපාත ඡන්ද ක්‍රමය නිසා ඇතිවී තිබේ. ප්‍රාදේශීය නියෝජනය සහමුලින්ම අවුල් වී ඇත."

විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම ගැනත් එම පිටුවේම තවදුරටත් මෙසේ සඳහන් කරලා තිබෙනවා:

> "පාර්ලිමේන්තුවට වෙනම ජනවරමක් ලැබෙන හෙයින් එයට ගරු කිරීමක් ලෙස රටේ ජාතිකමය වශයෙන් අත්‍යවශ්‍ය අවස්ථාවල හැර ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව හිතුමතේ වසරකට පසු විසුරුවා හැරීමේ බලය ඉවත් කිරීමට කටයුතු කරමි."

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
තව විනාඩියක කාලයක් ඔබතුමාට තිබෙන්නේ ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
රටේ ජාතිකමය වශයෙන් අත්‍යවශ්‍ය අවස්ථාවල හැර ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව හිතුමතේ වසරකට පසු විසුරුවා හැරීමේ බලය මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත තුළින් ඉවත් වනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට අප ඒ මතයේ ඉන්නවා. "මෙයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විරුද්ධයි" කියලා සමාජය තුළ මතයක් ඇති කරන්න හොඳ නැහැ.

තව එක කාරණයක් ගැන කියන්න ඕනෑ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මැතිවරණ ක්‍රමයත් වෙනස් කරන්න ඕනෑ. මේ සංශෝධන දෙකම එකට ගෙනෙන්න ඕනෑ කියන මතයේයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට අපි හිටියේ. නමුත් අපේ අතිගරු ජනාධිපතිතුමාගේ ඕනෑකම අනුව මේ පනත් කෙටුම්පත කලින් ගෙනැල්ලා තිබෙනවා. මැතිවරණ ක්‍රමය පිළිබඳ පනත් කෙටුම්පත දැන් ගැසට් කරගෙන යනවා. නව මැතිවරණ ක්‍රමයටත් එන්න අප සූදානම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අප මෙතැන ඉන්නේ කටු ලෙවකන්නවත්, කොන්දක් නැති නිසාවත් නොවෙයි. මේ රටේ ජනතාව අවශ්‍යයි කියන ඒ වෙනස ඇති කිරීම සඳහා අපේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ශක්තියක් දෙන්න තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නැත්නම් සන්ධානයේ මන්ත්‍රීවරු හැටියට අපි මෙතැන පෙළ ගැහිලා ඉන්නේ.

මොකද, අප මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ජයග්‍රහණය කරන්න පසු ගිය මැතිවරණයේදී වැඩ කළා. මැති ඇමතිකම් අපට නැති වෙලා ගියත් අප අවංකව එතුමා සමග හිටියා. අපි කියනවා, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් මේ රටේ ක්‍රියාත්මක කරන්න කියලා. මොකද, ජනතාව ඉල්ලන්නේ විධායක ජනාධිපති ක්‍රමයට වැඩිය තමන්ගේ මහජන නියෝජිතයා වශයෙන් ගමේ මිනිහෙකු පත් කර ගන්නයි. අප එතැනට කටයුතු කරන්න ලෑස්තියි. අප ඒ යුතුකම ඉටු කරලා, ඩිලාන් පෙරේරා ඇමතිතුමා කිව්වා වාගේ විපක්ෂයට ගිහිල්ලා වාඩි වෙනවා. එහෙම නැත්නම් අපට විපක්ෂය, ආණ්ඩු පක්ෂය කරන්නත් හැකියාවක් තිබෙනවාය කියමින් මට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඊළඟට ගරු අතාවුද සෙනෙවිරත්න මන්ත්‍රීතුමා.

[අ.භා.4.40]

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
මූලාසනයේ සිටින අපේ ගරු මන්ත්‍රීතුමියනි, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හදන කොට, මැතිවරණ ක්‍රමය හදන කොට, මම ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගෙන් ඇහුවා, ඔබතුමා මේ මැතිවරණ ක්‍රමය මේ විධියට දිස්ත්‍රික් ක්‍රමයක් කරන්නේ ඇයි, අනුපාත ක්‍රමයක් කරන්නේ ඇයි කියලා. මම කිව්වා, අපට දිස්ත්‍රික්කයක් තරග කරන්න නම් කෝටි ගණන්, ලක්ෂ ගණන් වියදම් කරන්න ඕනෑ; වාහන ඕනෑ; දැන්වීම් ගහන්න ඕනෑ; දිස්ත්‍රික්කය පුරා දුවන්න ඕනෑ; මේ විධියටයි කටයුතු වෙන්නේ කියලා. සාමාන්‍යයෙන් දිස්ත්‍රික්කයකට නියෝජිතයන් තෝරන කොට බලන්නේ මොකක්ද? දිස්ත්‍රික්කයක්. දිස්ත්‍රික්කයකට ඕනෑ, ගොවිගම මිනිහෙක්, බත්ගම කෙනෙක්, වහුම්පුර කෙනෙක්. ඊළඟට දෙමළ අය ඉන්නවා නම් දෙමළ කෙනෙක් ඕනෑ, මුස්ලිම් අය ඉන්නවා නම් මුස්ලිම් කෙනෙක් ඕනෑ. මෙන්න මේ වාගේ එක පක්ෂයක් තුළ වෙන වෙනම කණ්ඩායම් - groups - දේශපාලනය කරන තත්ත්වයට තමයි පත් වෙන්නේ. ඒ නිසා ආගම් භේද, ජාති භේද, කුල භේදත් මේ මඟින් පණ ලබනවා කියලා මම කිව්වා. ඊට පස්සේ එතුමා ඇහුවා, "නැහැ අතා, අනෙක් පැති, මුහුදුබඩ පැති, එහෙම ගත්තොත් ගොවිගම කෙනෙක්, කරාවේ කෙනෙක්, දුරාවේ කෙනෙක්, හලාගම කෙනෙක් කියන ඔය ආකාරයට එහෙත් බෙදෙනවාද?" කියලා. මේ ආකාරයට මුළු රටම තීරු තීරුවලට බෙදිලා, මේ තුළ භේද තමයි තිබෙන්නේ, ඒ අනුවත් ගහ ගන්නවා කියලා මම එතුමාට කිව්වා. ඊළඟට පක්ෂයකින් එක් කෙනෙකුට තරග කරන්න එක ආසනයක් දෙනවා. ඒ ආසනය තුළ විතරක් නොවෙයි නේ, ඡන්ද ගන්න හැම තැනම යන්න එපායැ. ඔහු මුළු ප්‍රදේශයේම යනවා. සල්ලි තිබෙන කෙනා එක එක තැන්වලට ගිහිල්ලා ප්‍රාදේශීය සභාවේ නියෝජිතයන් ගන්නවා, සංග්‍රහ කරලා. ඊළඟට තවත් අය ගන්නවා, ලේකම්වරුන් පත් කරනවා. මේ ආකාරයට තැන් තැන්වල කණ්ඩායම් - groups - හදනවා. ඊළඟට තෑගි භෝග දෙනවා. මෙන්න මේ වැඩ පිළිවෙළ තමයි ක්‍රියාත්මක වන්නේ. ඒ නිසා මේ

මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම අත්‍යවශ්‍ය දෙයක්. දැන් තිබෙන විධායක ජනාධිපති ක්‍රමයටත් වඩා ජනතාවට දැනෙන්නේ මේ ගමේ තිබෙන අර්බුදය; දිස්ත්‍රික්කයේ තිබෙන අර්බුදය. මෙන්න මේ අර්බුදය විසඳා ගන්න ඕනෑ කරලා තිබෙනවා. ඒ නිසා මේ ප්‍රශ්න විසඳා ගැනීමට මේ කරුණු දෙකම දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයටම ඇතුළත් කළා නම් කොච්චර හොඳද? දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඒක ඇතුළත් කළේ නැති නිසා විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ඉදිරිපත් කරන්න වුණා. ඉතින් ඒ කාරණා දෙකම එකම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඇතුළත් කළා නම් කොච්චර අගෙයිද? මේකේ එතුමා කරුණු තුනක් සඳහන් කරලා තිබෙනවා. ඒ, විධායක ජනාධිපති ක්‍රමය වෙනස් කිරීම, මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම සහ යහ පාලනය සඳහා ස්වාධීන කොමිෂන් සභා ඇති කිරීම. විධායක ජනාධිපති ක්‍රමයත්, ස්වාධීන කොමිෂන් සභා ඇති කිරීමත් මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඇතුළත් කළා. හැබැයි මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම ඇතුළත් කළේ නැහැ. මේ වැඩ පිළිවෙළ එකටම කර ගෙන යන්න තිබුණු එකක්. මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සකස් කළ අපේ අගමැතිතුමා ඇතුළු පිරිස ඒ ගැන සැලකිල්ලක් දැක්වූයේ නැහැ. ඒක නිසා තමයි දැන් ඊළඟ පියවර හැටියට එය ඉදිරිපත් කරන්න වෙලා තිබෙන්නේ. අපට මේ මැතිවරණ ක්‍රමය වෙනස් කර ගන්න ඕනෑ.

ඉස්සර මැතිවරණයක් ඉවර වුණාට පස්සේ තරග කරපු හැම අපේක්ෂකයෙක්ම මෙන්න මෙච්චර වියදම් කළා කියලා මැතිවරණ කොමසාරිස්ට විය හියදම් ලැයිස්තුවක් ලියලා යවන්න ඕනෑ; ඒ පිළිබඳ විස්තරයක් යවන්න ඕනෑ. දැන් එහෙම මොකක්වත් නැහැ. පුළුවන් හැටියට වියදම් කරනවා. මේ ක්‍රමය යටතේ රුපියල් කෝටි ගණන් වියදම් කරනවා. මේ ක්‍රමය තුළ අද මැති ඇමතිවරුනුත්, මන්ත්‍රීවරුනුත් පුළුවන් තරම් හම්බ කරන්න උත්සාහ කරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. දිස්ත්‍රික්කයක් පුරා වියදම් කරන්න විශාල මුදල් ප්‍රමාණයක් ඕනෑ. ඒ නිසායි එහෙම වෙලා තිබෙන්නේ. ඒක නිසා ඒ ගොල්ලන් නිදහසට කාරණයක් හැටියටත් පාවිච්චි කරනවා, වියදම් කරන්න මුදල් ඕනෑ කියන කාරණය. පළමු වැනි සැරේට අම්මා තාත්තාගේ සල්ලි වියදම් කළත් ඊළඟ සැරේ වියදම් කරන්න හොරකම් කර ගන්න එපායැ. මෙන්න මේ තත්ත්වයට යොමු වෙන්නත් මේ මැතිවරණ ක්‍රමය හේතු වෙලා තිබෙනවා. ඒක නිසා ඉතාම වැදගත් දෙය තමයි මැතිවරණ ක්‍රමය වෙනස් කරන එක. සියලු දෙනාම එකතු වෙලා ඒ කාර්යය කරන්න ඕනෑ.

විධායක ජනාධිපති ක්‍රමය වෙනස් කිරීම සම්බන්ධයෙන් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ මැතිවරණ ප්‍රකාශනයේ පැහැදිලිවම කියලා තිබෙනවා, "ජනමත විචාරණයකින් පමණක් වෙනස් කළ හැකි ව්‍යවස්ථා වගන්ති හැර" කියලා. ජනමත විචාරණයකට යන ව්‍යවස්ථා වගන්ති මොනවාද කියලා දැන් බලා ගන්න පුළුවන් වෙලා තිබෙනවා. "එම ව්‍යවස්ථා වගන්ති සංශෝධනය කිරීමට නම් ජනමත විචාරණයකට යා යුතුයි" කියලා, ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව අනුව බොහෝ සංශෝධන අවලංගු කරලා තිබෙනවා. එතකොට ඒ අනුව සමහර ව්‍යවස්ථා වගන්ති වෙනස් කර ගන්න බැරි වෙලා තිබෙනවා. එහෙම නම් අපි පාර්ලිමේන්තුවම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් බවට පත් කරලා, ඒ මඟින් අවුරුද්දක් හමාරක් සාකච්ඡා කරලා, මිනිසුන් අතර මතවාදයක් ඇති කරලා, මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න යවන එක තමයි අවශ්‍ය වෙන්නේ. ඉතින් ඒක එහෙම තිබුණාවේ. දැන් මේ ලැබෙන සංශෝධන ගැන කියන්න තිබෙන්නේ, "දසසිල් රකින්න බැරි නම් පන්සිල්වත් රකින එකත් හොඳයි" කියන එකයි. දසසිල් ගන්න බැරි නම් පන්සිල් රකින්නවත් පරිසරයක් හැදෙනවා නම් හොඳයි.

මේ මන්ත්‍රීවරු බොහෝ දෙනා කල්පනා කරන්නේ මොනවා ගැනද? අගමැතිතුමාගේ සැර පරුෂ කථාව, පහර ගහලා කථා කරන එක පිළිබඳව තමයි කථා කරන්නේ. ඊළඟට දූෂණ, දූෂණ කියලා එක එක පුද්ගලයන් සිර භාරයට ගන්නවා. ඒ කාලයේ ඉඳලාම දූෂණ තිබුණු නිසා තමයි, අවුරුදු දෙදහස් ගණනකට පෙර පන්සිල් දේශනා කර තිබෙන්නේ. දූෂණ කියන්නේ අපට නිදහස් වෙන්න පුළුවන් කාරණයක් නොවෙයි. ඒ දේවල් තිබෙනවා. ඒවා අවම කරගන්න යම් යම් වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒක ඇත්ත. නමුත් ඒවා සම්බන්ධව නිවැරදිව පරීක්ෂණ කරලා දඬුවම් කරන වැඩ පිළිවෙළකට යන්නේ නැතුව, ඒවා කල් ඇතුව දේශපාලන පළිගැනීම් විධියට කරනවාය කියන එක ගැන තමයි සමහර මන්ත්‍රීවරු කෝපයෙන් මේ වාගේ විවේචන කරන්නේ. මේ විධියට හැප්පෙන්නේ ඒක නිසායි. එසේ නමුත් රටේ ජනතාවට දිය යුතු දෙයක් තිබෙන නිසා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ගෙනෙන ඒ කරුණු දෙකම අනුමත කිරීම පිළිබඳව කිසිම මන්ත්‍රීවරයෙක් පැකිළෙන්නේ නැහැ කියන එකයි මගේ මතය. මොකද, අපේ රටේ ජනතාව වෙනුවෙන්, රට වෙනුවෙන් කරන ක්‍රියාවක් හැටියට ඒක කරන්න ඕනෑ.

සමහර අවස්ථාවලදී එක එක්කෙනා මේ ව්‍යවස්ථා සංශෝධනය කරනවාය කියා කිව්වාට කෙරුණේ නැහැ. මම මාදුළුවාවේ සෝභිත හාමුදුරුවෝ එක්ක කථා කළා. උන්වහන්සේ කියනවා, හිටපු ජනාධිපතිතුමන්ලා වෙතින්, ජනාධිපතිතුමිය වෙතින් එම කටයුත්ත සිද්ධ වුණේ නැහැ, වෙන්නෙත් නැහැ, කරගන්නත් බැහැ කියලා. ඒ වාගේම උන්වහන්සේ කියනවා, "මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හදපු අය හැටියට වර්තමාන අගමැතිතුමාටවත් මේ කටයුත්ත ගැන උනන්දුවක් නැහැ, ඒ අය මේ සම්බන්ධව දැඩි ලෙස ඕනෑකමක් දක්වන්නේ නැහැ, ඒ නිසා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ඉන්න කොට තමයි මේ කටයුත්ත කරන්න වෙන්නේ. මොකද, තමන්ට ලැබුණු බලය අත් හරින්න ලැහැස්ති කෙනෙක්, ඒ බලය දෙන්න කැමති කෙනෙක් කවදාවත් ලෝකයේ පහළ වෙන්නේ නැහැ. ලබා ගත් බලය තහවුරු කරගන්න, ශක්තිමත් කරගන්න එක තමයි කරන්නේ. ඒ අනුව මේ කාර්ය කරගන්න පුළුවන් තරම් බලපෑම් කරන්න ඕනෑ, උනන්දු කරවන්න ඕනෑ, අවුස්සන්න ඕනෑ" කියලා. උන්වහන්සේ පෙළපාළි යනවා කිව්වේත් ඒක උඩයි. මොකද, උන්වහන්සේ තුළ දැඩි ඕනෑකමක් තිබෙන නිසා තමයි, හැඟීමක් තිබෙන නිසා තමයි ඒ ක්‍රියාවට යොමු වෙලා සිටින්නේ. ඒක නිසා විශේෂයෙන්ම අපි මේ කාරණා ටික පදනම් කරගෙන මෙම කටයුත්ත ඉෂ්ට කර ගන්න ක්‍රියා කළ යුතුව තිබෙනවා.

විශේෂයෙන්ම දූෂණ නැති කිරීම අවශ්‍ය දෙයක්. මොකද, වර්තමානයේ මේ තිබෙන ධනේශ්වර ක්‍රමය තුළ, විවෘත ආර්ථිකය ක්‍රමය තුළ, පාරිභෝගික ක්‍රමය තුළ හැම දෙනාම පහසු ජීවිතයක් - comfortable living- ගත කරන්න හම්බ කරන තැනට තමයි පෙළඹිලා සිටින්නේ. කොච්චර හම්බ කළත් මදි. ඒවා පාලනය කරන්න අවශ්‍යයි.

සිංගප්පූරුවේ ලී ක්වාන් යූ කියලා අගමැතිවරයෙක් සිටියා. එතුමා ඇමතිවරු පත් කරලා කිව්වා, "උඹලා සියලු businessවලින් අයින් වෙයල්ලා, උඹලා සියලු දේවල් අත් හැරපල්ලා, මේ වැඩේ විතරක් කරපල්ලා, මම හොඳ දීමනාවක් දෙන්නම්" කියලා. එහෙම කියලා හොඳ වේතනයක් - හොඳ දීමනාවක් - දුන්නා. එහෙම දීලා කිව්වා, වෙන වැඩ කරන්න බැහැ, කොමිස් ගහන්න බැහැ, තමන්ගේ business බලන්න යන්න බැහැ, ඒවා සියල්ලෙන්ම නිදහස් වෙන්න ඕනෑය කියලා. ඔවුන්ට හොඳ දීමනාවක් දීලා ඒ විධියට කටයුතු කළා. එතුමාගේ කාලයේදී එක් අයෙක් හොරකම් කරලා අහු වුණාලු. අහු වුණාම ඒ ඇමතිවරයාට එන්න කියලා කිව්වාලු, "දැන් හොරකමකට අහු වෙලා තිබෙනවා, ඒකෙන් ගැලවෙන්න ඔබට ක්‍රම දෙකක් තිබෙනවා" කියලා. එක ක්‍රමයක් හැටියට කිව්වා, "උසාවියට යන්න ඕනෑ, උසාවියට ගිහිල්ලා පුළුවන් නම් ගැලවියන්" කියලා. "හැබැයි, උසාවියෙන් නිදහස් කරයිද කියලා මට කියන්න බැහැ. එහෙම නැති වුණොත්

[ගරු අතාවුද සෙනෙවිරත්න මහතා]

ඔබට කරගන්න තිබෙන්නේ සිය දිවි හානි කර ගැනීම -commit suicide- විතරයි" කියලා කිව්වා. ඊට පස්සේ ඔහු ගිහිල්ලා suicide කර ගත්තාලු; පණ නසා ගත්තාලු. ඉහළ ඉඳලා පහළටම ඒ වාගේ දැඩි තත්ත්වයක් මේ රටේ පවත්වා ගෙන යන්නේ නැතුව නම් මේ රට හදන්න බැහැ. සමහර ග්‍රාම නිලධාරි මහත්වරුත් නරක් වෙලා. පහළ කෙනාගේ ඉඳලා ඉහළට සමහර පොලිස් නිලධාරිනුත් ඒ තත්ත්වයට පත් වෙලා සිටිනවා. IGP විතරයි, තවම ඒ තත්ත්වයට පත් වෙලා නැත්තේ. ඊළඟට නඩුකාරයෝත් මේ තත්ත්වයට පත් වෙලා සිටිනවා. සමහර පූජකයෝත් මේ තත්ත්වයට පත් වෙලා සිටිනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු අතාවුද සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)
මේ අනුව බැලුවාම ධනය නිසා සමස්ත පිරිහීමකට තමයි, මේ රට පත් වී තිබෙන්නේ. ධනය නිසා බරපතළ පිරිහීමකට ලක් වී තිබෙනවා. "ධනයට ගල් පිළිමත් කට අරිනවා" කියනවා නේ. ධනයට බොහොම ආසා කරන, පෙළෙඹෙන යුගයක් තමයි, දැන් උදා වී තිබෙන්නේ. තට්ටු ගෙවල් ඕනෑ, ඒවාට tiles දමන්න ඕනෑ. ඊළඟට රූපවාහිනී ඕනෑ; ලොකු ලොකු වාහන ඕනෑ. දැන් භාවනා කරලා සෘද්ධියෙන් යන කිසිවෙක් පෙනෙන්නට නැහැ. හැබැයි, tickets ගත්තාම අහසින් යන්න පුළුවන්. ඒ වාගේම telephones ගත්තාම දිව, කන් ගන්න පුළුවන්. දැන් telephones දෙක, තුන අතේ. සමහර ඒවායේ වටිනාකම රුපියල් 50,000යි, රුපියල් 60,000යි, රුපියල් 70,000යි. එතකොට දිව කන ලැබිලා. ඊළඟට තව මොකක්ද ගන්න තියෙන්නේ? ඊළඟට, DIVA satellite TV ගන්න තිබෙනවා. ඒකෙන් අරවා මේවා දමා ගන්නවා. ඒකෙන් බලා ගන්න පුළුවන්. Telephone එකේ වාගේම තිබෙනවා. ඒ රටේ ඉඳන් කථා කරන එකත් බලා ගන්න පුළුවන්. ඒවා ඉන්ද්‍රිය ගෝචරයි. ඒ නිසා ඒ පැත්තට ගමන් කරනවා.

ඒ නිසා මේ රට සමස්තයක් හැටියට සුචරිතයෙන් පිරිහිලායි තිබෙන්නේ. ඒ තත්ත්වය හදන්නට මේ රජයට දැරිය හැකි සියලු පියවර ගත යුතුයි. ඒක ආරක්ෂා කරන්න කටයුතු කළ යුතුයි කියන එක මතක් කරමින්, මා මගේ කථාව අවසාන කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. ඊළඟට, ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමා.

[අ.භා.4.51]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා (ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Mass Media and Chief Government Whip)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඊයේත් අදත් මේ උත්තරීතර සභාවේ අප ඉතාම ඓතිහාසික ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ගැන විවාද කරද්දී මිනිත්තු හත අටක් හෝ ඒ ගැන කථා කරන්නට මටත් අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, තව සුළු වේලාවකින් මේ සභාවේ මන්ත්‍රීවරු ගන්නා තීන්දුව දෙස මේ වන විට මුළු රටම දෑස් දල්වා ගෙන බලා ඉන්නවා. මෙතැනදී මන්ත්‍රීවරු කී දෙනෙක් ප්‍රඥාවේ මාර්ගය තෝරා ගනියිද, කී දෙනෙක් පරිහානියේ මාර්ගයේම යන්නට ක්‍රියා කරයිද කියා රටක් බලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය දන්නා පරිදි මේ විධායක ජනාධිපති ධුරය ඇති කළ දවසේ සිටම විධායක ජනාධිපති ක්‍රමය මේ රටට ගැලපෙන්නේ නැහැ, මෙය ඒකාධිපතිත්වයට යන ගමනක්, ඒ නිසා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළ යුතුයි කියා බොහෝ දෙනෙක් කෑ ගැසුවා. මෙය ඒකාධිපති ගමනක් නිසා විධායක බලය -බලතල- කප්පාදු කළ යුතුයි කියන එකත් දිගින් දිගටම කියැවුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රධාන අද විපක්ෂය නියෝජනය කරන දේශපාලන පක්ෂවලින් විතරක් නොවෙයි, මේ රටේ සිවිල් සමාජය තුළිනුත් ඒ ගැන හඬක් නැඟුණා. පොදු මහ ජනතාවගෙන් විතරක් නොවෙයි, මේ උත්තරීතර තනතුරට විටින් විට තරග කළ අපේක්ෂක අපේක්ෂිකාවනුත් විධායක ජනාධිපතිකම අහෝසි කරන්නය කියා බලය ඉල්ලුවා. බොහෝ දෙනෙක්, බොහෝ විට බලය ලබා ගත්තේ මෙහි ඇති බලතල කප්පාදු කරනවාමයි කියලායි. නමුත්, අවාසනාවට දිගින් දිගටම සිද්ධ වුණේ මොකක්ද කියන එක ඔබතුමිය දන්නවා. "විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්නම්, කප්පාදු කරන්නම්" කියා බලය ලබා ගත් අය ජනාධිපති පුටුවේ වාඩි වුණාට පස්සේ එය රහ වැටිලා, වරප්‍රසාද බුක්ති විඳිමින් ජනාධිපති ධුරයේ දිගටම සිටීමයි දිගටම කළේ. සමහර අය මෙයට තවත් යකඩ දත් සවි කරමින් "යාවජීව ජනාධිපති" වෙන්නත් උත්සාහ කළ හැටි මේ සභාවේ සිටින අපට අමුතු දේවල් නොවෙයි; අප ඒවා දැක්කා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජාතියේ වාසනාවට, යථාවාදී-තථාකාරී ගුණයෙන් යුත්, කියන දේ කරන, කරන දේ කියන රාජ්‍ය නායකයෙක් ජනවාරි මාසයේ 8වැනිදා මේ රටේ බහුතර ජනතාවගේ කැමැත්තෙන් අප සියලු දෙනාටම එකතු වී පත් කර ගැනීමේ වාසනාව ලැබුණා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය දින සියයක් ඇතුළත අද ගෙනෙන විට, එවැනි නායකයෙක් ජයග්‍රහණය කරවන්න පක්ෂයක් හැටියටත් පෞද්ගලිකව අපටත් දායක වෙන්න ලැබීම ගැන ඇත්ත වශයෙන්ම අප සන්තෝෂ වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමා ජනාධිපති ධුරයේ දිවුරුම් දුන් අවස්ථාවේ ජාතිය අමතා කළ කථාව මට මතක් වෙනවා. කිසිම ජනාධිපතිවරයෙක් දිවුරුම් දුන් අවස්ථාවක අපට අහන්නට නොලැබුණු, මුළු රටම මවිතයට පත් වන ප්‍රකාශයක් එතුමා කළා. " මම මේ ජනාධිපති ධුරයේ දිවුරුම් දෙන්නේ පළමුවැනි වතාවටත්, අවසාන වතාවටත්" කියන එක එතුමා ප්‍රකාශ කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා තමන්ගේ කැබිනට් මණ්ඩලය පත් කරලා, ඒ කැබිනට් ඇමතිවරුන් හැටියට අපව ඉදිරියේ තියාගෙන, එදා ඒ මොහොතේ කරපු කථාව මට මේ වෙලාවේ මතක් වෙනවා. එතුමා ඒ වෙලාවේ මොකක්ද කිව්වේ? ඕනෑම දෙයක් ඕනෑම මොහොතක අත හරින්න සූදානම් වෙන්න කියන ප්‍රකාශය, බෞද්ධ දර්ශනයේ සාරය අඩංගු පණිවුඩය තමයි අපට එදා එතුමා ප්‍රකාශ කළේ. ඒ කාරණය කියන ගමන් එතුමා තමන්ගේ චරිතය තුළින් නිදර්ශනත් ගෙනහැර පාපු හැටි අපට මතක් වෙනවා. එතුමා කිව්වා, "මම අත්හරින්න ලැහැස්ති වුණු කෙනෙක්, මම පක්ෂයේ මහ ලේකම්කම අතහැරිය හැටි බලන්න, මම සෞඛ්‍ය ඇමතිකම අතඇරපු හැටි බලන්න" කියලා. ඒ තනතුරු අත හැරපු නිසා එතුමා රටේ ජනාධිපති ධුරයට විතරක් නොවෙයි, ශ්‍රී ලංකා නිදහස්

පක්ෂයේ නායක තනතුරට පවා අද වනකොට පත් වෙලා තිබෙනවා කියන එක අපට එතුමාගේ චරිතය තුළින් ආදර්ශයක් දෙමින් ප්‍රකාශ කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ සංශෝධනය හරහා රටේ ජනතාවට වන යහපත බලන්න. දියුණු සමාජයකට අවශ්‍ය වන්නේ යටත් වැසියන් සිටින රාජ්‍ය ආණ්ඩුවක් නොවෙයි. සක්‍රිය පුරවැසියන් සිටින ජනරජයක්. මේ සංශෝධන හරහා අපට නව ජනරජ මාවතක් විවර වී තිබෙනවා. මේ බලතල අහෝසි කරන්න ඕනෑ බවට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අවුරුදු ගණනක් තිස්සේ - විධායක ජනාධිපති ක්‍රමය හඳුන්වා දුන් දවසේ ඉඳලා- කෑ මොර දීපු හැටි අපට මතක් වෙනවා. එතුමන්ලා පිටකොටුවේ බෝධිය ළඟ සත්‍යග්‍රහ කරපු හැටි අපට මතක් වෙනවා. දිගින් දිගටම මේ ගැන කථා කරපු හැටි අපට මතක් වෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජනාධිපති අපේක්ෂක අපේක්ෂිකාවෝ පසු ගිය ජනාධිපතිවරණයේ දී පවා මේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන ආකාරය ගැන කථා කළා. ඒ විතරක් නොවෙයි, අද විපක්ෂයේ සිටින බොහෝ දේශපාලන පක්ෂවල උදවිය මේ වෙනුවෙන් අරගළ කළ හැටි අප හැම කෙනෙක්ම දැක තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඒ විතරක් නොවෙයි, මේ විධායක ජනාධිපති ධුරය හඳුන්වා දීපු එක්සත් ජාතික පක්ෂයත් කලක් යනකොට මේ ක්‍රමයේ තිබෙන අඩු පාඩුකම් දැක්කා. අපේ නායකතුමාගේ ප්‍රධානත්වයෙන් කතරගම පැවැති සම්මේලනයේ දී මේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න අපි යෝජනාවක් පවා සම්මත කර ගත්තා. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගෙන එද්දි ප්‍රබල දායකත්වයක් සපයපු, මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ කෘත හස්ත, දැන උගත් ඇමතිවරුන් වශයෙන් සිටි දිවංගත ගාමිණී දිසානායක ඇමතිතුමා, දිවංගත ලලිත් ඇතුලත් මුදලි ඇමතිතුමා වැනි නායකයන් පවා පසු කාලයේ මේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළ යුතුයි කියන මතයේ ඉඳගෙන ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළ හැටි අපට මතක් වෙනවා.

අවසාන මිනිත්තුවේ දී මම මේ කාරණය ගැනත් කියන්න කැමැතියි. මේ ස්වර්ණමය අවස්ථාවට පිටුපාන්න අප කාටවත් පුළුවන් කියලා මම නම් විශ්වාස කරන්නේ නැහැ. මෙහි ගෞරවය තම බලතල පරිත්‍යාග කරපු දුර්ලභ ගණයේ රාජ්‍ය නායකයකු වන ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට හිමි විය යුතුයි. එවැනි නායකයකුට මේ කටයුත්ත කරන්න ඉඩහසර විවර කර දෙමින් අසීමිත පරිත්‍යාගයක් සහ කැපවීමක් කරපු අපේ පක්ෂයේ නායක අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත් මේ ගෞරවය අනිවාර්යයෙන්ම හිමි විය යුතුයි කියලා මා කල්පනා කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු ඇමතිතුමනි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඒ විතරක් නොවෙයි, මෙවැනි ජනාධිපතිවරයකුට ජන වරම දීපු ජනතාවටත් එහි ගෞරවය හිමි විය යුතුයි කියන කාරණයත් මා මේ අවස්ථාවේ දී මතක් කරන්නට ඕනෑ. මුළු රටම බලාගෙන සිටින මේ සංශෝධනය සම්මත කිරීමට අප හැම කෙනෙක්ම කටයුතු කළ යුතුව තිබෙනවා. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අත උස්සලා කරපු ඓතිහාසික වැරැද්ද නිවැරදි කර ගන්න, ඒ පව් සෝදා ගන්න ලැබුණු මේ අනගි අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජනය ගන්න. අපේ ගරු සභානායකතුමා කිව්වා වාගේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කියන මල් වට්ටියට අත ගහන්න සියලු දෙනාටම ප්‍රඥාව පහළ වේවා! කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 5.00]

**ගරු වයි.ජී. පද්මසිරි මහතා**
(மாண்புமிகு வை.ஜி. பத்மசிறி)
(The Hon. Y.G. Padmasiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම ඉතාම සතුටු වෙනවා. ඒ එක්කම 1972 ජනරජ ව්‍යවස්ථාව සකස් වූ ආකාරය පිළිබඳවත් මොහොතකට මතක් කිරීම හොඳයි කියලා මම හිතනවා. 1970 ජූලි 19වැනිදා නව රඟහලේ එම ඓතිහාසික කාර්යය ආරම්භ වන අවධිය වන විට මම පාසල් ශිෂ්‍යයෙක්. ඒක මහා ප්‍රාතිහාර්යයක්, විප්ලවයක් හැටියටයි අපේ තරුණ අවධියේ දී දැක්කේ. ඒ වාගේම ඒ ව්‍යවස්ථා පනත් කෙටුම්පත දින ගණනාවක්ම "දිනමිණ" පත්‍රයේ පළ වුණා. අප පන්තියේ ඉගෙන ගත් ආණ්ඩුක්‍රම විෂයට අදාළව ව්‍යවස්ථා වර්ගීකරණය ඇතුළු අදාළ පාඩම් කරමින් සිටි යුගයක් නිසා ඒක බොහොම තදින් හිතට දැනුණා; හදවතට දැනුණා. ඒ නිසා ඉතා වුවමනාවෙන් ඒ පත්‍රවල පළ වන ලිපි, සංවාද කියැවීමටත්, නොයෙකුත් සම්මන්ත්‍රණ ආදියට සම්බන්ධ වන්නටත් අවස්ථාව ලැබුණා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයෙන් පුවත්පතක පළ කළ දැන්වීමකට අනුව මමත් ඒ ව්‍යවස්ථාවේ යම් කොටසකට යෝජනා යැව්වා. මට උත්තරයක් ලැබෙයි කියලා මම හිතුවේ නැහැ. නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයෙන් පිළිතුරක් සමඟ ව්‍යවස්ථාවේ කෙටුම්පතක් මට ලැබුණා. "ඔබේ යෝජනා පාර්ලිමේන්තු පුස්තකයට ඇතුළත් කර තිබෙනවා" කියා මට දැන්වුවා. ඒ අනුව මේ ව්‍යවස්ථාකරණය සම්බන්ධයෙන් මට ලොකු උද්‍යෝගයක්, උනන්දුවක් ඇති වුණා. මොකද, ගම්බද ශිෂ්‍යයකු හැටියට එදා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ කටයුත්තකට ඒ විධියට හරි සම්බන්ධ වෙන්න මට පුළුවන්කම ලැබුණා. ඒ විධියට අවුරුදු දෙකක් පමණ කාලයක් තිස්සේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය විවිධ අංශවලට බෙදෙමින්, සාකච්ඡා කරමින් තමයි 1972 ජනරජ ව්‍යවස්ථාව හැදුවේ. ඒ සමහර ලිපි පරිස්සම් කරලා අදත් තියා ගෙන ඉන්නවා. මට මතක විධියට ඒ ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය තුළ ඇති වුණු විවාදයක් තමයි 1815 ගිවිසුම රට පාවා දීමක්ද, පවරා දීමක්ද කියන කාරණය. ඒ පිළිබඳව යම්කිසි විවාදයක් ඇති වුණා. දෙපැත්තටම කරුණු කිව්වා. විශේෂයෙන් ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා ඇමතිතුමා ඒක රට පාවා දීමක් හැටියට කථා කරමින් කරුණු තහවුරු කර තිබෙනවා.

එවකට අපි දේශපාලනයටත් යම් සම්බන්ධයක් තිබුණා. මීට පෙර කථා කළ ගරු අතාවුද සෙනෙවිරත්න මන්ත්‍රීතුමා රුවන්වැල්ල ප්‍රදේශය නියෝජනය කළ මන්ත්‍රීතුමා හැටියට ඒ ප්‍රදේශයේ නායකත්වය දැරුවා. 1972 විතර වන විට ජනරජ ව්‍යවස්ථාව පිළිබඳව ඒ දවස්වල පක්ෂය සංවිධානය කළ සම්මන්ත්‍රණ ගම් දක්වා ගෙන යාමේ වැඩ පිළිවෙළට සම්බන්ධ වන්නට තරුණ සමිති ප්‍රාදේශීය මණ්ඩලයේ ලේකම්වරයා හැටියට මට පුළුවන් වුණා. ඒ නිසා ජනතාවට ලොකු අවබෝධයක් ලබා දෙන ව්‍යවස්ථාවක් නිර්මාණය කිරීමක් එදා සිද්ධ වුණා. නමුත් මේ කාලය තුළ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳවත්, ඉදිරිපත් කරන සංශෝධන පිළිබඳවත් පාර්ලිමේන්තුව තුළ සිටින අපි පවා දැන ගන්නේ දැනුයි. අද තවත් සංශෝධන ගැන අපි දැනගන්නවා. ඒ වාගේම ඒ ගැන කරුණු රට තුළ කථා කළා මදි; සාකච්ඡා වුණා මදි. ඒ නිසා

[ගරු වයි.ජී. පද්මසිරි මහතා]

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කළාට පසුව හෙට ඉඳලා මේ කරපු සියලු දේම ජනතාව දැන ගත්තාය කියලා මහා ප්‍රසාදයක් ඇති වෙනවා කියලා මැනීමක් කර ගන්නවා නම් ඒක තමන්ම තමන් රවටා ගැනීමක් කියලා මම හිතනවා. මේ ගැන ජනතාව තුළ තිබෙන්නේ ඉතාම අඩු අවබෝධයක්; අඩු සහභාගිත්වයක් කියන එකයි මට සඳහන් කරන්නට තිබෙන්නේ.

අද උදේ ගරු ඇමතිතුමකුගේ කථාවේ දී කියැවුණා, ජනවාරි 8වැනිදා ජනමතයත් එක්ක පාර්ලිමේන්තු ජනමතයත් වෙනස් වුණාය කියලා. නැහැ, පාර්ලිමේන්තු ජනමතය වෙනස් වුණාය කියන මතයට අපි කිසිසේත්ම එකඟ වන්නේ නැහැ. ඒක තමයි මේ තිබෙන ගැටලුව. ඒ වාගේම ජනවාරි 8වැනිදා අගමැති ධුරය සුළුතරයකට දීමත් අපේ පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි දෙයක් හැටියටයි අපි සලකන්නේ. එදා ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා මැතිතුමාගේ නායකත්වයෙන් සකස් කරන ලද 1972 ජනරජ ව්‍යවස්ථාවට සංශෝධන ඉදිරිපත් කරමින් ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ජනාධිපති වුණා. පූර්ණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් 1978 ජුනි 25වැනිදා මෙහිදී සම්මත කරන අවස්ථාවේ දී පාර්ලිමේන්තුව තුළ හිටපු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හත් දෙනා එයට විරුද්ධව ඡන්දය පාවිච්චි කළා. එදා යුනියන් පෙදෙසේ හයිඩ් පිටිය අසල එළිමහනේ තිබුණු සත්‍යග්‍රහයට - විරෝධතා ව්‍යාපාරයට- සහභාගි වුණු කෙනෙක් හැටියට; එදා ඉඳලාම මේ ව්‍යවස්ථා වෙනස් විය යුතුය කියන මතයේ සිටින කෙනෙක් හැටියට දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙනුත් ඒ විධියේ වෙනසක් වෙනවා නම් අපි කැමැතියි. නමුත් මෙයින් සිද්ධ වන්නේ ඉතා සුළු සංශෝධනයක්; බලතල සුළු ප්‍රමාණයකින් අඩු වීමක්. රට ඉල්ලන්නේ ඒක නම්, එයින් සෑහීමකට පත් වෙනවා නම් කරන්න දෙයක් නැහැ. නමුත් අපි සෑහීමකට පත් වෙන්නේ නැහැ. එයින්වත් මෙම දින සියයේ වැඩ පිළිවෙළ තුළ ජනතාවට සහනයක් ලැබෙනවා නම් අපි එයට එකතු වෙනවා කියලා සඳහන් කරන්න කැමැතියි. හැබැයි, එසේ එකතු වන්නේ විපක්ෂය විසින් ඉදිරිපත් කර තිබෙන වැදගත් සංශෝධනත් සමඟයි.

ඒත් එක්කම ස්වාධීන කොමිෂන් සභා සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සම්බන්ධව මතක් කරන්න ඕනෑ. ඒ සම්බන්ධව වැදගත් කරුණු මේ ගරු සභාවේ ඊයේ සිටම ඉදිරිපත් වෙලා තිබෙනවා. මේ පිළිබඳව අපි යම් එකඟතාවකට එන්න ඕනෑ. ව්‍යවස්ථාදායකයේ නියෝජිතයන් වන අප ජනතා පරමාධිපත්‍ය බලය; පාර්ලිමේන්තුවේ බලය ආරක්ෂා කර ගත යුතුව තිබෙනවා. පාර්ලිමේන්තුවේ බලය හැල්ලු වීමට ඉඩ නොදිය යුතුයි. එම නිසා බාහිරින් පත් වන පුද්ගලයින් වෙනුවට පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගෙන් ඒ අවස්ථා සම්පූර්ණ කර ගත යුතුයි. ඒ වාගේම කොමිෂන් සභා සම්බන්ධයෙන් වුණත් යම් කිසි පාලනයක් ඇති වන විධියට, පාර්ලිමේන්තුවේ යම් ආකාරයකට නියාමනයක් වන විධියට කටයුතු යෙදෙන්න ඕනෑ කියන අදහසේ අපි ඉන්නවා. නැතිනම් වෙන්නේ නූල කැඩිච්ච සරුංගල වාගේ ඕනෑ ඕනෑ විධියට කටයුතු කිරීමයි. විශේෂයෙන් ජනතා නියෝජිතයින් හැටියට මුහුණ දෙන්න බැරි තත්ත්වයකට පත් නොවන ආකාරයට මෙම කොමිෂන් සභා හසුරුවා ගන්න ඕනෑ කියන අදහස මා ඉදිරිපත් කරනවා. විශේෂයෙන්ම ලංකා සම සමාජ පක්ෂයෙනුත්, ඒ වාගේම වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාත් ඉදිරිපත් කරලා තිබෙනවා වැදගත් සංශෝධන දෙකක්. ඒ සංශෝධන දෙකෙන් ඉල්ලා තිබෙනවා ජනවාර්ගික හා ජාතික ඒකාබද්ධතා කොමිෂන් සභාවකුත් පත් කරන්න කියලා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු වයි.ජී. පද්මසිරි මහතා**
(மாண்புமிகு வை.ஜி. பத்மசிறி)
(The Hon. Y.G. Padmasiri)

අපේ රටේ පැන නැඟුණු ජාතික ප්‍රශ්නයටත් නිරතුරුවම විසඳුම් ලබා දිය හැකි කොමිෂන් සභාවක් බවට එම කොමිෂන් සභාව පත් වෙනවා. විශේෂයෙන්ම අපේ සුළු ජාතික ජනතාවට එය ප්‍රයෝජනවත් වෙනවා.

අවසාන වශයෙන් මේ කාරණයත් මතක් කරන්න කැමැතියි. අප යා යුතු නියම මඟ නම්, 1971 වර්ෂයේ තිබුණු ආදර්ශය ගනිමින් ඉදිරි පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසුව මුල් කාල සීමාවේදීම ආණ්ඩුක්‍රම සම්පාදක මණ්ඩලයක් බවට පත් වෙමින් නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සඳහා කටයුතු කිරීමයි. එය තමයි වඩාත් සුදුසු ක්‍රමය. පරණ රෙද්දක සිදුරු වසා ගැනීමට අලුත් රෙදි කැබැලි කොයි තරම් මූට්ටු කළත් කිසිදු ප්‍රයෝජනයක් නැහැ. ටික දවසකින් එහි තවත් සිදුරු ඇති වෙනවා. එම නිසා ජනතාවට ඡන්ද බලය පමණක් නොවෙයි, ග්‍රාමීය මට්ටමින් ප්‍රදේශ මට්ටමින් පාලන බලයට ඇතුළු වීමට ඉඩ ලැබී ජනතා බලයත් වැඩි වන විධියේ රටට ගැලපෙන නව ව්‍යවස්ථාවක් ඇති කරමින් විදේශීය රටවලට ගැති නොවී, අපේ ස්වාධීනත්වය ආරක්ෂා කරන්න නැඟී සිටින රටක් හැටියට -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

දැන් කථාව අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමනි.

**ගරු වයි.ජී. පද්මසිරි මහතා**
(மாண்புமிகு வை.ஜி. பத்மசிறி)
(The Hon. Y.G. Padmasiri)

1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වුණු ඒ නිර්මල ජාතික නිදහස රැක ගනිමින් ඉදිරියට යන වැඩ පිළිවෙළක් ගැබ් වෙන විධියේ ව්‍යවස්ථාවක් සකස් කර ගැනීමට අපට හැකි වේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමනි. මීළඟට ගරු පාඨලී චම්පික රණවක අමාත්‍යතුමා.

[අ.භා. 5.09]

**ගරු පාඨලී චම්පික රණවක මහතා (විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க - மின்வலு மற்றும் எரிசக்தி அமைச்சர்)
(The Hon. Patali Champika Ranawaka - Minister of Power and Energy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද මෙම ඓතිහාසික විවාදයට සම්බන්ධ වීමට ලැබීම ගැන මම ඉතාම සතුටට පත් වෙනවා. පසු ගිය ජනවාරි 08 වෙනිදා පවත්වපු ජනාධිපතිවරණයේ දී මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඉදිරිපත් කරන ලද "මෛත්‍රී පාලනයක් - ස්ථාවර රටක්" නැමැති ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඒ අන්තර් කාලීන, කෙටි කාලීන ජාතික සමඟි සන්ධාන ආණ්ඩුවේ වැදගත්ම කාර්යය වුණේ දේශපාලන ප්‍රතිසංස්කරණයයි. ඒ දේශපාලන ප්‍රතිසංස්කරණයෙන් අදහස් වුණේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් මඟින් විධායක ජනාධිපති ධුරය, ඒ වාගේම නිර්දේශපාලනික කොමිෂන් සභා සහ මැතිවරණ ක්‍රමය ව්‍යවස්ථාව තුළ වෙනස් කර ගැනීමයි. ඒ සඳහා තමයි ප්‍රතිවිරුද්ධ දේශපාලන පක්ෂ එකට එකමුතු කර ගෙන එතුමා එම මැතිවරණයට ඉදිරිපත් වුණේ. ඒ වාගේම ප්‍රතිවිරුද්ධ

අපේක්ෂකයා වුණු මහින්ද රාජපක්ෂ මැතිතුමාත් 2005දීත්, 2010දීත් මේ විධායක ජනාධිපති ධුරයේ බලතල අඩු කිරීම ගැන, එය අහෝසි කිරීම ගැන විවිධ පොරොන්දු ලබා දීලා තිබුණා. එම නිසා මෙය එක්තරා ආකාරයකට ජාතික අවශ්‍යතාවක් බවට, දේශපාලන පක්ෂ විනිවිද ගිය ජාතික වැඩ පිළිවෙළක් බවට, අත්‍යවශ්‍ය දේශපාලන ප්‍රතිසංස්කරණයක් බවට පත් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ශ්‍රී ලංකාව අද මැදි ආදායම් රටක්. ශ්‍රී ලංකාව එසේ මැදි ආදායම් රටක් බවට පත් වුණේ වර්ෂ 1998දීයි. ඒ වාගේම ශ්‍රී ලංකාව අධි ආදායම් රටක් බවට පත් වෙන්න බලාපොරොත්තු වෙන්නේ වර්ෂ 2045දීයි. මේ රටට එක තැන පල් වෙමින් මේ ආකාරයට ඉදිරියට යන්නට බැහැ. රට ආර්ථික වශයෙන්, සමාජයීය වශයෙන් තිරසර සංවර්ධනයක් ලබා ගනිමින් ඉදිරියට යෑමට නම් අත්‍යවශ්‍ය දේශපාලන ප්‍රතිසංස්කරණ ගණනාවක් සිදු කළ යුතුව තිබෙනවා. ඒ අත්‍යවශ්‍ය දේශපාලන ප්‍රතිසංස්කරණවලින් ඉතාම වැදගත් කාරණයක් තමයි මේ විධායක ජනාධිපති ධුරය ප්‍රජාතන්ත්‍රකරණය කිරීමේ වැඩ පිළිවෙළ. විධායක ජනාධිපති ධුරය වහාම අහෝසි කළ යුතුයි කියලා අද අපේ සමහරු මනෝරාජික අදහස් පළ කරනවා. එය, මේ පිළිබඳව තිබෙන ප්‍රායෝගික තත්ත්වයවත්, මේ පිළිබඳව රටේ තිබෙන ස්ථාවරත්වය පිළිබඳවත් පැහැදිලි හැඟීමක්, පැහැදිලි විශ්ලේෂණයක් නැතුව නඟන මනෝරාජික අරාජිකවාදී සටන් පාඨයක්. ඒ වාගේම ඇතැමුන්ට අවශ්‍ය වෙලා තිබෙනවා කිසිදු වෙනසකින් තොරව විධායක ජනාධිපති ධුරය පෙරට රැගෙන යන්න. ඒ කාරණය ජනතාව ඉදිරිපිට කෙළින් කියන්න බැරි නිසා විවිධාකාරයේ ප්‍රශ්න මතු කරමින්, විවිධාකාරයේ කුමන්ත්‍රණ කරමින් මෙය පාර්ලිමේන්තුවේ සම්මත කිරීම පමා කිරීමට හෝ වැළැක්වීමට කටයුතු කර ගෙන යනවා. ඒ නිසා මේ අන්ත දෙකටම යට නොවී විධායක ජනාධිපති ධුරය ප්‍රජාතන්ත්‍රකරණය කිරීම සඳහා අපි මේ ඓතිහාසික අවස්ථාව පත් කර ගත යුතුයි. මේ ඓතිහාසික අවස්ථාවේ ඒ ජාතික වගකීම ඉටු කළ යුතුයි කියලා අපි අවධාරණය කරන්න ඕනෑ. ඒ වාගේම මේ විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමට නොහැකිව තිබෙන ඒ අත්තනෝමතික බලතල පාලනය කරලා; විධායක ජනාධිපති ධුරය ප්‍රජාතන්ත්‍රකරණය කරලා; විධායක ජනාධිපති ධුරයත්, පාර්ලිමේන්තුවත්, අධිකරණයත් අතර බල තුලනයක් ඇති කිරීම තමයි මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අපේක්ෂා කරන්නේ. මේ විධායක ජනාධිපති ධුරය වෙනුවට විධායක අගමැති ධුරයක් ඇති කරන්නට, 1972 තිබුණු ව්‍යවස්ථාවට ආපසු යන්නට ඇතැමුන්ට ඕනෑ වුණා. ඒ වාගේම විවිධාකාරයේ වෙනත් සංශෝධන මඟින් රාජ්‍ය අස්ථාවරභාවයක් ඇති කරන්න තවත් පිරිස්වලට ඕනෑ වුණා. දැන් මේ තිබෙන දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, මාර්තු 13 වෙනිදා ගෙන ආපු දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නොවෙයි. දැන් ගෙනැල්ලා තිබෙන මේ සංශෝධනය විවිධ අදහස් උදහස් මඟින් නිසියාකාරයෙන් සමබරතාවකට පත් වුණු, විධායක ජනාධිපති ධුරය ප්‍රජාතන්ත්‍රකරණය කරන නව දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් බව අපි අවධාරණයෙන් කියන්න ඕනෑ. ඒකට සියලු පාර්ශ්වවල දායකත්වය ලැබීම මේ රටේ ජනතාව ළඟා කර ගත්ත ජයග්‍රහණයක් බවත් ප්‍රකාශ කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ මුළු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේම හරය, මේ මුළු ව්‍යවස්ථාවේම කේන්ද්‍රීය ප්‍රශ්නය බවට පත් වුණේ ජනාධිපතිවරයා කවුද කියන ප්‍රශ්නයයි. ජනාධිපතිවරයා රාජ්‍යයේ නායකයා, විධායකයේ නායකයා සහ සේනාධිනායකයා බව 1972 ව්‍යවස්ථාවේ ප්‍රකාශ කරලා තිබුණා. ඒ වාගේම ජනාධිපතිවරයාට එලෙස බලයක් ලබා දෙන අතරේ, අගමැතිවරයා කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා බවත්, අගමැතිගේ උපදෙස් මත ජනාධිපති ක්‍රියා කළ යුතු බවත් ඒ 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වෙලා තිබුණා. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා 1978දී ගෙන ආ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ජනාධිපතිවරයා රාජ්‍යයේ නායකයා බවටත්, විධායකයේ නායකයා බවටත්, ආණ්ඩුවේ නායකයා බවටත්, සේනාධිනායකයා බවටත් පත් කළා. එතකොට රාජ්‍යයේ නායකයා බවට පත් වුණු රටේ ප්‍රධාන පුරවැසියා ජනාධිපති බවට පත් වුණා. එහෙම නම් නාමමාත්‍රික ජනාධිපති ධුරයේත්, විධායක ජනාධිපති ධුරයේත් මූලික හරය තිබුණේ ආණ්ඩුවේ නායකයා කවුද කියන කාරණය මතයි. ආණ්ඩුවේ නායකයා සහ කැබිනට් මණ්ඩලයේ නායකයා අගමැති වෙනවා නම්, එතැන නාමමාත්‍රික ජනාධිපති ධුරය ඇති වුණා. ආණ්ඩුවේ නායකයා හා කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා වන අතරේ රාජ්‍යයේ නායකයා, විධායකයේ නායකයා සහ සේනාධිනායකයා ජනාධිපති වෙනවා නම්, එතැන විධායක ජනාධිපති ධුරය ඇති වුණා. ඒ නිසා මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඉදිරිපත් කරන ලද ප්‍රතිසංශෝධන ආදී සියල්ලේම හරය වෙලා තිබුණේ, විවාදය තිබුණේ මෙන්න මේ ආණ්ඩුවේ නායකයා, කැබිනට් මණ්ඩලයේ නායකයා කවුද කියන කාරණය මතයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමා, ඔබතුමාට තව විනාඩි එකක කාලයක් තිබෙනවා.

**ගරු පාඨලී චම්පික රණවක මහතා**
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

අද මේ ඉදිරිපත් වෙලා තිබෙන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන තුළ මේ තත්ත්වය විසඳෙයි කියලා අපි හිතනවා. මේ රාජ්‍යයේ නායකයාත්, ආණ්ඩුවේ නායකයාත්, විධායකයේ නායකයාත්, සේනාධිනායකයාත් ජනාධිපතිවරයා වන අතරේ, ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වග කියන, අධිකරණයට වග කියන ධුරයක් බවට ප්‍රජාතන්ත්‍රකරණය වීම සුවිශේෂී ජයග්‍රහණයක්. ඒ නිසා විධායක ජනාධිපති ධුරය අහෝසි වීම වෙනුවට, ඒ මඟින් රට අස්ථාවර වීම වෙනුවට, ඒ මඟින් නොයෙකුත් විසකුරු බලවේගවලට පාර කැපීම වෙනුවට, විධායක ජනාධිපති ධුරය ප්‍රජාතන්ත්‍රකරණය වන මේ ක්‍රියාදාමයට සහයෝගය දිය යුතුයි. මෙය සම්පූර්ණ වීමට නම් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් රට තුළ කොට්ඨාස ක්‍රමයේත්, අනුපාත ක්‍රමයේත් සම්මිශ්‍රණයක් සහිත නව ප්‍රජාතාන්ත්‍රික මැතිවරණ ක්‍රමයකුත් ඇති කර ගැනීමට මේ ගරු සභාව සමත් විය යුතුයි, ඒ සඳහා කටයුතු කළ යුතුයි කියන කාරණය අවධාරණය කරමින් මම නිහඬ වෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு )திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *left the Chair and* MR. DEPUTY SPEAKER *took the Chair.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ඊළඟට, ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා.

[අ.භා. 5.16]

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ ඒ මත පදනම් වුණු සංශෝධන පිළිබඳව අදහසක් කියන්න අවස්ථාව ලැබීම වැදගත් කොට මා සලකනවා. විශේෂයෙන්ම මේ ව්‍යවස්ථාව පිළිබඳව පසු ගිය ජනාධිපතිවරණ කාලයේ මත ඉදිරිපත් වෙද්දී අපි ඉදිරිපත් කළ අදහසත් කියන්න ඕනෑ. මේ ගරු සභාවේත් ඒක කියැවුණා. ඒ තමයි මේ ව්‍යවස්ථාවට අවස්ථා 18කදී සංශෝධන එකතු කළා. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හැර අනෙක් සෑම සංශෝධනයක්ම ඉදිරිපත් වුණේ විධායක ජනාධිපති ධුරයේ බලතල තවත් ශක්තිමත් කරන්නයි.

මේ රටේ ජනතාවට බලය දෙන්න, ජනතාවගේ බලය ශක්තිමත් කරන්න නොවෙයි ඒ සංශෝධනයන් ඉදිරිපත් වුණේ. විශේෂයෙන්ම එහි ඉතා නරකම අවස්ථාව, තවත් විධායක බලය ශක්තිමත් කර ගත් අවස්ථාවක් හැටියට අපි දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය දැක්කා. එම නිසා නැවත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදද්දී අපි මූලිකව මතු කළ එක කාරණයක් තිබුණා. ඒ තමයි ව්‍යවස්ථාවක් හදන්න නම් ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් හදන්න ඕනෑ. ඒ වාගේම ඒ ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය හදන ව්‍යවස්ථා කෙටුම්පත සම්බන්ධව මේ රටේ පුළුල් සාකච්ඡාවක් වෙන්න ඕනෑ.

මහජනතාව අතර, දේශපාලන පක්ෂ අතර, ප්‍රජාව අතර සාකච්ඡාවක් වෙන්න ඕනෑ. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ එහෙම සාකච්ඡාවක් වුණාද? අද උදෑසනත්, දැන් ටිකකට කලිනුත්, තවමත් මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ටවත් අවබෝධයක් නැහැ. එම නිසා මේ රටේ මූලික නීතිය හදද්දී, අඩු තරමින් 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හදද්දී සිදු වුණු ඒ සංවාදයවත් වෙලා නැහැ. එම නිසා අපි හිතනවා, මේ රටේ ජනතාව පිළිබඳව තීන්දු ගන්න ව්‍යවස්ථාවක් සමඟ මේ විධියට සෙල්ලම් කිරීම ඉතා බරපතළ ප්‍රශ්නයක් කියා. මුලින් කිව්වා වාගේ තවමත් එළියේ සාකච්ඡා වෙනවා අර වගන්තිය මොකක්ද? මේ වගන්තිය මොකක්ද? කොහොමද සංශෝධනය කරන්නේ කියා. මේ රටේ ජනතාව දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන "හොඳයි, හොඳයි" කියනවා. හැබැයි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන්නේ මොකක්ද කියා කාටවත් හරි අවබෝධයකුත් නැහැ.

එම නිසා අන්තිමට කවුරුත් එකතු වෙලා අශ්වයෙක් හදන්න ගිහිල්ලා මොකක්ද වෙන්නේ? බූරුවෙක් හදනවා. හදපු එක මොකක්ද කියා මේක හදන්න මැදිහත් වුණු අයවත් අන්තිමට දන්නේ නැහැ. එම නිසා මේ අවස්ථාවේදී ඒ කාරණය මතු කරන්න ඕනෑ. අඩු ගණනේ මීට පස්සේවත් මේ රටේ ව්‍යවස්ථාවක්, පනතක් හදද්දී මීට වඩා පුළුල් මහජන සංවාදයක යෙදෙන්න ඕනෑ කියන යෝජනාව අපි කරනවා. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මේ සංශෝධනය ගෙනෙනකොට හුඟක් අය අත හරින කතාවක් තිබෙනවා. ලිබරල්වාදීන් විතරක් නොවෙයි; වාමාංශික අයත් අත හරින කතාවක් තිබෙනවා. මොකක්ද? ඇයි, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආවේ? 1978 ඒකාධිපති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ආවේ ඇයි? මෙතරම් බලසම්පන්න ව්‍යවස්ථාවක් ආවේ ඇයි? එදා ආර්ථික ක්‍රමයක්, ආර්ථික සැලැස්මක් ආවා. බහුතර ජනතාවක් පීඩාවට පත් කරන වෙළෙඳ පොළ ආර්ථිකය පවත්වා ගෙන යන්න නම් මේ රටේ ජනතාව හසුරුවන බලය තනි පුද්ගලයෙක් අතේ තියා ගන්න ඕනෑ, ශක්තිමත් බලයක් තියා ගන්න ඕනෑ. ඒක මේ ගරු සභාවේ කියවෙන විධියට සංවර්ධනය පැත්තට නොවෙයි, ජනතාව පීඩාවට පත් කරන පැත්තටයි තිබුණේ.

අන්න ඒ සඳහා අවශ්‍ය බලය තමයි හදා ගත්තේ. ඒ බලය ක්‍රියාත්මක වෙනකොට, ඒ ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වෙනකොට, ඒකට විරුද්ධව ජනතාව නැඟිටිනකොට මර්දනය කරන්න තමයි මේ බලය අවශ්‍ය වුණේ. එම නිසා අපි විශ්වාස කරනවා, මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් විතරක් මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණු වෙනස කරන්න බැහැ කියා. මේ ආර්ථිකය ඇතුළේ ඒ කරපු ප්‍රතිසංස්කරණ, ඒ කළ වෙනස්කම් තවදුරටත් ඉදිරියට යනවා නම්, රනිල්-මෛත්‍රී පාලනය ඇතුළේ ඒක යනවා නම්, එය මර්දනය කිරීමේ වුවමනාව නැති වෙන්නේ නැහැ. එම නිසා මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පමණක් ඒක කරන්න බැහැ. ඒ නිසාම තමයි මේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් මොකක්ද කරන්නේ? පසු ගිය කාලයේ පැවැති සාකච්ඡා අනුව බලතල අහෝසි වෙනවා ද? බලතල අහෝසි කරන්න බැහැ, කරන්නේ නැහැ. ඇයි? මේ පවත්වා ගෙන යන්නේත් ඒ ආර්ථික රටාවමයි. අපි දැක්කා 1980 වර්ජනය කළා, 1982 ධවල පත්‍රිකාව ගෙනාවා. ඊළඟට, පෞද්ගලික විශ්වවිද්‍යාල ගෙනාවා. 1983 පක්ෂ තහනම් කළා. 1980 අග භාගයේ මේ රටේ තරුණ පරම්පරාව සංහාරයක් කළා, මර්දනය කළා. ඒ සියල්ල කළේ ඒ ආර්ථිකයේ වුවමනාව වෙනුවෙන් විධායක බලතල පාවිච්චි කර තමයි. ඒ වුවමනාව අහෝසි වනතුරු විධායක බලතල අහෝසි කරන්න බැහැ. අහෝසි කරන්න මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත්, රනිල් වික්‍රමසිංහ මැතිතුමාත්, මේ පාලකයිනුත් එකඟ වෙන්නේ නැහැ.

පසුගිය ජනාධිපතිවරණයේදී මොකක්ද කිව්වේ? පොදු අපේක්ෂකයෙක් හෙව්වා, විධායකය අහෝසි කරන්න. හැබැයි, පොදු අපේක්ෂකයා ලැබුණාට පස්සේ කිව්වේ, "විධායකය අහෝසි කරන්න නොවෙයි. විධායකය සංශෝධනය කරන්න." කියලයි.

පුරවැසියා ශක්තිමත් කරනවා කියායි කිව්වේ. ඊට පස්සේ මොකද කළේ? විධායකය අහෝසි කරනවා කියා විධායකය අහෝසි කරනවා වෙනුවට විධායකය සංශෝධනය කරන්න පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ගෙනාවා. ඒකත් එහෙන් මෙහෙන් දාලා, සම්බෝල කර අන්තිමට සම්මත වෙන්නේ විධායකය අහෝසි වන එකක්ද? නැහැ. ඒකාධිපති බලතල අහෝසි වනවා ද? නැහැ. ඇත්ත වශයෙන්ම වෙන්නේ මොකක්ද? දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි වීමයි. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට එහා දෙයක් මේකේ අහෝසි වනවා නම් ඒ ඉතාම සුළු ප්‍රමාණයයි. ජනාධිපතිවරයාට තිබෙන පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය අවුරුදු හතරහමාරක් දක්වා යනවා. නිල කාලය අවුරුදු පහක් වනවා. ඊට අමතරව වෙන්නේ දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි වීම විතරයි. විධායක බලය අහෝසි වෙලා නැහැ. දැන් විධායක බලය අහෝසි නොවනවා විතරක් නොවෙයි, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා එක පක්ෂයකට තනි බලයක් හැදෙනකොට මොකක්ද වෙන්නේ? ජේ.ආර්. ජයවර්ධන මහත්මයා විධායක බලයත් සමඟ හයෙන් පහක බලයක් තියා ගත්ත විධියට තවත් ශක්තිමත් පාලනයක් හැදෙනවා. දැන් ඒක තමයි හැදෙන්නේ. ඒක මේ වැඩේ ඉස්සරහට ගෙන යන්න හොඳයි. සෝභිත හාමුදුරුවෝ කිව්වේ, ජනතා විමුක්ති පෙරමුණ කිව්වේ විධායක බලය අහෝසි කරන්න කියායි. ජනාධිපතිවරයා උසාවියට ගෙනෙන්න පුළුවන් වෙන්න ඕනෑයි කිව්වා. ජනාධිපතිවරයාට ඕනෑම ඇමතිකමක් දරන්න තිබෙන අයිතිය, අමාත්‍යාංශ පවරා ගන්න තිබෙන අයිතිය අහෝසි කරන්න කිව්වා. මා අහනවා, මේ ව්‍යවස්ථා සංශෝධනයේ ඒක තිබෙනවාද කියා.

දැන් සමහරු කියනවා, මේ ව්‍යවස්ථා සංශෝධනයෙන් ජනාධිපතිවරයාට එරෙහිව නඩු පවරන්න පුළුවන් කියලා. මේකේ තිබෙන විධියට ජනාධිපතිවරයාට එරෙහිව නඩු පවරන්න පුළුවන්

වන්නේ මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් විතරයි. ඒත් ජනාධිපතිවරයා ගෙන්වන්න බැහැ. ගෙන්වන්න පුළුවන් නීතිපතිවරයායි. ඒ නිසා නීති මුක්තිය තිබෙනවා. නීති මුක්තිය තිබුණු විධියටම තිබෙනවා. දැන් බලන්න, චම්පික රණවක ඇමතිතුමා කිව්වා වාගේ රජයේ ප්‍රධානයා, විධායකයේ ප්‍රධානයා, ආණ්ඩුවේ ප්‍රධානයා ජනාධිපතිවරයායි. කලින් එකමයි. 30වන ව්‍යවස්ථාවමයි. පාර්ලිමේන්තුවේ වාර අවසාන කිරීමේ බලය, පාර්ලිමේන්තුව ඕනෑම වෙලාවක වහන්න බලය ජනාධිපතිවරයාට තිබෙනවා. දෝෂාභියෝගය වෙලාවේ ප්‍රේමදාස මහත්මයා කළේ ඒ බලය පාවිච්චි කළ එකයි. ඒක තිබෙනවා. වහන්න පුළුවන්, අරින්න පුළුවන්. ඒ බලයත් තිබෙනවා.

35.(1) වගන්තිය අනුව ජනාධිපතිවරයාට එරෙහිව නඩු පවරන්න බැහැ. මා මේ වෙලාවේ වගන්ති උධෘත කර දක්වන්නේ නැහැ . දැන් සමහරු කියනවා, නඩු පවරන්න පුළුවන් කියා. එකම කාරණයකදී විතරයි නඩු පවරන්න පුළුවන්. ඊළඟට, ඇමතිවරු සියයක් දක්වා පත් කරන්න පුළුවන්. 27 වැනි පිටුව බලන්න. ජාතික ආණ්ඩුවක් ප්‍රකාශයට පත් කර ඇමතිවරු සියයක් පත් කරන්න පුළුවන්. ඊළඟට අමාත්‍යාංශ ලේකම්වරු ඔක්කෝම පත් කරන්නේ ජනාධිපතිවරයායි.

ඊළඟට, 73වැනි පිටුව බලන්න. එහි සඳහන් වන ආකාරයට ජනාධිපතිවරයාට ඕනෑම අමාත්‍යාංශයක් දරන්න පුළුවන්. මහවැලිය විශේෂයෙන් මෙතුමාට දරන්න පුළුවන්. ඉතින්, මේ ව්‍යවස්ථාවේ මොකක්ද වෙනස් වෙලා තිබෙන්නේ? දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ආපසු අහෝසි වෙලා තිබෙනවා. විධායක බලය අහෝසි වෙලා නැහැ. ඒ නිසා ජනාධිපතිවරයාට ඕනෑම වෙලාවක ඕනෑම අමාත්‍යාංශයක බලය දරන්න පුළුවන්. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාට තිබුණු එක විවේචනයක් ඒක. අමාත්‍යාංශ ගණනක් දරාගෙන හිටියා, වැදගත්ම අමාත්‍යාංශ ජනාධිපතිවරයා දරාගෙන හිටියා කියන එක. ඒවා විවේචනය කරපු උදවිය අද කථා කරන්නේ නැහැ. ඒ අයට මේක පෙනෙන්නේ නැහැ. ඒ නිසා මේ රටේ මෛත්‍රීපාල ජනාධිපතිවරයාත්, මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාත් පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි තිබෙන්නේ. කවුරු හෝ ජනාධිපතිවරයකු වුණොත් මේ රටේ ව්‍යවස්ථාවේ ඔහුට තිබෙන ඒකාධිපති බලතල අහෝසි වෙලා නැහැ. ඒ නිසා භයානක දත් තිස් දෙකක් තිබෙනවා නම්, දත් දෙකක් ගැලෙව්වා කියා සන්තෝෂ වන්න බැහැ. දැන් කරන්නේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ගෙනැල්ලා ඊට පස්සේ -මේ දෙක එකට බලන්න ඕනෑ.- තවත් තිබෙන දත් දෙකක් විතර ගලවා ඉතිරි ඔක්කෝම උල් කරන එකයි. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරන්න කියා කවුරුත් කියනවා. මේක ගැන හරි අවබෝධයක් නැහැ. මොකක් හෝ කොළ කැල්ලක් සම්මත කරගෙන, අන්න අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කළා කියා සතුටු වන්න පුළුවන් නම්, මා හිතනවා මේ රටේ ජනතාවට කරන ලොකුම ද්‍රෝහීකම ඒකයි කියා.

1978 ඉඳලා අවුරුදු ගණනක් තිස්සේ පීඩාවට පත් වුණු මේ රටේ පීඩිත පන්තියේ ගොවි කම්කරු ජනතාව, ඒ වෙලාවේ විපක්ෂයේ හිටපු බලවේග මේකෙන් බැට කෑවා. ආණ්ඩුවේ ඉන්න අය මේක පාවිච්චි කළා. විපක්ෂයේ ඉන්න අය බැට කෑවා; අනෙකුත් පීඩිත බලවේග බැට කෑවා. මේ විධායක ක්‍රමයෙන් පීඩාවට පත් වුණු සියලු බලවේගවල පසු ගිය කාලයේ බලාපොරොත්තුව වුණේ විධායක ජනාධිපති ක්‍රමය සම්පූර්ණයෙන් අහෝසි කරන එකයි. හැබැයි, මේ කරන්නේ මොකක්ද? දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කියා කථා පවත්වලා, පවත්වලා විධායක බලතලවලින් ඉතාම සොච්චමක් අයින් කර තිබෙනවා. මහ කැලෑවක් අයින් කරනවා කියා තුත්තිරි ගහක් අයින් කරනවා වාගේ වැඩක් වෙලා තිබෙන්නේ.

අර මා කලින් කිව්වා වාගේ කවුරුත් එකතු වෙලා අශ්වයෙක් හදනවා කියා, අන්තිමට තේරුම් ගන්නත් බැරි තරමට, කියවා ගන්නත් බැරි තරමට සංශෝධන දාලා අශ්වයකු වෙනුවට බූරුවකු හදලා තිබෙනවා. ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර කාරණාවලදී ඒ වෙච්ච දේ හොඳයි. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබුණු ඒවා ආපසු ඇවිල්ලා ජනාධිපතිවරයාට දෙවරකට වඩා තරග කරන්න බැහැ කියන එක ඇවිල්ලා ඒ වුණු සංශෝධන හොඳයි. හැබැයි, රටේ ජනතාව ඉල්ලුවේ ඒක නොවෙයි. සෝභිත හාමුදුරුවන් කිව්වේ මේක නොවෙයි. ජනතා විමුක්ති පෙරමුණ කිව්වේ මේක නොවෙයි. අපි කිව්වේ මේක නොවෙයි. වේදිකාවල කිව්වේ මේක නොවෙයි. කිව්ව එකට වඩා ඉතාම පටු වෙච්ච එකක් ගෙනැල්ලා තිබෙනවා. පටු වුණු එකක් ගෙනැල්ලා කියනවා, මේක තමයි සුපිරි එක කියා. ඒක වැරදියි.

ඒ නිසා ඇත්තටම මාදුළුවාවේ සෝභිත හාමුදුරුවෝ උපවාස කරන්න ඕනෑ, මේක කරන්න කියලා නොවෙයි; කරනවාය කියා කිව්ව එක කරන්න කියලායි; විධායක ජනාධිපති ක්‍රමය සම්පූර්ණයෙන් අහෝසි කරන්න කියලායි. ඒ නිසා ඒ වංචාව කරන්න හොඳ නැහැ. අකුරු දන්නේ නැති එක හරි, මේක කියවන්නේ නැති එක හරි, තේරෙන්නේ නැති එක හරි නොවෙයි වෙලා තිබෙන්නේ. මේ ආණ්ඩුවත් එක්ක මේ දීගෙ යන්න ඕනෑ නිසා, එහෙම ඒ දීගෙ ගෙන යාමට හේතුවක් හදා ගන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව කොච්චර වෙලාවක් තිබෙනවාද?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
විනාඩියක් තිබෙනවා.

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)
හුඟක් අය මේ ආණ්ඩුවත් එක්ක එකට යන්න හේතුවක් හදා ගන්නවා, මේක තමයි හොඳම එක, සුපිරි එක කියලා. ඒක එහෙම නොවෙයි. ඒ බොරුව කරන්න එපා. ඒක තමයි ලොකුම ද්‍රෝහීකම. ජනතාව බලාපොරොත්තු වුණු, ජනතාව ඉල්ලූ ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන්නේ නැතිව බොරු සංශෝධනයක් ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම ජනාධිපතිතුමාට මේ ගැන වුවමනාවක් තිබෙනවාද? නැහැ. විධායකය අහෝසි කරන්න එතුමාට වුවමනාවක් තිබෙනවා නම් එතුමාට පුළුවන්කමක් තිබෙනවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හසුරුවන්න. අද මේ ආණ්ඩුවේ එකම කැබිනට් එකේ ඉන්න අය රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා කියනවාට වඩා සම්පූර්ණ විරුද්ධ කථාවක් මෙතැන කියන්නේ ජනාධිපතිතුමා නොදැනය කියා අප හිතන්නේ නැහැ. ඇත්තෙන්ම එතුමන්ලා දෙපළටම විධායක බලය අහෝසි කිරීමේ වුවමනාවක් නැහැ. මේ රටේ ජනතාවට තිබෙන වුවමනාව එතුමන්ලාට නැහැ. මොකද, විධායක බලයෙන් පීඩාවට පත් වුණේ ජනතාවයි; වැඩ ගත්තේ මේ ගොල්ලන්. ඒ නිසා ඒ කාරණයත් මතක් කරන්න ඕනෑ. ඒ වාගේම මේ අය ජනතාව රවටා තිබෙනවා; ජනතාව වංචා කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම තවත් කාරණයක් තිබෙනවා. ආණ්ඩුවත්, විපක්ෂයත් කියන කණ්ඩායම් දෙකම ජාතිවාදී පදනමෙන් මේකට විරුද්ධ වෙන එක ගැන අපි විරුද්ධයි. හැබැයි, ආණ්ඩුවේ ඉඳගෙන ජාතිවාදී පදනමෙන් කථා කරනකොට ඒක දකින්නේ නැතිව, විපක්ෂයේ අය කථා කරන ජාතිවාදය විතරක් දකින්න එපාය කියා ආණ්ඩුව පැත්තේ ඉන්න අයටත් මම මේ අවස්ථාවේදී මතක් කරනවා. විශේෂයෙන් මේ රටට අවශ්‍ය වෙලා තිබෙන්නේ, ජනතාවට බලය හැදෙන, ජනතාව ශක්තිමත් වෙන ව්‍යවස්ථාවක්. මේකෙදි එහෙම එකක්

[ගරු අජිත් කුමාර මහතා]

වෙන්නේ නැහැ. ඒ නිසා ඒ ගහපු පම්පෝරි මොකුත් නැහැ. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයයි කියා එකක් සම්මත කරනවා. ඖෂධ පනත ගැන කථා කරනකොට සේනක බිබිලේ ප්‍රතිපත්තියයි කියා කියලා, සේනක බිබිලේ ප්‍රතිපත්තියට සම්පූර්ණයෙන්ම පටහැනි එකක් සම්මත කළා වාගේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් සම්මත කර ගත්තාට පසුව විධායක බලය තවත් ශක්තිමත් වෙනවා. ඒ නිසා මම මේ රටේ ජනතාවට කියනවා, ඔබ බලාපොරොත්තු වුණු, ඔබ පීඩාවට පත් වුණු, විධායක ජනාධිපති ධුරය මේකෙන් අහෝසි වෙන්නේ නැහැ, ඉතාම සුළු සංශෝධනයක් පමණයි වෙන්නේ කියලා. ඒ වාගේම ඊට වඩා වෙනස්, පුළුල් ව්‍යවස්ථාවක් හදන්න මේ රටේ ජනතාව එකතු වෙන්න ඕනෑය කියන එකත් මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. මේක හරියට ගමරාළගේ තුවක්කුව වාගෙයි. ගමරාළගේ තුවක්කුවෙන් කිසි වැඩක් නැහැ. කොටනවා, කොටනවා, පත්තු වෙන්නේ නැහැ. ඒ වාගේ මේක පත්තු වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා මේක දේශපාලන ඉතිහාසයේ මහා බරපතළ, ඉතා වැදගත් පියවරක්ය කියා කියනවා නම් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවය කියා එකක් සම්මත වුණා විතරයි, ඒකෙන් මහා දැවැන්ත පරිවර්තනයක් වෙන්නේ නැහැ කියා මම කියනවා. ජනතාව අපේක්ෂා කළ පරිවර්තනය ගෙනෙන්නේ කවදාද කියන එකත් මම මේ සභාවෙන් අහනවා. ඇත්තෙන්ම ඔබතුමන්ලා විධායක බලය අහෝසි කරන්නේ කවදාද? එසේ අහෝසි කරන වෙලාවට මහජන සම්මුතියකට ඇවිල්ලා, මහජනතාව එක්ක සාකච්ඡා කරලා, පුවත් පත්වල පළ කරලා, වෙබ් අඩවිවල පළ කරලා, මීට වඩා පුළුල් සංවාදයක් කරලා ජනතාවගේ සැබෑ ජනසම්මතවාදී ව්‍යවස්ථාවක් සම්මත කර ගන්නය කියා මේ රටේ ජනතාවට ආරාධනා කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

[பி.ப. 5.29]

**ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)**

(மாண்புமிகு முருகேசு சந்திரகுமார் - குழுக்களின் பிரதித் தவிசாளர்)

(The Hon. Murugesu Chandrakumar - Deputy Chairman of Committees)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, அரசியலமைப்புக்கான பத்தொன்பதாம் திருத்தச் சட்டமூலம் தொடர்பான விவாதத்தில் கலந்துகொள்வதற்கு எனக்கும் சந்தர்ப்பம் தந்தமைக்காக நன்றி தெரிவிக்கின்றேன். இலங்கையிலே மிகவும் முக்கியத்துவம் வாய்ந்த, மக்கள் மிகவும் எதிர்பார்ப்புடன் காத்திருக்கும் அரசியலமைப்புக்கான பத்தொன்பதாம் திருத்தச் சட்டமூலம் இன்னும் அரைமணி நேரத்திலே நிறைவேற்றப்பட இருக்கின்றது என்று நான் நினைக்கின்றேன். ஆனால், எதிர்க்கட்சிகளினால் கொண்டு வரப்படவிருக்கும் முன்மொழிவுகள் ஏற்றுக்கொள்ளப்படு மிடத்து, இது வெற்றிகரமாக நிறைவேறும் என்ற நிலைமை தான் இப்பொழுது காணப்படுகின்றது. எல்லோருடைய கருத்துக்கும் முக்கியத்துவம் அளிக்கப்பட்டு இந்தத் திருத்தச் சட்டமூலம் நிறைவேற்றப்பட வேண்டும் என்பதுதான் எங்களுடைய விருப்பமாக இருக்கின்றது. அரசியலமைப் புக்கான திருத்தச் சட்டமூலங்கள் மக்களுக்கும் நாட்டுக்கும் பயனுடையதாக வரும்போதுதான் நாம் முழுமையான மனதோடு அவற்றினை ஆதரிப்போம். அந்த வகையில் இந்தச் சட்டமூலத்தைச் சில திருத்தங்களுடன் நாங்கள் ஏற்றுக்கொள்ள அல்லது ஆதரிக்கத் தயாராகவே இருக்கின்றோம்.

அதேவேளை, இந்த நாட்டிலுள்ள இன்னும் பல பிரச்சினைகளுக்குத் தீர்வு காண்பதற்காகப் பொருத்தமான சட்டமூலங்களை உருவாக்க வேண்டியுள்ளது. இலங்கை பல்லினச் சமூகங்கள் வாழும் ஒரு நாடு என்ற வகையில் ஜனநாயகத்தையும் சமநீதியையும் சரியாக நெறிப்படுத்தக் கூடிய சட்டமூலங்கள் உருவாக்கப்பட வேண்டும். அவை உரிய முறையில் நடைமுறைப்படுத்தப்பட வேண்டும். குறிப்பாக, சிறுபான்மைச் சமூகங்களின் பாதுகாப்பை உறுதிப்படுத்துகின்ற, அவர்களின் உணர்வுகளையும் அவர்களுடைய அடிப்படை உரிமைகளையும் மதிக்கின்ற, உத்தரவாதப்படுத்துகின்ற வகையில் இந்தச் சட்டமூலங்கள் அமைய வேண்டும். குறிப்பாக அரசியலமைப்புக்கான பத்தொன்பதாம் திருத்தச் சட்டமூலத்திலே அரசியலமைப்புப் பேரவையில் பன்முகத்தன்மை இருக்க வேண்டும் என்ற வரிதான் குறிப்பிடப்பட்டிருக்கின்றதே தவிர, பன்முகத்தன்மை என்ற பதத்துக்கான அர்த்தம் விரிவாக்கப்படவில்லை. குறிப்பாக, சிறுபான்மைச் சமூகங்களின் பிரதிநிதித்துவம் உறுதிப்படுத்தப்படவில்லை. இந்த அரசியலமைப்புப் பேரவை கிட்டத்தட்ட 11 ஆணைக்குழுக்களை நியமிக்கப்போகின்றது. அதேநேரம் அந்த 11 ஆணைக்குழுக்களின் தலைவர்கள் மற்றும் உறுப்பினர்களை அரசியலமைப்புப் பேரவைதான் தீர்மானிக்கப்போகின்றது. அந்தப் பேரவையில் தமிழ் பேசும் மக்களின் பிரதிநிதித்துவம் உறுதிப்படுத்தப்படாத பட்சத்தில், அந்த ஆணைக்குழுக்கள் தமிழ் மக்களின் அல்லது முஸ்லிம் மக்களின் நலன்சார்ந்த விடயங்களில் எந்தளவு அக்கறை செலுத்தும் என்பது கேள்விக்குறியாக இருக்கின்றது.

அந்தவகையில்தான் ஐக்கிய மக்கள் சுதந்திரக் கூட்டமைப்பும் எங்களது கட்சியும் இணைந்து இந்த பன்முகத்தன்மை என்ற பதத்தை மாற்றி இன விகிதாசார அடிப்படையில் அதற்குப் பிரதிநிதித்துவம் வழங்க வேண்டுமென்று நாங்கள் வலியுறுத்துகின்றோம். திருத்தங்களுக்கான முன்மொழிவுகளில் அது சேர்க்கப்பட வேண்டுமென்ற பரிந்துரை இன்று குழுநிலையிலே ஏற்றுக்கொள்ளப்படவேண்டுமென்பதையும் நான் இங்கு வலியுறுத்துகின்றேன். பொதுவாக 11 ஆணைக்குழுக்கள் சுயாதீனமாக உறுதிப்படுத்தப்படுவதை நாங்கள் ஏற்றுக் கொள்கின்றோம். இருந்தபோதிலும், அந்த சுயாதீனம் என்பதன்மூலம் சிறுபான்மைச் சமுகங்களுக்கு உரிய அந்தஸ்து வழங்கப்படாமல் இருப்பதை நாங்கள் ஏற்றுக்கொள்ள முடியாது. ஏனென்றால் இப்படி அரசியலமைப்புத் திருத்தச் சட்டமூலங்கள் ஒவ்வொரு மாதத்துக்குமோ அல்லது ஒவ்வொரு வருடத்துக்குமோ சமர்ப்பிக்கப்படுவதில்லை. 18வது திருத்தச் சட்டம் பல விமர்சனங்களுக்கு உள்ளாக்கப்பட்டிருப்பதால் அது தொடர்பாகவே 19வது திருத்தச் சட்டமூலம் சமர்ப்பிக்க வேண்டிய அவசியம் உணரப்பட்டிருக்கின்றது. ஆகவே, அதனைச் சமர்ப்பிக்கும்போது அதற்குச் சரியான அர்த்தங்கள் இருந்தால்தான் அது எல்லா மக்களுக்கும் சம நீதியான ஓர் ஏற்பாட்டை வழங்கும் என்பதை நான் இங்கு தெரிவிக்க விரும்புகின்றேன்.

மேலும், 19வது அரசியலமைப்புத் திருத்தச் சட்டமூலத்துக்கு எங்களது கட்சி சார்பாக மாண்புமிகு டக்ளஸ் தேவானந்தா அவர்கள் இன்று குழுநிலையிலே சில திருத்தங்களை முன்மொழிய இருக்கின்றார். குறிப்பாக, இன மற்றும் மத நல்லிணக்கத்தைப் பேணுவதற்கான ஓர் ஆணைக்குழுவொன்றை அமைக்க வேண்டுமென்று அவர் வலியுறுத்த இருக்கின்றார். ஏனென்றால் இன நல்லிணக்கம் சம்பந்தமாக சட்டரீதியான ஓர் ஏற்பாடு எங்களுக்கு இருக்கும்போதுதான் பாதிக்கப்பட்டவர்கள் அதற்கூடாகத் தங்களுக்குரிய நியாயங்களைப் பெறமுடியும்.

இந்த ஆணைக்குழுக்கள் பாராளுமன்றத்துக்கு பொறுப்புக் கூறக்கூடிய ஆணைக்குழுக்களாக அமைவது முக்கியமானது. அந்த வகையில், பாராளுமன்ற உறுப்பினர்களை அதிகமாகக் கொண்ட அரசியலமைப்புப் பேரவை உருவாக்கப்பட வேண்டுமென்று இப்போது வலியுறுத்தப்பட்டிருக்கின்றது. வெறுமனே பாராளுமன்றத்துக்கு வெளியே இருக்கும் அதிகாரிகளை வைத்துக்கொண்டு இந்த அரசியலமைப்புப் பேரவை உருவாக்கப்படுவதால் எல்லா மக்களையும் நீதியான, நியாயமான அடிப்படையில் பார்க்கும் நிலைமைகள் இல்லாமல் போய்விடும். அதை வலியுறுத்தித்தான் ஐக்கிய மக்கள் சுதந்திரக் கூட்டமைப்பு இன்றைய அரசுடன் இணக்கப்பாட்டுக்கு வருவதற்காக பேசிக்கொண்டிருக்கின்றது. ஆகவே, இந்த இணக்கப்பாடு நீதியான முறையில் எட்டப்பட வேண்டுமென்பதை நான் இங்கு வலியுறுத்துகின்றேன்.

19ஆவது திருத்தச் சட்டமூலத்தை நிறைவேற்றியதன் பின்பு இருபதாவது திருத்தச் சட்டமூலமும் சமர்ப்பிக்கப்பட விருக்கின்றது. இந்த நாட்டின் தேர்தல் முறைமையிலே மாற்றத்தைக் கொண்டுவருவது தொடர்பான இருபதாவது திருத்தச் சட்டமூலத்துக்கு பல முன்மொழிவுகள் செய்யப் பட்டிருக்கின்றன. அவற்றில் பெரும்பான்மையானவை இரு பெரும் கட்சிகளின் நலன் சார்ந்த விடயமாக இருப்பதை நாங்கள் பார்க்கின்றோம். நாட்டிலே இருக்கின்ற சிறுபான்மை மற்றும் சிறிய கட்சிகள் ஒன்றிணைந்து அண்மையில் ஒரு தீர்மானத்தை மேற்கொண்டன. அந்தத் தீர்மானத்தின் அடிப்படையில் தயாரிக்கப்பட்ட வரைபை அரசின் தலைவரான ஜனாதிபதி அவர்களுக்கும் பிரதமர், சபாநாயகர், எதிர்க்கட்சித் தலைவர் ஆகியோருக்கும் வழங்கவிருக்கிறோம். அந்த முன்மொழிவுகள் சிறுபான்மை மற்றும் சிறிய கட்சிகளின் பிரதிநிதித்துவத்தை உறுதிப்படுத்தக்கூடிய வகையிலான ஒரு தேர்தல் முறைமை என்பதை நான் இச்சந்தர்ப்பத்தில் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன். ஏனென்றால், உண்மையாகவே ஜனநாயகம் பேணப்பட வேண்டுமாயின் எல்லா இனங்களுக்கும் சமனாக - அவர்களுடைய இன விகிதாசாரத்துக்கேற்ப - பிரதிநிதித்துவம் வழங்கப்பட வேண்டும். தேர்தல் முறைமை தொடர்பாக இரு பெரிய கட்சிகளும் தத்தமது நலன்களை அடிப்படையாகக் கொண்டு சிந்தித்து தங்களது பிரதிநிதித்துவத்தை உறுதிப்படுத்துவதில் குறியாய் இருக்கும்பொழுது இங்கு சிறுபான்மை மற்றும் சிறிய கட்சிகளின் பிரதிநிதித்துவம் கேள்விக்குறியாகி விடும். அந்த வகையில், சிறுபான்மை மற்றும் சிறிய கட்சிகளின் நலன்கள், அபிலாஷைகள் ஏற்றுக்கொள்ளப்பட்டு கொண்டுவரப்படும் இருபதாவது திருத்தச் சட்டமூலத்தைத்தான் அக்கட்சிகள் ஆதரிக்கும் என்பதை நாங்கள் இச்சந்தர்ப்பத்தில் வலியுறுத்துகின்றோம்.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, you are left with two more minutes.

**ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා**
(மாண்புமிகு முருகேசு சந்திரகுமார் )
(The Hon. Murugesu Chandrakumar)

ஏற்கெனவே, சிறுபான்மை இன மற்றும் சிறிய கட்சிகளைச் சார்ந்த எழுபதுக்கும் மேற்பட்ட பாராளுமன்ற உறுப்பினர்கள் இந்த அவையிலே அங்கம் வகிக்கின்றார்கள். அவர்களின் எதிர்ப்பை மீறி, அவர்களின் உடன்பாடில்லாமல் தேர்தல் முறைமை தொடர்பான எந்தவொரு திருத்தச் சட்டமூலத்தையும் இந்த பாராளுமன்றத்திலே நிறைவேற்ற முடியாதென்பதை நான் ஆணித்தரமாக இங்கு தெரிவிக்க விரும்புகின்றேன்.

இந்த 19வது திருத்தச் சட்டமூலத்தின்படி நாங்கள் ஜனாதிபதிக்குரிய அதிகாரங்களைக் குறைக்கின்றோம். கடந்த காலங்களில் இருந்த ஜனாதிபதிகள் நிறைவேற்று அதிகார ஜனாதிபதி முறைமையை ஒழிப்பதாக வாக்குறுதி அளித்தே அந்தப் பதவிக்கு வந்தபோதும் அந்த அதிகாரங்களைக் குறைக்க ஒருவரும் முன்வரவில்லை. தற்போது மேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்கள் தனது அதிகாரங்களைப் பாராளுமன்றத்துக்கு கையளிக்கும் பெருந்தன்மையான முடிவெடுத்திருப்பதை நான் இந்தச் சபையிலே வரவேற்கின்றேன். தேர்தல் முறைமை தொடர்பான திருத்தச் சட்டமூலங்களாக இருந்தாலென்ன, அரசியலமைப்புக்கான வேறெந்தத் திருத்தச் சட்டமூலங்களாக இருந்தாலென்ன, அவற்றை வரைவோர் - திருத்தம் செய்வோர் சிறுபான்மைச் சமுகங்களின் நலன்கள் தொடர்பாகவும் அக்கறையுடன் செயற்பட்டு அந்த விடயத்தை மேற்கொள்ள வேண்டுமென்று நான் கேட்டுக்கொள்கின்றேன்.

கடந்த தேர்தல் காலத்தில் இந்த 19 ஆவது திருத்தச் சட்டமூலத்தை வரைவது தொடர்பாக தமிழ்த் தேசியக் கூட்டமைப்பின் பாராளுமன்ற உறுப்பினர் சுமந்திரன் அவர்கள் முக்கிய பங்கு வகித்தாரென்று சொல்லப்படுகின்றது. ஆனால், இந்தச் சட்டத் திருத்தம் பற்றிய முன்மொழிவில் சிறுபான்மைச் சமூகங்களின் நலன்கள் மற்றும் அவர்களது உரிய பிரதிநிதித்துவம் பேணப்படாமல் விடுபட்டிருக்கின்றன. ஆகவே, இதுபோன்ற சிறுபான்மை மக்களுக்குக் குந்தகம் விளைவிக்கும் திருத்தச் சட்டமூலங்களில் தங்களது காத்திரமான பங்களிப்பை அவர்கள் செலுத்தாது வெளியே நிற்பது மிகவும் கவலைக்குரியதாக இருக்கின்றது. ஆகவே, இதுபோன்ற திருத்தச் சட்டங்களில் சிறுபான்மை மக்களின் நலன்கள் பேணப்படுவது முக்கியமானது. கடந்த அரசாங்க காலத்தில் ஆட்சியுரிமை (விசேட ஏற்பாடுகள்) சட்டமூலம் கொண்டுவரப்பட்டபோதும் அதே உறுப்பினர் அவர்கள் தமிழ் மக்களின் நலன்களுக்கு எதிராகச் செயற்பட்டிருக்கின்றார். ஆகவே, அரசியலமைப்பு தொடர்பில் திறமையை வெளிப்படுத்தும் சட்டத்தரணிகளாகத் தங்களைக் காட்டிக் கொள்பவர்கள் குறித்த சந்தர்ப்பங்கள் வரும்பொழுது தங்களது சமூகம் சார்ந்த சிந்தனையுடன் செயற்பட வேண்டும் என்று கூறி, எனக்குச் சந்தர்ப்பம் அளித்தமைக்காக நன்றி தெரிவித்து, விடைபெறுகின்றேன். நன்றி, வணக்கம்.

[අ.භා. 5.40]

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
නමෝ බුද්ධාය!

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම අතිශය වැදගත් ව්‍යවස්ථා වෙනස්කම පිළිබඳව සාකච්ඡා කරන වෙලාවේ ඒ ගැන වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වනවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතට සහයෝගය දක්වන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රතිපත්තිමය වශයෙන් එකඟ වෙලා තිබෙනවා. මේ පනත් කෙටුම්පතට සහයෝගය දක්වන පසු බිම මේකයි. ජනාධිපතිවරණයෙන් ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ලත් ජයග්‍රහණයෙන් පසු, එතුමා විසින් ජනතාවට ඉදිරිපත් කළ දින සියයේ වැඩසටහනේ එක පොරොන්දුවක් වන දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කෙටුම්පතක් හැටියට ඉදිරිපත් කරන බව කිව්වා. අපි එයට සහාය දෙන්න ප්‍රතිපත්තිමය එකඟතාවකට ආවා. හැබැයි, ඒ ප්‍රතිපත්තිමය එකඟතාවට ආපු සංශෝධන නොවෙයි, අප බලාපොරොත්තු වූ සංශෝධන නොවෙයි අපට බෙදා දුන් කඩදාසියේ තිබෙන්නේ.

[ගරු තිලංග සුමතිපාල මහතා]

මෙම පනත් කෙටුම්පත අධිකරණයට ඉදිරිපත් වුණාට පස්සේ, රජය අධිකරණයටත් තවත් සංශෝධන ඉදිරිපත් කළා. ඊටත් පස්සේ අපට මේ සභා ගර්භයේදී විවාද කරන්න ලියැවිල්ලක් දුන්නා. ඊයේත්, අදත් ඒ ගැන විවාද කරන්නට ලැබුණාට පස්සේ අපට පැහැදිලි අවබෝධයක් තිබෙනවා, "අපි මේ මොකක්ද අනුමත කරන්නේ" කියලා. එහිදී අප බොහොම සාධාරණ ඉල්ලීම් කීපයක් ඉදිරිපත් කළා.

මේ ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන වැදගත්ම කරුණ තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව. ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් කොමිෂන් සභා පත් කරනු ලබනවා. ඒ පත් කරන කොමිෂන් සභාවලින් තමයි ඉදිරියේ දී මේ රටේ වැදගත්ම කර්තව්‍යයන් ස්වාධීනව කරන්න බලාපොරොත්තු වන්නේ. ඒවා තමයි: The Election Commission, The Public Service Commission, The National Police Commission, The Audit Service Commission, The Human Rights Commission of Sri Lanka, The Commission to Investigate Allegations of Bribery or Corruption, The Finance Commission, The Delimitation Commission සහ The National Procurement Commission. මේ කොමිෂන් සභාවලට අමතරව The University Grants Commission එක හා The Official Languages Commission එක පත් කරනවා. මේ කොමිෂන් සභාවලට ස්වාධීනත්වය ලබා දීමේ පූර්ණ එකඟතාවකට අපි ආවා. හැබැයි, අපි බලාපොරොත්තු වුණා ජනාධිපතිවරයාගේ බලතල වෙනස් කිරීම සඳහා වෙනම ලියැවිල්ලකුත්, ස්වාධීන කොමිෂන් සභා සඳහා වෙනම ලියැවිල්ලකුත්, මැතිවරණ ක්‍රමය සංශෝධනය කිරීම සඳහා වෙනම ලියැවිල්ලකුත් මේ උත්තරීතර සභාවට ඉදිරිපත් කරයි කියලා. නමුත්, මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතින් යම් කිසි දුරකට ජනාධිපතිතුමාගේ බලතල අඩු කිරීමක් හා ස්වාධීන කොමිෂන් සභා පිහිටුවීමක් තමයි කෙරෙන්නේ.

මෙම පනත් කෙටුම්පත පිළිබඳව කතිකාවතක් ඇති කර ගැනීමේදී යම් නොසන්සුන්තාවක් ඇති වූ බව අපි පිළිගන්නවා. මෙහි දී අපි බලාපොරොත්තු වන්නේ, පාර්ලිමේන්තුව නියෝජනය කරන බහුතර මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත කමිටුවකින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ස්ථාපිත විය යුතුයි කියන එක. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සභාපති ලෙස කථානායකතුමා පත් වෙනවා. ගරු අගමැතිතුමා, විපක්ෂ නායකතුමා ඇතුළු ජනාධිපතිතුමා විසින් පත් කරන නියෝජිතයකුත්, තවත් පස් දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පත් වනවා. නමුත් අපි ඉල්ලා සිටියේ ඒ සභාවට මන්ත්‍රීවරුන්ගේ නියෝජනයක්ද අවශ්‍ය බවයි. බහුතර මන්ත්‍රීවරුන් පිරිසකගේ අවශ්‍යතාව අපි ඉදිරිපත් කළේ, ඒ කොමිෂන් සභාවලට පත් කරන උදවිය මේ ගරු පාර්ලිමේන්තුවට උත්තර බඳිනවාද, නැද්ද කියන ප්‍රශ්නය මත. ඒ කොමිෂන් සභාවලින් ඉදිරිපත් කරන වාර්තා ජනාධිපතිතුමාට දීමට හැකියාව තිබෙනවා. ඒත් අවුරුද්දකට සැරයක්. නමුත් අපි ඉල්ලා සිටියේ, අඩුම වශයෙන් මාස තුනකට සැරයක් සියලුම කොමිෂන් සභා විසින් ඒ අයගේ වාර්තා කථානායකතුමා තුළින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, ඒ වාර්තාවල අඩංගු දේ ගැන අපට සාකච්ඡා කරන්න, විවාද කරන්න අයිතිය ලබා දෙන්න කියලායි. මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ප්‍රජාතන්ත්‍රවාදී විධියට, වඩා හොඳට, බහුතර පිරිසකගේ නියෝජනය ඇති වන විධියට සම්මත කිරීම සඳහා වූ සංශෝධන තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඉදිරිපත් කළේ.

රජය මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම ගැන අපි සන්තෝෂ වනවා. රජය කාලෝචිතව මේ සංශෝධන පනත් කෙටුම්පත ඉදිරිපත් කළත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකත්වය සහිත බහුතර බලයක් තිබෙන එක්සත් ජනතා නිදහස් සන්ධානයේ සහයෝගය නැතිව මෙම පනත් කෙටුම්පත සම්මත කිරීමට බැරි බව හැමෝම දන්නවා. අපි මේ සංශෝධන ගැන කරුණු ඉදිරිපත් කළේ, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට සහයෝගය නොදී ඉන්න නොවෙයි. එසේ කළේ අපේ මතවාදය, අපේ අරමුණ, අපේ ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමටයි. නමුත් මම දැක්කේ නැහැ, කිසිම මන්ත්‍රීවරයෙක් කිසිම අවස්ථාවක විපක්ෂයෙන් ඉල්ලීමක් කරනවා; සහයෝගය ඉල්ලනවා, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සඳහා අපගේ සහයෝගය අත්‍යවශ්‍යයි කියලා. ඔවුන් හැම තිස්සේම කියා සිටියේ මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට සහයෝගය දෙන්න, ඡන්දය දෙන්න අපි බැඳිලා ඉන්නවා කියලායි. අතිගරු ජනාධිපතිතුමා පමණයි මෙම කර්තව්‍ය සඳහා පැහැදිලි ස්ථාවරයක සිටියේ. අපි එය සඳහන් කළ යුතුමයි. මොකද, යම් අය කියන්න උත්සාහ ගත්තා, "විධායක ජනාධිපති ධුරයේ බලතල අඩු කරලා මදි, ජනාධිපති ධුරයේ බලතල සම්පූර්ණයෙන්ම ඉවත් කරන්නට ඕනෑ, ඒවා කරලා නැහැ" කියලා මතයක් හදන්නට. එහෙම කරන්නට මේ දවස් 100 තුළ බැහැ. එහෙම නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් සමඟ, -සුප්‍රිම් උසාවියේ තීන්දුවකුත් තිබෙනවා.- ජනමත විචාරණයකට යන්නට ඕනෑ. ජනමත විචාරණයක් නැතිව ජනාධිපති ධුරයේ බලතල ඉවත් කරන්නට බැහැ. ඒ නිසා මේ කර්තව්‍යයේදී අපිට පැහැදිලිව පෙනෙනවා, අවංක උත්සාහයක් වර්තමාන ජනාධිපතිතුමා අරගෙන තිබෙනවා; ක්‍රියාත්මක කරලා තිබෙනවා; එය ඉදිරිපත් කරලා තිබෙනවා කියලා.

සුප්‍රිම් උසාවියේ තීරණයෙන් පසුව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය දේ දැන් අපේ සභා ගර්භයට ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා අපි පැහැදිලිවම කියන්නට ඕනෑ, මෙම කර්තව්‍යයේදී අපි ජනතා නියෝජිතයන් හැටියට දැක්ක අඩු පාඩුකමක් වූ, පාර්ලිමේන්තුවට තිබෙන අයිතිය, පාර්ලිමේන්තුවට ලබා දෙන්නට යන විධායකයේ තිබෙන බලය, තවත් තැනකට දෙන්න කලින් එය විමර්ශනය කිරීමේ හැකියාව, අවශ්‍යතාව ක්‍රියාත්මක කිරීම තමයි අපේ උත්සාහය කියන එක. ඒ නිසා ඒ අන්දමින් කටයුතු කළේ මේ ක්‍රියාදාමය කඩාකප්පල් කිරීමේ අදහසින් කරන දෙයක්ය කියලා කීම අසාධාරණයි; අයුක්තිසහගතයි. මොකද, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් අපි දිගින් දිගටම සාකච්ඡා කරලා, අවශ්‍ය පසු බිම හදලා, සහයෝගය දෙන්න එකඟ වුණා. ගිය සතියපුරාත් මේ වගන්තිවල වෙනස් කිරීම් පිළිබඳව අපට නොයෙකුත් අදහස් ඉදිරිපත් කළා; වෙනස්කම් වුණා.

විශේෂයෙන්ම මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමට අලුත් ආණ්ඩුක්‍රම ව්‍යස්ථා සංශෝධනයක් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හැටියට ගෙනෙන්න කියන ප්‍රතිපත්තියේ, තීරණයේ අපි පක්ෂයක් හැටියට හිටියා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට සහයෝගය දෙන්න නම් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන්න ඕනෑ කියන ප්‍රතිපත්තියේ පක්ෂයක් හැටියට අපි හිටියා. නමුත් ගරු ජනාධිපතිතුමාගෙන් අපි කළ ඉල්ලීම මත, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනිවාර්යයෙන්ම ගෙනෙනවා කියන පොරොන්දුව අපට ලබා දුන්නා. ඒ පොරොන්දුවේ තිබුණු එකඟතාව වූයේ, මනාප ක්‍රමය අහෝසි කරලා, සෑම මැතිවරණ කොට්ඨාසයකින්ම නියෝජිතයෙක් පත් වන විධියට මිශ්‍ර ක්‍රමයකට, දිස්ත්‍රික්කය තුළින් තමන්ගේ පක්ෂයේ නියෝජිතයෙක් පත් වෙන ක්‍රමයක් එක්ක විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒමටයි. ඒ නිසා අපි මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට සහයෝගය දෙන ගමන් අපේක්ෂා කරනවා; බලාපොරොත්තු වෙනවා, අලුත් මැතිවරණ ක්‍රමයක් හැකි ඉක්මනින් මේ සභා ගර්භයට ගෙනැල්ලා තර්ක, විතර්ක කරලා අනුමත කර ගනී කියලා. ඊළඟ පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී මනාප ක්‍රමය නැති, -ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අලුත් ව්‍යවස්ථාවක් හැටියට- අලුත් ඡන්ද ක්‍රමයකට යන්න පුළුවන් ව්‍යවස්ථා සංශෝධනයක් අනුමත කර ගනීයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! ගරු සභානායකතුමා, කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පස්වරු 7.00 වන තුරු විවාදය පවත්වාගෙන යා යුතු යැයි මම යෝජනා කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒ අනුව විවාදය පැවැත්වෙන කාලය පැයකින් දීර්ඝ කරනවා. සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
Sir, how many more minutes do I have?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
You have another five minutes. You can go ahead with your speech.

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අවස්ථාවේ අපි මැතිවරණ ක්‍රමය ගැන කථා කළා, අපි ඉල්ලීමක් කළා, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් අපට අලුත් මැතිවරණ ක්‍රමයකට යාමට තිබෙන අවශ්‍යතාව ගැන. අපි දන්නවා, අපේ සමහර මැතිවරණ කොට්ඨාසවල, -පෞද්ගලිකව ගත්තොත් කොළඹ නගරයේ ජීවත් වන කෙනෙක් හැටියට මම දන්නවා, නාගරික කොට්ඨාසවලත්- අපේ පක්ෂයට තිබෙන ආකර්ෂණය අඩුයි කියලා. නමුත් අපි ඒ පෞද්ගලික වාසි අවාසි ගැන බලන්නේ නැතිව පක්ෂයක් හැටියට ගත්ත තීන්දුව අනුව රටේ පොදු අවශ්‍යතාව සඳහා, -බහුතර කැමැත්ත අනුව- අලුත් මැතිවරණ ක්‍රමයකට යාමට එකඟ වෙලා තිබෙනවා. අපි ඒකට සහයෝගය දෙනවා. ඒ, අවශ්‍යතාව හඳුනාගෙන බොහොම සද්භාවයෙන් කරන කටයුත්තක්. මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට සහයෝගය දෙන ගමන් අපි විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන කථා කරන්නේ මේ නිසායි. ජනතාවගෙන් අහුවොත් පෙනෙනවා, මේ ස්වාධීන කොමිෂන් සභාවලට වඩා, ජනාධිපතිතුමාගේ බලතලවලට වඩා මේ මනාප ඡන්ද ක්‍රමයේ තිබෙන දෝෂ ගැන, අකැමැත්ත ගැන, මිනිසුන්ගේ තිබෙන පිළිකුල වැඩියි කියලා. මේ ඡන්ද ක්‍රමය අද රටම විශාල වශයෙන් ප්‍රතික්ෂේප කරලා තිබෙනවා.

ජනතාව අකැමැත්ත ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ නිසා රටේත්, ජනතාවගේත්, අපේත් වැඩි උනන්දුවක් තිබෙන්නේ මැතිවරණ ක්‍රමය වෙනස් කළ යුතුය කියන කාරණය ගැනයි. ඒ කර්තව්‍යය කිරීම සඳහා මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරු, ඇමතිවරු, සියලු පක්ෂ එකතු වෙලා අවංක උත්සාහයක් දරාවිය කියා අපි අපේක්ෂා කරනවා. මොකද, මේ කොමිෂන් සභා පැමිණීම තුළින් සියලුම කර්තව්‍යයන් සාර්ථක වේවිය කියා අපි අපේක්ෂා කරන්නේ නැහැ. කොමිෂන් සභා හරහා පත් කරන නිලධාරින්ගෙන් වරදක් වුණොත්, අපේ සාමාන්‍ය ජනතාව ගැන ඔවුන් විසින් වැරදි තීන්දුවක් ගත්තොත් ඒ වැරදි තීන්දුව අභියෝගයට ලක් කිරීමේ යන්ත්‍රණයක් තිබෙන්න ඕනෑ. ඒ අයගෙන් ප්‍රශ්නයක් අහලා, කැඳවීමක් කරලා, අඩුම ගණනේ කථානායකතුමා වෙත කැඳවීමක් කරලා, මේ ප්‍රශ්නය ගැන මෙවැනි තීන්දුවක් ගත්තේ ඇයි කියලා අහන්නට තිබෙන ඒ ප්‍රජාතන්ත්‍රවාදී අවස්ථාව ජනතාවට ලබා දීමේ හැකියාව අපට තිබෙන්න ඕනෑ. එවැනි හැකියාවක් තිබුණේ නැත්නම් තව ටික කාලයක් ගියාම විශාල පිරිසක් අගතියට පත් වුණොත්, අසාධාරණයට ලක් වුණොත්, ඒ අයව නියෝජනය කිරීමට යන්ත්‍රණයක් නැති වුණොත් අපට නැවතත් අපේ මේ ව්‍යවස්ථා සංශෝධනයට, සංශෝධනයක් ගෙනෙන්න වෙනවා. ඒ නිසා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල - Standing Ordersවල - සංශෝධනයක් අපි අපේක්ෂා කරනවා. ඒ සංශෝධනයෙන් පැහැදිලිවම, අපේ COPE එක කැඳවනවා වාගේ, මේ ස්වාධීන කොමිෂන් සභා මෙතැනට කැඳවීමක් කිරීමේ හැකියාව ඇති කිරීමක් ගැන අපි බලන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම තවත් අතිශය වැදගත් කරුණක් තිබෙනවා. හැම පාර්ලිමේන්තුවකම පාහේ තිබෙනවා, උසස් නිලතල පිළිබඳ කාරක සභාවක්- Committee on High Posts. මෙම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පිහිටුවන කොමිෂන් සභාවලට පත් කරන සෑම නිලධාරියකුම, ඔවුන්ගේ පළමුවැනි පත් කිරීමට කලින් පාර්ලිමේන්තුවේ කමිටුවක් හරහා මුණගැසීමේ අවස්ථාවක් සෑදීම සඳහා යන්ත්‍රණයක් තිබෙන්න ඕනෑ. අපි මේ කරුණු ඉදිරිපත් කරන්නේ පක්ෂයක් හැටියට නොව, රජයක් හැටියටත් නොව, ජනතා නියෝජිතයන් හැටියටයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප ජනතාවගේ නියෝජිතයන් හැටියට කටයුතු කරන නිසා ජනතා නියෝජිතයන් වන අපගෙන් ජනතාව බලාපොරොත්තු වන දෙයක් තිබෙනවා. අප විසින් පත් කරන ලද යම්කිසි නිලධාරින් පිරිසක් ඉන්නවා නම්, යම්කිසි කොමිසමක් තිබෙනවා නම් ඒ නිලධාරින් හෝ කොමිසම ගන්නා තීන්දු තීරණ යම්කිසි විධියකට අභියෝගයට ලක් කිරීමේ අයිතිය පාර්ලිමේන්තුවට නැති නොකරාවි කියන එක ජනතා නියෝජිතයන් වන අපගෙන් ජනතාව බලාපොරොත්තු වනවා. ඒ නිසා ඒ සඳහා වූ යන්ත්‍රණයක් සෑදීම, ස්ථාවර නියෝග පිළිබඳ අවබෝධයක් ඇති කර ගැනීම, ඒ මඟින් මේ ස්වාධීන කොමිෂන් සභාවල ගමන සාර්ථක කර ගැනීම තමයි අපේ අභිලාශය. මේ අවස්ථාවේ ජනාධිපතිවරයාගේ බලතල විශාල ප්‍රමාණයක් පාර්ලිමේන්තුව වෙත පවරා ගැනීම කරනවා සේම ඡන්දයක් දීලා රටේ පළමුවන පුරවැසියා පත් කර ගැනීමේ අවස්ථාවක් අපේ රටේ සෑම ජන කොටසකටම, සෑම ඡන්දදායකයකුටම ලැබිය යුතුය කියලා මම විශ්වාස කරනවා. අප විධායක ජනාධිපති ක්‍රමය ගැන විවේචනාත්මකව කථා කළත් ඒ විධායක ජනාධිපති ක්‍රමයේ විධායකභාවය තමයි අපට ප්‍රශ්නය වුණේ. නමුත් මුළු රටේ ජනතාව ජනාධිපතිවරයා පත් කරන්න ඡන්දය ප්‍රකාශ කළාම ඔවුන්ට හිතෙනවා, තමන්ගේ රටේ පළමුවන පුරවැසියා පත් කරගැනීමේ අයිතිය තමන්ටත් තිබෙනවා කියා. ඒ අවස්ථාව රැක දීම ගැන අපි සලකා බලන්න ඕනෑ. එහෙම නොවුණොත් මොකක්ද වෙන්නේ? එහෙම නොවුණොත්, තවත් ටික කාලයක් ගියාම දකුණේත් වෙනත් වෙනත් පළාත් එකතු වෙලා අග්‍රාමාත්‍යතුමා සමඟ එක්ව මේ රාජ්‍යය පාලනය කරගෙන යන්න පුළුවන්. එහෙම කළොත් උතුරුකරයේ සහ නැඟෙනහිර ජනතාව අපට නැවත වතාවක් අමතක වෙන්න පුළුවන්; අප ඒ ජනතාව අමතක කරන්න පුළුවන්. ඒ නිසාම ඒ අය කනස්සල්ලට පත් වන්න පුළුවන්. නමුත් ජනාධිපතිවරයෙකුට දිගින් දිගට ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමේ හැකියාවක් තිබෙනවා නම්, ඒ

[ගරු තිලංග සුමතිපාල මහතා]

ජනාධිපතිවරයා පත් කරන ජනාධිපතිවරණය අවස්ථාවේදී තමා නියෝජනය කරන නියෝජිතයා පත් කර ගැනීමේ හැකියාව ඒ ජනතාවට ලැබෙනවා නම් ඔවුන්ට හැඟීමක් ඇති වෙනවා, එක ධජයක් යටතේ, එක රජයක් වෙනුවෙන්, එක රටක් වෙනුවෙන් නායකයා පත් කර ගැනීමට අවස්ථාවක් තමන්ටත් තිබෙනවා කියා. එවැනි අවස්ථාවක් මඟ හැරුණු ගමන්, තමා මේ රටේ පුරවැසියකු නොවෙයි කියන හැඟීමක් ඔවුන්ට ඇති වනවා. තමන්ට අයිති මේ රටේ කොටසක් විතරයි කියා ඔවුන්ට සිතෙනවා. ඒ තුළින් තමයි, තමා යම් වර්ගයකට අයත්, සමාජයේ එක පැත්තකට විතරක් කොන් වූ, එක පළාතකට විතරක් අයිති පිරිසක්ය කියන හැඟීමක් ඔවුන් තුළ ඇති වන්නේ. තමන් ඉස්ලාම්, හින්දු ආදි වශයෙන් නොයෙකුත් වර්ගවලට අයත් වූ පිරිසක්ය කියන හැඟීමක් ඔවුනට ඇති වන්නේ. අපේ රටේ ඉතිහාසය දෙස හැරී බැලුවාම එවැනි අවස්ථා පැවැති බව පෙනෙනවා. ඒ නිසා, ජාතින් විශාල සංඛ්‍යාවක් සිටින හා ආගම් විශාල_ප්‍රමාණයක් තිබෙන රටක පුරවැසියන් හැටියට අපට වගකීමක් තිබෙනවා, අපේ ඉතිහාසයේ - විශේෂයෙන්ම පසු ගිය අවුරුදු 30ක, 40ක කාලය තුළ- සිදු වූ අඩු පාඩුකම් දිහා බලා ජනාධිපතිවරණයද, ජනාධිපතිවරයාද කියන එක නොව මේ රටේ ප්‍රධාන පුරවැසියා පත් කර ගැනීමේ ඡන්ද ක්‍රමයක් ගැන සිතීමට.

මීට අවුරුදු 30කට ඉස්සර වෙලා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ ක්‍රමවේදයට ජනතාවගේ විශාල අකැමැත්තක් තිබුණා. ඒ වෙලාවේ විවිධ සංසන්දන කිරීම් කළා. නමුත් 1977 දී ආර්ථික ක්‍රමයක් අලුතින් හඳුන්වා දුන් නිසා ඒ ආර්ථික ක්‍රමයත් එක්ක යෑමට විධායක ජනාධිපති ක්‍රමයක් අවශ්‍යයි කියා එදා කිව්වා. ප්‍රතිපත්තිමය වශයෙන් ජනාධිපති ධුරය, විවෘත ආර්ථිකය කියන කරුණු එකට බැඳ තමයි විධායක ජනාධිපති ක්‍රමය ඉදිරිපත් කළේ. ආර්ථික පරිවර්තනයක් ගැන ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා එදා කථා කළා. ඒ පරිවර්තනය හා බැඳුණු අවශ්‍යතාවක් බවට විධායක ජනාධිපති ක්‍රමය පත් කළා. එහිදී කියා සිටි දේ තමයි, "හැමදාම ආණ්ඩු එනවා; යනවා. ආණ්ඩු පෙරළෙනවා. ප්‍රතිපත්ති එනවා; යනවා. දේශපාලන ස්ථාවරභාවයක් නැහැ." කියන එක. ඒ නිසා, එදා ගෙන ආ ආර්ථික ක්‍රමය විධායක ජනාධිපති ක්‍රමය හා බොහොම සමීප බව, එනම් විවෘත ආර්ථිකයකට විධායක ජනාධිපති ක්‍රමය හුඟක් සමීප බව පෙන්නුම් කළා. නමුත් අපි දුටුවා, 1987 වන විට ඉන්දියාවේ අවශ්‍යතාව නිසා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරන්න සිදු වූ බව. ඒ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් සමඟම බලය විමධ්‍යගත කිරීමක් ගැන කථා කරමින් එය ක්‍රියාත්මක කිරීමට සිද්ධ වුණා. ඊට පස්සේ මොකද වුණේ? ඊට පස්සේ මේ රටේ ප්‍රශ්න අවසන් වුණේ නැහැ. ප්‍රශ්න දිගින් දිගට, තවතවත් ව්‍යාකූල වුණා. එහි ප්‍රතිඵලයක් හැටියට, ජේ.ආර්. ජයවර්ධන මහත්මයා ගෙන ආ විධායක ජනාධිපති ක්‍රමය කෙරෙහි පැවැති අකැමැත්ත වැඩි වෙලා මිනිස්සු පාරට බැහැලා විරෝධය පළ කළා. ඒ නිසා මේ රටේ විශාල පරිවර්තනයක් සිදුවූ බව, විධායක ජනාධිපති ක්‍රමයට විරුද්ධව ජනතාව විශාල හඬක් නැඟූ බව අපි දුටුවා.

හැබැයි අන්තිම අවුරුදු 10 ගැන බැලුවොත්, විශේෂයෙන්ම 2005 වර්ෂයෙන් පස්සේ යුද්ධය උග්‍ර අවස්ථාවට පත් වෙලා, උතුරු නැඟෙනහිරට වෙනම ස්වාධීන ස්වයංපාලන අධිකාරියක් - ISGA එකක්- ඉල්ලා මේ රට බෙදන තත්ත්වයට පත් වුණා. සාකච්ඡා කරලා යුද්ධය විසඳන්න බැලුවා. නමුත් හරි ගියේ නැහැ. ඊට පස්සේ යුද්ධ කළා; යුද්ධය සම්පූර්ණයෙන්ම අවසන් වුණා. අපට දැන් අවස්ථාවක් ලැබී තිබෙනවා, ජනාධිපතිවරයා, විධායක ජනාධිපතිවරයා, අගමැතිවරයා, විධායක අගමැතිවරයා, එහෙමත් නැත්නම් පාර්ලිමේන්තු සංයුතිය තුළ ක්‍රියාත්මක වන වැඩසටහන් ගැන අවබෝධයක් ඇති කර ගෙන ඒ ගැන බොහොම කල්පනාවෙන් බලන්න. ඊළඟ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සඳහා ඒ වෙනුවට සමහර විට අපි සියලු දෙනාටම අලුත්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පනත් කෙටුම්පතකට යන්න සිද්ධ වෙයි. ඒ පනත් කෙටුම්පතට අපේ ඉතිහාසයේ සියලුම අත් දැකීම්, අදහස් ලබා ගෙන ක්‍රියාත්මක වෙන්න සිද්ධ වෙයි. ඊළඟ මැතිවරණයෙන් පසුව ඒ සම්පූර්ණ වෙනස සඳහා යෑමට අපි අපේක්ෂා කරනවා. වර්තමානයේ එය කිරීමට අපට කාලයක් නැහැ. මේ පාර්ලිමේන්තුවට තව අවුරුද්දක පමණ කාලයයි තිබෙන්නේ. ඒ වාගේම දින සියයේ වැඩසටහන තුළින් මේ රටට වුණු පොරොන්දු තිබෙනවා. ඒ වාගේම අලුත් මැතිවරණ ක්‍රමයක් පිළිබඳව එකඟතාවක් තිබෙනවා. මේ සියල්ල බැලුවාම අපේ මේ සියලු අදහස් ඊළඟ මහා මැතිවරණයෙන් පස්සේ ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් තිබෙනවා. එහිදී සම්පූර්ණ බලතල තිබෙන, එහෙම නැත්නම් බලතල නැති ජනාධිපතිවරයෙක්ද පත් වන්නේ, එහෙමත් නැත්නම් සම්පූර්ණ බලය පාර්ලිමේන්තුවට තිබෙන පාර්ලිමේන්තුවක්ද ඇති වන්නේ යනාදී වශයෙන් වෙන් වෙන්ව හිතන්න වෙනවා. එම නිසා මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතට පක්ෂයක් හැටියට අපි සහයෝගය දක්වන ගමන්, පාර්ලිමේන්තුවට බලය පවරනවා නම් ඒ ලබා දෙන බලය ශක්තිමත් කරන්නය කියලා තමයි අපි ඉල්ලා සිටින්නේ. ඒ ශක්තිය තුළින් විනිවිදභාවයෙන් යුක්ත කොමිෂන් සභා පත් කරලා, ඒවාට ගෞරවනීය පුද්ගලයන් පත් කරලා, ඒ ගෞරවනීය පුද්ගලයන්ගේ විශ්වාසය ජනතාව අතර ස්ථාපිත කරලා, ඔවුන් ගනු ලබන තීන්දු තීරණ ගැන ජනතාවට යම්කිසි විධියේ සන්නිවේදනයක් කරලා, ඒ සන්නිවේදනය තුළින් සාධාරණ සමාජයක් සඳහා අපට පෙළ ගැසෙන්න පුළුවන්. ඒ අවශ්‍යතාව ඊයේට වඩා අද වැඩියි.

අද තොරතුරු තාක්ෂණය නිසා තරුණයාගේ සිට හැම කෙනකුටම දින පතාම තොරතුරු ගලා එනවා. සමාජ මාධ්‍ය - social media - තුළින් ඒ අයට හැම තිස්සේම තොරතුරු ගලා ගෙන එනවා. ඒ අය තොරතුරුවලින් පොහොසත්. ඒ අය පොත පත කියවා තොරතුරු දැන ගන්නවා. අපේ රටේ පාර්ලිමේන්තු ක්‍රියාදාමයේදීත්, පරිපාලනයේදීත් මේවා මඟ හරින්න අවස්ථාවක් නැහැ. එම නිසා ජාත්‍යන්තර ප්‍රමිතීන්, කලාපීය ප්‍රමිතීන් පිළිබඳව අවබෝධයක් ඇතිව ක්‍රියාදාමයකට යෑමේ අවශ්‍යතාව, හැකියාව අපට තිබෙනවා. එම නිසා එවැනි වැඩසටහනකට අපි ක්‍රියාත්මක වන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට වැඩිපුර කාලයක් ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මේ අතිශය වැදගත් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කථා කරන්න අවස්ථාවක් ලැබීම ගැන සන්තෝෂ වෙමින්, අපි අපේක්ෂා කරන වෙනස තුළින් මේ රටේ ඊළඟ පරම්පරාවට සාධාරණ සමාජයක් සඳහා අවශ්‍ය පෙළ ගැස්මක් ඇති වේවාය කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඊළඟට, ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමා.

[අ.භා. 6.00]

**ගරු මහින්ද අමරවීර මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - கடற்றொழில் மற்றும் நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Fisheries and Aquatic Resources Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දිනය ඉතාමත් වැදගත් ඓතිහාසික දිනයක් විධියට අපට හඳුන්වන්න පුළුවන්. මෙම විවාදයට සහභාගි වී කථාවක් කරන්න ලැබීමත් භාග්‍යයක් විධියට තමයි මා සලකන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කරපු අවස්ථාවේ සිට විධායක බලය අඩු කිරීම සඳහා තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපි දිගින් දිගටම සටන් කළේ; කථා කළේ. ඒ වන විට අපේ මන්ත්‍රීවරු හත්දෙනෙක් පමණයි පාර්ලිමේන්තුවේ සිටියේ. ඒ මන්ත්‍රීවරු හත්දෙනාම මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කරන වෙලාවේ ඊට විරුද්ධ වුණා. එතැන ඉඳලාම අපේ ඉලක්කය වී තිබුණේ මෙහි අවසානයක් දකින්නයි. වරින් වර බලයට පත් වුණු අපේ පක්ෂ නායකයෝ සියලු දෙනාම මේ වෙනුවෙන් පොරොන්දු වුණා; ඒ වාගේම ඒ සඳහා උත්සාහයන් දැරුවා; ඉෂ්ට කරන්න අවස්ථාව ලැබුණේ නැහැ. නමුත් මේ අවස්ථාවේදී මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මේ වෙනුවෙන් පොරොන්දු වුණා වාගේම එය ඉෂ්ට කිරීම සඳහා එකඟ වුණා. ඒ පිළිබඳව අපි සතුටු වනවා. එතුමා එකඟ වුණේ අද අඩු කරන බලතලවලට පමණක් නොවෙයි. මීට එහා ගිය බලතල ප්‍රමාණයක් අඩු කිරීමටත් එතුමා එකඟතාව පළ කළ බව මා හොඳටම දන්නවා. ඒ වාගේම සැලකිය යුතු මට්ටමකින් විධායක බලතල අඩු කර ගන්නත් එතුමා බලාපොරොත්තු වුණා. රාජ්‍ය නායකයෙක් උත්සාහ දරන්නේ තමන්ට ලැබෙන බලතල අඩු කර ගන්න නොවෙයි, වැඩි කර ගන්නයි. නමුත්, එතුමා එය අඩු කරන්න ගත් උත්සාහය පිළිබඳව අපට තිබෙන්නේ ඉමහත් සතුටක්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයෙක්, නායකයෙක් ඒ විධියට කටයුතු කිරීම පිළිබඳව අප සතුටු වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මේ සංශෝධන ගෙන එන වෙලාවේ ශ්‍රේෂ්ඨාධිකරණය යම් යම් මට්ටමකට සීමා පැන වූ බව ඔබතුමාත් දන්නවා. අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා බලාපොරොත්තු වුණු තරමටත්, නැත්නම් යෝජනා වුණු තරමටත් එම බලතල අඩු කරන්න ශ්‍රේෂ්ඨාධිකරණය අවස්ථාව ලබා දුන්නේ නැහැ. ඒ සම්බන්ධව ඊට එහා කටයුතු කරනවා නම්, ජනමත විචාරණයකට යා යුතුය කියන එක තමයි ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය වුණේ. අපි ජාතික සමඟි සන්ධාන ආණ්ඩුවට එකතු වීමේ එක පරමාර්ථයක් තමයි මේක. අපි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විධියට විරුද්ධ පක්ෂයේ හිටියේ. අපි විරුද්ධ පක්ෂයේ ඉන්න වෙලාවේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අපේ පක්ෂයේ නායකත්වය භාර ගෙන අපෙන් ඉල්ලීමක් කළා, "ජාතික සමඟි සන්ධාන ආණ්ඩුවක් සඳහා තමයි මම පොරොන්දු වුණේ, ඒකට එකතු වන්න" කියලා. අපි මුල් අවස්ථාවේදී එය ප්‍රතික්ෂේප කළා. දෙවෙනි අවස්ථාවේදී අපේ පාර්ලිමේන්තු කණ්ඩායමට ඒ යෝජනාව ගෙනැල්ලා ඊට පසුව අපේ පක්ෂයේ මධ්‍යම කාරක සභාවට එම යෝජනාව ඉදිරිපත් කරලා මධ්‍යම කාරක සභාවේ යෝජනාව මත ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගත් තීන්දුවක් අනුවයි අපි ජාතික සමඟි සන්ධාන ආණ්ඩුවකට එකතු වුණේ. එලෙස අපි එකතු වුණේ ප්‍රධාන අරමුණු දෙකක් මුල් කර ගෙනයි.

අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ දින සියයේ වැඩ පිළිවෙළ තුළින් පොරොන්දු රාශියක් දීලා තිබුණා. ඒ යටතේ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක වුණත්, ප්‍රධාන කාරණා දෙකක් කෙරෙහි තමයි අපේ වැඩි අවධානය යොමු කළේ. ඒ එක ප්‍රධාන කාරණයක් තමයි, මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත. ඒ වෙනුවෙන් අපේ කණ්ඩායම විශාල මහන්සියක් දැරුවා. ඒ වෙලාවේ එක්සත් ජාතික පක්ෂයත් ඒ කටයුත්තට මැදිහත් වුණා. ඒ වාගේම එහි යම් යම් කාරණාවලදී විපක්ෂය, ආණ්ඩු පක්ෂය කියලා වෙන් වන්නේ නැතිව අප සියලු දෙනා එකතු වෙලා ඒවාට සහයෝගය ලබා දීම නිසා අද මේ තත්ත්වයට එන්න පුළුවන්කම ලැබුණා. නමුත් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට රජය දැක්වූ උනන්දුව විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට තිබුණේ නැති බව කනගාටුවෙන් වුණත් අපි සිහිපත් කරන්න ඕනෑ. නව මැතිවරණ ක්‍රමයක් පිළිබඳව වුණු පොරොන්දුව ඒ ආකාරයෙන් ඉෂ්ට කිරීම සඳහා ඒ වෙලාවේ ගත් උත්සාහය පිළිබඳව සෑහීමකට පත් වන්න පුළුවන්කමක් නැහැ. දින සියය තුළ ඒ කටයුත්තට ඊට වැඩි බලයක්, ඊට වැඩි ශක්තියක් යොදවන්න ඕනෑය කියන එක තමයි අපේ හැඟීම. ජනාධිපතිතුමාත් එක්ක සාකච්ඡා කරලා මේ කටයුත්තට අපි මැදිහත් වෙන්නම් කියලා පසුව අපි තීන්දු කළා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ගිය අප කණ්ඩායම එකතු වෙලා මැතිවරණ කොමසාරිස්තුමාත් සමඟ සාකච්ඡා කරලා දින සියයේ කටයුත්ත පැය සියයකින් විශාල ප්‍රගතියක් කරා ගෙන යන්න අපට හැකියාව ලැබී තිබෙනවා. මේ වනකොට කැබිනට් මණ්ඩලයට එය යොමු කරලා තිබෙනවා. ඒ වාගේම එය කෙටුම්පත් කරලා තිබෙනවා. එහි බොහෝ කටයුතු අද වනකොට අවසාන කරලා තිබෙනවා.

අද ගමේ මනුස්සයෙකුගෙන් ගිහිල්ලා ඇහුවොත් විධායක බලය අඩු කරනවාට කැමැතියිද කියලා ඒ අය කැමැතියි කියනවා. මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අද ගමේ අයත් කැමැතියි. පාසල් ශිෂ්‍යයෙකුගෙන් ඇහුවත්, ඒ සඳහා කැමැත්ත තිබෙන බව කියනවා; ඒ පිළිබඳව ඔවුන් තුළ දැනුවත්වීමක් තිබෙනවා.

ඊටත් වඩා කැමැත්තක් නව මැතිවරණ ක්‍රමයක් පිළිබඳව ගමේ ජනතාව තුළත්, ඒ වාගේම රටේ විවිධ මට්ටමේ පුද්ගලයන් තුළත් තිබෙනවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයටත් එහා ගිය කැමැත්තක් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඇති කර ගන්න ඔවුන් තුළ තිබෙනවා. ඒ අනුව නව මැතිවරණ ක්‍රමයක් පිළිබඳව විශාල උනන්දුවක් ඔවුන් තුළ තිබෙනවා. තමන්ගේ ආසනයට මන්ත්‍රීවරයෙකු ලැබෙන, මන්ත්‍රීවරයාට ආසනයක් නියම වෙන, ඒ වාගේම ප්‍රබුද්ධයන්ට පාර්ලිමේන්තුවට එන්න අවකාශය ලැබෙන මැතිවරණ ක්‍රමයක් පිළිබඳව රටේ කථා කළා. අද පාර්ලිමේන්තුවේ සංයුතිය පිළිබඳව විවිධ අය විවිධ චෝදනා එල්ල කරනවා. අද පාර්ලිමේන්තුවට නුසුදුස්සෝ එනවා කියනවා; ඒකට එන අය හොඳ නැහැ කියනවා. හැබැයි, මේ මැතිවරණ ක්‍රමය තිබෙන තාක්කල් එවන් අය පාර්ලිමේන්තුවට ඒම වළක්වන්න පුළුවන්කමක් නැහැයි කියන එක අපි පැහැදිලිව දන්නවා. යම් කෙනෙකුට ධනස්කන්ධයක් තිබෙනවා නම්, ඒවා කොහොම හොයා ගත්තත්, ඒවා මොන ආකාරයෙන් අරගත්තත් මේ තිබෙන මැතිවරණ ක්‍රමය තුළ ආණ්ඩු පක්ෂයෙන් බැරි නම්, විරුද්ධ පක්ෂයෙන් හෝ ඒ අයට පාර්ලිමේන්තුවට එන්න අවකාශය තිබෙනවා. නමුත් නව මැතිවරණ ක්‍රමය තුළ ඊට එහා ගිය ප්‍රබුද්ධ අයට පාර්ලිමේන්තුව නියෝජනය කරන්න හැකියාව ලැබෙනවා. ඒ වාගේම එකිනෙකා ඇනකොටා ගන්න, එක පක්ෂය තුළ පවා එකිනෙකා ඇනකොටා ගන්න, එකම පවුලේ අය වුණත් මැතිවරණයකට ඉදිරිපත් වුණොත් එකිනෙකාට එරෙහි වන මේ ඡන්ද ක්‍රමය වෙනුවට නව ඡන්ද ක්‍රමයකට යාමේ අවශ්‍යතාව අද රට තුළ නිර්මාණය වෙලා තිබෙනවා. එම නිසා තමයි අලුත් ඡන්ද ක්‍රමයක් සකස් කර තිබෙන්නේ.

එක් ආසනයකට මන්ත්‍රීවරයකු බැගින් සියලුම ආසනවලට මන්ත්‍රීවරුන් ලැබෙන, සමානුපාතික නියෝජනයක් ඇති වන විධියේ නව ඡන්ද ක්‍රමයක් සකස් කර තිබෙනවා. මා හිතන විධියට මෙයින් කිසිම කෙනෙකුට අවාසියක් ඇති වන්නේ නැහැ. මෙතෙක් තිබුණු ඡන්ද ක්‍රමය තුළ බහුතර බලයක් ලබා ගත්තේ අවස්ථා දෙකකදී විතරයි. 1989 වර්ෂයේ දී සහ 2010 වර්ෂයේදී තමයි තනි පක්ෂයක ආණ්ඩුවක් පිහිටුවන්නට පුළුවන්කම ලැබුණේ. සුවිශේෂී අවස්ථා දෙකක් නිසායි ඒකත් සිදු වුණේ. එහෙම නැත්නම් මේ තිබෙන ඡන්ද ක්‍රමය තුළ ස්ථාවර ආණ්ඩුවක් පිහිටුවීමේ හැකියාවක් ලැබෙන්නේ නැහැ. නමුත් නව ඡන්ද ක්‍රමය තුළ ස්ථාවර ආණ්ඩුවක්, ශක්තිමත් ආණ්ඩුවක් පිහිටුවීමේ හැකියාව ලැබෙනවා වාගේම සියලුම ජන කොටස්වල -

[ගරු මහින්ද අමරවීර මහතා]

සුළු යයි කියා ගන්නා සියලුම පක්ෂවල - නියෝජනයක් ලැබෙන ඡන්ද ක්‍රමයක් තමයි අලුතෙන් හඳුන්වා දී තිබෙන්නේ. මේ ඡන්ද ක්‍රමය ක්‍රියාත්මක කිරීම තුළින් කිසිම කෙනෙකුට අසාධාරණයක් නොවන මට්ටමට - මැතිවරණ කොමසාරිස්තුමා දේශපාලනඥයන් එක්ක සාකච්ඡා කර සකස් කළ වැඩපිළිවෙළ තුළ - ස්ථාවර ආණ්ඩුවක් පිහිටුවීමේ අවස්ථාව උදා වෙනවා.

පෞද්ගලිකව බැලුවොත් මම මේ ඡන්ද ක්‍රමයට විරුද්ධ වන්නට ඕනෑ. මොකද, පසු ගිය වතාවේ ලංකාවෙන්ම පස්වන තැනට මනාප ඡන්ද ලබාගත් මන්ත්‍රීවරයා මමයි. නමුත් නව ක්‍රමයේ දී එහෙම ස්ථාන ලබා ගන්නට පුළුවන්කමක් නැහැ. ආසන මට්ටමෙන් තමයි ලබා ගන්න පුළුවන් වන්නේ. නමුත් මේ මොන වාසිය ලැබුණත්, රට වෙනුවෙන් ජනතාවගේ ඉල්ලීමක් වුණු නව ඡන්ද ක්‍රමයට අප ප්‍රවේශ වන්නට ඕනෑයි කියන කාරණය අපි පැහැදිලිවම කියනවා. අපේ වගකීම, අපේ යුතුකම වන්නේ මේ කාර්ය භාරයන් දෙක ඉෂ්ට කිරීමයි. ඒකට තමයි අපි මේ ආණ්ඩුවට ආවේ. අපි මේ ආණ්ඩුවට ඇමති වැටුප ගන්න, ඇමති වරප්‍රසාද ගන්න ආවා නොවෙයි. අප ඒවා ගන්නේ නැහැ. අපි ඇමතිවරයකුගේ වැටුප ගන්නේ නැහැ. ඇමතිවරයකුගේ වරප්‍රසාද ගන්න යන්නේත් නැහැ. මේ ප්‍රධාන කාර්ය දෙක මුල් කර ගත් යෝජනාවලිය ක්‍රියාත්මක කරන්නයි අපි ආවේ. ඒ සඳහා අප ඉදිරි කාලය තුළත් කැප වෙලා කටයුතු කරනවා. අප සියලු දෙනාම එකතු වෙලා අද මේ ඓතිහාසික ජයග්‍රහණය ලබා ගන්න කටයුතු කරනවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සම්මත කර ගන්න සියලු දෙනාගේම ඡන්දය ලබා දෙනවා. මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන් 225 දෙනාම මේ කටයුත්තට දායක වේවි කියලා මම විශ්වාස කරනවා. ඒ වාගේම ඉදිරියේ දී එන නව මැතිවරණ ක්‍රමය සම්මත කර ගැනීම සඳහාත් අප සියලු දෙනාම එකතු වෙලා ඒ උතුම් කාර්යයට දායක වීම අවශ්‍ය වෙනවා. එතැනින් අපේ කාර්ය අවසානයි.

ඊළඟට නැවත ඇවිල්ලා තමුන්නාන්සේලාත් එක්ක, නැත්නම් විරුද්ධ පක්ෂයේ අයුත් ගෙන කටයුතු කරන්නට අපට අනිවාර්යෙන්ම අවස්ථාව ලැබෙනවා. අප එන්න සූදානම් බවත් මතක් කරමින් මා නිහඬ වෙනවා, ස්තූතියි.

[අ.භා. 6.10]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාමත් වැදගත් සංශෝධන පනත් කෙටුම්පතක් වන දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත අද දවසේ මේ ගරු සභාවේ සම්මත වන්නට තිබෙන මොහොතක වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. අද මුළු රටම මේ ඓතිහාසික අවස්ථාවේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සම්මත වන තුරු බලාගෙන ඉන්නවා.

මේ රටේ දේශපාලන ඉතිහාසය දෙස බැලුවාම 1977 මේ රටේ තිබුණු මැතිවරණ ක්‍රමය වෙනස් කරමින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් තමයි මේ රටට විධායක ජනාධිපති ධුරය හඳුන්වා දුන්නේ. එය අප කිසි කෙනෙකුට අමතක කරන්නට බැහැ. කිසිම කෙකෙනකුට ඒ ඉතිහාසය වෙනස් කරන්නටත් බැහැ. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නැත්නම් මහා බලතල තිබෙන ජනාධිපති ධුරයක් මේ රටට හඳුන්වා දුන්නේ එක්සත් ජාතික පක්ෂයයි. එය එක්සත් ජාතික පක්ෂය පිළිගන්නා කාරණයක්. එදා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා 1977 මහා මැතිවරණයෙන් හයෙන් පහක බලයක් අරගෙන - තුනෙන් දෙකක බලයක් නොවෙයි, හයෙන් පහක බලයක් අරගෙන - තමයි 1978 ව්‍යවස්ථාව තුළින් මේ විධායක ජනාධිපති ධුරය මේ රටට හඳුන්වා දුන්නේ. ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා, ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමා, ඩී.බී. විජේතුංග ජනාධිපතිතුමා, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිතුමිය, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා, වර්තමානයේ දී මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත් එම විධායක ජනාධිපති ධුරය හොබවලා තිබෙනවා. මේ විධායක ජනාධිපති ධුරය ආහෝසි කිරීම පිළිබඳව පසු ගිය කාලයේ මැතිවරණ වේදිකාවලත්, මැතිවරණය සම්බන්ධ ලියවිලිවලත් යම් යම් මත පළ වුණා. විටින් විට මේ පිළිබඳව යම් පොරොන්දු ලබා දුන්නත් ඒවා ඉටු කරන්නට බැරි වුණු බව අපි මේ අවස්ථාවේ දී මතක් කරන්නට ඕනෑ. නරකම දේත් හොඳක් තිබෙනවා. හොඳම දේත් නරකක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විධායක ජනාධිපති ධුරය යම් අවස්ථාවල දී මේ රටට හිතකර වුණු බව මා පෞද්ගලිකව විශ්වාස කරනවා. විධායක ජනාධිපති ධුරය මේ රටට හිතකර වූ අවස්ථාවන් අපට අමතක කරන්න බැහැ. එය හිතකර වූ එක් අවස්ථාවක් තමයි අවුරුදු තිහක් තිස්සේ පැවැති දැවැන්ත ත්‍රස්තවාදය මේ රටින් අතුගා දමා යුද්ධය නිම කළ අවස්ථාව. ඒ වග කීම ඉටු කරන කොට මේ විධායක ජනාධිපති ධුරය එයට ලොකු පිටුවහලක් වුණාය කියන එක බොහොම පැහැදිලිව අවධාරණය කළ යුතු කාරණයක් හැටියට අපි විශ්වාස කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විධායක ජනාධිපති ධුරයේ තිබුණු බලතල පාවිච්චි කරලා එදා ඒ වාගේ තීන්දු තීරණ ගන්න පුළුවන් වුණු නිසා තමයි මේ රටේ පැවැති ත්‍රස්තවාදය තුරන් කරලා, මේ රටට සාමය ළඟා කර දෙන්න එදා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාට පුළුවන්කම ලැබුණේ.

මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මේ රටේ ජනතාවට පොරොන්දු වුණු ආකාරයට විධායක ජනාධිපති ධුරයේ තිබෙන බලතල අඩු කිරීම, ස්වාධීන කොමිෂන් සභා නැවත ස්ථාපිත කිරීම වැනි කාරණා රාශියක් සම්බන්ධයෙන් මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ දී "ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේකට විරුද්ධයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේක සම්මත වෙන්න ඉඩ දෙන්නේ නැහැ" කියන මතය රටට දෙන්න කවුරු හෝ උත්සාහ කරනවා නම්, ඒක එහෙම පිටින්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට කරන චෝදනාවක් හැටියටයි මා විශ්වාස කරන්නේ. අපට තිබෙන ප්‍රශ්නය මේකයි. මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධ ගැසට් පත්‍රය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපේ අතට ලැබෙන කොට - දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන කාරණා ටික අපේ අතට ලැබෙන කොට - ඊට අමතරව වෙනත් සංශෝධන කිහිපයක් අධිකරණයට ඉදිරිපත් වෙලා තිබුණා. අපේ අතට ලැබුණු ලියවිල්ලට අමතරව මෙය සම්මත කරනවාය කියලා කියන දවසේ උදේ වරුවේවත් ඒ සංශෝධන මොනවාද කියලා අපට දැන ගන්නට නැහැ. මේ රටේ ජීවත් වන සමස්ත ජනතාව නියෝජනය කරන මන්ත්‍රීවරුන් 225 දෙනාට වග කීමක් තිබෙනවා, තමන් අත ඔසවන්නේ මොනවාටද, තමන් කැමැත්ත පළ කරන්නේ මොනවාටද, තමන් අකමැත්ත පළ කරන්නේ මොනවාටද කියන එක ගැන ජනතාවට උත්තර දෙන්න. ඒ නිසා තමයි අපි යම් සංශෝධන ගැන විටින් විට අපේ විරෝධය පළ කළේ.

අද මාධ්‍යවේදීන්, මාධ්‍ය ආයතනවල නියෝජිතයන් මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉන්නවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට මාධ්‍ය ආයතන සම්බන්ධයෙනුත් සංශෝධනයක් ඇතුළත් වෙලා තිබුණා. ගරු අග්‍රාමාත්‍යතුමා මේ සංශෝධන සකස් කරන කොට මාධ්‍ය ආයතනවලට බලපාන සංශෝධනයක් එතුමා ඉදිරිපත් කර තිබුණා. මාධ්‍ය ආයතනවලට

ඉදිරිපත් කරන වාරණය යම් විධියකින් ඒ මාධ්‍ය ආයතන උල්ලංඝනය කළොත් අවුරුදු තුනක සිර දඬුවමකට යටත් කරන්න එහි යෝජනා කර තිබෙනවා. මේ රටේ මාධ්‍ය නිදහස මේකද? මේ රටේ මාධ්‍ය නිදහස අවශ්‍යයි කියලා පසු ගිය ආණ්ඩුවට දිගින් දිගටම පන්න පන්නා ගහපු, ඒ ගැන විවේචනය කරපු අය අද බලයට ඇවිල්ලා ඇති කරන මාධ්‍ය නිදහස මේකද? මාධ්‍යකරුවන්ට දෙන පණිවුඩය මේකද? ඒ නිසා අපි ඒකට විරුද්ධයි. ඒ නිසා තමයි අපි තරයේ කිව්වේ, මෙවැනි සංශෝධන දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතෙන් ඉවත් විය යුතුයි කියලා.

මේ කරන්න යන්නේ මොකක්ද, මේ සම්බන්ධයෙන් තමන්ගේ වගකීම මොකක්ද කියලා සියලු මාධ්‍ය ආයතන බලාගෙන හිටියා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය රටට අවශ්‍ය විධියටයි ගෙනෙන්න ඕනෑ; රටේ ජනතාවට අවශ්‍ය විධියටයි ගෙනෙන්න ඕනෑ. හැබැයි, මේක දේශපාලන න්‍යාය පත්‍රයක්. එක්සත් ජාතික පක්ෂයේ තව න්‍යාය පත්‍රයක් දිගින් දිගටම තිබෙනවා. එදා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා විධායක ජනාධිපති ක්‍රමයත් එක්ක 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැදුවේ දිගින් දිගටම එක්සත් ජාතික පක්ෂය බලයේ ඉන්නයි. මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත ගෙනෙන්නේත් එහෙම ඉන්න හදපු ව්‍යවස්ථාවක් වාගේ නම් එතැනදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කොන්ද කෙළින් තියාගෙන වැඩ කරන්න ලෑස්තියි කියන කාරණය අප මතක් කරන්න ඕනෑ.

අද අප ජයග්‍රහණයක් ලබලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂය මේ රටට ගෙනාපු 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධායක ජනාධිපති ධුරයේ තිබෙන බලතල අඩු කරලා, මේ කියපු පොරොන්දු ටික ඉටු කරන්න අද පුළුවන් වෙලා තිබෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජනාධිපතිවරයෙකු යටතේ කියන එක බොහොම වගකීමකින් අද අපට කියන්න පුළුවන්කමක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් තමයි අපට ලියවිල්ල අතට දෙන්නේ" කියලා හිතනවා නම්, මේක යට තිබෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බෙදන්න ඕනෑ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දෙකඩ කරන්න ඕනෑ, ඊළඟ මැතිවරණය එන කොට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සුන්නද්දූලි කරන්න ඕනෑ, ඒකේ ඉන්න අයව වෙන වෙනම දඩයම් කරන්න ඕනෑ කියා උත්සාහයක් තිබෙනවා නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට ඒකටත් මුහුණ දෙන්න අපි ලෑස්තියි. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් එක්ක විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් ගෙනෙන්න ඕනෑ. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් අවශ්‍යයි. එදා ඒ මැතිවරණ ප්‍රකාශයේ තිබෙනවා අප දැක්කා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් එක්ක සමගාමීව මැතිවරණ ක්‍රමය වෙනස් කරන විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් ගෙන එනවාය කියලා. නමුත් එක්සත් ජාතික පක්ෂයට අප බලපෑම් කරන තුරු ඒ මැතිවරණ සංශෝධනය ගැන කථා කළේ නැහැ. ඒ මැතිවරණ සංශෝධනය ගැන කිසි දෙයක් කථා කළේ නැහැ. අවසානයේ අපේ කණ්ඩායම් රැස්වීම අතරතුරේදී අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට කියන්න අපට සිද්ධ වුණා, මේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් මේ එක්කම අවශ්‍යයි කියලා. ඒ නිසා තමයි අද මේ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම ගැන යම් උනන්දුවක් එක්සත් ජාතික පක්ෂයට ඇති වුණේ කියන එක අප මතක් කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඊළඟට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ගැන බැලුවොත්, එහි නියෝජිතයන් තෝරා ගැනීම සම්බන්ධයෙන් උත්තරීතර පාර්ලිමේන්තුවේ නියෝජනයක් තිබිය යුතු බව අප බොහොම වගකීමකින් කියනවා. ආණ්ඩු පක්ෂයෙන් වෙන්න පුළුවන්, විපක්ෂයෙන් වෙන්න පුළුවන්, විපක්ෂයේ ඉන්න යම් යම් ජාතීන් නියෝජනය කරන පක්ෂවලින් වෙන්න පුළුවන්, ඒ අයගෙන් සමන්විත වුණු කණ්ඩායමක් මේ ව්‍යවස්ථා සභාවට තෝරා ගන්නවා නම් අපට යම් විශ්වාසයක් තිබෙනවා. තවත් පිටස්තර පුද්ගලයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පත් කරනකොට අප කොහොමද විශ්වාස කරන්නේ? අප දන්නවා ද, ඔහු රොබෝ කෙනෙකුද කියලා. නැහැ. අපට ඒ ගැන විශ්වාසයක් නැහැ. අප දන්නේ නැහැ, ඔහුගේ දේශපාලන පසු බිම මොකක්ද කියලා. අප දන්නේ නැහැ, ඔහු එන්නේ මොන න්‍යාය පත්‍රයකින්ද කියලා. මේ වාගේ ප්‍රශ්න මතු වෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප බොහොම වගකීමකින් කියනවා, මේ හැම ස්වාධීන කොමිෂන් සභාවකටම ස්වාධීනව හැසිරෙන්න ඉඩ දෙන්න ඕනෑය කියා. ස්වාධීන කොමිෂන් සභා කියලා බෝඩ් ලෑල්ලට තියලා, ඒක දේශපාලන හස්තයන් විසින් හසුරුවනවා නම් ඒක ස්වාධීන කොමිසමක්ද කියන ප්‍රශ්නාර්ථය ඇති වනවා. මේ රටේ නීති හදන්නේ මේ උත්තරීතර පාර්ලිමේන්තුවෙන්. ඒ නීති හදන පාර්ලිමේන්තුවේ තැන හරියාකාරව නොතිබුණොත් රටේ මහ ජනතාවට යන කල මොකක්ද කියන ප්‍රශ්නය අප ඉදිරියේ තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටේ යහ පාලනය වෙනුවෙන්, රටේ ඉදිරි ගමන වෙනුවෙන් ගන්නා වූ යම් තීන්දුවක් තිබෙනවා නම් ඒ තීන්දුවත් එක්ක කෙළින් හිට ගන්න පුළුවන්කමක් අපට තිබෙනවාය කියලා අප වගකීමකින් යුතුව කියනවා. හැබැයි, ඒක දේශපාලන න්‍යාය පත්‍රයක් බවට පත් කරගෙන, ඒකෙන් තවත් පක්ෂයක් විනාශ කරමින්, විපක්ෂය දඩමීමා කර ගන්න උත්සාහ කරන වැඩ පිළිවෙළවල් තිබෙනවා නම් ඒකට විරුද්ධවත් අප විපක්ෂයක් හැටියට නැඟී සිටින්න ලෑස්තියි. ඊළඟට එන මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමත් එක්කම ඒ එන මැතිවරණ ක්‍රමයට මුහුණ දීලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ රජයක් මේ රට තුළ බිහි කිරීමේ වගකීමටත් අප ලෑස්තියි කියන කාරණය මතක් කරන ගමන්

මට කථා කරන්න වේලාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[பி.ப. 6.21]

**ගරු ජේ. ශ්‍රී රංගා මහතා**
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்தச் சபையிலே நடைபெறுகின்ற அரசியலமைப்புக்கான பத்தொன்பதாவது திருத்தச் சட்டமூலம் தொடர்பான விவாதத்தில் பேசுவதற்கு எனக்குச் சந்தர்ப்பம் கொடுத்ததற்காக உங்களுக்கு முதலில் நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். உண்மையில் இந்தப் பத்தொன்பதாவது திருத்தச் சட்டமூலம் நாட்டிலே ஜனநாயகத்தை ஏற்படுத்துவதற்கு முக்கிய பங்கினை வகிக்க விருக்கிறது. இந்தத் திருத்தச் சட்டமூலத்தினூடாகப் பல சுயாதீன ஆணைக்குழுக்கள் உருவாக்கப்பட இருக்கின்றன. நீண்டகாலமாக மக்கள் எதிர்பார்த்த சில விடயங்கள் இதனூடாக மக்களை எட்டவிருக்கின்றது. பத்தொன்பதாவது திருத்தச் சட்டமூலத்தின் ஊடாக மேற்கொள்ளப்பட எதிர்பார்க்கின்ற விடயம் தொடர்பாகப் பலரும் கிட்டத்தட்ட இருபது வருடங்களாகப் பேசி வருகின்றனர். 1994ஆம் ஆண்டி லிருந்து கடந்த தேர்தல் காலம்வரை பல கட்சிகள் தங்கள் தேர்தல் விஞ்ஞாபனங்களிலே அதை உள்ளடக்கி வந்திருக் கின்றன. அரச தரப்பினர் ஓர் அரசியலமைப்புத் திருத்தச் சட்டமூலத்தை பாராளுமன்றத்துக்குக் கொண்டுவந்தால் எதிர்க்கட்சியினர் அதை எதிர்க்கின்ற, அந்தச் சட்டமூலத்தைக் கொளுத்துகின்ற நிகழ்வுதான் கடந்த இருபது வருடங்களாக

[ගරු ජේ. ශ්‍රී රංගා මහතා]

நிலவி வந்தது. ஆனால், இம்முறை கொண்டுவரப்பட்டிருக்கின்ற இந்தப் பத்தொன்பதாவது திருத்தச் சட்டமூலத்தில் பல மாற்றங்கள் கொண்டுவரப்பட்டிருக்கின்றன. இதை நல்லாட்சி - good governance என்று சொல்கின்றார்கள்.

உண்மையில், இந்த good governance இல் என்ன கொண்டுவரப்பட்டிருக்கின்றது? உதாரணமாக, 13.02.2015 அன்று gazette notification ஒன்று வெளியாகியிருக்கின்றது. அதன் பிரகாரம் பிரதம மந்திரி அவர்களின் தலைமையில் 7 அமைச்சர்கள் கொண்ட ஒரு குழு உருவாக்கப்பட்டு ஊடக நிறுவனங்கள் கண்காணிக்கப்படும். ஊடக நிறுவன அதிகாரிகள் ஒழுங்காக வேலை செய்யவில்லையென அந்தக்குழு தீர்மானித்தால் நேரடியாக பொலிஸ் அதிகாரிக்கு சம்பந்தப்பட்டவர்களைக் கைதுசெய்யும்படி கட்டளையிடும். இதன்மூலம் ஒரு தகவலின் அடிப்படையில் ஓர் அதிகாரி கைதுசெய்யப்படும் துர்ப்பாக்கிய நிலைமை! அப்படியானால், உண்மையில் இது நல்லாட்சியா? என்று கேட்கவேண்டியிருக்கின்றது. ஏற்கெனவே எனக்கு முன்னர் பேசிய உறுப்பினர் அவர்களும் இதுபற்றிக் குறிப்பிட்டார். அப்படிப் பார்த்தால், ஊடக நிறுவன உரிமையாளர்களாக இருக்கின்ற இங்குள்ள உறுப்பினர்கள் பலர் கைதுசெய்யப்பட்டு விடுவார்கள். ஏன், ஐக்கிய தேசியக் கட்சியைச் சேர்ந்த பாதுகாப்புப் பிரதியமைச்சரான ருவன் விஜயவர்தன அவர்களுடைய தந்தையைக்கூட கைதுசெய்யும் துர்ப்பாக்கிய நிலைமை ஏற்பட்டுவிடும். ஆனால், நல்லவேளையாக அந்தத் திருத்தம் இந்த நாட்டில் அமுலுக்கு வரவில்லை. அவ்வாறு அமுலுக்கு வந்திருந்தால், இந்தப் பாராளுமன்றத்தில் அதற்கு ஆதரவாகக் கையுயர்த்தியதன்மூலம் தந்தையார் கைதுசெய்யப்படுவதற்கான பாவம் மகனுக்கு ஏற்பட்டிருக்கும்.

நல்லாட்சி பற்றிப் பேசிக்கொண்டு, ஒருதலைப்பட்சமாக எப்படி தங்களுக்கு அதிகாரங்களைக் குவித்துக்கொள்ளலாம்? என்றுதான் சிந்திக்கின்றார்கள். அந்த வகையில்தான், இந்தப் பத்தொன்பதாவது திருத்தச் சட்டமூலத்தில் பல விடயங்கள் புகுத்தப்பட்டிருக்கின்றன. மக்களுக்குத் தேவையான முறையிலே இந்தத் திருத்தங்கள் செய்யப்பட வேண்டுமென்று சிந்திக்கவில்லை. Gazette Notification ஐ பாராளுமன்ற உறுப்பினர்களும் மக்களும் மதித்தார்கள். ஆனால், இன்று சிரிக்கின்றார்கள். ஏனென்றால், இன்று ஒரு Gazette Notification. நாளை இன்னொன்று! நாளை மறுநாள் வேறொன்று! முதல் நாள் வெளியீட்டில் இருந்த வாசகம், அடுத்த நாள் வெளியீட்டில் இருக்கவில்லை; அடுத்தநாள் வெளியீட்டில் இருந்த வாசகம், அதற்கடுத்த நாள் வெளியீட்டில் இருக்கவில்லை. இதுதான் நல்லாட்சியா?

எனவே, நல்லாட்சி என்றால் என்ன? ஒரு நாட்டில் மக்கள் நிம்மதியாக வாழவேண்டுமென்றால் அங்கு அதற்குரிய ஒரு சட்டம் இருக்க வேண்டும். அந்தச் சட்டத்தை இயற்றுபவர்கள் யார்? அவர்கள் இந்தப் பாராளுமன்றத்தில் இருக்கின்ற உறுப்பினர்கள். அவர்களை யார் தீர்மானிக்கிறார்கள்? நாட்டு மக்கள். எனவே, அந்த மக்களுக்காக நாட்டில் நல்லாட்சி இருக்க வேண்டுமானால் அவர்களுக்குத் தேவையான வகையில்தான் சட்டங்கள் இயற்றப்பட வேண்டும். ஆனால், அன்று தங்களுடைய ஆட்சியை நீடித்துக்கொள்வதற்காக அப்பொழுது அதிகாரத்தில் இருந்தவர்களால் 14வது அரசியலமைப்புத் திருத்தச் சட்டம் கொண்டுவரப்பட்டதென்பது இந்தச் சபைக்குத் தெரியும். அதுபோல், ஐக்கிய மக்கள் கூட்டமைப்பைத் தொடர்ந்தும் ஆட்சியில் வைத்திருப்பதற்காகத்தான் 17வது திருத்தச் சட்டம் கொண்டுவரப்பட்டது. எனவே, இந்தப் பாராளுமன்றத்திலே மக்களுக்காகத்தான் சகல சட்டமூலங்களையும் கொண்டுவருகிறோம் என்று கூறினாலும் உண்மையிலே அங்கீகரிக்கப்பட்ட அனைத்துச் சட்டங்களுமே மக்களுக்காகக் கொண்டுவரப்பட்டவையல்ல. தமது கட்சியை எப்படி ஆட்சியில் அமர்த்துவது? தம்முடன் இணைந்திருக்கின்ற கட்சிகளை எப்படி சந்தோசப்படுத்துவது? என்பதற்காகத்தான் அவை கொண்டுவரப்பட்டிருக்கின்றன. இன்று கூடப் பார்த்தால், -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Order, please! දැන් ගරු කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *took the Chair.*

**ගරු ජේ. ශ්‍රී රංගා මහතා**
(மாண்புமிகு ஜெ. ஸ்ரீ ரங்கா)
(The Hon. J. Sri Ranga)

இந்தச் சட்டங்களிலே பல மாற்றங்களைக் கொண்டுவர வேண்டிய தேவையில்லை. சுதந்திர இலங்கையில் முதன் முறையாக 225 பாராளுமன்ற உறுப்பினர்களும் 19வது திருத்தச் சட்டமூலத்துக்கு ஆதரவளிப்பதற்கு ஆரம்பத்திலே தயாராகத்தான் இருந்தார்கள். ஆனால், துரதிருஷ்டவசமாக இன்று அவர்கள் பாராளுமன்ற 'கொரிடோர்'களிலே சண்டைபிடிக்கின்ற நிலைமை ஏற்பட்டிருக்கின்றது. காரணம், நிறைவேற்று அதிகாரம் கொண்ட ஜனாதிபதி முறைமையை ஒழித்து, அதையும்விட இன்னொரு சர்வாதிகாரம் கொண்ட முறைமையைக் கொண்டுவருகின்ற நிலைமையிருப்பதாக அவர்கள் கருதுகின்றார்கள்.

இன்றுள்ள நல்லாட்சியிலே உச்சநீதிமன்றம் சென்று 19ஆம் திருத்தச் சட்டமூலத்தில் மாற்றம் செய்ய முடியுமென்றால், உண்மையிலே அதில் மக்களுக்குத் தேவையான திருத்தங்கள் உள்ளனவா? என்பதைப் பார்க்க வேண்டும். ஏனென்றால், இன்று இந்தச் சபையிலே பேசப்பட்ட பல விடயங்களைக் கட்சி பேதங்களற்ற ஒரு தமிழ் மகனாக நின்று கவனித்துப் பார்த்தால், இந்தத் திருத்தச் சட்டமூலத்திலே தமிழ் மக்களுக்கென்று எதுவுமில்லை என்பதைத் தெரிந்து கொள்ளலாம். எனினும், இந்த நாட்டிலே ஒரு நல்லாட்சி வேண்டும் என்ற ஒரேயொரு காரணத்துக்காகத்தான் இங்கிருக்கின்ற சகல தமிழ் பேசும் உறுப்பினர்களும் இன்று இதற்கு ஆதரவளிக்கிறார்கள்.

19வது திருத்தச் சட்டமூலத்தைப் பொறுத்தவரையிலே, இந்த நாட்டுக்குத் தேவையான பல விடயங்கள் இருக்கின்றன. அதிலும் சுயாதீனமாக அமைக்கப்படுகின்ற ஆணைக்குழுக்கள் நிச்சயமாக மக்களுக்குச் சேவைகளை வழங்கும் என்றொரு எண்ணம் அவர்கள் மத்தியிலே இருக்கிறது. இருந்தும், இந்த நாட்டை வழிநடத்துகின்ற சட்டங்களை இயற்றுகின்ற இடமாகிய இந்தப் பாராளுமன்றத்தை விட்டு, எங்கேயோ இருக்கின்ற, அவர்களுக்குத் தெரிந்த NGO காரரையும் மற்றவர்களையும் கொண்டுவந்து ஆணைக்குழுக்களில் புகுத்துவதற்காக வாக்குவாதம் நடக்கின்றது. இன்று இந்த நாட்டிலே ஜனாதிபதி, பிரதம அமைச்சர், அமைச்சர்கள் மற்றும் பாராளுமன்ற உறுப்பினர்கள் எதற்கு வாக்குவாதப்

படுகிறார்கள்? எதற்கு மோதிக்கொள்கிறார்கள்? யாரோ வெளியில் இருக்கிற NGOகாரரையும் உள்ளுக்குள் கொண்டுவர வேண்டுமாம். அதற்காகத்தான் இங்கு வாக்கு வாதம் நடந்துகொண்டிருக்கின்றது.

தேர்தல் முறையில் மாற்றம் ஏற்பட வேண்டும் என்றெல்லாம் பலமுறை பேசப்பட்டது. அதனடிப்படையில் பல தொகுதிகளிலே தனித்துப் போட்டியிடுகின்ற கட்சி களுக்குப் பாராளுமன்ற ஆசனங்கள் கிடைக்காமல் போகலாம். சிலவேளை எனது நண்பி திருமதி விஜயகலா மகேஸ்வரனுக்குக்கூடக் கிடைக்காமற் போகலாம். இந்தத் தேர்தல் முறையின்படி யாழ். மாவட்டத்தில் அல்லது கொழும்பு மாவட்டத்தில் பிரசாரம் செய்கின்றபொழுது இங்கு நாங்கள் 'எதனோல்'காரர்களையும் குடுக்காரர்களையும் முற்றுமுழுதாக அதிலிருந்து நீக்கிவிடமுடியாது. ஏனெனில், தேர்தல்களுக்குச் செலவழிப்பதற்கான நிதி அவர்களிடம்தான் இருக்கிறது. நான் தெரிவுசெய்யப்பட்ட நுவரெலியா மாவட்டமாக இருந்தாலும் இந்தத் தேர்தல் முறைமையின்மூலம் எனக்கு பாராளுமன்ற அங்கத்தவராக வரமுடியும். ஆனால், அதற்குச் செலவழிக் கின்ற பணத்தைப் பார்க்கின்றபொழுது நான் பாராளுமன்றம் வருவது முக்கியமல்ல என்பது தெரிகிறது. ஆனால், தொகுதி வாரியான முறைமையின்படி, மக்களால் தெரிவுசெய்யப் படுகின்ற பாராளுமன்ற உறுப்பினர்கள் அந்தந்தத் தொகுதிக்குள்ளேயே இருப்பதால் செலவழிக்கின்ற பணம் குறைவாக இருக்கும்.

கொழும்பு மாவட்டத்திலிருந்து தெரிவுசெய்யப்பட்ட பாராளுமன்ற உறுப்பினர் ஒருவர் இந்தச் சபையிலே இருக்கின்றார். எல்லா மின்கம்பங்களிலும் அவருடைய posters இருந்தன. ஒரு posterக்கு கிட்டத்தட்ட 1,000 ரூபாய் செலவாகும். கொழும்பு மாவட்டத்தில் இருக்கின்ற எல்லா மின்கம்பங்களையும் கணக்கிட்டால் அவர் செலவழித்த காசை மதிப்பிடலாம். அவர் அதனைப் பெறுவதற்கு மூன்று தரம் தன்னுடைய வாகன permit ஐ விற்கவேண்டியதாக இருந்திருக்கும். அவர் அமைச்சரென்பதால் அதிலிருந்து நிதியைப் பெற்றிருப்பார்.

இந்த நிறைவேற்று அதிகார முறைமையில் மாற்றம் கொண்டுவர வேண்டுமென்று பேசிய இரு கட்சிகளும் அதில் உடன்பாடு காணாத ஒரு நிலை காணப்படுகின்றது. இது ஒரு துரதிருஷ்டவசமான நிலைமை! இந்தப் பாராளுமன்றத்திலே நாங்கள் நல்லாட்சியைப் பற்றிப் பேசுகிறோம்; நல்லாட்சிக் காகத்தான் மக்கள் கடந்த ஜனாதிபதித் தேர்தலில் வாக்களித் திருக்கிறார்கள்; எதிர்க்கட்சியிலிருப்பவர்களும் ஆளும் கட்சி யிலிருப்பவர்களும் அதற்கு ஆதரவளிக்கின்றார்கள். இருந் தாலும், இருதரப்பிலும் உடன்பாடு காணப்படவில்லை. சர்வாதிகாரம் கொண்ட ஜனாதிபதி முறைமையை ஒழித்து விட்டு, பிரதம மந்திரிக்குச் சர்வாதிகாரங்களையும் கொடுப் பதா? மீண்டும் இன்னொரு 30 வருடங்கள் அதற்கெதிராகப் போராட்டம் நடத்த வேண்டிவருமா? என்ற கேள்விகள் இங்கே எழுகின்றன.

ஒவ்வோர் அமைச்சுக்கும் Consultative Committees இருக்கின்றன. அந்தக் குழுக்களுக்கு எந்த அதிகாரங்களும் வழங்கப்படவில்லை. இந்த விடயத்தை ஏன் Consultative Committee இல் கலந்துரையாட முடியவில்லை? நல்லாட்சியில் Consultative Committees ஊடாக ஏன் மாற்றங்களைக் கொண்டுவர முடியவில்லை? பத்தொன்பதாவது திருத்தச் சட்டமூலத்தை Consultative Committeeஇல் கலந்துரையாடிய பின்பு இந்தப் பாராளுமன்றத்துக்கு சமர்ப்பித்திருந்தால் ஆளுங்கட்சியும் எதிர்க்கட்சியும் ஒன்றாகச் சேர்ந்து அதை ஆதரித்திருக்க முடியும். இன்று எதிர்க்கட்சியினர் குழப்பு கிறார்கள்; ஆளுங்கட்சியினர் சம்மதிக்கிறார்கள் என்ற நிலை உருவாகியிருக்கின்றது. இந்த 19ஆவது திருத்தச் சட்டமூலத்தை அமைச்சர்களே எதிர்த்துப் பேசுகின்ற நிலைமையும் அமைச்சர்கள் நீதிமன்றத்துக்குச் செல்ல வேண்டிய நிலைமையும் ஏற்பட்டிருக்கின்றதென்றால் இது ஒரு நல்லாட்சியா? இந்தத் திருத்தச் சட்டமூலம் மக்களின் தேவைக்காக உருவாக்கப்பட்டிருந்தால் ஏன், ஓர் அமைச்சர் நீதிமன்றத்தை நாடிச் செல்ல வேண்டும்? ஏன், அமைச்சர்கள் பலர் இன்று இந்தத் திருத்தச் சட்டமூலத்திற்கு எதிராகப் பேச வேண்டும்? தமது கட்சித் தலைவரின் ஆசீர்வாதத்தோடு கொண்டுவரப்பட்ட இந்த 19ஆவது திருத்தச் சட்டமூலத்திற்கு ஆதரவாகப் பேசாவிட்டால், அடுத்தமுறை தனக்கு nomination கிடைக்காமல் போய்விடும்; மீண்டும் தன்னால் பாராளு மன்றத்துக்கு வரமுடியாது என்பதற்காக, பொய்யாகக் கூக்குரலிடுவதில் எந்தவித பிரயோசனமும் இல்லை. ஆகவே, இதில் ஒவ்வொருவரும் தமது கட்சிகளைப் பற்றிச் சிந்திக்காதீர்கள்! மக்களைப் பற்றிச் சிந்தியுங்கள்! என்று நான் அனைவரிடமும் கேட்டுக்கொள்ள விரும்புகின்றேன். உங்களைக் கட்சி தெரிவு செய்யவில்லை; மக்கள்தான் தெரிவு செய்தார்கள். மக்கள் உங்களைத் தெரிவுசெய்தது உங்களுடைய சொந்த நலன்களுக்காக அல்ல! ஆனால், தற்போதைய தேர்தல் முறைமையில் மாற்றம் ஏற்பட வேண்டுமென்பது பலராலும் ஒத்துக்கொள்ளப்பட்ட விடயமாக இருக்கின்றது.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි. තව විනාඩි දෙකක් ගන්න.

**ගරු ජේ. ශ්‍රී රංගා මහතා**
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)

இந்த 19ஆவது திருத்தச் சட்டமூலத்தை எல்லோரும் எதிர்பார்த்துக்கொண்டிருக்கின்றார்கள். தேசிய நிறைவேற்றுச் சபையில் இது பற்றி ஆராயப்பட்டிருக்கிறது.

இன்னமும் தீர்க்கப்படாத பல பிரச்சினைகள் இருக் கின்றன. இந்தப் பாராளுமன்றத்தில் அங்கம் வகித்த பல உறுப்பினர்கள் சுட்டுக் கொல்லப்பட்டிருக்கிறார்கள். அவர்கள் சம்பந்தமாக அந்த உயர் சபையிலே இன்றுவரை பேசப் படவில்லை. ஒருசிலரின் விடயங்கள் பற்றி அமைச்சர் ராஜித சேனாரத்ன அவர்கள் பேசியிருக்கிறார். மக்களுக்குத் தேவையான சட்டமூலங்களைக் கொண்டுவருகின்றபொழுது ஏன், மக்களால் தெரிவுசெய்யப்பட்ட எங்களால் அதற்கு உடன்பட முடியவில்லை? மக்கள் உறுப்பினர்களைப் பற்றித் தீர்மானிப்பதற்கு இது நல்லதொரு சந்தர்ப்பம்! திருத்தச் சட்டமூலங்கள் கொண்டுவரப்படுகின்றன; அவை நீதிமன்றத் திற்கு ஆற்றுப்படுத்தப்படுகின்றன. நீதிமன்றமே அவற்றின் சரத்துக்கள் சில அரசியலமைப்புச் சட்டத்திற்கு முரணான தென்று கூறுகின்றது. இதனால் நல்லாட்சி பற்றிய நம்பிக்கை மக்களிடமிருந்து போய்விட்டது.

1994ஆம் ஆண்டு manifesto இலும் இந்தத் திருத்தச் சட்டமூலம் பற்றிக் கூறப்பட்டது. இருபது வருடங்களின் பின்பும் அந்த விடயங்கள் பற்றிக் கூறப்படுகின்றது. இன்று இந்தத் திருத்தச் சட்டமூலத்தின்படி சில ஆணைக்குழுக்களை அமைப்பதற்குத் தீர்மானிக்கப்பட்டிருக்கின்றது. ஆகவே, சிறுபான்மை இனத்தவர்களையும் இந்த ஆணைக்குழுக்களில் உள்வாங்கி, அதனூடாக ஒரு ஜனநாயக ஆட்சியை ஏற்படுத்த வேண்டும். Direct democracy ஐ உருவாக்க வேண்டுமென்று கேட்டு, இந்தச் சபைக்கு மீண்டும் நன்றி கூறி, விடைபெறுகின்றேன்.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මීළඟට, ගරු ජගත් පුෂ්පකුමාර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.32]

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා (වැවිලි කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார - பெருந்தோட்டக் கைத்தொழில் பிரதி அமைச்சர்)
(The Hon. A.P. Jagath Pushpakumara - Deputy Minister of Plantation Industries)
ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම අද දවස මේ රටේ ඓතිහාසික දවසක් වන බවට නොඅනුමානයි. වසර ගණනාවක් තිස්සේ විධායක ජනාධිපති ධුරයේ බලතල අඩු කිරීම වාගේම ආසනයකට වග කියන මැතිවරණ ක්‍රමයක් හඳුන්වා දීම සම්බන්ධව වර්තමාන අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පමණක් නොවෙයි, 1994 සිටම මේ පාර්ලිමේන්තුව නියෝජනය කරපු කෙනෙක් හැටියට මා දන්නවා, මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම සහ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සම්බන්ධව විටින් විට සෑම ජනාධිපතිතුමෙක්ම, ජනාධිපතිතුමියක්ම මේ රටට පොරොන්දුවක් දුන් බව. 1994 වර්ෂයේ එදා හිටපු ජනාධිපති අපේක්ෂක නිහාල් ගලප්පත්ති මහත්මයා ඉල්ලා අස් වුණා. එදා මෙදා තුර බලයට පත් වූ සෑම කෙනෙක්ම, හිටපු රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලයේ ඉඳලා, හිටපු ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා ඇති කරපු මේ විධායක ජනාධිපති ක්‍රමය වෙනස් කිරීම සඳහා පාර්ලිමේන්තු මැති ඇමතිවරුන් පක්ෂ පාට භේදයෙන් තොරව එකඟ වුණා. නමුත් මේ කටයුත්ත සාර්ථක කර ගන්න හැකියාවක් ලැබුණේ නැහැ. වර්තමාන මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට හැකියාව ලැබෙනවා, මේ දෙපැත්තේම කණ්ඩායම් එකතු කර ජනතාව බලාපොරොත්තු වන ආකාරයට අද මේ සංශෝධන ඉදිරිපත් කර, මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණු එක අවස්ථාවක් උදා කරන්න. එපමණක් නොවෙයි, එතුමා බලාපොරොත්තු වුණු ආකාරයටම විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව මැතිවරණ කොට්ඨාසයකට සෘජුව වග කියන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් පත් කිරීම සඳහා අවස්ථාවක් උදා කර දෙන්න සියලු දෙනාටම හැකියාව ලැබෙයි කියා අපි විශ්වාස කරනවා. පවතින මැතිවරණ ක්‍රමය අනුව විශාල වශයෙන් මුදල් වැය කරන්න වෙනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමා නියෝජනය කරන තිස්සමහාරාම ආසනයෙන්, එහෙම නැත්නම් කිරින්දෙන්, කතරගමින් පටන් ගත්තාම මෙහා කෙළවරේ මහවෙළ, නාකුළුගමුව, කුඩාවැල්ල දක්වා ඡන්ද ගන්න විශාල ප්‍රදේශයක යන්න වෙනවා. මම නියෝජනය කරන ප්‍රදේශය වන තණමල්විල, රණවරනාවෙන් පටන් ගත්තාම මේ දිස්ත්‍රික් මැතිවරණ ක්‍රමයේදී ඈත කෙළවරේ ඉඟිනියාගල දක්වා කිලෝමීටර 200ක් විතර අපි යන්න ඕනෑ. මේ නිසා ඡන්ද ප්‍රචාරක වැඩ කටයුතු සඳහා විශාල මුදල් සම්භාරයක් වැය වෙනවා. ඊළඟට, එක එක ඡන්ද දායකයාට වර දාන දීලා, ගිහිල්ලා බඩු බෙදා දීලා, ඒ නොයෙක් ආකාරයට තමයි අපට ඡන්ද ලබා ගන්න සිදු වෙන්නේ. මේ කටයුත්ත කිරීම සඳහා වර්තමාන මැතිවරණ කොමසාරිස්තුමා ඉතාම උනන්දුවෙන්, අප්‍රමාණ ශක්තියකින් යුතුව කටයුතු කර ගෙන යනවා. අතිගරු ජනාධිපතිතුමාටත්, අප සියලු දෙනාටමත් නොබෝ දිනකදී මේ මැතිවරණ ක්‍රමය සංශෝධනය කර ජනතාවට සෘජුව වග කියන මන්ත්‍රීවරුන් පත් කරන්න හැකියාව ලැබෙයි කියා මා විශ්වාස කරනවා.

අද මේ විධායක ජනාධිපති ධුරයේ බලතල අඩු කිරීම සම්බන්ධව වර්තමාන ජනාධිපතිතුමා ඉතාම කැපවීමෙන් කටයුතු කළා. එතුමා සෑම අවස්ථාවකදීම කිව්වේ, "දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට සහාය දෙන්න." කියායි. ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න ඉස්සර වෙලා එතුමාගේ සියලුම බලතල අඩු කරන්න සම්පූර්ණ සහාය දෙන්න කියා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් වන අපෙන් ඉල්ලීමක් කළා. ඒ නිසා තමන්ට තිබෙන බලය අඩු කරන්න උත්සාහ ගත්ත නිර්ලෝභී නායකයෙක් හැටියට එතුමා අද මේ රටේ ඉතිහාසයට පමණක් නොවෙයි, ලෝක ඉතිහාසයටත් එක් වනවා. උදාහරණයක් හැටියට මම කලින් කිව්ව මැතිවරණ ක්‍රමය අරගෙන බලන්න. ගරු කථානායකතුමනි, කයිට්ස් මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද දායකයන් සංඛ්‍යාව 26,000යි. ඊළඟට නුවරඑළිය මස්කෙළිය මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද දායකයන් සංඛ්‍යාව 302,000යි. එක මැතිවරණ කොට්ඨාසයක ඡන්ද දායකයින් සංඛ්‍යාව 302,000ක් වෙන කොට තවත් මැතිවරණ කොට්ඨාසයක ඡන්ද දායකයන් සංඛ්‍යාව 26,000යි. ඒ නිසා මේ සම්බන්ධව නැවත සීමා නිර්ණය කොමිසමක් පත් කරලා ඉතාම කෙටි කාලයක් තුළ මේ කර්තව්‍ය ඉටු කරන්න මැතිවරණ කොමසාරිස්තුමාට හැකියාව තිබෙනවාය කියා අප විශ්වාස කරනවා.

අපේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මධ්‍යම කාරක සභාව, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායම එකඟ වෙලා ජාතික සමගි සන්ධාන රජයකට එකතු වුණේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත්, විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් සම්මත කරගෙන මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා බලාපොරොත්තු වුණු විධියට ඒ කටයුතු ඉෂ්ට කරන්නයි. අපි ඒ විධියට කටයුතු කර එම බලාපොරොත්තු ඉෂ්ට කර දීලා නැවතත් එක්සත් ජාතික පක්ෂය හැටියට එක්සත් ජාතික පක්ෂ අපේක්ෂකයෝත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට අපිත් තරග කරලා නැවත රටේ සංවර්ධනය උදෙසා අවශ්‍ය කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ අනුව සියලු දෙනාම අත් වැල් බැඳගෙන අතිගරු ජනාධිපතිතුමා බලාපොරොත්තු වන ආකාරයට කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගනු ඇතැයි මා විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මම ඉතාම වැදගත් කාරණාවක් මේ සභාවට යොමු කරන්න බලාපොරොත්තු වෙනවා. දැන් මගේ අතේ තිබෙනවා, 2015 පෙබරවාරි මස 13වැනි සිකුරාදා නිකුත් කළ 1901/20 දරන අති විශේෂ ගැසට් පත්‍රය. මේ ගැසට් පත්‍රය "පොලිස් ආඥාපනත (53 අධිකාරිය වූ) පොලිස් ආඥාපනතේ 55වන වගන්තිය යටතේ ..." යනුවෙන් පොලිස්පතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාට මේ ගැසට් පත්‍රය ලැබුණාද කියා මම දන්නේ නැහැ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට අප කිසිම කෙනෙකුට මේ දක්වා මෙම ගැසට් පත්‍රය ලැබිලා නැහැ. ගරු කථානායකතුමනි, ඒ නිසා මම විශේෂයෙන්ම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ ගැසට් පත්‍රය මුද්‍රණය කළේ කවදාද කියා සොයා බලන ලෙස. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට අපේ දැන ගැනීම සඳහා මෙම ගැසට් පත්‍රය ලැබුණේ නැහැ. ඊයේ තමයි අපට කිසියම් ආකාරයකින් මෙය ලැබුණේ. මේ ගැසට් පත්‍රය තුළ බරපතළ තත්ත්වයක් තිබෙනවා. අප ඒ බව බොහොම වග කීමෙන් කියන්න ඕනෑ. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අප උදව් කරනවා කියන එක අපට කියන්න පුළුවන්. ඒ වාගේම ජනාධිපතිතුමාගේ බලතල ඉවත් කරලා මේ පාර්ලිමේන්තුවට බලතල ගෙනෙන කොට දේශපාලන දඩයමේ යන්න මේ ගැසට් පත්‍රය නිකුත් කරලා කටයුතු කරනවා නම් ඒ සඳහා අපේ සම්පූර්ණ විරෝධතාව පළ කරනවාය කියන එකත් මේ අවස්ථාවේ කියන්නට ඕනෑ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් කථාව අවසන් කළොත් හොඳයි.

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
අද මම කියන්න ඕනෑ ශ්‍රී ලංකා පොලිස්,-

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
දැන් කථාව අවසන් කරන්න.

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
තව විනාඩියක කාලයක් දෙන්න ගරු කථානායකතුමනි. මෙය ඉතාමත් වැදගත් කාරණාවක්; රටේ ජනතාව දැනගන්න ඕනෑ කාරණාවක්. ඒ නිසා මට තව විනාඩියක කාලයක් දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ ගැසට් පත්‍රයේ තිබෙනවා, "ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව තුළ නව පොලිස් කොට්ඨාසයක් ස්ථාපිත කිරීම" කියලා.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
Sir, I rise to a point of Order.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, ඒ සඳහා විධායක සභාවේත් දැනුවත්කමක් තිබෙනවාද කියලා සොයලා කියන්න පුළුවන්ද?

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
මම විධායක සභාව නියෝජනය කරන්නේ නැහැ.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ඔබතුමා නියෝජනය කරනවා කියලා නොවෙයි මම කියන්නේ. පොඩ්ඩක් ඒ ගැන හොයලා කියන්න. රජයේ ප්‍රධානීන් ඒ ගැන කියයිනේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, තව තත්පර ගණනයි තිබෙන්නේ. දැන් කථාව අවසන් කරන්න.

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
ගරු කථානායකතුමනි, මගේ වෙලාව?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමා දැන් කථාව අවසන් කරන්න.

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
ගරු කථානායකතුමනි, මට විනාඩියක කාලයක් දෙන්න මේ කාරණය අවසන් කරන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විනාඩියකට වැඩියි. දැන් විනාඩි දෙකක් විතර ගත වුණා.

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
මේ ගැසට් පත්‍රයේ "ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව තුළ නව පොලිස් කොට්ඨාසයක් ස්ථාපිත කිරීම" කියන සිරස් තලය යටතේ අංක 04 වශයෙන් මෙසේ සඳහන් වනවා:

> "04. අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව පිහිටුවා ඇති, අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් කැබිනට් අනු කමිටුව මගින් ස්ථාපිත කර ඇති ලේකම් කාර්යාලය විසින් මෙම පැමිණිලි විමර්ශනය කිරීම සඳහා පොලිස්පතිවරයාට යොමු කරන අතර, ඊට අමතරව විශේෂිත පැමිණිලි කැබිනට් අනුකමිටුව මගින් සෘජුවම මෙම කොට්ඨාස භාර නියෝජ්‍ය පොලිස්පති වෙත යොමු කරනු ලැබේ."

මෙතැනදී මහජන,- [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි. මීළඟට කථා කරන්නේ ගරු රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමා.

[අ.භා. 6.40]

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் கொள்கை உருவாக்கம், பொருளாதார அலுவல்கள், சிறுவர், இளைஞர் மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremasinghe - Prime Minister, Minister of Policy Planning, Economic Affairs, Child, Youth and Cultural Affairs)
ගරු කථානායකතුමනි, 1978 විධායක ජනාධිපති ක්‍රමය හඳුන්වා දෙන කොට එදා පාර්ලිමේන්තුවේ හිටපු පස්දෙනෙක් අද මේ ගරු සභාවේ ඉන්නවා. ඒ තමයි, මමත්, ජෝශප් මයිකල් පෙරේරා ඇමතිතුමාත්, ගාමිණී ජයවික්‍රම පෙරේරා ඇමතිතුමාත්, පී. දයාරත්න මැතිතුමාත්, ආර්. සම්පන්දන් මැතිතුමාත්. ඒ අය අතරින් සම්පන්දන් මැතිතුමා හැර අප සියලු දෙනාම විධායක ජනාධිපති ක්‍රමය ඇති කරන්න පක්ෂව ඡන්දය දුන්නා. අපේ රට 1972 දී ජනරජයක් වූ අවස්ථාවේදී ඒ ජනරජයෙන් අප බලාපොරොත්තු වුණු දියුණුවවත්, ප්‍රගතියවත් මේ රටට ලැබුණේ නැහැ.

විශේෂයෙන්ම අපේ මතය අනුව පාර්ලිමේන්තුවේ සියලුම බලය කැබිනට් මණ්ඩලයටත්, කැබිනට් මණ්ඩලයෙන් අගමැතිටත් භාර දීලා, හදිසි නීතිය එක්ක රට පාලනය කරන්න අගමැතිට පුළුවන් වුණා. ජනතාව මෙය ප්‍රතික්ෂේප කළ නිසා එදා විධායක ජනාධිපති ක්‍රමයක් ඇති කරන්න ජනවරමක් ඉල්ලුවා. ප්‍රංශයේ පස්වැනි ජනරජයේ "චාල්ස් ඩි ගෝල්" ජනාධිපතිතුමා ඇති කරන ලද ක්‍රමය අනුගමනය කරමින් පාර්ලිමේන්තුවයි විධායක ජනාධිපතිතුමායි එකට එකතු කළා. ඒකට විශේෂයෙන්ම

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

තිබුණේ පාර්ලිමේන්තුව විශ්වාසය තබන අගමැතිවරයෙක් සිටීමත්, කැබිනට් මණ්ඩලයක් මාර්ගයෙන් ක්‍රියා කිරීමත්. ඒ අනුව තමයි මේ වැඩ කටයුතු කළේ. ඒ පියවර ගත්ත නිසා මේ රටේ විශාල පරිවර්තනයක්, විප්ලවයක් ඇති කරන්න එදා අපට පුළුවන් වුණා. මාස කිහිපයක් යන්නට පෙර විවෘත ආර්ථිකයක් ඇති කළා. ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අපේ අගනුවර හැටියට පත් කර පාර්ලිමේන්තුව මේ අද තිබෙන තැනට ගෙනෙන්නට අපි තීරණය කළා. මහවැලි ව්‍යාපාරය ආරම්භ කළා. නිදහස් වෙළෙඳ කලාප ආරම්භ කළා. "උදාගම්" නිවාස සංකල්පය ආරම්භ කළා. මම හිතන හැටියට මේවායේ සංවර්ධනයක් ඇති වුණේ එදා ජේ.ආර්.ජයවර්ධන ජනාධිපතිතුමා දුන් ඒ නායකත්වය නිසායි. විශාල සංවර්ධනයක් ඇති වුණා. එහි බුක්තිය තවමත් අප අත් විඳිනවා. අන්න එවැනි සංවර්ධනයක් ඇති කරන්නට පුළුවන් වුණා.

ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා බ්‍රිතාන්‍ය ආණ්ඩු ක්‍රමය ගැන හිතලා, බ්‍රිතාන්‍ය ආණ්ඩු ක්‍රමය මෙතැනට එකතු කරන්නට - කැබිනට් ක්‍රමය එකතු කරන්නට- ක්‍රියා කළේ ජනාධිපතිවරයෙකුට වඩා විශේෂයෙන්ම අගමැතිවරයෙක් හැටියටයි. "පාර්ලිමේන්තුවෙන් නොවෙයි, ජනතාවට පමණක් ඉවත් කරන්න පුළුවන් අගමැතිවරයෙක් තමයි අද මේ රටේ සිටින්නේ" කියා එතුමා එක් අවස්ථාවක කිව්වා. එතුමාටත්, රණසිංහ ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමාටත් මේ කැබිනට් ක්‍රමය ගැන, පාර්ලිමේන්තු ක්‍රමය ගැන විශේෂ දැනුමක් තිබුණා. එවැනි පසු බිමක් තුළ මෙය ක්‍රියාත්මක කළා. එහෙත් එහි යම් අඩුවක් තිබුණා. ඒක සම්ප්‍රදායටත් දැම්මා. අප එය ව්‍යවස්ථාවට ඇතුළු කළේ නැහැ. එහි විපාකය තමයි අපට පසුව විඳින්නට සිදු වුණේ.

ඒ එක්කම එදා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාට පුළුවන් වුණා, මේ රටට දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කරන්න. මම හිතන හැටියට අන්න එතැනදී තමයි අද තිබෙන රාමුව සම්පූර්ණයෙන් අපි ඇති කළේ.

ඊට පස්සේ රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා බලයට ආවා. රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ ඝාතනයෙන් පසුව ඩී.බී. විජේතුංග ජනාධිපතිතුමා රජය භාර ගත්තා. පළමුවන වතාවට අපි පාර්ලිමේන්තුවේ ඉඳගෙන ජනාධිපතිවරයෙක් තේරුවා. සතියක්, සති දෙකක් පමණ කාලයක් අගමැති පුටුවේ වාඩිවෙලා තමයි එතුමා ඒ කටයුතු දෙකම කළේ. අගමැති තනතුරත් භාර ගත්තා. ඒ වාගේම ජනාධිපති තනතුරේත් ක්‍රියා කළා. පාර්ලිමේන්තුව ඇතුළේ ක්‍රියා කළ එකම ජනාධිපති හැටියට ඒ කාලයේ ක්‍රියා කළ ඩී.බී. විජේතුංග ජනාධිපතිතුමා අපට සඳහන් කරන්නට පුළුවන්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම එතුමාට එය ක්‍රියාත්මක කරන්නට අවස්ථාව ලැබුණා.

ඊට පසුව චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපතිතුමිය විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්නට කියා පත් වුණා. එහෙත් එතුමියගේ කාලය තුළ එය සිදු වුණේ නැහැ. පළමුවැනි වාරයේදී සිදු වුණේ නැහැ. දෙවැනි වාරයේදී අපි සියලු දෙනාම සාකච්ඡා කළා. විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්නට කියා අලුත් ව්‍යවස්ථාවක් ගෙන ආවා. අප එයට එකඟ වුණත් එතුමියගේ කාල සීමාව අවසන් වන තෙක් විධායක ජනාධිපති හැටියට ක්‍රියා කරන්න එතැනට අලුත් කොන්දේසියක් ආවා. අපට එයට එකඟ වන්නට බැරිවුණා.

එතැනින් පසුව මහ ඡන්දයකට ගියා. ඒ ඡන්දයේදී ආපහු ප්‍රශ්නයක් ඇති වුණා. ජනාධිපතිනිය අපේ අනුදැනුම නැතිව පාර්ලිමේන්තුව කල් තැබුවා. පාර්ලිමේන්තුව ආරක්ෂා කිරීමට ක්‍රියා කරන්න ඒ වෙලාවේ අපට සිදු වුණා. එතුමියගේ සහෝදරයා වන අනුර බණ්ඩාරනායක මැතිතුමා එදා පාර්ලිමේන්තුව ආරක්ෂා කරන තීන්දුවක් දුන්නා. ආපසු මහ මැතිවරණයක් ආවා. එතැනදී එක්සත් ජාතික පක්ෂයයි ජයග්‍රහණය කළේ. එක්සත් ජාතික පක්ෂයේ නායකයා හැටියට, පාර්ලිමේන්තුවේ බහුතරයකගේ සහයෝගය තිබුණු පුද්ගලයා හැටියට මම අගමැතිකම භාර ගත්තා. අප ඒ අවස්ථාවේ උත්සාහ කළේ වෙනත් පක්ෂයක සිටින ජනාධිපතිතුමිය එක්ක වැඩ කටයුතු කරන්නයි. ප්‍රංශයේ එයට කියන්නේ "cohabitation" කියලායි. ඒ කියන්නේ අපි කොහොමද එකට එකතු වෙලා වැඩ කරන්නේ කියන එකයි. ඒ වෙලාවේ ජනාධිපති කිසිම අමාත්‍යාංශයක් භාරගන්නේ නැතිව ප්‍රධානියා හැටියට කැබිනට් මණ්ඩලය ඇතුළේ වැඩ කරන්න උත්සාහ කළා.

ඒක අමාරු ගමනක් වුණා. කොහොම හරි අපි කාලයක් ඒ ගමන ගියා; හුඟක් වැඩ කටයුතු කළා. කඩා වැටුණු ආර්ථිකය ආපසු දියුණු කළා. අන්න එහෙමයි ඉදිරියට ගියේ. අමාරුවෙන් හෝ පක්ෂ දෙකක් එකට වැඩ කරන ස්ථාවරයකට ආවා. එහෙත් අවාසනාවකට 2003 ඔක්තෝබර් මාසයේ ඒ ජනාධිපතිතුමිය තනිවම ක්‍රියා කරලා පාර්ලිමේන්තුවේ අනුමැතිය නැතිව ඇමතිකම් තුනක් ඉවත් කළා. ඒ ප්‍රශ්න විසඳන්න බැරි වුණ නිසා අපට ආපසු මැතිවරණයකට යන්න සිදු වුණා. ඒත්, ජනාධිපති විසින් වෙනත් පක්ෂයක අගමැතිවරයකු පත් කරලා වැඩ කිරීමේ අත්දැකීම පළමුවැනි වතාවට අපට තිබුණා. මේ හැම ප්‍රශ්නයක්ම අපි පාර්ලිමේන්තුවටයි ගෙනාවේ. පාර්ලිමේන්තුවට යටත් වෙලායි, අපි ක්‍රියා කළේ.

ගරු කථානායකතුමනි, ඊට පස්සේ මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වුණා. එහෙත් ඒ කාලය වෙන කොට ජනාධිපතිගේ බලතල සීමා කරන්න ඕනෑ, නැත්නම් අහෝසි කරන්න ඕනෑ කියලා මතයක් තමයි තිබුණේ. නමුත් ඒ බලතල අහෝසි නොකළ නිසා අපි කිව්වා ඒ බලතල සීමා කරන්න කියලා.

අපි දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත ගෙනාවා, ස්වාධීන මැතිවරණ කොමිසම, ස්වාධීන පොලිස් කොමිසම, ස්වාධීන රාජ්‍ය සේවා කොමිසම, ස්වාධීන අධිකරණ කොමිසම ඇති කරන්න. ඊට වඩා බලතල පාර්ලිමේන්තුවට දෙන්න, ඒ වාගේම අගමැතිට දෙන්න, ඒ විධායක බලතල තවත් අඩු කරන්න කියලා තමයි අපි එදා යෝජනා කළේ. ඒත් මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වෙලා කිව්වා, යුද්ධයෙන් පස්සේ මේ බලතල ඉවත් කරනවා කියලා. නමුත් යුද්ධයෙන් පස්සේ දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඇති කරපු ස්වාධීන බලතල ඉවත් කරලා, ස්වාධීන කොමිෂන් සභා ඉවත් කරලා තමන්ගේ අතට ඒ බලතල ගත්තා. යුද්ධය අවසන් කිරීමට කලින් කිව්වේ, යුද්ධය අවසන් කිරීමට විධායක බලතල ඕනෑ කියලායි. අන්තිමට වුණේ, ජනාධිපති ක්‍රමය ටිකෙන් ටික පාර්ලිමේන්තුවෙන් වෙන්වීමට පටන් ගැනීමයි. එයින් කොටසක් චන්ද්‍රිකා කුමාරණතුංග ජනාධිපතිතුමියගේ කාලයේ සිද්ධ වුණා. අපි එතුමියට ඒ ගැන කිව්වාට පස්සේ ආපසු පාර්ලිමේන්තුවට ලැබුණා. 2004දී එතුමියගේ පක්ෂයට පාර්ලිමේන්තුවේ බහුතරයක් නොතිබුණු නිසා අනෙක් පක්ෂ සමඟ එකට එකතු වෙලා වැඩ කටයුතු කරන්න සිදු වුණා. එතැනදී අපට පෙනුණේ සම්පූර්ණ බලතල ජනාධිපති වෙත තබා ගනිමින් ජනාධිපති උපදේශක මාර්ගයෙන් සහ නිලධාරින් මාර්ගයෙන් කටයුතු කිරීමයි. පාර්ලිමේන්තුවේ අපි මොකුත් දැන ගෙන සිටියේ නැහැ. සමහර විට ආණ්ඩු පක්ෂයේ අයට වඩා විපක්ෂයේ අය කරුණු දැන සිටියා. වගකීමක් තිබුණේ නැහැ. කැබිනට් මණ්ඩලයයි, පාර්ලිමේන්තුවයි ජනාධිපතිගේ බලතලවලින් ඉවත් වුණා. ඒක විශාල ප්‍රශ්නයක් බවට පත් වුණා. වෙනම ආණ්ඩුවක් ඇති වුණා. ඒක "Kitchen Cabinets" එකක්වත් නොවෙයි. ගරු කථානායකතුමනි, අපි ඒකට කිව්වේ - ඔබතුමා හැර- "රාජපක්ෂ රෙජීමය" කියලායි. ඔබතුමා විතරයි ඒකෙන් පිටත සිටියේ. ඔබතුමා පාර්ලිමේන්තුවේ බලය ආරක්ෂා කරන්න ක්‍රියා කළ ආකාරය අපි මෙම ගරු සභාවේදී සඳහන් කරන්න වුවමනායි.

විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ අපෙන් විතරක් නොවෙයි, මුළු රටෙන්ම මතයක් ආවා, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න වුවමනායි කියලා. අන්තිමේදී අපි එක්සත් ජාතික පක්ෂයේ අදහස් අරගෙන, 2013 වර්ෂයේ පැවැති අපේ සම්මේලනයේදී විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරලා පාර්ලිමේන්තුවට වග කියන අගමැතිවරයෙකු යටතේ කටයුතු කරන්න ඕනෑය කියලා තීරණය කළා. ඒ තීරණය මත තමයි, පක්ෂ ගණනාවක් එකතු වුණේ. එසේ පක්ෂ ගණනාවක් එකතු වුණේ, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්නයි. ඒ එක්කම දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරන්නයි. එය අපේ ප්‍රධාන සටන් පාඨයක් බවට පත් වුණා.

එම සටන් පාඨය ඉදිරියට ගෙන යෑමේදී හදිසියේම මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ජනාධිපතිවරණයක් පැවැත්වූවා. ඒ ජනාධිපතිවරණයේදී පොදු අපේක්ෂකයෙකු ඉදිරිපත් කරනවාය කියලා අපි තීරණය කළා. ඒ පොදු අපේක්ෂකයා හැටියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට අපගේ සහයෝගය ලබා දුන්නා. අපි ඇති කළ දින සියයේ වැඩසටහනේ ප්‍රධානම තැන දුන්නේ, මේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට අප ගන්නා පියවරයන්ටයි. ඊට අමතරව මනාප ක්‍රමය අහෝසි කිරීම සම්බන්ධවත් අපි ප්‍රකාශ කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා තේරී පත් වුණාට පස්සේ, අපි කිව්ව හැටියට මේ පාර්ලිමේන්තුවේ බහුතරයක් තිබුණේ අනෙක් පක්ෂවලට. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා හැටියට පත් වුණා. එහෙත් පාර්ලිමේන්තුවේ අපි සුළුතර ආණ්ඩුවක්. විශේෂයෙන්ම සුළුතර ආණ්ඩුවක් හැටියට අපට විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත කර ගන්නත් පාර්ලිමේන්තුවේ සියලු පක්ෂවල සහයෝගය වුවමනා වුණා. අපි දින සියයේ වැඩසටහන යටතේ වැටුප් වැඩි කිරීම් ආදි වැඩ කටයුතු ගණනාවක් සිදු කළා. එහෙත් විධායක බලතල අඩු කරන්න අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත ඉදිරිපත් කළා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතේ කාරණා දෙකක් තිබෙනවා. අපි එදා ප්‍රකාශ කළේ, විධායක ජනාධිපති කැබිනට් මණ්ඩලය මාර්ගයෙන් පාර්ලිමේන්තුවට වග කියන්න ඕනෑය කියලායි.

පාර්ලිමේන්තුවේ බහුතරයක සහයෝගය තිබෙන පුද්ගලයා තමයි අගමැති වන්නේ. ඒ උපදෙස් අනුව වැඩ කටයුතු ක්‍රියාත්මක කරන්න, ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු, රාජ්‍ය ඇමතිවරු නම් කිරීම ආදී බලතල අගමැතිට පැවරුවා. අපි ආපසු දහහත් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවයි, ස්වාධීන කොමිෂන් සභායි ඇති කළා. ඒවා පදනම් කරගෙන තමයි විශේෂයෙන්ම දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. අපි එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු අවස්ථාවේදීත් ඒ සමහර කරුණු ජාතික විධායක සභාවෙන් තීරණය කර තිබුණේ නැහැ. ඒ තීරණය කරපු ඒවා අපි සංශෝධන හැටියට කැබිනට් මණ්ඩලයට දැම්මා. ප්‍රථම වතාවට මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරපු අවස්ථාවේදී අප ඉදිරිපත් කරන සංශෝධන ටිකත් ඉදිරිපත් කළා. පළමුවෙනි වතාවටයි ඒක සිදු වුණේ. මීට ඉස්සර වෙලා එහෙම සිදු වුණේ නැහැ. හදිසියේ, අන්තිම මොහොතේ තමයි ඒ සංශෝධන ගෙනෙන්නේ. ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණයෙන් කිව්වා, වගන්ති 6කට ජනමත විචාරණ වුවමනායි කියලා. අපි පොරොන්දු වූ පරිදි ඒ ජන මත විචාරණයට බලපාන වගන්ති සියල්ලම සංශෝධනය කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, මෙතැනදී එක වැදගත් කාරණයක් ලෙස, ජනාධිපතිවරයායි, කැබිනට් මණ්ඩලයයි, පාර්ලිමේන්තුවයි එකතු කරන්න තව එක පියවරක් ගත්තා. ඒ අනුව, ඇමතිවරුන් නම් කරන්නේ අගමැතිවරයා. පාර්ලිමේන්තුවට දැන් පුළුවන් ඒක වෙනස් කරන්න. එතැනින් අගමැතිවරයා ඉවත් කරන්න. ඒ අනුව තමයි ඒ පියවර අපි ඉදිරියට ගත්තේ. මේක විධායක ජනාධිපති ක්‍රමයේ බලතල අඩු කිරීමක්. බලතල සම්පූර්ණයෙන් නැති කිරීමක් නොවෙයි.

අනෙක් කාරණය මේකයි. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට දුන්න තීන්දුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණය කිව්වා, ජනාධිපතිවරයා තනියම නොවෙයි, කැබිනට් මණ්ඩලය මාර්ගයෙන් තමයි විධායක බලය ක්‍රියාත්මක කරන්නේ කියලා. ඒ කාරණය වැදගත්. එහෙම නම් අපි මෙතැනට ඉදිරිපත් කළේ කැබිනට් මණ්ඩලය මාර්ගයෙන් පාර්ලිමේන්තුවට වග කියන ජනාධිපති ක්‍රමයක්. ඉතුරු ඒවා ටික කරන්න ඊළඟ පාර්ලිමේන්තුව ව්‍යවස්ථාදායක සභාවක් හැටියට පත් කරලා අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඇති කරන්නයි අපි බලාපොරොත්තු වන්නේ.

දහහත් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවත්, ස්වාධීන කොමිෂන් සභාත් පිළිබඳ යෝජනාව අපි ඉදිරිපත් කළා. ඒවා ඉදිරිපත් කරද්දී, විශේෂයෙන්ම පරණ ක්‍රමයට තමයි අපි ඉදිරිපත් කළේ.

මේ ගරු සභාවට මම එක කාරණයක් කියන්න ඕනෑ. මෙතෙක් කල් ජනතාව කිව්වා විධායක ජනාධිපතිකමට එන එක්කෙනා ඒ බලය අත හරින්නේ නැහැ කියලා. එහෙත් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කරද්දි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ඒ මතය කඩලා කිව්වා, "අපි ඒකට එකඟ වුණා, ඒකටයි මම වරම ඉල්ලුවේ, ඒ නිසා තමයි මම දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කළේ" කියලා.

මට මතකයි, ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා විශ්‍රාම ගියාට පසු දවසක හැන්දෑවක මේ ගැන විශාල විවාදයක් යන වෙලාවේ කථා කරන කොට එතුමා මට කිව්වා, “Ranil, anyone who sits there would not like to give up that power. You have to get him out when his term is over” කියලා. ඒත් ඇත්ත වශයෙන්ම මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ඒ පුටුවේ වාඩි වෙලා පෙන්වලා තිබෙනවා, ඒ බලතල අතහරින්න ඕනෑය කියලා. ඇයි එතුමා ඒක කරන්නේ? එතුමා ඒක කරන්නේ අලුත් ක්‍රමයක් ඕනෑ නිසායි. විශේෂයෙන්ම පාර්ලිමේන්තුව ශක්තිමත් කරන්න ඕනෑ නිසායි. එහෙම නම් මා හිතන විධියට ඓතිහාසික අවස්ථාවක් තමයි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මේ උදා කරලා තිබෙන්නේ. ඒ තමයි, ආපහු මේ පාර්ලිමේන්තුවට මේ බලය දෙන එක.

අප ස්වාධීන කොමිෂන් සභා සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිහිටුවන්න කියන යෝජනාව ඉදිරිපත් කළා. ඒත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ගැන කථා කරන කොට විශාල ප්‍රශ්නයක් ආවා. විරුද්ධ පක්ෂයෙන් කියන්නේ ඒ සභාව පාර්ලිමේන්තුවට යටත් වෙන්න ඕනෑය කියලායි. ඒක පාර්ලිමේන්තුවට වග කියන්න පුළුවන්. යටත් වෙන්න බැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙන්න ඕනෑය කියනවා. විරුද්ධ පක්ෂයේ සහයෝගය නැතිව අපට මේ සංශෝධනය සම්මත කර ගන්න බැහැ. එහෙම නම් මේ සංශෝධනය සම්මත නොකර ඉන්න ඕනෑ. එහෙත් මේක වැදගත් පියවරක්. සම්පූර්ණ දුර නොගියත් යම්කිසි දුරක් මේ හරහා ගිහින් තිබෙනවා. අපේ මතය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මන්ත්‍රීවරු තුන්දෙනෙක් පමණක් ඉන්න ඕනෑය කියන එකයි. ඒ ගරු කථානායකතුමායි, අගමැතිතුමායි, විරුද්ධ පක්ෂයේ නායකතුමායි. එතුමන්ලා තමයි පාර්ලිමේන්තුවේ ප්‍රධානම නිලධාරීන්. මේ ව්‍යවස්ථා සංශෝධනයට සහයෝගය දුන්න සිවිල් සමාජයත්, අනෙක් අයත්, පූජක පක්ෂයත් අපෙන් ඒ ගැන අහන්න

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

යනවා. ඒ නිසා මම හිතුවා මේ කාරණය මෙතැනදී කියන්න. අපි තවම ඒ මතයේ ඉන්නේ. ඒත් අපට මේ පාර්ලිමේන්තුවේ බහුතරයක් නැහැ. සුළුතර ආණ්ඩුවක් තිබෙන්නේ. තුනෙන් දෙකේ බලය එකතු කර ගන්න විපක්ෂය එක්ක කථා කරන්න ඕනෑ.

එතැනදී සම්මුතියකට එන්න සිදු වුණා. ඒ සම්මුතියට ආවේ හත් දෙනෙක් මන්ත්‍රීවරු, තුන් දෙනෙක් මන්ත්‍රීවරු නොවන කණ්ඩායමක් විය යුතුය කියලායි. හැම එක්කෙනාම මේකෙන් සෑහීමට පත් වන්නේ නැහැ. මටත් මේ ගැන ප්‍රශ්න තිබෙනවා. අපේ තීරණය තිබුණේ, අපි මේ සංශෝධනය සම්මත කර ගන්නවාද, අඩු ගණනේ අපි යන ගමනෙන් මේ කොටසවත් කරගෙන යනවාද, එහෙම නැත්නම් සම්පූර්ණයෙන් අතහරිනවාද කියන එක ගැනයි. ඒ නිසා දැනට මෙතැනට යන්නේ මේ තත්ත්වයෙන් නොවෙයි. මේ පාර්ලිමේන්තුව ව්‍යවස්ථා සභාව වුණාම මම යෝජනා කරන්නේ නිර්දේශපාලනය කරන්න නම් පරණ ක්‍රමයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් ඇති කරන්න ඕනෑ කියන එකයි. ඒ ගැන විවිධ මත ඉදිරිපත් වුණා, අපි ඒක කරන්නේ කොහොමද කියලා. නම් නිකම් ගන්නවා නොවෙයි. එක එක සංවිධානවලින් වෘත්තීයවේදී සංවිධානවලින්, උගතුන්ගේ සංවිධානවලින් නම් අරගෙනයි කරන්නේ. ඒක අපට මේ අවස්ථාවේ කරන්න බැරි වුණත් ඊළඟ පාර්ලිමේන්තුවේදී කරන්න බලාපොරොත්තු වෙනවා කියලා මම කියන්න කැමැතියි.

විශේෂයෙන්ම මේ කටයුත්ත අපි මෙතැන එකට එකතු වෙලා කරන එකක්. එකට එකතු වෙලා කළාට ගරු ජගත් පුෂ්පකුමාර ඇමතිතුමා කිව්වා වාගේ ඡන්දයට යන්නේ වෙන වෙනම. නමුත් ආපහු ඇවිල්ලා බලන්න ඕනෑ, අපි එකට එකතු වෙලා මේ රට ඉදිරියට ගෙන යන්නේ කොහොමද කියලා. එහෙම නම් කැබිනට් මණ්ඩලයේ ඇමතිකම් දරන එක භාරදීම විතරක් නොවෙයි, ඊළඟට ඇති කරන්න ඕනෑ, මුළු පාර්ලිමේන්තුවම ආණ්ඩුවක් හැටියට ක්‍රියා කරන ක්‍රමයක්. එහි කථානායක ඉදීවි, නියෝජ්‍ය කථානායක ඉදීවි, නියෝජ්‍ය කාරක සභාපති ඉදීවි, අගමැති ඉදීවි, ඇමතිවරු ඉදීවි, නියෝජ්‍ය ඇමතිවරු ඉදීවි. ඒ වාගේම කාරක සභා මාර්ගයෙන් අනෙක් වැඩ කටයුතු කරන්න මන්ත්‍රීවරු පත් කරන්න පුළුවන්. එතකොට කාරක සභා සභාපතිවරු ඉදීවි. ඒ අයටත් එහි කරන්න කටයුතු තියේවි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
විපක්ෂ නායක?

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

මගේ මිත්‍ර මන්ත්‍රීතුමා හැම වෙලාවේම හිතන්නේ විපක්ෂ නායක ධුරය ගැනයි. ඔබතුමා කියනවා වාගේ විපක්ෂ නායකත් ඉන්න ඕනෑ. අපි විපක්ෂ නායකත් පත් කරන්න ඕනෑ. මම ඒ ප්‍රශ්නයට අතගහන්න යන්නේ නැහැ. මොකද, මෙතැනදී තරහ වෙලා මේ සංශෝධනයට තුනෙන් දෙකේ බලය නොදී ඉන්න පුළුවන්. විශේෂයෙන්ම අපි අලුත් ක්‍රමයකට යන්න වෙනවා. වෙස්ට්මින්ස්ටර් ක්‍රමයෙන් ටිකක් ඉදිරියට යන්න ඕනෑ. මොකද, එංගලන්තයේත් වෙස්ට්මින්ස්ටර් ක්‍රමය විශාල ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. එක පක්ෂයකට බලය ගන්න නොවෙයි, ඊළඟ පාර්ලිමේන්තුවේ කාටවත් බහුතරයක් ඇති වන්නේ නැහැ. පක්ෂ කීයක් එක්ක ආණ්ඩුවක් හදන්නද? ස්කොට්ලන්තයේ ජාතික පක්ෂය -Scottish National Party -ද, නැත්නම් උතුරු අයර්ලන්තයේ ප්‍රජාතන්ත්‍රවාදී එකමුතු පක්ෂය - Democratic Unionist Party - එක්කද, නැත්නම් Welsh ජාතිකයන් එක්කද, නැත්නම් UKIP එක්කද කියලා ඒ අයට බලන්න වෙනවා. බලන කොට අද තුන්වැනි තැන එන්නේ Liberal Democrats Party එකටවත් නොවෙයි, අලුත් පක්ෂවලටයි. හැම තැනම මේ ක්‍රම වෙනස් වෙනවා. ඇත්ත වශයෙන්ම ඩේවිඩ් කැමරන් මැතිතුමා Liberal Democrats Party එක එක්ක ඇති කළ ගිවිසුම අනුව අවුරුදු පහක් ආණ්ඩුව ගෙන ගියා. සමහරවිට ඒ පක්ෂ එකිනෙකා අතර විරුද්ධ වුණු තැනුත් තිබුණා; එකඟ වුණු තැනුත් තිබුණා; සමහර තැන්වලදී ස්වාධීනව තීරණය කරන්න කියලා මන්ත්‍රීතුමන්ලාට කිව්වා. අපිත් ඒ විධියට ක්‍රමයක් හදා ගන්න ඕනෑ. මොකද, අපි බලන්නේ මේ රට දියුණු කරලා ජනතාවට ඒ අවස්ථාව ලබා දෙන්නයි. අපි කියනවා නම් "පරමාධිපත්‍ය ජනතාවට අයිතියි" කියලා අපට පුළුවන් වෙන්න ඕනෑ, ජනතාවගේ මූලික ප්‍රශ්න විසඳලා හොඳ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ඇති කරන්න. අන්න ඒ සමාජය ඇති කරන්නයි අද මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ.

දැන් ගරු සභානායකතුමා ඉදිරිපත් කරන ඒ සංශෝධනවලට අපි සියලුදෙනාම එකඟ වෙමු. අනෙක් ඒවාට විරුද්ධ වෙමු. ඒ විධියට තමයි අපට මේ වැඩ කටයුත්ත කරලා ඉදිරියට යන්න පුළුවන් වන්නේ. අපට තවත් දේවල් කරන්න තිබෙනවා. මැතිවරණ ක්‍රමය සංශෝධනය කරන්න, තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පනත් කෙටුම්පත සම්මත කරන්න, විගණන සේවා කොමිෂන් සභාව පිළිබඳ පනත් කෙටුම්පත නීතිය ඉදිරියට ගේන්න තිබෙනවා. මූලික පියවර තමයි මේ සංශෝධන සම්මත කිරීම. මේ පියවර ඉතිහාසගත වන පියවරක් වන්නේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ආරම්භයේ සිටම කිව්වා, "මේ බලතල පාර්ලිමේන්තුවට යන්න ඕනෑ, උසාවියෙන් කියන හැම බලයක්ම අපි පාර්ලිමේන්තුවට දෙනවා" කියලා. එහෙම නම් මේ අවස්ථාවේ මේ ප්‍රශ්නය විසඳන්න ජනාධිපතිවරයා විතරක් නොවෙයි, කථානායකතුමාත් උත්සාහ ගැනීම සම්බන්ධයෙන් ස්තුති කරමින් මම මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා, මේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත සම්මත කරන ලෙස.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදි***
***කටහඬවල් අනුව "පක්ෂ" මන්ත්‍රීන්ට ජය බව කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

*வினா விடுக்கப்பட்டது.*
*குரல்களின்படி 'ஆம்' மேலோங்கிற்று என சபாநாயகர் அவர்கள் அறிவித்தார்கள்.*

*Question, put.*
MR. SPEAKER *having collected the Voices, declared that the "Ayes" had it.*

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, divide by name!

***පාර්ලිමේන්තුව මතු පළ වන අන්දමට-පක්ෂව 215; විරුද්ධව 01; වැළකී සිටීම 01; නොපැමිණි 07; යනුවෙන් බෙදුණේය.***
*பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 215; எதிராக 01; நடுநிலைமை 01; வராதோர் 07.*
*The Parliament divided: Ayes 215; Noes 01; Abstained 01; Absent 07.*

***පක්ෂව***
*சார்பாக*
*Ayes*

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremasinghe)

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා
(மாண்புமிகு ரெஜினோல்ட் குரே)
(The Hon. Reginold Cooray)

ගරු පියසේන ගමගේ මහතා
(மாண்புமிகு பியசேன கமகே)
(The Hon. Piyasena Gamage)

ගරු එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මහතා
( மாண்புமிகு எம்.கே.ஏ.டி.எஸ். குணவர்தன)
(The Hon. M.K.A.D.S. Gunawardana)

ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය
(மாண்புமிகு (திருமதி) சந்திராணி பண்டார )
(The Hon. (Mrs.) Chandrani Bandara)

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා
(மாண்புமிகு ஜனக பண்டார தென்னகோன்)
(The Hon. Janaka Bandara Tennakoon)

ගරු පලනි දිගම්බරම් මහතා
(மாண்புமிகு பழனி திகம்பரம்)
(The Hon. Palani Digambaram)

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)

ගරු දුමින්ද දිසානායක මහතා
(மாண்புமிகு துமிந்த திசாநாயக்க)
(The Hon. Duminda Dissanayake)

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

ගරු එස්.බී. නාවින්න මහතා
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன)
(The Hon. S.B. Nawinne)

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)

ගරු ෆීලික්ස් පෙරේරා මහතා
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாத் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen )

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)

ගරු පාඨලී චම්පික රණවක මහතා
(மாண்புமிகு பாட்டளி சம்பிக ரணவக்க)
(The Hon. Patali Champika Ranawaka)

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)

ගරු අබ්දුල් හලීම් මහතා
(மாண்புமிகு அப்துல் ஹலீம்)
(The Hon. Abdul Haleem)

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி)
(The Hon. A.H.M. Fowzie)

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)

ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා
(மாண்புமிகு முருகேசு சந்திரகுமார் )
(The Hon. Murugesu Chandrakumar)

ගරු එම්.ටී. හසන් අලි මහතා
(மாண்புமிகு எம்.ரீ. ஹஸன் அலி)
(The Hon. M.T. Hasen Ali)

ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)

ගරු ජීවන් කුමාරණතුංග මහතා
(மாண்புமிகு ஜீவன் குமாரணதுங்க)
(The Hon. Jeewan Kumaranatunga)

ගරු ඩිලාන් පෙරේරා මහතා
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)

ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

ගරු රුවන් විජයවර්ධන මහතා
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijayawardhana )

ගරු දිලිප් වෙදආරච්-චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

ගරු කරුපයියා වේලායුදම් මහතා
(மாண்புமிகு கருப்பையா வேலாயுதம்)
(The Hon. Karuppaiah Velayudam)

ගරු මහින්ද සමරසිංහ මහතා
(மாண்புமிகு மஹிந்த சமரசிங்க)
(The Hon. Mahinda Samarasinghe)

ගරු රෝසි සේනානායක මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluvihare)

ගරු දුනේෂ් ගන්කන්ද මහතා
(மாண்புமிகு துனேஷ் கங்கந்த)
(The Hon. Dunesh Gankanda)

ගරු අනෝමා ගමගේ මහත්මිය
(மாண்புமிகு (திருமதி) அனோமா கமகே)
(The Hon. (Mrs.) Anoma Gamage)

ගරු එම්.එස්. තව්ෆික් මහතා
(மாண்புமிகு எம்.எஸ். தௌபீக்)
(The Hon. M.S. Thowfeek)

ගරු දයාශ්‍රිත තිසේරා මහතා
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු ලලිත් දිසානායක මහතා
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)

ගරු ඒ.ඩී. චම්පික ප්‍රේමදාස මහතා
(மாண்புமிகு ஏ.டி. சம்பிக பிரேமதாச)
(The Hon. A.D. Champika Premadasa)

ගරු ශාන්ත බණ්ඩාර මහතා
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

ගරු විජයකලා මහේස්වරන් මහත්මිය
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු නෙරන්ජන් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு நெரன்ஜன் விக்கிரமசிங்க)
(The Hon. Neranjan Wickramasinghe)

ගරු රංජිත් සියඹලාපිටිය මහතා
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாப்பிட்டிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා
(மாண்புமிகு அமீர் அலி சிஹப்தீன்)
(The Hon. Ameer Ali Shihabdeen)

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ගරු වසන්ත සේනානායක මහතා
(மாண்புமிகு வசந்த சேனாநாயக்க)
(The Hon. Vasantha Senanayake)

ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)

ගරු ඒ.එල්.එම්. අතාවුල්ලා මහතා
(மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா)
(The Hon. A.L.M. Athaullah)

ගරු තිස්ස අත්තනායක මහතා
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ගරු දිළුම් අමුණුගම මහතා
(மாண்புமிகு திலும் அமுனுகம)
(The Hon. Dilum Amunugama)

ගරු පී. අරියනේත්‍රන් මහතා
(மாண்புமிகு பா. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)

ගරු ටිරාන් අලස් මහතා
(மாண்புமிகு டிரான் அலஸ்)
(The Hon. Tiran Allas)

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු සිල්වෙස්ත්‍රි අලන්ටින් මහතා
(மாண்புமிகு சில்வேஸ்திரி அலன்றின்)
(The Hon. Silvestrie Alantin)

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු මොහමඩ් අස්ලම් මහතා
(மாண்புமிகு மொஹமட் அஸ்லம்)
(The Hon. Mohamed Aslam)

ගරු සිවශක්ති ආනන්දන් මහතා
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

ගරු වික්ටර් ඇන්ටනි මහතා
(மாண்புமிகு விக்டர் அன்டனி)
(The Hon.Victor Antony)

ගරු වී.කේ. ඉන්දික මහතා
(மாண்புமிகு வி.கே. இந்திக)
(The Hon.V.K. Indika)

ගරු ටී. බී. ඒකනායක මහතා
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)

ගරු ඩබ්ලිව්.බී. ඒකනායක මහතා
(மாண்புமிகு டபிள்யு.பி. ஏக்கநாயக்க)
(The Hon. W.B. Ekanayake)

ගරු තිස්ස කරල්ලියද්ද මහතා
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)

ගරු ඒ.ආර්.එම්.ඒ.කාදර් මහතා
(மாண்புமிகு ஏ.ஆர்.எம்.ஏ. காதர்)
(The Hon. A.R.M.A. Cader)

ගරු ෆයිසාල් කාසිම් මහතා
(மாண்புமிகு பைஸால் காசிம்)
(The Hon. Faizal Cassim)

ගරු ජයන්ත කැටගොඩ මහතා
(மாண்புமிகு ஜயந்த கெடகொட)
(The Hon. Jayantha Ketagoda)

ගරු (වෛද්‍ය) රෝහණ පුෂ්ප කුමාර මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி)ரோஹண புஷ்பகுமார)
(The Hon. (Dr.) Rohana Pushpa Kumara)

ගරු සනී රෝහන කොඩිතුවක්කු මහතා
(மாண்புமிகு சனீ ரோஹன கொடிதுவக்கு)
(The Hon. Sanee Rohana Kodithuvakku)

ගරු නිර්මල කොතලාවල මහතා
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු ප්‍රභා ගනේසන් මහතා
(மாண்புமிகு பிரபா கணேசன்)
(The Hon. Prabha Ganesan)

ගරු සිරිපාල ගමලත් මහතා
(மாண்புமிகு சிறிபால கமலத்)
(The Hon. Siripala Gamalath)

ගරු සරත් කුමාර ගුණරත්න මහතා
(மாண்புமிகு சரத் குமார குணரத்ன)
(The Hon. Sarath Kumara Gunaratne)

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු සරණ ගුණවර්ධන මහතා
(மாண்புமிகு சரண குணவர்தன)
(The Hon. Sarana Gunawardena)

ගරු අර්ල් ගුණසේකර මහතා
(மாண்புமிகு ஏர்ல் குணசேக்கர)
(The Hon. Earl Gunasekara)

ගරු ඩිව් ගුණසේකර මහතා
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)

ගරු හේමාල් ගුණසේකර මහතා
(மாண்புமிகு ஹேமால் குணசேகர)
(The Hon. Hemal Gunasekera)

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)

ගරු සනත් ජයසූරිය මහතා
(மாண்புமிகு சனத் ஜயசூரிய)
(The Hon. Sanath Jayasuriya)

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)

ගරු අචල ජාගොඩගේ මහතා
(மாண்புமிகு அச்சல ஜாகொடகே)
(The Hon. Achala Jagodage)

ගරු බෂීර් සෙගු ඩාවුඩ් මහතා
(மாண்புமிகு பசீர் சேகு தாவூத்)
(The Hon. Basheer Segu Dawood)

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)

ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා
(மாண்புமிகு ஆறுமுகன் தொண்டமான்)
(The Hon. Arumugan Thondaman)

ගරු පී. දයාරත්න මහතා
(மாண்புமிகு பீ. தயாரத்ன)
(The Hon. P. Dayaratna)

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු විජය දහනායක මහතා
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු රෝහණ දිසානායක මහතා
(மாண்புமிகு ரோஹண திசாநாயக்க)
(The Hon. Rohana Dissanayake)

ගරු වීරකුමාර දිසානායක මහතා
(மாண்புமிகு வீரகுமார திசாநாயக்க)
(The Hon. Weerakumara Dissanayake)

ගරු සාලින්ද දිසානායක මහතා
(மாண்புமிகு சாலிந்த திசாநாயக்க)
(The Hon. Salinda Dissanayake)

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

ගරු මනූෂ නානායක්කාර මහතා
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු වයි.ජී. පද්මසිරි මහතා
(மாண்புமிகு வை.ஜி. பத்மசிறி)
(The Hon. Y.G. Padmasiri)

ගරු පී. පියසේන මහතා
(மாண்புமிகு பொ. பியசேன)
(The Hon. P. Piyasena)

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු නියෝමාල් පෙරේරා මහතා
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා
(மாண்புமிகு லக்ஷ்மன் வசந்த பெரேரா)
(The Hon. Lakshman Wasantha Perera)

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු මිල්රෝයි ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு மில்ரோய் பர்னாந்து)
(The Hon. Milroy Fernando)

ගරු කන්දයියා ප්‍රේමචන්ද්‍රන් මහතා
(மாண்புமிகு கந்தையா பிரேமச்சந்திரன்)
(The Hon. Kandiah Premachandran)

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ගරු ජයසිංහ බණ්ඩාර මහතා
(மாண்புமிகு ஜயசிங்க பண்டார)
(The Hon. Jayasinghe Bandara)

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)

ගරු සී.පී.ඩී. බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு சீ.பீ.டி. பண்டாரநாயக்க)
(The Hon. C.P.D. Bandaranaike)

ගරු තාරානාත් බස්නායක මහතා
(மாண்புமிகு தாராநாத் பஸ்நாயக்க )
(The Hon. Tharanath Basnayaka)

ගරු ඒ.එම්. චාමික බුද්ධදාස මහතා
(மாண்புமிகு ஏ.எம். சாமிக புத்ததாஸ )
(The Hon. A.M. Chamika Buddhadasa)

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා
(மாண்புமிகு நிஷாந்த முத்துஹெட்டிகமகே)
(The Hon. Nishantha Muthuhettigamage)

ගරු විනායගමූර්ති මුරලිදරන් මහතා
(மாண்புமிகு விநாயகமூர்த்தி முரளிதரன்)
(The Hon. Vinayagamoorthi Muralidaran)

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

ගරු ආර්. යෝගරාජන් මහතා
(மாண்புமிகு ஆர். யோகராஜன்)
(The Hon. R. Yogarajan)

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)

ගරු ජේ. ශ්‍රී රංගා මහතා
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)

ගරු කමලා රණතුංග මෙනෙවිය
(மாண்புமிகு (செல்வி) கமலா ரணதுங்க)
(The Hon. (Ms.) Kamala Ranathunga)

ගරු රුවන් රණතුංග මහතා
(மாண்புமிகு ருவன் ரணதுங்க)
(The Hon. Ruwan Ranatunga)

ගරු රොෂාන් රණසිංහ මහතා
(மாண்புமிகு ரொசான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු ලොහාන් රත්වත්තේ මහතා
(மாண்புமிகு லொஹான் ரத்வத்தே)
(The Hon. Lohan Ratwatte)

ගරු පෙරුමාල් රාජදූරයි මහතා
(மாண்புமிகு பெருமாள் ராஜதுரை)
(The Hon. Perumal Rajathurai)

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)

ගරු නිරූපමා රාජපක්ෂ මහත්මිය
(மாண்புமிகு(திருமதி) நிரூபமா ராஜபக்ஷ)
(The Hon. (Mrs.) Nirupama Rajapaksa)

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා
(மாண்புமிகு உதித் லொக்குபண்டார)
(The Hon. Udith Lokubandara)

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

ගරු රත්නසිරි වික්‍රමනායක මහතා
(மாண்புமிகு ரத்னசிறி விக்கிரமநாயக்க)
(The Hon. Ratnasiri Wickramanayaka)

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු නිමල් විජේසිංහ මහතා
(மாண்புமிகு நிமல் விஜேசிங்க)
(The Hon. Nimal Wijesinghe)

ගරු (මහාචාර්ය) රාජීව විජේසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ராஜீவ விஜேசிங்க)
(The Hon. (Prof.) Rajiva Wijesinha)

ගරු ඩුලිප් විජේසේකර මහතා
(மாண்புமிகு துலிப் விஜேசேகர)
(The Hon. Duleep Wijesekera )

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)

ගරු තේනුක විදානගමගේ මහතා
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)

ගරු එස්. විනෝ මහතා
(மாண்புமிகு எஸ். வினோ)
(The Hon. S. Vino)

ගරු ගුණරත්න වීරකෝන් මහතා
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)

ගරු කුමාර වෙල්ගම මහතා
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

ගරු ආර්. සම්පන්දන් මහතා
(மாண்புமிகு ஆர். சம்பந்தன்)
(The Hon. R. Sampanthan)

ගරු ඊ. සරවනපවන් මහතා
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)

ගරු ආර්. දුමින්ද සිල්වා මහතා
(மாண்புமிகு ஆர். துமிந்த சில்வா)
(The Hon. R. Dumindha Silva)

ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)

ගරු මුතු සිවලිංගම් මහතා
(மாண்புமிகு முத்து சிவலிங்கம்)
(The Hon. Muthu Sivalingam)

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

ගරු සී.ඒ. සූරියආරච්චි මහතා
(மாண்புமிகு சீ.ஏ. சூரியஆரச்சி)
(The Hon. C.A. Suriyaarachchi)

ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මහතා
(மாண்புமிகு ஜே.ஆர்.பீ. சூரியப்பெரும)
(The Hon. J.R.P. Sooriyapperuma)

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு அதாவுத செனெவிரத்ன)
(The Hon. Athauda Seneviratne)

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

ගරු පොන්. සෙල්වරාසා මහතා
(மாண்புமிகு பொன். செல்வராசா)
(The Hon. Pon. Selvarasa)

ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා
(மாண்புமிகு மாவை. சோ. சேனாதிராஜா)
(The Hon. Mavai S. Senathirajah)

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු උපේක්ෂා ස්වර්ණමාලි මහත්මිය
(மாண்புமிகு (திருமதி) உபேக்ஷா சுவர்ணமாலி)
(The. Hon. (Mrs.) Upeksha Swarnamali)

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු එච්.එම්.එම්. හරීස් මහතා
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)

ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. M.L.A.M. Hisbullah)

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

ගරු ජයරත්න හේරත් මහතා
(மாண்புமிகு ஜயரத்ன ஹேரத்)
(The Hon. Jayarathna Herath)

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

**ගරු එම්.බී. ෆාරුක් මහතා**
(மாண்புமிகு எம்.பி. பாறூக்)
(The Hon. M.B. Farook)

**ගරු හුනෙයිස් ෆාරූක් මහතා**
(மாண்புமிகு ஹுனைஸ் பாறூக்)
(The Hon. Hunais Farook)

**ගරු මාලනී ෆොන්සේකා මහත්මිය**
(மாண்புமிகு (திருமதி) மாலனீ பொன்சேக்கா)
(The Hon. (Mrs.) Malani Fonseka)

***විරුද්ධව***
*எதிராக*
*Noes*

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி)சரத் வீரசேகர)
(The Hon. (Dr.) Sarath Weerasekara)

***වැළකී සිටි***
*நடுநிலைமை*
*Abstained*

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

***නොපැමිණි***
*வராதோர்*
*Absent*

**ගරු එච්.එල්. ප්‍රේමලාල් ජයසේකර මහතා**
(மாண்புமிகு எச்.எல். பிரேமலால் ஜயசேகர)
(The Hon. H.L. Premalal Jayasekara)

**ගරු ජානක බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஜானக பண்டார)
(The Hon. Janaka Bandara)

**ගරු (ආචාර්ය) ජගත් බාලසූරිය මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஜகத் பாலசூரிய)
(The Hon. (Dr.) Jagath Balasuriya)

**ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි**
(மாண்புமிகு (வண.)எல்லாவல மேதானந்த தேரர்)
(The Hon. (Ven.) Ellawala Medhananda Thero)

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)

**ගරු ඒ. විනායගමූර්ති මහතා**
(மாண்புமிகு அ. விநாயகமூர்த்தி)
(The Hon. A. Vinayagamoorthy)

***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.***
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Bill accordingly read a Second time.*

***[ඉතිරි වැඩ කටයුතු සඳහා 2015 අප්‍රේල් 28 අඟහරුවාදා නිල වාර්තාවේ II වන කොටස බලන්න]***
*[நிகழ்ச்சித்தொடரை 2015 ஏப்பிரல் 28, செவ்வாய்க்கிழமைய அதிகார அறிக்கை, பகுதி II இல் பார்க்க]*
*[For continuation of Proceedings, see Part II of OFFICIAL REPORT of Tuesday, 28th April, 2015]*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.